යූරී ඩලේෂා

නපුරු පාලකයෝ තුන්දෙනා


යුරී ධලෙෂා
නපුරු පාලකයෝ තුන්දෙනා

යූරී ඩලේෂා

නපුරු පාලකයෝ තුන්දෙනා

චිත්‍ර
වී. ගොරියායච්

අනුවාදය
දැදිගම වි. රුද්රිගු

ISBN 978-955-1319-67-0

පරිගණක අක්ෂර යෝජනය
එස්. එල්. ඒ. දිලිනි සඳමාලි

මුද්‍රණය
Kanol PRINT

ප්‍රකාශනය
සී/ස, ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම
91, ආචාර්ය අන්.ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ලංකාවේ මුද්‍රණය 2017

පටුන

පළමුවැනි කොටස

කඹය දිගේ ගමන් කරන ටිබුල්

1. දෙස්තර ගස්පාර් අර්නේරි නොසන්සුන් දවසක් ගත කරයි . . 9
2. පෝරක දහයක් 15
3. තරු පහන 22

දෙවැනි කොටස

ඔටුන්න හිමි ටුට්ටිගේ බෝනික්කා

4. බැලුන් වෙළෙන්දු අහසේ පාවෙයි 37
5. කාපිරි තරුණයෙක් 63
6. බලාපොරොත්තු නොවූ දෙයක් 81
7. මහ රෑ අසීරු ගමනක් 91

තුන්වැනි කොටස

සුවනී

8. පුංචි නිළිය අසීරු චරිතයක් රඟපායි 105
9. බඩගිනිකාර බෝනික්කා 114
10. සත්තු වත්ත 126

හතරවැනි කොටස

ප්‍රෙස්පේරෝ

11. සුවනී සෙබළුන්ට අසුවෙයි 139
12. නැටුම් ගුරුවරයා 148
13. ජය ලැබීම 154
අවසානය 172

පළමුවැනි
කොටස

කාලිය දිගේ
ගමන් කරන විවුල්

1

දෙස්තර ගස්පාර් අර්නේරි නොසන්සුන් දවසක් ගත කරයි

ඉන්ද්‍රජාලම් කාරයින්ගේ කාලය අවසාන වෙලා. හැබෑටම ඔවුන් හිතූ හැම දෙයක්ම කළ කාලයක් තිබුණේ නැතැයි කියන්නට පුළුවන්. ඒ කතා පුංචි ළමයින් සතුටු කරවන්ට ගොතාපු ඒවා. සමහර අලසයින්ව කොතරම් ලස්සනට රැවැට්ටුවාදැයි කීවොත්, විජ්ජාකාරයින්ව පිළිගත්තේ බලසම්පන්න මායාකාරයින් සහ ඉන්ද්‍රජාලම් කාරයින් හැටියටයි.

ඔන්න එක රටක හිටියා දෙස්තර කෙනෙක්. ඔහුගේ නම ගස්පාර් අර්නේරි. බොළඳ මිනිසුන්, කඩ පිල් ගානේ රස්තියාදු වන එවුන්, බාගෙට ඉගෙන ගත්තු සිසුන් ගස්පාර්ව පිළිගත්තේ ඉන්ද්‍රජාලම් කාරයකු හැටියටයි. ඇත්ත වශයෙන්ම දෙස්තර ගස්පාර් නොයෙක් පුදුම දේ කළා. සමහර ඒවා හැබෑටම අරුම පුදුම දේවලට සමානයි. හැම දෙයක් ගැනම ඕනෑවට වැඩිය විශ්වාස කරන දුප්පත් ජනතාව රවටන්නෝ තමා විත්තිකාරයෝ. දෙස්තර ගස්පාර් ඒ වගේ නොවෙයි.

දෙස්තර ගස්පාර් අර්නේරි හැබෑටම උගත් කෙනෙක්. ඔහු නොයෙක් විද්‍යා සියයක් පමණ ඉගෙන ගත්තා. ගස්පාර්ට වැඩිය උගත්, නුවණැති කෙනෙක් ඒ රටේ හිටියේ නැහැ.

ඔහුගේ උගත්කම ගැන රටවැසියෝ දන්නවා: පිටි මෝලේ වැඩකරන්නාත්, යුද සෙබළුත්, නෝනලාත්, ඇමතිවරුත් මේ ගැන දන්නවා. පාසල් යන ළමයි ගස්පාර් ගැන ගී සින්දු හදලා කියන්ට පටන් ගත්තා.

අහසේ තරු අල්ලන්නට
හිවල් හාමි එළවන්නට
වැලි මිරිකා තෙල් ගන්නට
පුළුවනි අපෙ අර්නේරිට.

ගිම්හාන කාලය ආවා. ජූනි මාසයේ එක දවසකදී බොහොම හොඳ කාල ගුණයක් තිබුණා. දෙස්තර ගස්පාර් අර්නේරි ඇත පළාතකට ගිහිල්ලා බෙහෙත් පැළෑටි වර්ගයි, කුරුමිණි සතුන්වයි එකතු කිරීමට තීරණය කළා.

දෙස්තර ගස්පාර් තරුණයෙක් නොවෙයි. වැස්සට තෙමිලා, හුළං පාරට අහු වුණොත් ලෙඩ වෙනවා. ඔහු ගමනට පිටත් වුණේ මෙන්න මෙහෙමයි. ලොකු තුවායක් බෙල්ල වටේ ඔතා ගත්තා. ඇස් දූවිල්ලෙන් ආරක්ෂා වෙන්න, කණ්ණාඩි කුට්ටමක් දමා ගත්තා. පය ලිස්සා නොවැටෙන්නට හැරමිටියක් අතට ගත්තා.

එදා කාලගුණය බොහොම අපූරුයි. හිරු රැස් බොහොම දීප්තිමත්. තණ කොළ, පැළෑටි, කොළම, කොළ පාටයි. හැම තැනම නැවුම් සුවඳයි. පුංචි මල්වල පෙති සුළඟට අසුවෙලා පාවෙනවා. කුරුල්ලෝ ගී ගයනවා. සිසිල් සුළං ඇඟට වැදෙන විට හරි සනීපයක් දැනෙනවා.

"කාලගුණය බොහොම හොඳ බව නම් ඇත්ත තමා. ඒ වුණාට ගිම්හානයේ කාලගුණය ගැන විශ්වාසය තබන්නට බැහැ. වැහි කබාය ගෙනියන්නට ඕන," දෙස්තර ගස්පාර් කීවා.

ගස්පාර් ගෙදර වැඩ එකලසක් කරලා, ඇස් කණ්ණාඩි කුට්ටම පිහදා ගෙන පැළඳ ගත්තා. කොළ පාට ගමන් පෙට්ටියත් අරගෙන ඔහු ගමනට පිටත් වුණා.

ඉතාම හොඳ තැන් තියෙන්නේ නගර සීමාවෙන් එපිට, තරබාරු නපුරු පාලකයන් තුන්දෙනාගේ මාලිගාව අවට පෙදෙසෙ, ගස්පාර් නිතර, නිතර ඒ පැත්තට යනවා. තරබාරු නපුරු පාලකයින්ගේ මාලිගාව තියෙන්නේ මහ විසාල මල් වත්තක් මැද. මල් වත්ත වටේට ගැඹුරු දිය අගල්. ඔය දිය අගල් වලට උඩින් පූට්ටු පාලම්. මාලිගාවෙ මුරකාරයො - යුද සෙබළු ඒවා මුරකරනවා. ඔවුන්ගේ හිස් වැසුම් කළු පාටයි. කහ පාට පිහාටු වලින් ඒ තොප්පි සරසලා. මල් වත්ත වටේට තණ පිටියකි. එය හැතැප්ම ගණනක්ම දිගයි. තණ පිටියේ තැන්, තැන්වල මල් පඳුරු, පොකුණු තියෙනවා. විවේකයට ඇවිදින්න කියාපු තැන. ඉතාම එටිනා පැළෑටි, බොහොම ලස්සන කුරුමිණි සත්තු, ගී ගයන ලස්සන කුරුල්ලෝ මේ තණ පිටියේ ඉන්නවා.

"පයින් යන්ට බැහැ. බොහොම දුරයි. නගර සීමාවට ගිහිල්ලා අස් රියක නැගිලා යනවා," දෙස්තර ගස්පාර් කල්පනා කළා. "කුලී රියකරුවා මාව මල් වත්තට ගෙන යාවී."

නගර සීමාව ළඟ එදා වෙනදාට වැඩිය මිනිස්සු පිරිලා.

"අද ඉරිදද?" දෙස්තර සැක කළා. "වෙන්ට බැහැ. අද අඟහරුවාදා." ඔහු තමාටම කියා ගත්තා.

දෙස්තර තවත් ළඟට ගියා.

නගර කොටුව මිනිසුන්ගෙන් පිරිලා, ඉතිරිලා. කොළ පාට අත් සහිත අළු පාට කබා ඇඳගත්තු කම්මල් කාරයින්, සුදුමැලි මුණු ඇති නාවිකයන්, ජේත්තුවට හැඳ පැළඳගත් නගරයේ පොහොසත් ගෑනුන් සහ පිරිමින් දෙස්තර දැක්කා. පෝසත් ගෑනුන්ගේ සායවල් හරියට රෝසම්ල් පඳුරු වගෙයි. මේ මිනිසුන් ගොඩෙහි සරුවත් වෙළෙන්දෝ, අයිස්ක්‍රීම් කාරයෝ, පදික වේදිකාවල නැටුම් පෙන්වන නළුවෝ හිටියා. කොළ පාට, කහ පාට අල්ලි වැටිච්ච ඇඳුම් ඇඳගෙනයි නළුවන් හිටියේ. ඒ ඇඳුම් පුංචි රෙදි කෑලි මූට්ටු කරලා මහලා වගෙයි. රතු පාට බල්ලන්ගේ පිටුපසින් පුංචි ළමයි ගමන් කළා.

මේ මහ පිරිස නගරයේ දෙරටු ළඟ රැස්කකා හිටියා. බොහොම උසැති නගරයේ දෙරටු වහලා තිබුණා.

"මේ දෙරටු වහලා තියෙන්නේ මොකද?" දෙස්තර පුදුම වුණා.

පිරිස කෑ ගහනවා, මහ හඬින් කතා කරනවා, ශබ්ද කරනවා, බණිනවා. ඒ වුණාට කිසි දෙයක් හරිහැටි තෝරා බේරාගන්ට බැහැ. අළු පාට මහත බළලෙකු වඩා ගෙන සිටි ගැහැණියක් ළඟට ආපු දෙස්තර ඇගෙන් මෙහෙම ඇහැව්වා :

"මෙතැන සිදුවන්නේ මොනවාද කියලා විස්තර කරන්න පුළුවනිද? මෙතැන සෙනඟ පිරිලා ඉන්නේ මොකද? ඒ ගොල්ලා කලබල වෙලා නෙවද. නගරයේ දෙරටු වහලා තියෙන්නේ මොකද?"

"මුර සෙබළු මිනිසුන්ට යන්න ඉඩ දෙන්නේ නැහැ."

"ඇයි එහෙම කරන්නේ?"

"නපුරු පාලක තඩියන් තුන්දෙනාගේ මාලිගාව වටලන්න ගිය මිනිසුන්ට උදව් කරයි කියලා බයේ," ගැහැණිය කීවා.

"අනේ නෝනා මට නම් කිසිවක් තේරෙන්නේ නැහැ. සමාවෙන්න..."

"හැබෑටම ඔබ දන්නේ නැතිද? අවි හදන ප්‍රොස්පේරෝ සහ සර්කස් කාරයා ටිබුල්, මිනිසුන් සමග නපුරු පාලකයන් තුන්දෙනාගේ

මාලිගාව අල්ලන්නට ගියා."

"අවි හදන ප්‍රොස්පේරෝද?..."

"ඔව්, මහත්මයා. නගර දෙරටු බොහොම උසයි. නගරයෙන් එළියට කාටවත් යන්ට බැහැ. ප්‍රොස්පේරෝ සමග ගිය අයට මාලිගාවේ සෙබළු පහර දේවි."

ඔන්න එවිටම ඈත වෙඩි තියන හඬ ඇසුනා.

ගැහැණියගේ අතේ හිටිය බළලා බිම වැටුණා. ඌ පැනලා දිව්වා. සෙනඟ හඬ නගා කෑ ගැසුවා.

දෙස්තර කල්පනා කළා : "සෑහෙන දේ සිදුවෙලා, මම දන්නෙවත් නැහැ නොවැ. ඇත්ත තමා මම මාසයක් තිස්සේම දෙරවල් වහගෙන විද්‍යාත්මක කටයුතු කළා. කිසිම දෙයක් ගැන දන්නේ නැහැ."

ඒ වේලාවේදී තරමක් ඈතින් කාලතුවක්කුවක් වෙඩි තැබුවා. වෙඩි උණ්ඩය පිට වෙනවාත් සමගම හෙණ පහරක් වගේ මහා ශබ්දයක් ඇහුණා. බය වුණේ දෙස්තර විතරක් නොවේ. රැස්වෙලා හිටිය සෙනඟ අඩි කීපයක් පහු බැහැලා, විසිරී ගියා. පොඩි ළමයි බයවෙලා ඇඬුවා, පරවියෝ සට සට ගාලා පියාපත් ගසලා පියාඹා ගියා. බල්ලෝ උඩු බුරලන්ට පටන් ගත්තා, කෙඳිරි ගෑවා.

දිගටම කාලතුවක්කු වලින් වෙඩි තිබ්බා. වෙඩි හඬ නිසා ශබ්දය තවත් වැඩිවුණා. මිනිස්සු දෙරටු ළඟ රැස්වෙලා කෑ ගැහැව්වා :

"ප්‍රොස්පේරෝ! ප්‍රොස්පේරෝ!"

"නපුරු පාලකයින් තුන්දෙනා භංග වේවා!"

දෙස්තර ගස්පාර් හොඳටම කලබල වුනා. බොහෝ දෙනෙක් ඔහුව අඳුනනවා. සෙනඟ ගොඩේ හිටිය මිනිස්සු ඔහුව දැක්කා. ආරක්ෂාවීමට වගේ සමහරු දෙස්තර ගස්පාර් ළඟට ආවා. ඔහුට කිසිවක් කරන්ට බැරි හන්දු ඔහු නෑඬුවා විතරයි.

"අතන වෙන්නේ මොනවාද? දෙරටුවෙන් එහා වෙන දේ දැනගන්නේ කොහොමද? සමහර විට මහජනයාට ජය ලැබිලා ඇති. නැතිනම් ඒ ගොල්ලන්ට වෙඩි තියලා වෙන්නට ඕන."

ඔන්න එතකොට මිනිස්සු දහ දෙනෙක් පටු මාවත් තුනක් දිගේ, නගර කොටුවෙන් ඈතට දුවන්නට වුණා. එක මුල්ලක උස කුළුණක් සහිත ගෙයක් තිබුණා. ගස්පාර් මිනිස්සු කීපදෙනෙක් සමග කුළුණට නගින්නට පටන් ගත්තා. පහළ රෙදි අපුල්ලන ලොන්ඩරියක්. එය හරියට නාන තැනක් වගෙයි. එතැන බිම්ගෙයක් වගේ කළුවරයි.

කුළුණට නගින්නට වට රවුමට හදපු හිණි මගක් තිබුණා. කුළුණ තුළට එළිය වැටුනේ පුංචි ජනේල වලින්. නමුත් කුළුණ ඇතුලේ කළුවරයි. මිනිස්සු හෙමින්, හෙමින්, අමාරුවෙන් හිණිමග දිගේ ඉහළ නැග්ගා. හිණි මග පරණයි. දිරච්ච වැටවල් එයට සවිකරලා තිබුණේ. දෙස්තර ගස්පාර් බොහොම මහන්සියෙන් හති දම දමා ඉහළටම නැග්ගා. ඔහු තව පඩි විස්සක් විතර නැගලා කළුවරේම කෑ ගැසුවා :

"මගේ හදවත පැළෙන්ට එනවා. ඒ අස්සෙ මගෙ සපත්තුවක අඩියකුත් ගැළවුණා!"

කාලතුවක්කු වලින් වෙඩි තියන වේලාවේදී ඔහුගේ වැහි කබාය නැතිවුණා.

කුළුණ උඩ පොඩි හතරැස් කොටුවකි. එය වටේට ගඩොලින් කළ වැටකි. මෙතැන ඉඳලා බැලුවාම හැතැප්ම තිහක් විතර දුර පේනවා. අවට බොහොම ලස්සනයි. නමුත් බල, බලා ඉන්ට දැන් සුදුසු වේලාවක් නොවේ. මහජනයයි, නපුරු පාලකයෝ තුන්දෙනාගේ හමුදාවයි කරන සටන දෙස හැම දෙනාම බලන්නට පටන් ගත්තා.

"මගෙ ළඟ තියෙනවා දුර බලන දුර දක්නයක්. වීදුරු අටක් දමාපු දුර දක්නයක්. මෙන්න ඒ දුර දක්නය." දෙස්තර ගස්පාර් පටියක් ගළවලා දුර දක්නය අතට ගත්තා. පිරිස මාරුවෙන්

මාරුවට සටන දිහා දුර දක්නයෙන් බැලුවා.

ඈත කොළ පාට බිමක මිනිස්සු නගරය දෙසට දුවන හැටි ගස්පාර් දැක්කා. ඔවුහු සටන් කළා. දුර ඉඳලා බලන කොට මිනිසුන් හරියට නොයෙක් පාට වලට අයත් කොඩි වගෙයි. සෙබළු අසුන් පිට නැගලා මිනිසුන් ලුහුබඳින්නට වුණා.

මේ ජවනිකාව හරියට මැජික් පහනකින් මවාපු දෙයක් වගෙයි කියලා දෙස්තර ගස්පාර්ට කල්පනා වුණා. තද හිරුරැස් නිසා තණකොළ දිලිසෙනවා. බෝම්බ පුපුරලා හැම තැනම ගිනි ඇවිලෙනවා. දුර ඉඳලා බලන කොට, වීදුරු කැලිවලට ඉර අව්ව වැටුණා වගෙයි. අස්වයෝ හේසාරවය කළා, පසුපස කකුල් වලින් හිට ගත්තා.

මල් වත්තයි නපුරු පාලකයින් තුන් දෙනාගේ මාලිගාවයි දුමෙන් වැසුණා. "මිනිස්සු දුවනවා!"

"ඒ ගොල්ල දුවනවා... මහජනතාවට පරාජය ලැබිලා!"

මිනිස්සු නගරය දෙසට දුවන්නට පටන් ගත්තා. ඔවුන් රංචු මහ මග වැටුනා, පැළෑටි අතරින් නොයෙක් පාටැති කුඩා කැලි වීසිවෙනවා වගේ තමයි, දුර ඉඳලා බලන විට පෙනෙන්නේ.

කොටුවට ඉහළින් බෝම්බයක් පියාඹා ගියා.

එක මිනිහෙක් බයවෙලා අතේ තිබුණු දුර දක්නය බිම දැම්මා. හැමදෙනාම ආපහු හිනි මග දිගේ බහින්නට පටන් ගත්තා. හිණි මග තියෙන්නේ කුළුණ ඇතුලේ.

යකඩ වැඩ කාරයාට බිමට බහින්නට බැරිවුණා. එයාගේ කබාය කුළුණ උඩ වැටේ කොක්කකට ඇමුණුනා. ඔහු සටන් බිම දෙස බලා මහ හයියෙන් කෑ ගැසුවා:

"දුවපල්ලා! අන්න හතුරෝ ප්‍රොස්පේරෝව අල්ලා ගත්තා! හතුරෝ දැන් නගරයට ඒවි!"

නගර කොටුවේ මහ කලබලයකි. නගර වැසියෝ දෙරටුවෙනුයි, කොටුවෙනුයි ඇතට දිව්වා, පටු පාරවල් දිගේ. වෙඩි හඬ නිසා කන් බිහිරි වෙලා.

ගස්පාර් කුළුණේ තුන්වැනි තට්ටුවේ නැවතිලා පුංචි ජනේලයකින් අවට බැලුවා. ඔහු සමග තවත් දෙදෙනෙක් නැවතුනා.

එක් කෙනෙකුට විතරයි හරිහැටි පෙනුණේ. අනිත් දෙදෙනා බැලුවේ එක ඇහැකින්. ජනේලය ඒ තරම්ම පොඩියි. ඇතිවුණු සටන්

දිහා බලන්නට පවා බැහැ. එතරම් භයානකයි.

නගරයේ විශාල දෙරටු ඇරුණා. එතකොට මිනිස්සු තුන්සියයක් විතර එකවරම ඇතුළු වුණා. ඒ ගොල්ල තමා හස්ත කර්මාන්ත කාරයෝ. කොළ පාට අත් ඇති කපු කබා ඔවුන් ඇඳලා හිටියා. මේ ගොල්ල බීම වැටුණු හැටියේම අත් පා කැඩිලා ලේ ගලන්නට වුණා. ඔවුන්ගේ ඇඟට උඩින් සෙබළු අසුන් පැන්නුවා. ඔවුන් කඩු වලින් කැපුවා. තුවක්කු වලින් වෙඩි තැබුවා. සෙබළ තොප්පිවල තිබුණු කහ පාට පිහාටු ළෙලදුන්නා. අශ්වයෝ උන්ගේ රතු පාට කටවල් ඇරියා. ඇස් මහත් කරගෙන පෙණ වීසි කළා.

"අර බලපල්ලා! අර බලපල්ලා! ප්‍රොස්පේරෝ!" දෙස්තර කෑ ගැසුවා.

අවි හඳන ප්‍රොස්පේරෝව මාංචු දලා ගෙනිච්චා. ඔහු වැටී, වැටී ගියා. ඔහුගේ හිසකේ අවුල් වෙලා. ඒවා රතු පාටයි. මූණ පුරා ලේ ගලනවා. බෙල්ලට යකට පටියකින් තොණ්ඩුවක් දලා.

"ප්‍රොස්පේරෝව සිරභාරයට අරගෙන!" දෙස්තර කෑ ගැසුවා.

මේ අතර බෝම්බයක් රෙදි හෝදන ලොන්ඩරියට වැටුණා. කුළුණ හෙලවිලා, තත්පරයක් පමණ ඇලවෙලා තිබිලා, එක පාරටම ඇද වැටුණා. දෙස්තර ගාස්පාර් වීසිවෙලා ගියා, අනිත් සපත්තුවේ අඩියත් කැඩුණා. හැර මිටියයි, ගමන් පෙට්ටියයි, ඇස් කණ්ණාඩි කුට්ටමයි කොහේ විදුණාද දන්නේ නැහැ.

2

පෝරක දහයක්

දෙස්තර ගස්පාර් වීසි වෙලා ගිහින් බීම වැටුණාට තුවාල වුණේ නැහැ. ඔළුව පැලුනේ නැහැ. අත් පා කැඩුණේ නැහැ. ඒ වුණත් මහ උස කුළුණක් කැලි, කැලි වලට කැඩිලා වීසි වෙන කොට, මොන වාසනාවක්ද, දෙස්තර ගස්පාර් තරුණයෙක් නොවෙයි, ඔහු දෙගොඩ හරි වයසේ කෙනෙක්. ඔහු වීසිවෙලා වැටුණු හැටියේම සිහිය නැතිවුණා.

දෙස්තර ගස්පාර්ට ආපහු සිහිය ලැබෙන කොට හවස් වෙලා තිබුණා. ඔහු වට පිට බැලුවා.

"මදෑ වෙච්ච දේ! ඇස් කණ්ණාඩි කුට්ටමත් කැඩිලා. ඇස් හොඳට පෙනෙන මිනිහෙක් කණ්ණාඩි දාගෙන බලනකොට පෙනෙන විදියට තමා දැන් මට පෙනෙන්නේ. කොහෙත්ම පැහැදිලි නැහැ." ඔහු තමාටම කියා ගත්තා.

ඊට පස්සේ ඔහු සපත්තු අඩි කැඩුණු හන්ද මුනු මුනු ගාලා දෙස් කීවා.

"මම මිටි මිනිහෙක්. සපත්තු අඩි කැඩුණු හන්ද මම තවත් මිටි වේවි. සපත්තු අඩි දෙකම කැඩුණු හන්ද අඟල් දෙකක්ම මිටි වේවිද? නැහැ එක සපත්තු අඩියක උස අඟලයි. ඒ නිසා මම අඟලකින් මිටි වේවි, ඔව් හැබෑටම..."

ඔහු කුළුණේ සුන් බුන් ගොඩක වැටිලා හිටියා. බිම නොවැටුනු කුළුණේ කොටසක් කටුවක් වගේ උලට තිබුණා. ඈත තැනක සංගීත වාදනයක හඬක් ඇසුණා. සුළං පහරක් සමග ඇසෙන ඒ සංගීතය බොහොම පියකරුයි. දෙස්තර හිස ඔසවා බැලුවා. උඩ සිට කළු පාට ලී කැලි විසිරී ගියා. නිල්වන් අහසේ තරු දිලිසෙනවා.

"සංගීතය වාදනය කරන්නේ කොහිද?" දෙස්තර පුදුම වුණා.

වැහි කබාය නැති නිසා ඔහුට හීතලයි. දෙස්තර උගුර පාදගෙන නැගිට්ටා විතරයි ඔහුගේ ඇඟේ තිබුණු ගඩොල් කැලී බිම වැටුණා. ඔහු යන ගමන් ඔහුගේ කකුලක් ඉඹිටම ලොකු සපත්තුවක් ඇතුළට ගියා. යකඩ වැඩ කාරයා බාල්කයක් උඩ හරහට වැටිලා අහස දිහා බලාගෙන හිටියා. දෙස්තර ගස්පාර් ඔහුට කතා කළා. නමුත් ඔහු නැගිට්ටේ නැහැ. යකඩ වැඩ කාරයා මැරිලා.

දෙස්තර ඔහුට ගරු කරන්ට ඕන හන්ද තොප්පිය ගලවා ආචාර කරන්ට හිතලා අතක් ඉස්සුවා. එතකොට තමා ඔහු දැනගත්තේ ඔහු හිසේ තිබුණු තොප්පියත් නැතිවෙලා බව.

"තොප්පියත් නැතිවෙලා. දැන් ඉතින් කොහේ යන්නද?"

ඔහු නගර කොටුවෙන් ඈතට ගියා. මහ පාරෙ හැම තැනම මළ සිරුරු. දෙස්තර ඔවුන් දිහා හොඳට බැලුවා. සමහරුන්ගේ ඇස් ඇරිලා. අහසේ බැබළෙන තරු එම ඇස් වලින් පිළිබිඹු වෙන හැටි දෙස්තර දැක්කා. ඔහු මළ සිරුරුවල නළල් අත ගෑවා. ඒවා හොඳටම හීතලවෙලා. ලේ නිසා තෙත් වෙලා. රතු පාට ලේ රෑට පෙනෙන්නේ කළු පාටටයි.

"ඔන්න ඉතින් වෙච්ච දේ! මහජනයා පැරදුනා... දැන් ඉතින් මොනවා වේවිද?" දෙස්තර මුමුණන්නට වුණා.

පැය බාගයකින් ඔහු මහජනයා ඉන්න තැනකට ආවා. ඔහුට බොහොම මහන්සියි. යමක් කාලා, බීලා විඩා හරින්ට ඔහුට සිතුනා. නගරයේ මේ පැත්ත සටන්වලට අසුවුණේ නැත.

දෙස්තර ගස්පාර් හතර මං හන්දියක් ළඟ නැවතිලා හති හැරියා. "හරි පුදුමයක් නොවැ! නොයෙක් පාටවලින් පහන් දිලිසෙනවා. අස්රිය දුවනවා. වීදුරු දෙරවල් හඬ නගනවා. අඩක් වටකුරු ජනේල රන් පාටින් දිලිසෙනවා. ගෙවල්වල ජෝඩු බැගින් වැළඳගෙන නටනවා. ඒ ගෙවල්වල ප්‍රීති උත්සව, නැටුම්. මිනිස්සු කිසි දෙයක් නූනා වගේ ජීවත් වෙනවා. අද උදේ වුණු දේ මේ මිනිස්සු දන්නේ නැතිද? වෙඩිතැබීම්, කෙඳිරිගෑම් මේ මිනිසුන්ට ඇහිලා නැතිද? සමහර විට ඒ වගෙ දෙයක් සිදුනූණා වෙන්ට පිළිවනි. ඒක මට පෙනුණ හීනයක් වෙන්ට බැරිද?" දෙස්තර විඩා හරිමින් එහෙම කල්පනා කළා.

වීදියක තුන් හුලස් පහනක් දැල්වුණා. ඒ අසල පදික වෙදිකාවේ අස්රිය කීපයක් තිබුණා. මල් වෙළෙන්දියෝ මල් වික්කා. අස් රියකරුවෝ මල් වෙළෙන්දියන් එක්ක කතාබහ කළා.

"අනේ පව්. බෙල්ලට යකඩ මාංචුවක් දලා ඔහුව මහ පාරේ ඇදගෙන ගියා. අසරණයා!"

"දැන් ඔහුව යකඩ කූඩුවක දලා. ඒ යකඩ කූඩුව නපුරු පාලකයෝ තුන්දෙනාගේ මාලිගාවේ තියලා තියෙනවා," මහත අස් රියකරුවා කීවා. ඔහු නිල් පාට ඇඳුමක් ඇඳලා හිටියා.

මේ වේලාවේදී මල් මිලදි ගන්ට, නෝනා කෙනෙක් ළමයකුත් එක්ක එතැනට ආවා.

"කාවද යකඩ කූඩුවක දැම්මේ?" ඈ විපරම් කළා.

"අවි හදන ප්‍රොස්පේරෝව. යුද බටයෝ ඔහුව හිරබාරයට ගත්තා."

"දෙවියන්ට පින් සිදු වේවා!" නෝනා කීවා.

ළමයා ඇඬුවා.

"මෝඩ කෙල්ල නුඹ අඩන්නේ මොකද?" නෝනා පුදුම වුණා. "නුඹ ප්‍රොස්පේරෝට අනුකම්පා කරනවද? ඔහුට අනුකම්පා කරන්ට එපා. ඔහු අපට හතුරු කම් කළා. මේ බලපන්. මේ රෝසමල් කොච්චර ලස්සනද!..."

මල් වෙළෙන්දියන්ගේ භාජනවල රෝස මල් හරිම ලස්සනයි. හරියට විලක පාවෙන හංසයෝ වගෙයි.

"මෙන්න නුඹට රෝස මල් තුනක්. අඬන්නට එපා. ප්‍රොස්පේරෝලා කැරලි කාරයෝ. උන්ව යකඩ කූඩුවලට දැම්මේ නැතිනම්, උන් අපේ වතු, පිටි ඉඩ කඩම්, ගෙවල් දොරවල් විතරක් නොවෙයි අපේ රෝස මල් පවා උදුරා ගනීවී. උන් අපව කැලි වලට කපා දමාවි."

මේ වේලාවේදී නෝනා ළඟින් කොල්ලෙක් දිවගියා. ඌ ඉස්සෙල්ලා නෝනාගේ සාය ඇද්ද. ඒ සාය තරු අල්ලපු ලස්සන ඇඳුමක්. ඊට පස්සේ ගෑනු ළමයාගේ කොණ්ඩෙන් අල්ලා ඇද්ද.

"කුමාරි හාමිනේ, ඒකට කමක් නැහැ. ප්‍රොස්පේරෝව යකඩ කූඩුවේ දැම්මාට, සර්කස් කාරයා ටිබුල් නිදහසේ ඉන්නවා!" කොල්ලා කීවා.

"ආෑ, තෝ උද්දච්චයා! නෝනා බැණ වැදුනා.

නෝනා පයක් ඉස්සුවා කොල්ලාට පහර දෙන්නට. එතකොට ඇගේ බෑගය බිම වැටුණා. මල් වෙළෙන්දියෝ බක බක ගාලා හිනාවුණා. මහත අස් ගොව්වා නෝනාට කතා කරල කීවා, "රියට නගින්න බංගලාවට ගෙනියන්නම්" කියලා.

නෝනා සහ ළමයා රියේ නැගිලා ගියා.

"කොල්ලෝ පොඩ්ඩකට නැවතියන්!" මල් වෙළෙන්දියක් කීවා. "මෙහෙ වරෙන්! නුඹ දන්න දේ කියාපන්...!"

අස් රියකරුවෝ දෙදෙනෙක් තම අසුන් වලින් බැහැලා කොල්ලා ළඟට ආවා. ඔවුහු දිග කබා ඇඳ හිටියා. දෙදෙනාම මල් වෙළෙන්දියන් ළඟට ආවා.

අස් රියකුරුවකුගේ අතේ තියන කසය දැකපු කොල්ලා කල්පනා කළා. "මේක කසයක් නොවෙයි, කස රජෙක්." කොල්ලාටත් ආසා හිතුනා ඒ වගේ කසයක් ලබා ගන්ට. කරුණු කීපයක් හන්දා ඒ ආසාව හරිගියේ නැහැ.

"කොලේලෝ නුඹ කීවේ මොනවාද?" රියකරුවා ගොරෝසු හඬින් ප්‍රශ්න කළා. "ටිබුල් සර්කස්කාරයා නිදහසේද?"

"කතාව එහෙමයි. මම තොටුපළට ගියා."

"මුර භටයෝ ඔහුව මරා දැම්මේ නැතිද?" අනිත් රියකරුවාත් ඇසුවා.

"නැහැ මාමේ... ලස්සන නැන්දේ මට රෝසමලක් දියන්!" කොල්ලා කතාව වෙන අතකට හැරෙව්වා.

"ඉවසපන් මෝඩයා. නුඹ වෙච්ච සිද්ධිය විස්තර කරපන්."

"මෙන්න මෙහෙමයි... ඉස්සෙල්ලා හැම දෙනෙක්ම හිතුවේ ටිබුල්ව මැරුවයි කියලා. ඔහුගේ මළ සිරුර හෙව්වා, නමුත් හොයාගන්ට බැරිවුණා."

"සමහර විට ඔහුගේ මළ මිනිය අගලට වීසි කළාද?" රියකරුවා ඇසුවා.

හිඟන්නෙක් ඔය කතාවට කට දැම්මා.

"අගලට දැම්මේ කාවද? සර්කස්කාර ටිබුල් බළල් පැටියකු නොවේ. එයාව ගිල්ලවන්ට බැහැ. ටිබුල් ජීවතුන් අතර. ඔහු අහුනොවී පැනලා ගියා."

"බොරු කියනවා, හොර අලියා!" රියකරුවෙක් කීවා.

"ටිබුල් ජීවතුන් අතර ඉන්නවා!" මල් වෙළෙන්දියෝ කෑ ගසා එකවර කිව්වා.

කොල්ලා රෝස මලක් ඩැහැගෙන එක පිම්මට දුවන්නට වුණා. දෙස්තරට හීන් දඩිය දැම්මා. ඔහුට බොහොම මහන්සියි. ඔහු ඩහදිය පිසදමාගෙන හිඟන්නා ළඟට කිට්ටු වුණා විස්තර දැනගන්ට.

කතාවට බාධාවක් මේ වර ඇති වුණා. මහ පාරේ අරුම පුදුම පෙරහැරක්. ඉස්සරහින් අසරු සෙබළු දෙදෙනෙක් පන්දම් දෙකක් අරගෙන ගියා. පන්දම්වල ගිනි බොහෝම දීප්තිමත්ව ඇවිලුනා. පිටිපසින් රාජකීය ලකුණ ඇති කළු පාට අස්රියක් සෙමින් ගියා.

රියට පසුව වඩුවෝ සිය දෙනෙක් ගමන් කළා.

වසුවෝ වැඩෙ ලෑස්ති වෙලා කමිස අත් නමා ගෙන, වැඩ කබා ඇඟ ලා ගෙන, කියත්, යතු කැට, වඩු උපකරණ සහිත පෙට්ටි අරගෙන පෙළට ගමන් කළා. ඔවුන් දෙපසින් මුර සෙබළු අසුන් පිට නැගලා ගමන් ගත්තා. අසුන්ට ඕන පැන පැන හැල්මේ යන්ට. මුර සෙබළු එයට ඉඩ දුන්නේ නැහැ.

"ඒ මොකද? ඒ මොකද?" පාරේ යන මිනිස්සු කලබල වෙලා ඇසුවා.

රාජකීය ලකුණ ඇති කළු පාට අස්රියෙන් ගමන් කළේ නපුරු පාලකයින් තුන්දෙනාගේ උපදේශකයා. මල් වෙළෙන්දියෝ බය වුණා. කම්මුලට අත තබාගෙන ඔවුහු උපදේශකයාගේ ඔළුව දිහා බැලුවා. අස්රියේ කණ්ණාඩිවලින් ඔහුගේ ඔළු ගෙඩිය පෙනුණා. මහ පාර ගිනි පන්දම් වලින් ආලෝක කර තිබුණා. ඔහුගේ ඔළුවට උඩින් කළු පාට බොරු කොණ්ඩයක්. එය සෙළවුණේ හරියට මළ මිනියක් වගෙයි. අස්රිය ඇතුලේ නපුරු සතකු හිටියා වගෙයි දැනුණේ.

"අයින් වෙයල්ලා!" මුර සෙබළු කෑ ගැසුවා.

"වඩුරාලලා යන්නේ කොහිද?" පුංචි මල් වෙළෙන්දිය නායක මුර සෙබළාගෙන් විමසුවා.

ඒ මිනිහා තිරිසනකු වගේ කෑ ගැසුවා. සුළං පහරකට අසුවුනා වගේ ඇගේ හිස කේ අවුල් වුණා.

"වඩුවෝ පෝරක, එල්ලම් ගස් හදන්නට යනවා. නුඹට තේරුණද? වඩුවෝ පෝරක දහයක් හදවි!"

"අපෝයි!"

මල් වෙළෙන්දියගේ අතේ තිබුණු මල් බඳුන බිම වැටුණා. මල් සේරම බිම විසිරිලා ගියා.



"ඒ ගොල්ල පෝරක හදන්ට යනවා!" බයවුණු දෙස්තර ගස්පාර් කිව්වා.

"ඔව්, පෝරක හදන්ට," මුර සෙබළා උඩු රැවුලට යටින් තිබුණු දත් විරිත්තලා කෑ ගැසුවා. ඒවා හරියට පොල් ඉරි වගෙයි. "පෝරක හදන්ට වඩුවෝ යනවා! කැරලි කාරයින්ගේ බෙලි කපා දමනවා. පාලකයින් තුන් දෙනාට විරුද්ධව කැරලි ගසන හැම දෙනාවම මරා දමනවා." ඔහු ගෙරෙව්වා.

දෙස්තර ගස්පාර්ගේ හිස කැරකැවෙන්ට පටන් ගත්තා. සිහි නැති වෙලා ඔහු දැන් බිම ඇද වැටෙයි කියලා ඔහුට සිතුනා.

"මම අද බොහෝ දේ වලට මූණ පෑවා. ඒ විතරක් නොවෙයි මට බඩගිනියි, හොඳටම මහන්සියි. ඉක්මනට ගෙදර යන්ට ඕන," ගස්පාර් තමාටම කියා ගත්තා.

ඇත්තටම දෙස්තරට බොහොම මහන්සියි. ඔහු විවේක ගන්ට ඕන. ඔහු හැම තැනම දුටු දේ නිසාත්, අහපු දේ නිසාත්, ඔහු බොහොම කලබල වුණා. කුළුණ බෝම්බ පහරකට අහුවෙලා ඔහුත් සමග වීසිවෙලා ගිය හැටි පවා ඔහුට අමතක වුණා. තමාගේ තොප්පිය, වැහි කබාය, හැරමීටිය, සපත්තු අඩි නැතිවුණු එක ගැනවත් දෙස්තර ගස්පාර්ට මතක නැහැ. ලොකුම පාඩුව තමා ඇස් කණ්ණාඩි කුට්ටම නැතිවීම.

ඔහු කුලී අස් රියකට නැගලා ගෙදර ගියා.

3

තරු පහන

දෙස්තර ගස්පාර් අර්නේරි වාඩිවී හිටිය අස් රිය ගමන් කළේ බොහොම හොඳට ආලෝක කළ මගක් දිගේ. ඒ මග දෙපැත්තේ පහන් කණු හිටවා තිබුණා. පහන් වටකුරුයි, සුදුම සුදු පාටයි. ඒවා බොහොම දීප්තිමත්. පහන් වටේට හෝ හපුටුවෝ හඬ නගමින් පියාසර කළා. දෙස්තර ගස්පාර්ගේ අස් රිය ගං ඉවුර අයිනේ පාරක් ඔස්සේ ගමන් කළා. ඒ මග දිගට ගල් වැටකි. ඒ වැටේ කණු උඩ ලෝහ වලින් හදපු සිංහ රූප තිබුණා. උන් කට ඇරගෙන දිව දිගු කරගෙන, පා වලින් පළිහ අල්ලාගෙන හිටියා. පහළ ගඟේ වතුර කළුම කළු පාටයි. ලාටු වගේ දිලිසෙන ජලය ගඟ පහළට ගලන්නට වුණා. ගස්පාර්ගේ අස් රිය ආරුක්කු හැඩයට නැමිලා තිබුණු පාලම් ඔස්සේ ගමන් කළා. ආරුක්කු වගේ නැමී තිබෙන මේ පාලම් දිහා දුර සිට නැතිනම්, එහා ඉවුරේ සිට බලන විට, පෙනෙන්නේ හරියට පණිවිඩ ලෑස්ති වෙලා ඉන්න යෝධ බළලුන් වගෙයි, හැම පාලමක්ම මුර සෙබළු මුර කළා. සෙබළු මුර පොළවල වාඩිවෙලා දුම්කොළ පුරවපු පයිප්ප බී බී, සූදු සෙල්ලම් කළා, ඈනුම් අරිමින් අහසේ තරු දිහා බැලුවා.

දෙස්තර රියෙන් යන ගමන් වට පිට බලනවා, ඇහුම් කන් දෙනවා.

මහ පාර අයිනේ තියෙන ලොකු බංගලා වලින්, හෝටල වලින්, ලොකු ගෙවතු වලින් ගී සින්දු ඇසුණා :

කැරලිකාර ප්‍රොස්පේරෝට
මෙදු පොවේ වැදුන බැවේ
යකඩ පටිය බෙල්ල වටේ
එයා වැටිල, මාර කටේ.

මත්පැන් පොඩ්ඩක් බීපු ජේත්තු කාරයකුත් ඔය සින්දුව කිය කියා ගියා. ජේත්තු කාරයාගේ පොහොසත් නැන්ද කෙනෙක් මේ ළඟදී මළා. ඇයට නැයින් හිටියේ නැති හන්ද ඇගේ බූදලය මේ ජේත්තු කාරයාට ලැබුණා. දැන් ඉතින් මිනිහත් කැමති නැහැ ධනපතියන්ට විරුද්ධව දුප්පත් මහජනයා කැරලි ගහනවාට.

වෙන්ත විදියක සර්කස් නැටුමක් පෙන්වනවා. නාකි වඳුරෝ තුන් දෙනෙක් නපුරු පාලකයින් තුන්දෙනා වගේ වේදිකාවට නැගලා නැටුවා. පොක්ස් ටෙරියර් වර්ගයට අයත් බල්ලෙක් මැන්ඩලීනයක් වාදනය කළා. කවටයා දම් පාට ඇඳුමක් ඇඳලා. ඔහුගේ පිටේ හිරුගේ රත්රන් පාට රූපයකි. බඩේ රත්රන් පාට අඩ සඳකි. කවටයා සිංදුවක් කියනවා:

කති, බොති, නටති අපේ පාලකයෝ නපුරු
නැති, බැරි අපට ගරහති, තුන්දෙන රුදුරු
බේරගන්ට ප්‍රොස්පේරෝ
අවි අරගෙන වරෝ වරෝ.

"බේරගන්ට ප්‍රොස්පේරෝ, අවි අරගෙන වරෝ, වරෝ!" කියලා සර්කස් බලන්නට ආපු මිනිස්සු කිව්වා.

හැම පැත්තෙන්ම මහා විශාල කෑ කෝ ගැසීම් ඇතිවුණා. කුඩුවල හිටිය සත්තු ගොරවනවා, බුරනවා, කෙඳිරි ගානවා, හූ කියනවා, උඩු බුරලනවා.

වඳුරෝ කරළිය උඩ වේගයෙන් පිනුම් ගහනවා. උන්ගේ අත් පා වෙන් කරලා අඳුනා ගැනීමට බැහැ. වඳුරෝ සර්කස් බලන මිනිසුන් අතරට පැනලා කොලොප්පම් කළා. සමහරු කෝපවුණා. වැඩියෙන්ම කෝපවුණේ සල්ලිකාර මහත මිනිසුන්. උන් තොප්පි වලින්, දුර බලන කණ්ණාඩි වලින් කවටයාට පහර දුන්නා. උන් කෝපයෙන් වෙව්ලන්නට පටන් ගත්තා. උන්ගේ මූණු රතු වුණා. තරබාරු නෝනා කෙනෙක් කුඩයක් දිග හරින කොට, එහි නනයක්, ළඟ හිටිය අනිත් නෝනාගේ තොප්පියේ ඇමුණුනා.

"අනේ, අපොයි!" කියලා නෝනා කෑ ගැසුවා. මොකද දන්නවද තොප්පියත් එක්ක එයාගේ බොරු කොණ්ඩය කුඩ නනයට පැටලිලා වීසි වෙච්ච හන්ද.

එක වඳුරෙක් අර මහත නෝනාගේ තට්ටයට පහරක් ගහපි. නෝනා ක්ලාන්ත වෙලා බිම වැටුනා.

"හා, හා, හා" දුප්පත් මිනිස්සු හිනා වුණා. ඒ ගොල්ල එතරම් හොඳට ඇඳලා හිටියේ නැහැ. "යසයි, යසයි!" "ධනපතියන්ට වැදෙයි බැටේ" නපුරු පාලකයින් තුන්දෙනා පරාජය වේවා! ප්‍රොස්පේරෝට ජය වේවා! ටිබුල්ට ජය වේවා! මහජනයාට ජයවේවා!"

මේ වේලාවේදී කිසිවෙක් මහ හඬින් කෑ ගැසුවා.

"ගිනි ඇවිලිලා! නගරයට ගිනි තියලා!"

සර්කස් බලමින් හිටිය මිනිස්සු, පුටු බංකු පෙරළා ගෙන පැන දිව්වා. මුර කාරයෝ වඳුරන්ව අල්ලා ගත්තා.

දෙස්තර ගස්පාර් ගමන් කළ කුලී අස් රිය දක්කන්නා සබුක්කුවෙන් ඈත පෙන්වමින් කතා කළා :

"මුර සෙබළු කම්කරුවන්ගේ ගෙවල් ගිනි තියනවා. උන් ටිබුල්ව හොයනවා."

නගරයට ඉහළින්, කළු පාට කුඩා කම්කරු ගෙවල්වලට ඉහළින් රතු පාට ගිනි ජාලා මතුවුණා.

දෙස්තර ගමන් කළ අස් රිය නගරයේ ප්‍රධාන චතුරශ්‍රය ළඟට ආවා. එහි නම තමා 'තරුව.' චතුරශ්‍රය හරහා යන්ට කොහොමවත් බැහැ. එතැන අස්රිය, අසුන් පිට යන මිනිස්සු, මගියෝ රැස්වෙලා, තෙරපෙනවා.

"මොනවා වෙලාද?" දෙස්තර ඇසුවා.

කිසිවෙක් දෙස්තරට පිළිතුරු දුන්නේ නැහැ. හැම දෙනාම තෙරපී, තෙරපී චතුරශ්‍රය දෙස බලනවා. රියකරුවා පා පුවරුවට නැගලා බෙල්ල දිගු කරගෙන බැලුවා.

ඔය චතුරශ්‍රයට 'තරුව' කියන නම වැටුණේ මේ හේතුව නිසයි: චතුරශ්‍රය වටේටම එක සමාන උසට ගෙවල්, ඒවායේ වහළවල් වීදුරුවලින් හදලා. හරියට සර්කස් මඩුවේ පියස්ස වගේ එය අඩක් වටකුරුයි. පියස්ස මුදුනේ ලෝකයේ ලොකු පහන සවිකර තිබුණා. ඒ පහන බෝලයක් වගේ වටකුරුයි. පහන වටේට යකඩ වළල්ලක්. සවිබල ඇති යකඩ කණු වළල්ලට සවිකරලා. ඒ පහන සෙනසුරු ග්‍රහ තරුවට සමානයි. ඒ පහනේ එළිය වෙනත් පහන් වල එළියට සම කරන්නට බැහැ. ඒ නිසා මිනිස්සු එයට 'තරුව' යන නම තැබුවා.

මේ පහනේ එළිය නිසා චතුරශ්‍රයටත්, අවට ගෙවල් වලටත්. ළඟ ඇති මාර්ගවලටත් ආලෝකයක් උවමනා කළේ නැහැ. ගෙවල්වල විසිත්ත කාමර වලට විතරක් නොවෙයි ගබඩා කාමරවලට පවා වෙන ආලෝකයක් වුවමනා නැහැ. චතුරශ්‍රය හරහා ගිය මිනිස්සු ලාම්පු, ඉටිපන්දම් නැතිව ගමන් කළා.

අස් රියකරුවා, රියවලටත්, අනිත් රියකරුවන්ගේ උස කොප්පි වලටත් ඉහළින් බැලුවා.

"තමුසෙට මොනවද පෙනෙන්නේ?" සිදුවෙන්නේ මොනවාද?" දෙස්තර කලබල වෙලා රියකරුගෙන් ඇහුවා. දෙස්තර මිටි මිනිහෙක් බව ළමයි දන්නවා නොවැ. එයාට ඇස් කණ්ණාඩි නැතිව කොහෙත්ම දුර පෙනෙන්නේ නැහැ.

රියකරුවා තමා දුටු දේ දෙස්තරට කීවා.

ඔහු දැකපු දේ මෙන්න මේවයි:

චතුරශ්‍රයේ මිනිස්සු බොහොම කලබල වෙලා. නොයෙක් පාටැති ඇඳුම් ඇඳගත් මිනිස්සු හැම තැනම දුවනවා. චතුරශ්‍රය නිකම් බඹරයක් වගේ කරකැවෙන හැටියටයි, පෙනෙන්නේ. චතුරශ්‍රය උඩ සිදුවන දේ හොඳට බලාගන්නට මිනිස්සු හැම තැනම දුවනවා.

මහ විශාල පහන හරියට දවාලට පායන ඉර වගෙයි ඒ දිහා බලන්නටවත් බැහැ. මිනිස්සු අතින් ඇස් මුවා කර ගෙන උඩ බලාගෙන ඉන්නවා.

"අර ඉන්නේ ඔහු තමා! ඔහු තමා!" මිනිස්සු කෑ ගහනවා.

"අර බලපල්ලා! අන්න අතන!"

"කොහෙද? කොතැනද?"

"උඩ බලපල්ලා!"

"ටිබුල්, ටිබුල්"

සිය ගණනක් මිනිස්සු අත් දිගු කොට වම් පැත්ත පෙන්නුවා. එතැන තට්ටු හයක ගෙයකි. ඒ ගෙදර හැම ජනේලයක්ම ඇරලා. හැම ජනේලයකින්ම මිනිස්සු එබිකම් කරලා බලනවා. සමහරු රෑට නිදාගන්න කොට ඇඳින ඇඳුම් වලින් සැරසිලා. සමහරු සුදු පාට කොප්පි පැළඳලා. ඔවුන්ගේ ඔළුගෙඩි කිරිමැටි ගුලි වගෙයි. තවත් සමහරු රතු පාට කොප්පි පැළඳලා. ඔවුන්ගේ ඔළු ගඩොල් කැට වගෙයි. ගෑනු කොණ්ඩා ගොතලා. හයවැනි තට්ටුවේ පදිංචි වෙලා හිටියේ දුප්පත් තරුණයෝ - කවියෝ, චිත්‍ර ශිල්පියෝ, නළුවෝ ඒ ගොල්ලා සිගරට් බී බී සිනහ වෙවී බලනවා. නිළියන්ගේ හිසකේ රත්රන් පාටයි. ඔවුන්ට පියාපත් තියනවාවගෙයි පෙනෙන්නේ. ගරාදි සහිත ජනේල ඇති ඒ ගෙය විශාල කුරුළු කූඩුවක් වගෙයි. ජනේලවලින් එළියට එබිකම් කරලා බලන මිනිස්සු නොයෙක් පාටැති කුරුල්ලන්ට සමානයි. තට්ටු හයක් උසැති එම ගොඩනැගිල්ලේ හැම ජනේලයකින්ම මිනිස්සු හිස් එළියට දමාගෙන නොයෙක් අතට හැරි හැරී වහළ උඩ වෙන යම්කිසි දෙයක් බලන්නට වුණා. නමුත් එය කරන්නට බැරි වැඩක්. මූණ බලන කණ්ණාඩියක් නැතුව තමන්ගේ දෙකන් බලන්නට හදනවා වගේ වැඩක්. ජනේල වලින් හිස් එළියට ඔබා ගෙන බලන මිනිසුන් සිදුවන දේ ගැන දැන ගැනීමට චතුරශ්‍රයේ ඉන්න මිනිසුන් දිහා බැලුවා. ඒ මිනිසුන්ට හැම දෙයක්ම පෙනුණා. ඔවුහු අත් වැනුවා. සමහරු සතුටු වුණා. සමහරු කෝප වුණා.

වහළ උඩ කුඩා රූපයක් යන්නා වගේ පෙනුනා. ඒ රූපය බොහොම පරිස්සමින්, සෙමින්, තුන් හුලස් වහළ දිගේ පහළට බැස්සා. යකඩ තහඩු සෙවිලි කළ වහළ හඬ නැගුවා.

වහළ උඩ සිටි මිනිහා තමාගේ සළුව වනා සමබරව සිටියා. සර්කස් එකේ කඹය දිගේ ඇවිදින මිනිහා කහ පාට චීන කුඩය වනලා සමබර ඇතිකර ගන්නා විදිහ මේ නිසා මතක් වෙනවා.

වහළ උඩ හිටියේ කවුද දන්නවද, ඒ තමා ටිබුල්.

මහජනයා කෑ ගැසුවා:

"ටිබුල් වීරයා! ටිබුල් හපනා!"

"වැටෙන්න එපා, සල්පිල දවසෙ කඹය දිගේ ඇවිද්ද හැටි නුඹට මතක නේද."

"මිනිහා වැටෙන්නේ නැහැ. ඔහු තමා මේ රටේ ඉන්න හොඳම සර්කස් කාරයා!"

"මේක පළමුවැනි වතාව නොවෙයි. ඔහු කොතරම් දක්ෂ ලෙස කඹය දිගේ ඇවිදිනවද. අපි එය දැක තිබෙනවා."

"ටිබුල් වීරයා!"

"බේරිලා පලයන්! ප්‍රොස්පේරෝව ගලවා ගනින්!"

පොහොසත් මිනිස්සු දත් මිට කන්ටයි, බණින්ටයි පටන් ගත්තා.

"සර්කස්කාර නීචයා කොහේ දුවන්ටද!"

"තක්කඩියා!"

"කැරලිකාරයා, නුඹට හාවකුට වගේ වෙඩි තියාවි!"

"ප්‍රවේසම් වෙයන්! නුඹව වහළෙන් ඇදලා පෝරකයට ගෙනියනවා. හෙට පෝරක දහයක් හදලා ඉවර කරාවි." එහෙම කීවේ සල්ලි කාරයෙක්.

ටිබුල් වහළ උඩ ගමන් කරනවා. බිම වැටුණොත් ඔහුගේ කැලිවත් හොයන්ට ලැබෙන්නේ නැහැ.

"ටිබුල් ආවේ කොහේ ඉඳලද?" මිනිස්සු විමසුවා. "මිනිහා චතුරශ්‍රයට ආවේ කොහොමද? වහළ උඩට නැංගේ කොහොමද?"

"ඔහු මුර සෙබළුන්ගෙන් බේරිලා පැන ගියා," සමහරු කීවා. "ඔහු පැනලා දිව්වා, අතුරුදහන් වුණා, නගරයේ හැම තැනම ඉන්නවා දැක්කා. ඔහු වහළක් දිගේ ගිහිල්ලා ගෙන් ගෙට පනිමින් දිව්වා. ටිබුල් කොටියකු වගේ කඩිසරයි, සර්කස් වල සරඹ ක්‍රීඩා කරන නිසා මිනිහා දක්ෂයෙක් වෙලා. ඔහුගේ හපන්කම් යැන රට පුරාම ප්‍රසිද්ධ වෙලා තියෙන්නේ නිකමට නොවේ.

චතුරශ්‍රයට මුර සෙබළු ආවා. රස්තියාදු කාරයෝ අවට වීදි ඔස්සේ දුවන්නට වුණා. ටිබුල් පිම්මක් පැනලා ජනේල ලීස්තරයක් උඩ හිට ගත්තා. ඔහු තමාගේ දිග සලුව සහිත අතක් දිගු කළා. නිල් පැහැති සලුව කොඩියක් වගේ ළෙල දුන්නා.

සල්පිලේත් ඉරිදා දවස්වල ඇවිදින විටත්, මිනිස්සු ටිබුල්ව දැකලා තියෙනවා. ඒ වේලාවලදී ඔහු ඇඳලා හිටියේ හැමදාම අඳින කහ සහ කළු පාට කොටු සහිත ඇඳුමයි, නිල් පාට සලුවයි.

දැන් ටිබුල් අඩක් වටකුරු වීදුරු වහළ යට. බිම ඉඳලා බලන විට, පුංචි, සිහින්, බඹරකු සුදුපාට බිත්තිය දිගේ යනවා වගෙයි පෙනෙන්නේ. ඔහු සළුව දිග හරින විට, බඹරා පියාපත් දිග හරිනවාට සමානයි.

"ඒයි තක්කඩියා නුඹ දැන් චතුරශ්‍රයට වැටේවී!" නැන්දගේ බූදලය හිමි වුණු ජේත්තුකාරයා කීවා.

මුර සෙබළු පහසු තැන්වල හිට ගත්තා. උන්ගේ නායකයා හැම තැනම දිව්වා. ඔහු පිස්තෝලයක් අතින් ගත්තා. සෙබළ නායකයාගේ සපත්තු වල අඩු දිගයි.

දැන් හැම තැනම නිහඬයි. දෙස්තර ගස්පාර් දැතින්ම තමාගේ පපුව අල්ලා ගත්තා. ඔහුගේ හදවත උතුරන චතුරට දපු බිත්තරයක් වගේ උඩ පනින්නට පටන් ගත්තා.

ටිබුල් ලීස්තරය උඩ මොහොතකට නැවතුණා. ඔහුට චතුරශ්‍රයේ එහා පැත්තට යාමට වුවමනායි. එහා පැත්තේ සිට ඔහුට කම්කරු ගෙවල් තියන දිහාවට දුවන්නට පිළිවනි.

සෙබළ නායකයා චතුරශ්‍රය මැද තිබුණු මල් පාත්තියකට නැංගා. එහි කහ පාට නිල් පාට මල් පිපිලා. මෙතැන ජල තටාකයක් සහ උල්පතක් තිබුණා. එය තනි කළු ගල් වලින් හදලා.

"නුඹලා මෙතැන නැවතියල්ලා!" නායකයා සෙබළුන්ට අණ කළා. "මම ඔහුට වෙඩි තියනවා. මම තමයි සේනාවේ ඉතාම හොඳ වෙඩි තබන්නා. වෙඩි තියන හැටි මගෙන් ඉගෙන ගනිල්ලා."

චතුරශ්‍රය වටේට ඇති ගෙවල් නවයෙන් චතුරශ්‍රය මැදට දිග යකඩ රිටි නවයක් සවිකර තිබුණා. ඒවා නැව්වල මහත කඹ වලට සමානයි.

චතුරශ්‍රය මැද තිබෙන පහනෙන්, නැතිනම් තරුවෙන් කළු පාට රැස විහිදෙනවා වගේ මේ යකඩ රිටි නවය විහිදී තිබුණා.

ඒ මොහොතේදී ටිබුල් කල්පනා කළේ මොනවාදැයි කාට කියන්ට පුළුවන්ද? ඔහු මෙහෙම තීරණය කළා වෙන්න ඕනෑ: "මම සර්කස් වලදී කඹය දිගේ ගමන් කරන්නා වගේ, මේ රිට දිගට ගමන් කරනවා. බිම වැටෙන්නේ නැහැ. එක යකඩ රිටක් මෙතන ඉඳලා පහනට සවි කරලා, අනික් රිට පහනේ සිට එහා පැත්තේ ගෙයකට සවි කරනවා. මම මේ රිටි දෙක දිගේ ගිහිල්ලා එහා පැත්තේ තියෙන ගෙට පැනලා බේරෙන්නම්."

සෙබළ නායකයා ටිබුල්ට වෙඩි තියන්ට කුරුමානම් ඇල්ලුවා. ටිබුල් යකඩ රිට පටන් ගන්න තැනට ගියා. ඔහු තරු පහන දක්වා වැටී තියන යකඩ රිට දිගේ දුවන්නට පටන් ගත්තා.

පහළ රැස්වෙලා හිටි පිරිස මවිත වෙලා බලාගෙන ඉන්නවා.

ටිබුල් එක වරක සෙමින් යනවා. හිටිය ගමන් රිට දිගේ වේගයෙන් දුවනවා. ඔහු ඉක්මනින් අඩියෙන් අඩිය තියලා වේගයෙන් යන්නට

ජටන් ගත්තා. දැත් වනලා සමබර ඇතිකර ගත්තා. පහන් එළිය නිසා ඔහුගේ සෙවනැල්ල බිත්තියට වැටුණා. ඔහු පහන ළඟට ළං වෙන කොට, බිත්තියේ ඇති ඔහුගේ සෙවනැල්ල දිගු වෙනවා. ඒ වගේම ටිබුල්ගේ සෙවනැල්ල විසිරිලා ගිහින් කළු පාටින් අඳුවුණා.

රිට උඩ ඉඳලා බීම වැටුණොත් කැලිවත් හොයාගන්ට බැහැ. එතරම් එය උසයි.

ටිබුල් රිට දිගේ තරු පහන දක්වා අඩක් දුර යන විට, නිහඬ බිඳගෙන කෙනෙක් කතා කළා. ඒ තමා සෙබළ නායකයා.

"දැන් මම වෙඩි තියනවා. ටිබුල් ජල තටාකයට වැටේවී. එකයි, දෙකයි. තුනයි!"

වෙඩි පහරක් ඇහුණා.

ටිබුල් දිගටම රිට දිගේ ගමන් කරනවා. නමුත් සෙබළ නායකයා මැරී වැටුණා. ජල තටාකයට.

එක මුර සෙබළෙක් නායකයට වෙඩි තියලා. ඔහුගේ අතේ තිබුණු පිස්තෝලයෙන් දුම් පිටවුණා.

"බල්ලා, නුඹ ජනතාවගේ මිතුරාව මරා දැමීමට ලැහැස්ති වුණා. මම නුඹව ඉවර කළා. මහජනයට ජයවේවා!"

"මහජනයට ජයවේවා!" අනිත් මුර සෙබළුත් ජය හඬ නැගුවා.

"පාලකයො තුන්දෙනාට ජයවේවා!" එතැන රැස්වෙලා හිටිය පොහොසත් මිනිස්සු කෑ ගැහුවා.

පොහොසත් මිනිස්සු කීපදෙනෙක් රිට දිගේ ගමන් කරන ටිබුල්ට වෙඩි තිබ්බා.

ඒ වේලාවේ ටිබුල් තරු පහනට අඩි දෙකක් විතර ඇතින් හිටියේ. තමාගේ සළුව වනලා ටිබුල් පහනේ ආලෝකයෙන් ඇස් මුවා කරගත්තා. වෙඩි පහරවල් ළඟින් ගියා මිස ටිබුල්ට වැදුනේ නැහැ. මිනිස්සු සතුටින් කෑ ගැසුවා.

පටාස්! පටාස්!

"වැදුනේ නැහැ!"

"හරියට හරි! ආයෙමත් බේරුණා!"

තරු පහන වටේ ඇති යකඩ කවයට ටිබුල් ආවා.

"කමක් නැහැ! අනිත් පැත්තට යාවි. එතකොට අපි ඔහුව අල්ලා ගන්නවා," සමහර මුර සෙබළු කීවා.

මේ වේලාවේදී කිසිවෙක් බලාපොරොත්තු නොවූ දෙයක් සිදුවුණා. ටිබුල් තරු පහන වටේ ඇති කවය ළඟ වාඩිවෙලා යතුරක් කැරකැව්වා. එවිට එකවරම පහන නිවුණා.

කාටවත් වචනයක්වත් කතා කරන්නට ඉඩක් ලැබුණේ නැහැ. හිටි හැටියේම ඇහැට ඇන්නත් පෙනෙන්නේ නැති තරම් කළුවරක් ඇතිවුණා.

ඊළඟ විනාඩියේදී බොහොම උස තැනක ටිබුල් ගමන් කරන හැටි ඇසුණා. අඳුරු වීදුරු වහළේ හතරැස් කොටුවක් යන්තමින් පෙනුණා. ඒ කොටුවෙන් අහසත් තරු දෙකකුත් පිරිස දැක්කා. ටිබුල් ඒ කොටු හරහා යන හැටි පෙනුණේ ඔහුගේ සෙවනැල්ල අනුවයි. ඔහු ඉක්මණට වීදුරු වහළ හරහා දුව ගියා.

සර්කස්කාර ටිබුල් තරු චතුරශ්‍රයේ තියෙන පුංචි ජනේලයකින් පිටවුණා.

වෙඩි තැබීම හා හිටි හැටියේම ඇතිවූ අඳුර නිසා අශ්වයෝ බයවුණා.

දෙස්තර ගස්පාර් වාඩිවී හිටිය අස් රිය පෙරළුනේ නැතුවා විතරයි. අස් රියකරුවා රිය හරවාගෙන වංගු පාරක් ඔස්සේ දෙස්තරගේ ගෙදරට ඔහුව ගෙන ගියා.

ඔන්න ඉතින් ඔය විදියට අපූරු රෑයකුයි, අපූරු දවසකුයි ගතකළ දෙස්තර ගස්පාර් අර්නේරි අවසානයේදී ගෙදර ආවා. ඔහුගේ ගෙදර වැඩ කටයුතු සොයා බලන හනිමේද් නැන්දා ඔහු පිළිගන්නට මිදුලට ආවා. ඈ බොහොම කලබල වෙලයි හිටියේ. උදේ ගෙදරින් පිටවුණු දෙස්තර රෑ වෙලත් ගෙදර නාපු හන්දා ඈ දැත් වනලා, හිස වනලා කතා කළා:

"ඔබේ ඇස් කණ්ණාඩි කුට්ටම කොහෙද? කැඩුණද? අනේ දෙස්තර, දෙස්තර! ඔබගේ වැහි කබාය කොහිද? ඒකත් නැති කර ගත්තද? අනේ. අනේ!

"අනේ නැන්දේ ඒ විතරක් නොවෙයි, මම සපත්තු අඩි දෙකත් කඩා ගත්තා."

"අනේ අවාසනාවක හැටි!"

"එයිට වඩා ලොකු විපතක් අද සිදුවුණා. හනිමේද් නැන්දේ අවි හදන ප්‍රොස්පේරෝව් හිර බාරයට අරගෙන, ඔහුව යකඩ කූඳුවක් ඇතුළට දාලා."

දවල් තිස්සේ වෙච්ච දේ හනිමේද් නැන්දා දැනගෙන හිටියේ නැහැ. හැබැයි ඇයට වෙඩි හඬ ඇසුණු එක නම් ඇත්ත තමා. කැරලි කරුවන් මරා දමන්නට වඩුවෝ පෝරක හදන බව ඈට අල්ලපු ගෙදර නෝනා කීවා.

"මම බොහොම බයවුණා. දෙර ජනේල වහලා ගෙදරට වෙලා ඉන්න තීරණය කළා. මම ඔබ එන තුරු බලාගෙන හිටියා. දවල් කෑම පිළියල කළා. ඒක නිවිලා. හීතල වුණා. ඊට පස්සේ රෑ කෑම පිළියල කළා. ඒකත් හීතල වෙලා. ඔබ ආවේ නැති නිසා මම බොහොම කලබල වුණා," හනිමේද් නැන්දා පැහැදිලි කළා.

ඔයින් මෙයින් රෑයත් ගෙවුණා. දෙස්තර නිදගැනීමට ලැහැස්ති වුණා.

දෙස්තර දන්නේ වෙදකම් විතරක් නොවෙයි, තවත් විද්‍යා, ශාස්ත්‍ර සියයක් විතර දන්නවා. ඒවා ඉගෙන ගන්නවා. ඒවායින් එකක් තමා

ඉතිහාසය. ඔහු හම් කවරයක් සහිත විශාල පොතක ඉතිහාසය ගැන සටහන් ලියනවා. නොයෙක් සිද්ධීන් ගැන තමාගේ අදහස්, මත ආදිය ලියා තැබීම ඔහුගේ සිරිතක්.

"නිසි ලෙස වැඩ කරන්නට ඕන," දෙස්තර අතක් ඔසවා තමාටම කියා ගත්තා.

මහන්සිය නොබලා ඔහු හම් කවරය සහිත විශාල පොත අරගෙන, මේසයට වාඩි වෙලා ලියන්නට පටන් ගත්තා.

"හස්ත කර්මාන්තකාරයෝ, පාල්වල වැඩ කරන අය, නාවිකයෝ නගරයේ ජීවත්වන දුප්පත් වැඩ කරන ජනතාව නපුරු පාලකයින් තුන්දෙනාගේ පාලනයට විරුද්ධව කැරලි ගැසුවා. මේ සටනේදී මුර සෙබළුන්ට ජය ලැබිලා. දුප්පත් මිනිසුන්ගේ නායක ප්‍රොස්පේරෝව හිර බාරයට අරගෙන. අනික් නායකයා ටිබුල් පැනලා ගියා. චතුරශ්‍රයේ තරු පහන අසලදී තමන්ගේ සෙබළ නායකයාට මුර සෙබළෙක් වෙඩි තැබුවා. වැඩිකල් නොගොස්ම සෙබළු ජනතාවට විරුද්ධව යුද්ධ කිරීම නවත්වනවා ඇති. නපුරු පාලකයන් තුන්දෙනා ආරක්ෂා කිරීමට සෙබළු බැහැයි කියාවි. ටිබුල්ගේ ජීවිතය ආරක්ෂා කිරීමට යමක් කළ යුතුයි."

මේ වේලාවේදී දෙස්තරට පිටුපසින් කවුදෝ සද්ද කරන්නට වුණා. ඔහු හැරී බැලුවා. සීත කාලෙට ගිනි තපින ලිප ඇතුලෙන් තමා ඒ ශබ්දය ආවේ. ඒ ලිප ඇතුලේ ඉඳලා නිල්පාට සළුවක් ඇඳගත් උස මිනිහෙක් එළියට ආවා. ඒ තමා ටිබුල්.

දෙවැනි
කොටස

ඔවුන්න හිමි
වුරිරිගේ බෝන්කාකා

4

බැලුන් වෙළෙන්ද අහසේ පාවෙයි

ඒ ඊළඟ දවසේදී නගරයේ නඩු අසන කොටුවේ ඉක්මණින් පෝරක හදන්න පටන් ගත්තා. වඩුවෝ බොහොම මහන්සි වෙලා පෝරක දහයක් හැදුවා. නමුත් ඒ ගොල්ල වැඩ කළේ ආශාවකින් නොවේ.

"කම්මල් කාරයින්ව, පතල් කාරයින්ව මරා දමන්න අපි කැමති නැහැ," වඩුවෝ කීවා.

"ඒ ගොල්ල අපේ සගයෝ."

"ඒ ගොල්ල මරණයට පවා බය නැතිව සටන් කළේ අපේ දුප්පත් අය බේරා ගන්ටයි!"

"කට වහපියව්!" අළුගෝසුවන්ගේ ලොක්කා කෑ ගැසුවා. ඒ මිනිහා කොතරම් හයියෙන් කෑ ගැහුවාද, පෝරක හදන්නට ගෙනත් තිබුණු ලී ගොඩ පවා වීසි වුණා. "කට වහපියව්, නැතිනම් තොපට කස පහර දීමට මම අණ කරනවා."

උදේ ඉඳලම මිනිස්සු නඩු අහන කෙටුවට එන්නට පටන් ගත්තා.

මේ වේලාවේදී මහ කුණාටුවක් හමන්නට වුණා. දුවිලි අහසේ පාවුණා. තොප්පි, වට්ටි, පෙට්ටි විසිවෙලා ගියා. සමහරුන්ගේ තොප්පි අස්ව කරත්තවල රෝදවලට යට වුණා.

එන්න එන්නම කුණාටුව සැර වුණා. ළමයින්ට බැලුන් බෝල විකුණන එක වෙළෙන්දෙක් බැලුන් බෝල ගොඩකට හුළං පුරවලා ඒවා අතින් අල්ලාගෙන හිටියා. කුණාටුව හන්ද මේ වෙළෙන්ද බැලුන් බෝලත් එක්ක උඩ යන්නට පටන් ගත්තා.

"හරිම ලස්සනයි! අර බලපල්ලා!" ළමයි බොහොම සතුටු වෙලා අහසේ පාවෙන බැලුන් බෝල වෙළෙන්දව පෙන්නුවා.

ළමයි අත්පුඩි ගැහුවා. මොකද දන්නවද, හිටි හැටියේ මිනිහෙක් ඉගිලෙන හැටි බලන්ට හැම දෙනාම කැමතියි. ඒ විතරක් නොවෙයි.

බැලූන් වෙළෙන්දු හරිම තණ්හා කාරයෙක්. ඔහු ළඟ රතු පාට, නිල් පාට, කහ පාට ලස්සන, ලස්සන බැලූන් ගොඩක් තිබුණා. ඉතින් ළමයි බැලූන් බෝල වෙළෙන්දට ඉරිසියා කළා. ඉරිසියා කිරීම හොඳ ගතියක් නොවෙයි. මොනවා කරන්නද! බැලූන් බෝල හරිම ලස්සනයි නොව. හැම ළමයකුටම බොහොම ආසයි බැලූන් බෝලයක් ලබාගන්ට. වෙළෙන්දු ළඟ බැලූන් බෝල ගොඩක්. හාස්කම් සිදුවෙන්නේ නැහැ! ඉතාම කීකරු කොල්ලාටවත්, ඉතාම හොඳ කෙල්ලටවත් බැලූන් බෝල වෙළෙන්දු කිසිම දවසක නිකම් බැලූන් බෝලයක් තෑගි දීලා නැහැ. ඒ වුණාට ඔහු ළඟ රතු පාට නිල් පාට, කහ පාට ලස්සන, ලස්සන බැලූන් බෝල ගොඩක් තිබුණා.

දැන් ඉතින් කෑදරයට යස දඬුවමක් ලැබිලා. හුළං පුරවමු බැලූන් ගොඩක් එකට බැඳලා තිබුණු කඹයක් අල්ලාගෙන වෙළෙන්දු අහසේ පාවෙනවා. නිල්වන් අහසේ පාට පාට ලස්සන බැලුම් බෝලත් අරගෙන වෙළෙන්දු ඉගිලෙන හැටි බලන්නත් පුදුමයි.

"මාව බේරා ගනිල්ලා!" බැලූන් වෙළෙන්දු කෑ ගහනවා. ඔහු කකුල් වනනවා. බයේ වෙව්ලනවා.

ඔහු ගේ කකුල්වල පිදුරු වලින් හදපු ලොකු සපත්තු දෙකකි. සපත්තු, කකුල්වලට බොහොම ලොකු හන්දා ඔහු ගමන් කළේ කකුල් අද්දවමින්, ගාථමින්, හරියට කම්මැලියකු වගේ.

දැන් ඔහුට මහ පොළොවේ යන විදියට ගාථන්නට බැහැ.

"මොන යකාට කියන්නද!"

පඹයකුගේ වගේ දෙපා වැනෙනවා.

"මොන යකාට කියන්නද!"

බැලූන් බෝල හුළං පහරට ඒ අත, මේ අත වැනෙන්වා.

කොහොම වුණත් එක පිදුරු සපත්තුවක් කකුලෙන් ගැලවිලා වීසි වුණා.

"අන්න බලපල්ලා කුල්ලක් බිම වැටෙනවා!" බැලූන් වෙළෙන්දු ඉගිලෙන හැටි බල බලා දුවන ළමයි කෑ ගැහුවා.

හැබෑටම පිදුරු සපත්තුව කුල්ලක් තරම් ලොකුයි.

මේ වේලාවේදී නැටුම් උගන්වන ගුරුවරයෙක් මහපාරේ ගමන් කළා. ඔහු බොහොම කඩවසම් කෙනෙක්. ඔහු උසයි, ඔහුගේ හිස පුංචියි, වටකුරුයි. හීන් කකුල් දිගයි. ඔහු දිහා බැලුවම වීණාවක් නැතිනම්

පළඟැටියකු මතක් වෙනවා. ඔහුගේ කන ගී සිංදු අහන්ටයි, බට නළාවේ දුක්මුසු සංගීත අහන්ටයි. නැට්ටුක්කාරයින්ගේ වචන අහන්ටයි පුරුදුවෙලා. ළමයිනගේ කෑ කෝ ගැසීම් ඇසීමට ඔහුට බැහැ.

"ළමයිනේ කෑ ගහන්නට එපා!" ගුරුවරයා කෝප වුණා. "ඔහොමත් බෙරිහන් දෙන්න පුළුවන්ද! තමන්ගේ සතුට ලස්සන වචන වලින් කියන්නට ඕන. සින්දුවක් වගේ ඇදලා, පැදලා, මෙන්න මෙහෙම..."

ඔහුට ඕන වචන සොයා ගැනීමට බැරිවුණා. ඒ වුණත් ඔහු හැම නැටුම් ගුරුවරයෙකු මෙන්ම නටන්නට ඉස්සෙල්ලා පාඳ තබන විදියට දෙපා තබලා බිම බැලුවා. ඔහු පාඳ දිහා බැලුවා මිසක්, උඩ ඉගිලෙන වෙළෙන්දු දිහා බැලුවේ නැහැ.

බිමට පාත්වුණු පිදුරු සපත්තුව නැටුම් ගුරුගේ ඔළුවට වැටුනා. ඔහුගේ හිස පුංචියි, වටකුරුයි කියලා ඉස්සෙල්ලා කිව්වා නෙව. වෙළෙන්දගේ පිදුරු සපත්තුව නැටුම් ගුරුට කදිම තොප්පියක් වුණා. කඩවසම් නැටුම් ගුරා කෝප වෙලා ගොනෙකු වගේ තප්පුලන්ට පටන් ගත්තා.

පිදුරු සපත්තුව නිසා ඔහුගේ මුහුණයි ඇසුයි, කටයි වැහිලා.

ළමයි බඩවල් අල්ලාගෙන හිනා වුණා:

"හා-හා-හා! හා-හා-හා!"

අපි සේරම උඩ බැලුවා,
නැටුම් ගුරා බිම බැලුවා,
සපත්තුවක් බිම වැටිලා,
ගුරුට තොප්පිය වැටිලා,
ගුරා දුවයි හැටට හැටේ
තප්පුලනව ගොනකු වගේ.

ගෙයක වැටක් උඩට නැග ගත්තු කොල්ලෝ ඔය විදියට කිය කියා සතුටු වුණා.

"අනේ, අනේ මට වුණු දේ! මට හරිම දුකයි. බාල් නැටුම් වලට නෝනා කෙනකු අඳින සපත්තුවක් නම්, කමක් නැහැ කියලා සැනසෙන්ටවත් තිබුණා. මගෙ ඔළුවට වැටුණෙ ගඳ ගහන පිදුරු සපත්තුවක් නොවැ!"

ඔයින් මෙයින් නැටුම් ගුරුව හිර බාරයට ගත්තා.

"උන්නැහැ තමුසෙ දිහා බලන්නටවත් බැහැ. තොප්පියක් ඔළුවේ

දැගෙන බෙරිහන් දෙනවා. ඒක සාමය කඩ කිරීමක්. හැබෑටම මේ වගේ වේලාවක ඔය විදියට හැසිරීම බරපතළ වරදක්." ඔහුව හිර බාරයට ගත් පොලිස් ලොක්කා කිව්වා.

නැටුම් ගුරා දැත් බැඳගෙන මෙහෙම පිළිතුරු දුන්නා:

"මොන බොරුද!" ඔහු සුසුම් ලෑවා. "කොතරම් ලොකු අපහාසයක්ද. මම වොල්ස් නැටුම් නටන්ටයි, සිනා පාන්ටයි විතරයි පුරුදු වෙලා තියෙන්නේ. මම හරියට වීණාවක් වගෙයි. එහෙවූ මම කොහොමද සාමය කඩ කරන්නේ..."

නැටුම් ගුරාට මොනවා වුණාද කියලා දැනගන්ට බැරිවුණා. ඒ ගැන දැන ගැනීමට එතරම් ආශාවකුත් නැහැ. එයට වැඩිය හොඳයි අහසේ පාවෙන බැලුන් වෙළෙන්දට මොනවද වුණේ කියලා දැනගැනීම.

බැලුන් වෙළෙන්ද පුළුන් රොදක් වගේ අහසේ පාවෙන්නට වුණා.

"මේක හරිම පවක්. මට ඉගිලෙන්ට උවමනා නැහැ. මට ඉගිලෙන්ට බැහැ," ඔහු කිව්වා.

බැලූන් බෝල පොදියයි, වෙළෙන්දයි කුණාටුවට අහුවෙලා තවත් ඉහළ ගියා. ඔහොම ගිහිල්ලා, ඔහු නපුරු පාලකයෝ ඉන්න මාලිගාව ළඟට ආවා.

අහසේ පාවෙන බැලුම් වෙළෙන්දට ඉඳ හිටලා බිම බැලුණා. එවිට ඔහුට වහළවල උළු කැට පෙනුණා. ඒවා හරියට සතුන්ගේ නියපොතු වගෙයි. ගෙවල් පුංචියට පෙනුණා. ගලා බසින ගඟ නිල් පාටයි. මිනිසුන් හරියට කුරුමිණියන් වගෙයි. ගෙවතු කොළ පාටයි. පහළ තියෙන නගරය පින්තූරයකට සමානයි.

තත්ත්වය නරක අතට හැරුණා.

"තව ටිකයි, මාව නපුරු පාලකයින්ගේ මාලිගා වත්තට වැටේවි," වෙළෙන්දා බයවුණා.

විනාඩියකින් සුළං පහර අඩු වෙන්නට පටන් ගත්තා. බැලූන් වෙළෙන්දා ටිකෙන් ටික බිමට පාත්වුණා. ඔහු දැන් මාලිගා වත්තට උඩින් පාවෙන්නට වුණා.

"දැන් මම බිමට පාත් වුණොත්, මාව අල්ලාගෙන, මගේ ඇට කටු පුපුරණ තුරු මට පහර දේවි. පස්සේ හිරගෙට දාවී. අන්තිමේදී හිස ගසා දමාවි," වෙළෙන්දා කල්පනා කළා.

බැලූන් වෙළෙන්දට කියිවෙක් දුටුවේ නැහැ. එක ගහක වහලා හිටිය කාක්කෝ, කුරුල්ලෝ විතරක් හැම අතටම පියාසර කළා. පාට පාට බැලූන් බෝල හන්දා අහසේ වළාකුලක් පා වෙනවා වගේ දැනුණා. ලස්සන පාට සහිත වලාකුළ මල් පාත්තිවලට ඉහළින් පාවෙනවා. තාරාවකු පිට නැගී හිටින කොල්ලකුගේ කිරි ගරුඬ රූපයට උඩින්, නිදහිටි මුර සෙබළකුගේ හිටස උඩින් පාවෙනවා. මුර සෙබළාගේ මුහුණ බැලූන් වල හෙවනැලි නිසා වෙනස් වුණා. එක වරක් ඔහුගේ නහය නිල් පාට වුණා. හරියට මැරිච්ච මිනිහකුගේ වගේ. ඔන්න ඊට පස්සේ විජ්ජා කාරයකුගේ වගේ ඔහුගේ නහය කොළ පාට වුණා. ඊටත් පස්සෙ බේබද්දකුගේ වගේ නහය රතු වුණා. හරියට මැජික් කණ්ණාඩියක් වගේ පාට වෙනස් වුණා.

දැන් ඉතින් බොහොම ලොකු විපතකට මූණ පාන්න ළං වෙලා. බැලූන් වෙළෙන්දා නපුරු පාලකයන් ඉන්න මාලිගාවේ ජනේල ළඟටම

පාවෙලා ආවා. ලියුමක් ගෙනෙන පණිවුඩ කරුවකු වගේ ඔහු ඇරපු ජනේලයකින් මාලිගාව ඇතුලට යාවි කියලා වෙළෙන්දට සිතුණා.

ඔහු හිතපු විදියටම සිදුවුණා.

වෙළෙන්ද බැලුන් ගොඩත් සමග මාලිගාවේ කුස්සිය පැත්තේ ජනේලයකින් ඇතුළු වුණා. කුස්සියේ කේක් වර්ග හදන කාමරයට තමයි. ඔහු පාවෙලා ආවේ.

ඊයේ ඇතිවූ කැරළි විනාශ කිරීමේ ප්‍රීතිය නිසා නපුරු පාලකයින්ගේ අණ පිට බොහොම ජයට කෑමක් පිළියෙල කළා. කෑම කාලා නඩු අහන කොටුවට යාමට නපුරු පාලකයොත්, ඇමතිවරුත්, සිටු වරුත්, රදළයොත්, මුදලාලිලාත් ලැහැස්ති වුණා.

කේක් සහ රස කෑම හදන කාමරයට යාමට ඉඩ ලැබීම වාසනාවක්. නපුරු පාලකයෝ තුන්දෙනා කෑම ජාති ගැන, රස කැවිලි ගැන බොහොම හොඳට දන්නවා. නිතරම කන බොන හන්ද උන් අලි වගෙ මහතයි. ඒ විතරක් නොවෙයි එදා උදේ බොහොම ජයට කෑම ලැස්ති කළා. මාලිගාවෙ කෝකි අප්පුලයි; කේක්, ලොසින්ජර, රස කෑම හදන බක්කරේලයි බොහොම මහන්සි වෙලා කෑම ජාති හැදුවා.

කේක් හදන කාමරයට පාවෙලා ආපු බැලුන් වෙළෙන්ද එක අතකින් බයවුණා, අනිත් අතින් සතුටු වුණා. බැරිවෙලා කේක් ගෙඩියක් ජනේලය ළඟ තිබ්බම, මී මැස්සකු වහලා රෑං රෑං ගාලා බයවෙනවා වගේ තමයි බැලුන් වෙළෙන්දත් බය වුණේ.

විනාඩියකින් ඔහු බැලුන් බෝල ගොඩත් එක්ක කේක් හදන කාමරයට පාවෙලා ආවා. ඔහු මුලදීම කල්පනා කළේ ලස්සන, ලස්සන වටිනා කුරුල්ලෝ ඉන්න වත්තකට ආවා කියලයි. විනාඩියකට පසුව ඔහුට හිතුනේ ඔහු පලතුරු කඩයකට ගොඩ වුණා කියලයි. ඒ කඩේ නොයෙකුත් ජාති වලට අයත් පලතුරු තියෙනවා. මේ පලතුරු, යුෂ වල පාවෙනවා වගේ ඔහුට දැනුණා. පලතුරුවල පුසුඹ හන්ද ඔහුට ලොකු සතුටක් දැනුණා. ඔහුගේ උගුර හිර වුණා. ඔහුට හුස්ම ගැනීම අමාරු වුණා.

මෙතැන හැම දෙයක්ම කවලම් වෙලා. කුරුල්ලොයි, පලතුරු එකට මුසු වෙලා.

එක තැනකදී වෙළෙන්දට ඉබේම ඉන්ද වුණා. එතැන මුදුයි, උණුසුමකුත් දැනුණා. හැබැයි ඔහු බැලුන් බෝල අත හැරියේ නැහැ. ඒවා ඔහුගේ හිසට උඩින් තිබුණා.

ඔහු ඇස් දෙක වහගෙන, "ඉතින් කවදාවත් ඇස් ඇරලා බලන්නේ නැහැ," කියලා හිතා ගත්තා.

"දැන් මට සියල්ලම තේරෙනවා. මෙය පලතුරු කඩයක්වත්, කුරුළු කූඩයක් වත් නොවෙයි. මේ කේක් හදන කාමරය. මම දැන් වාඩිවෙලා ඉන්නේ ලොකු කේක් ගෙඩියක් උඩ," බැලුන් වෙළෙන්ද ඇස් වහගෙන කල්පනා කළා.

ඇත්තටම ඔහු කේක් ගෙඩියක් උඩ තමා වාඩිවෙලා හිටියේ.

ඔහු වාඩිවෙලා හිටියේ චොකලට්, දෙඩම්, අන්නාසි, දෙළුම්, ඇපල්, මුද්දරප්පලම්, ජෑම්, බටර්, සීනි, කෝලිකුට්ටු, කිස්මීස්, කජු ආදිය යොදා හදපු ගෙයක් තරම් ලොකු විසාල කේක් ගෙඩියක් උඩ.

ඒ වුණත් බැලුන් වෙළෙන්ද ඇස් ඇරියේ නැහැ. දැන් දැන් ඔහු මහ අමාරුවක වැටෙයි කියලා කල්පනා කළා. ඔහු ඒ වගේ දෙයකට මුහුණ දීමට ලෑස්ති වුණා. නමුත් ඔහු හීනෙකින්වත් හිතාපු දෙයක් නොවෙයි, සිදුවුණේ.

"කේක් ගෙඩිය විනාසයි," රසකෑම හදන දෙවෙනි බක්කරේ කණගාටුවෙන් කීවා.

දැන් හැම තැනම නිහඬයි. චොකලට් බුබුළු පුපුරණ හඬ විතරක් ඇසුණා.

"මොනවා වෙයිද?" කේක් ගෙඩිය උඩ වාඩිවෙලා ඇස් වහගෙන ඉන්න බැලුන් වෙළෙන්ද හෙමින් තොල මැතිරුවා. ඔහු බොහොම

බය වෙලා තවත් තදින් දෑස් වසා ගත්තා.

ඔහුගේ හදවත රබර් බෝලයක් වගේ උඩ පැන්නා.

"මොන බොරුද!" මහ බක්කරේ කේක් ගෙඩිය දිහා බලලා සැරෙන් කිව්වා. මාලිගාවේ කෑමට වාඩිවෙලා හිටිය ලොකු ලොක්කෝ සුප් බීලා, මාස්, මාළු කකා වයින් බීබී හිටියා. තව විනාඩි විස්සකින් ඔවුන්ට කේක් අල්ලන්ට ඕන. ලස්සන බැලුන් බෝල ගොඩයි ඒවා අල්ලා ගෙන කේක් ගෙඩිය උඩ වාඩිවී ඉන්න වෙළෙන්දගේ මෝඩ පෙණුමයි නිසා කේක් ගෙඩිය තවත් ලස්සන කරන්ට පුළුවනියි මහ බක්කරේ කල්පනා කළා.

මහ බක්කරේ මහ හඬින් කෑ ගැසුවා: "ක්‍රීම් ගෙනෙල්ලා!"

ක්‍රීම් හදලා තියෙන්නේ අමු බීත්තරයි, බටරුයි. සීනියි එකතු කරලා. ක්‍රීම් ගෙනාවා.

ඊට පස්සේ මොකද වුණේ!

බක්කරේලා තුන්දෙනෙකුයි, බක්කර වැඩ ඉගෙන ගන්නා කොල්ලො විසිදෙනෙකුයි, බැලුන් වෙළෙන්දගේ ඇඟට ක්‍රීම් ගාන්නට පටන් ගත්තා. නපුරු පාලකයින් තුන්දෙනාගේ මහ එකා වුණත් බක්කරේලාට ස්තුති කරන්න අදිමදි කරන්නේ නැහැ. එතරම් හොඳට ඔවුනු වැඩ කළා.

විනාඩියකදී වෙළෙන්දගේ ඇඟ පුරාම ක්‍රීම් ගෑවා ඔහු ඇස් වහගත්ත ගමන්ම ඉන්නවා. ඔහුට මේවා කිසිවක් පේන්නේ නැහැ. බලන්න එටින වැඩේ. ඇඟ පුරාම කිරිමැටි ගෑවා වගේ ක්‍රීම් ගාලා. ඔහුගේ ඔළුව තේ පොච්චියක් වගෙ පුංචියි, රවුම්. ඔහුගේ මූණ වැහෙන්න මාජරින්

වලින් වැඩ දැම්මා. නහය විතරක් එළියට පැනලා. අත්, පා බඩ, පපුව, බෙල්ල, පිට සේරම රෝස පාට ක්‍රීම් වලින් වැහිලා. දැන් ඔහු දිහා බලන මිනිහකුට ඔහු ඕනෑම විදියකට පෙනේවි. හැබැයි බැලුන් වෙළෙන්දෙ කියලා නම් කාටවත් කියන්ට බැහැ.

කවියකුට නම් ඔහු හරියට හංස විලේ ඉන්න නාකි හංසයකු වගෙයි; මල් වත්තක වැඩ කරන කෙනෙක් නම්, ඔහුව කිරිගරුඬ රූපයක් හැටියට හිතාවි. කොල්ලන්ට නම් ඔහු හිම කාලෙට හදන හිම ආච්චිට සමානයි.

බැලුන් බෝල ගොඩ බැඳලා තියෙන කඹය ඔහු දැතින්ම අල්ලාගෙන හිටියා. බැලුම් බෝලයි, ක්‍රීම් වලින් වැහිච්ච අවතාරයයි දිහා, බැලුවම හැබෑ අපූරු ජවනිකාවක්.

"ඔන්න ඔහොම," මහ බක්කරේ කීවේ සිත්තමක් අඳින සිත්තරකු වගේ, තමාගේ සිත්තම නිසා ඔහු සතුටු වුණා වගේ.

හිටිහැටියේම මහ බක්කරේ බෙරිහන් දී කෑ ගැහැව්වා:

"කජු ගෙනෙල්ලා!"

කීවා විතරයි, කජු පුරවපු වට්ටි, පෙට්ටි හැම තැනින්ම ගෙනාවා. ලොකු කජු, රටකජු, ආදී නොයෙක් වර්ගවලට අයත් කජු ගෙනාවා.

පුංචි බක්කරේලා හැම පැත්තකින්ම ක්‍රීම් ගොඩක එරිලා හිටිය බැලුන් වෙළෙන්දගේ ඇඟට කජු ඔබන්නට පටන් ගත්තා. මහ බක්කරේ එකයි, දෙකයි, තුනයි කියලා ගනින්ටත් ඉස්සෙල්ලා කජු වලින් කේක් ගෙඩියට වැඩ දලා ඉවරයි.

"ලෑස්තියි! දැන් ඉතින් ටිකක් රතු පැහැ ගන්ට මහ ලිපට දලා පුච්චන්න ඕන," මහ බක්කරේ කේක් ගෙඩියේ හැඩ බලලා කියාපි.

"මහ ලිපටද!" වෙළෙන්දෙ බයවුණා. "මොකටද? මොන ලිපටද? මාව ලිපට දන්ට යනවද? අයියෝ!"

හොඳ වෙලාවට මාලිගාවේ වේටරයෝ කේක් හදන කාමරයට දුවගෙන ඇවිල්ල කෑ ගැහුවා:

"කේක් ගෙඩිය! ඉක්මනට කේක් ගෙඩිය. කේක් ගෙඩිය ඉල්ලනවා."

"ලෑස්තියි, ගෙනියපල්ලා!" බහ බක්කරේ කීවා.

"දෙවියන්ගේ පිහිටයි!" බැලුන් වෙළෙන්දෙ සැනසුණා. දැන් ඔහු පොඩ්ඩක් ඇස් ඇරලා බැලුවා.

වේටරලා හය දෙනෙක් අත් කරත්තයක් වගේ ලොකු බත්දේසියක කේක් ගෙඩිය තියලා ගෙනයනවා. කේක් කාමරයෙන් පිටවෙන කොට, බක්කරේලා හිනාවෙන හැටි වෙළෙන්දට ඇහුණා.

පළල් පඩිපෙළ දිගේ බැලුන් වෙළෙන්ද වාඩිවෙලා හිටිය කේක් ගෙඩිය උඩ තට්ටුවට ගෙනිච්චා. කෑම කන සාලාවේ දෙර ඇරිය හැටියේම වෙළෙන්ද ඇස් වසා ගත්තා. මස්, මාළු කකා වයින් බීබී හිටිය උන් මහ හයියෙන් කෑ ගැසුවා, හිනාවුණා, විහිළු තහළු කළා, අත්පුඩි ගැසුවා. උන්ගේ හැසිරීම දිහා බලන විට, ජයට කන බොන හැටි පෙනෙන්නට තිබුණා.

බැලුන් වෙළෙන්දත් සමග කේක් ගෙඩිය මේසය උඩ තැබුවා.

ඔන්න එතකොට වෙළෙන්ද ඇස් ඇරලා බැලුවා.

ඔහු නපුරු පාලකයින්ව දැක්කා. නපුරු පාලකයෝ උෆරු තඩියන්ටත් වැඩිය මහතයි, වෙළෙන්ද උන්ව දැකපු හැටියෙ, ඔහුගේ කට ඉබේටම ඇරුණා.

"වහාම කට වහ ගන්ට ඕන. පණ තියෙන බවක් නම් පෙන්වන්න හොඳ නැහැ," ඔහු තමාටම කියා ගත්තා.

නමුත් එකවරම කට වැහුනේ නැහැ. විනාඩි දෙකක් විතර ඔහු කට ඇරගෙන බලාගෙන උන්නා. ටිකෙන් ටික ඔහු අලුත් තත්ත්වයට පුරුදු වුණා. ඉතින් ඊට පසුට තමා ඔහුට අමාරුවෙන් කට වහගන්නට පුළුවන් වුණේ. ඒ ගමන් ඔහුගේ ඇස් මහත් කරගෙන බලන්නට වුණා. ඔහු ටික වේලාවක් කට ඇරගෙන බලනවා. ඊට පසුව ටික වේලාවක් ඇස් ඇරගෙන බලනවා. අන්තිමේදී ඔහු පුදුමයට පත්වීම මෙල්ල කර ගත්තා.

නපුරු පාලකයෝ තුන්දෙනා උස ආසන වල වාඩිවෙලා හිටියා. අනිත් අය පහළ ආසන වල වාඩිවෙලා.

නපුරෝ තුන්දෙනා අනිත් අයට වැඩියෙන් කෑවා, බීවා. නපුරු පාලකයන් තුන්දෙනාගෙන් එකෙක් කෑම වලට ඔතන කඩදාසියක් ගෙන කන්ඩ පටන් ගත්තා.

"ඔබ කඩදාසියක් කනවා..."

"හැබෑටම ඔව්. පොඩි වැරදීමක්."

ඔහු කඩදාසි කෑල්ල ඉතුරු කරලා, ළඟ වාඩිවෙලා හිටිය අනිත් පාලක නපුරාගේ කනක් හැපුවා. එය හැඩ හුරු කමින් කොකිසකට සමානයි.

හැම දෙනාම බක බක ගාලා හිනා වුණා.

"හොඳයි, විහිළු කිරීම නවත්වමු!" දෙවැනි පාලක නපුරා කීවා." ලැහැස්ති වෙයල්ලා, ඔන්න කේක් ගෙඩිය ගෙනාවා."

"කේක් ගෙඩියට ජයවේවා!"

හැම දෙනාම බොහොම සතුටු වුණා.

"දැන් ඉතින් මොනවා වේවිද? මොනවා වේද? උන් මාව කා දමාවි!" බැලූන් වෙළෙන්ද කේක් ගෙඩිය උඩ වාඩිවෙලා කල්පනා කළා.

එතකොටම ඔර්ලෝසුවේ කණිසම දෙවරක් හඬ නැගුවා.

"තව පැයකින් නඩු අහන කොටුවට යන්න ඕන. බෙලි කපා දැමීමට පටන් ගනීවි," පළමුවැනි පාලක නපුරා කිව්වා.

"ඉස්සෙල්ලාම මරා දමන්නේ ප්‍රොස්පේරෝව නේද?" මස් කටුවක් ලෙව කකා හිටිය රදළයෙක් ඇසුවා.

"ඔහුව අද මරා දමන්නේ නැහැ," මහලේකම් පිළිතුරු දුන්නා.

"ඒ මොකද? ඒ මොකද? මක් නිසාද?"

"අපි දැනට ඔහුව මරන්නේ නැහැ. කැරැල්ලේ අනික් නායකයින් ගැන තොරතුරු ඔහුගෙන් දැන ගැනීමට අපි උත්සාහ කරනවා."

"ඔහු දැන් කොහෙද?"

කෑමට වාඩිවෙලා හිටිය රදළ, ධනපති, ඉඩම්හිමි, සල්ලිකාර පිරිසට කේක් ගෙඩිය ගැන අමතක වුණා. ඔවුහු ප්‍රොස්පේරෝ ගැන තොරතුරු විමසුවා.

"අපි ඔහුව යකඩ කූඩුවක දාලා තියෙනවා. යකඩ කූඩුව තියෙන්නේ ඔටුන්න හිමි කුමාරයා වන ටුට්ටිගේ සත්තු වත්තේ."

"ඔහුව මෙහාට ගේන්න..."

"ඔහු මෙතැනට ගේන්න," පිරිස කෑ ගැසුවා.

"ඇත්ත තමා. අපේ අමුත්තෝ ඒ සතාව බලාපුවාවෙ. මම යේජනා කරනවා, අපේ අමුත්තන්ට සත්තු වත්තට යන්ටයි කියලා. නමුත් සත්තු කෑ ගහනවා, හඬ තියනවා. උන්ගෙ ගඳ උහුලන්ට බැහැ. ඌව මෙහාට ගෙනෙල්ලා. අපට විස්කි බීබී ඌ දිහා බලන්ට පුළුවනි..." මහ පාලක නපුරා කීවා.

"සත්තකින්ම, සත්තකින්ම! සත්තු වත්තට යන්ට ඕන නැහැ..."

"ප්‍රොස්පේරෝව මෙහාට ගෙනෙන්න!" අමුත්තෝ ඉල්ලා හිටියා. "අපි කේක් කකා වයින් බීබී ඔහු දිහා බලමු."

"ඔන්න උන් ආපහු කේක් ඉල්ලනවා. උන්ගේ බඩවල් පැලෙන්නේ නැති එක තමා පුදුමේ!" මෙහෙම කල්පනා කළේ කේක් ගෙඩිය උඩ වාඩිවෙලා ඉන්න බැලුන් වෙළෙන්දා.

"ප්‍රොස්පේරෝව මෙහාට ගෙනෙල්ලා!" මහ පාලක නපුරා අණ කළා.

මහා ලේකම් පිටවෙලා ගියා. මාලිගා කොරිඩෝරයේ හිටිය සේවකයෝ හිස නමලා ආචාර කළා.

කෑදරයෝ අයෙමත් කන්නට පටන් ගත්තා.

"ඔහු බොහොම භයානකයි. ඔහුට සිංහයකුටත් වඩා හයිය තියෙනවා. ඔහුගේ ඇස් දෙක ගිනි බෝල වගෙ. ඔහු දිහා බලන්ටවත් බැහැ." එහෙම කීවේ දෙවැනි නපුරු පාලකයා.

"ඔහුගේ ඔළුව භයානකයි. හරි විශාලයි. ඔහුගේ ඔළුව සිංහයකුගෙ වගෙ. හිසකෙස් රතු පාටයි. හිස ගිනිගත්තා වගේ ඔහු දිහා බැලුවම පෙනෙන්නේ," ඇමති වරයෙක් කට දම්මා.

ප්‍රොස්පේරෝගේ හැටි කියන්ට පටන් ගත්තම කෑදරයො කෑම බීම නැවැත්තුවා. උන් උන්ගේ බඩවල් අතගාන්ට පටන් ගත්තා. උන් සුදුමැලි වුණා. කෑ ගැසීම්, විහිළු කිරීම් නැවැත්තුවා. ප්‍රොස්පේරෝව බැලීමට ඉල්ලා හිටීම නිසා බොහෝ දෙනෙක් අමනාපයට පත්වුණා.

කන්දක් තරම් උස, මස්, බිත්තර, බටර් කේපු කාලා මහත්වෙලා හිටිය නපුරු පාලකයෝ තුන් දෙනා එක පාරටම කෙට්ටු වුණා වගෙ පෙනුණා.

හැම දෙනාම නිහඬ වුණා. නපුරු පාලකයෝ තුන්දෙනා එකාගේ පස්සෙ, එකා හැංගිලා බේරෙන්ට හදනවා.

කෑම කන ශාලාවට ප්‍රොස්පේරෝව ගෙනාවා. ඔහු වටේට මුර සෙබළු, කඩු දික්කරගෙන හිටියා. ප්‍රොස්පේරෝගේ අත්වලට මාංචු දැලා. ඔහුව මේසය ළඟට ගෙනගියා. ඔහු නපුරු පාලකයන් තුන් දෙනාට අඩි කීපයක් දුරින් හිටියා.

ප්‍රොස්පේරෝ හිස පහතට හරවාගෙනයි හිටගෙන උන්නේ. ඔහුගේ මුහුණ සුදු මැලියි. ටිකවේලාවක් යනකොට ඔහුගේ මුහුණ රතු පාට වුණා. ඔහු කෝපවන හැටි කෑදරයන්ට පෙනුණා.

"ඔහුව මෙතනට මොකටද ගෙනාවේ. මම ඔහුට බයයි!" එහෙම කිව්වේ රටේ පිටිමෝල් අයිති කාරයා.

පිටිමෝල් අයිතිකාරයා බයවුණු හන්දා ඔහුගේ සිහිය නැතිවෙලා, ඔහු සරුවක් කල්දේරමට වැටුණා. සමහරුන්ට කේක් කෑමත් එපාවෙලා එළියට දිව්වා.

"තොපට මගෙන් මොනවද ඕන?" ප්‍රොස්පේරෝ මහ හඬින් ඇසුවා.

මහ පාලක නපුරා බය මැඩගෙන කතා කළා: "නුඹ දිහා බලන්ට අපි කැමතියි. නුඹ කා අතේද ඉන්නේ කියලා බලන්ට නුඹ කැමති නැද්ද?"

"නුඹලා දකින කොට මගේ ඇඟේ ලේ නටනවා," ප්‍රොස්පේරෝ බෙරිහන් දුන්නා.

"අපි නුඹගේ බෙල්ල කපා දමනවා. එතකොට නුඹේ ඇඟේ ලේ නැටීම නවතීවි."

"මම තොපට බය නැහැ. මගේ එක හිසක් නැති වුණාට මහජනයාගේ හිස් ලක්ෂ ගණනක්. මහජනයාව නැති කරන්ට තොපට බැහැ."

"අද නඩු අහන කොටුවේදී, නුඹේ සගයින්ව අපි මරා දමනවා."

කෑදරයින්ගෙ බය ටිකක් අඩුවුණා. පිටිමොල්කාරයාට සිහිය ආවා. ඔහු සරුවත් වලින් මූණ හෝද ගත්තා.

"නීචයිනි, තොපේ බඩවල් පුපුරන කලියෙන් කනවා. බොනවා හැර තොපට වෙන කිසි දෙයක් පේන්නේ නැහැ..." ප්‍රොස්පේරෝ කිව්වා.

ඒ කතාව හන්දා දෙවැනි පාලක නපුරා අමනාප වුණා:

"අපි දකින්ට ඕන මොනවාද?"

"අහපල්ලා නුඹලාගේ ඇමතිවරුන්ගෙන්. ඔවුන් නුඹලාට කියාවී රටේ ජනතාව විඳින දුක."

මහලේකම් "හ්ම්" ගාලා උගුර පෑදුවා. ඇමතිවරු ගොළු වෙලා පිඟන් වලට තට්ටු කළා.

"ඇමතිවරුන්ගෙන් අහපල්ලා. රටේ හැටි ඔවුන් නුඹලාට කියාවි."

නිහඬතාවයක් ඇතිවුණා. හැම දෙනාම ප්‍රවේසම් වුණා.

"මේ රටේ ගොවියෝ බොහොම දුක් විඳලා ගොවිතැන් කරනවා. නුඹලා ඔවුන්ගේ අස්වැන්න බලෙන් උදුරා ගන්නවා. ගොවීන්ට එදාවේල කන්න නැහැ. දැන් ගොවියෝ රදළ ඉඩම් හිමියන්ට විරුද්ධව නැගිටලා සටන් කරනවා. රදළ වලව්වලට ගිනි තියනවා. ගල් අඟුරු ආකරවල වැඩ කරන කම්කරුවෝ වැඩ නවත්වලා. නුඹලාව තවත් පොහොසත් කරවන්ට ඔවුන් කැමති නැහැ. නැවියෝ නුඹලාගේ බඩු

මුහුදට දමනවා. යුද සෙබළු නුඹලා යටතේ සේවය කරන්ට ලැහැස්ති නැහැ. මේ රටේ විද්‍යාඥයෝ, බුද්ධිමත් අය, නඩුකාරවරු, නළුවෝ මහජනයාගේ පැත්ත ගනීවි. නුඹලා ජනතාව සූරගෙන කෑවා. නුඹලා කෝටි පතීන් වුණා.ජනතාව හිඟන්නන් වුණා. දැන් ජනතාවට කෑමක් නැහැ. ගෙවල් නැහැ. ඇඳුම් නැහැ. ලෙඩට-දුකට බෙහෙත් නැහැ. මෙයිට වැඩිය ජනතාව ඉවසන්නේ නැහැ. තොපගේ මොළවල ගොම. හදවත් කළුගල්. තොපගේ දුෂ්ට පාලනය පෙරලා දමන්න ජනතාව නැගිටලා," ප්‍රොස්පේරෝ වේගයෙන් කතා කළා.

"මට හිතෙන්නේ ඔහු ඕනවට වැඩිය කතා කරනවයි කියලා," මහඇමති කට දම්මා.

ප්‍රොස්පේරෝ දිගටම කතා කළා:

"අවුරුදු පහළොවක් තිස්සේ තොපට වෛර කරන්ට, තොපේ ආණ්ඩුව පෙරලා දමන්ට මම මහජනයාට ඉගැන්නුවා! දැන් ඉතින් තොපේ අවසාන මොහොත ළං වෙලා."

"ඇති, ඇති," තුන්වැනි පාලක නපුරා කීවා.

"ඔහුව ආපහු යකඩ කූඩුවට දමාපල්ලා!" දෙවැනි පාලක නපුරා කිව්වා.

"අපි සර්කස්කාර ටිබුල්ව අල්ලාගන්නා තුරු නුඹට යකඩ කූඩුවේ ලගින්ට සිදුවේවි. අපි නුඹලා දෙදෙනාවම එකට මරා දමනවා. නුඹලගෙ මළ මිනී මිනිසුන්ට පෙන්නුවාම, උන් බය වේවී. සටන් කිරීම නවත්වාවී," මහපාලක නපුරා කිව්වා.

ප්‍රොස්පේරෝ නිහඬව නොසැලී සිටියා.

"නුඹ කා සමඟද යුද්ධ කරන්නේ කියන එක නුඹට අමතක වෙලා. පාලකයෝ තුන්දෙනා වන අපි තමා මහ බලසම්පන්න අය. මම පළමුවැනි පාලකයා, මේ රටේ තියන සියලු ඉඩම් මටයි අයිති.

තිරිඟු, වී, සහල්. බාර්ලිවලින් ලැබෙන ආදායම මගේ, දෙවැනි පාලකයාට ගල් අඟුරු, ආකර සියල්ලම අයිතියි. තුන්වැනියාට රටේ යකඩ කර්මාන්තය අයිතියි. මේ රටේ බලය අප අතේ. අපි හැම දෙනාටම වඩා පොහොසත්. මේ රටේ ලොකුම සල්ලිකාරයා අපට වැඩි සිය ගුණයක් දුප්පත්. අප ළඟ තියෙන රත්තරන් වලින් ඕනෑම දෙයක් මිලදී ගන්ට පුළුවනි," මහ පාලක නපුරා පුරසාරම් දෙඩුවා.

ඔන්න ඒ පාර කෑදරයින්ගේ හිත්වල තිබුණු බය ටිකක් අඩු වුණා. මහ නපුරාගේ කතාව නිසා ඔවුන්ට දහිරිය ලැබුණා.

"මූව කුඩුවට දාපල්ලා! කුඩුවට දාපල්ලා!" කෑදර රදළ, ධනපති ඉඩම් හිමියෝ කෑ ගැහුවා.

"සත්තු වත්තට ගෙනියව්!"

"කුඩුවට දාමාපියව්!"

"කැරලි කාරයා!"

"යකඩ කුඩුවට!"

මුර සෙබළු ප්‍රොස්පේරෝව ගෙන ගියා.

"දැන් ඉතින් කේක් කමු," මහ නපුරා යෝජනා කළා.

"මම ඉවරයි!" බැලුන් වෙළෙන්ද සිතුවා.

හැමදෙනාම කේක් ගෙඩිය දිහා බැලුවා. වෙළෙන්ද ඇස් වහ ගත්තා. කෑදරයෝ සතුටු වුණා.

"හා-හා-හා!"

"හා-හා-හා! හරිම පුදුම කේක් ගෙඩියක්. බැලුන් දිහා බලාපල්ලා!" කෑදරයෝ ප්‍රීති වුණා.

"අර මූණ දිහා බලාපල්ලා!"

"යස මූණත්තහඬුව."

කෑදරයෝ කේක් ගෙඩිය වටේට හිට ගත්තා.

"කේක් ගෙඩිය උඩ ඉන්දවලා තියෙන පඹයාගේ කුහරය ඇතුලේ මොනවද තියෙන්නේ?" එක කෑදරයෙක් කේක් ගෙඩිය ළඟට ඇවිත්,

පඹයකු කියලා හිතාගෙන බැලුන් වෙළෙන්දගේ නළලට පහරක් ගැසුවා.

"කුහරය ඇතුළේ චොකලට්."

"නැතිනම් ෂැම්පේන්..."

"ඉස්සෙල්ලාම පඹයාගේ ඔළුව කපා වෙන් කරලා කුහරය ඇතුලේ මොනවද තියෙන්නේ කියලා බලමු."

"අයියෝ"

වෙළෙන්දට ඉවසාගෙන ඉන්ට බැරිවුණා. ඔහු "අයියෝ!" කියලා කිව්වේ ඒ තරම් පැහැදිලිව නොවෙයි.

ඒ වේලාවේදී පඩි පෙළේ හිටිය ළමයෙක් බොහොම හයියෙන් කෑ ගහපු හින්ද හැම දෙනාම හැරිලා බැලුවා.

"බෝනික්කා! මගේ බෝනික්කා!"

හැම දෙනාම ඒ හඬට සවන් දුන්නා. වැඩියෙන්ම කලබල වුණේ නපුරු පාලකයෝ තුන්දෙනයි, මහ ඇමතියයි.

කෑ ගැසූ ළමයා අඬන්න පටන් ගත්තා. ළමයා ඇඳුවේ බොහොම කනගාටු වූ නිසයි.

"ඒ මොකද? අඬන්නේ ඔටුන්න හිමි කුමාරයා ටුට්ටි නේද?" මහ නපුරු පාලකයා ඇසුවා.

"ඔව්, ඔව්. අඬන්නේ ඔටුන්න හිමි ටුට්ටි තමා," කියලා දෙවැනි පාලක නපුරයි, තුන්වෙනි පාලක නපුරයි එකවරම කිව්වා.

නපුරු පාලකයෝ තුන්දෙනාම බය වුණා. උන්ගේ මුහුණු සුදුමැලි වුණා.

මහා ඇමතියයි තවත් ඇමතිවරු කීපදෙනෙකුයි, සේවකයොයි පඩිපෙළ ළඟට දුවලා ගියා.

"මොනවා වෙලාද? මොනවා වෙලාද? කේක් කන්ට ලෑස්ති වුණු කෑදරයෝ කුසු කුසු ගෑවා.

ටුට්ටි කෑම කන ශාලාවට දුවගෙන ආවා. ඔහු ඇමතිවරුන්වයි, සේවකයින්වයි තල්ලු කළා. ඔහු නපුරු පාලකයින් තුන්දෙනා ළඟට දුවගෙන ආවා. හිස වනලා, සපත්තු අඩි පොළොවේ හප්පලා මරහඬ දීලා කෑ ගැසුවා. ඔහු කී දේ කාටවත් තේරුම් ගන්ට බැරි වුණා.

"මේ කොල්ලාට නම් මාව පෙනේවි. සැකයක් නැහැ. මගේ නහයයි, කටයි ක්‍රීම් වලින් වැහිලා හින්ද මට හුස්ම ගන්නවත් බැහැ. මාව දැකපු හැටියෙම කොල්ලා සතුටු වේවි. ඔහුගේ හැඬීම නවත්වන්ට ඔහුට මගේ විලුඹෙන් කැල්ලකුත් එක්ක, කේක් කෑල්ලක් කපලා දේවි." එහෙම කල්පනා කළේ කේක් ගෙඩිය උඩ වාඩිවෙලා ඉන්න බැලුන් වෙළෙන්ද.

ඒ කොල්ලා එසේ මෙසේ කොල්ලෙක් නොවෙයි, ඔටුන්න හිමි කුමාරයා. ඔහු කේක් ගෙඩිය දිහා බැලුවේවත් නැහැ. වෙළෙන්දගේ ඔළුවට උඩින් තියෙන ලස්සන බැලුන් බෝල දිහාවත් ඔහු බැලුවේ නැහැ.

ටුට්ටි අඬන්නට වුණා.

"අඬන්නේ මොකද?" මහ පාලක නපුරා ඇහුවා.

"ඔටුන්න හිමි ටුට්ටි කුමාරයා අඬන්නේ ඇයි?" දෙවැනි පාලක නපුරා ඇහුවා.

තුන්වෙනි පාලක නපුරා දුක් වුණා.

ඔටුන්න හිමි ටුට්ටිට වයස අවුරුදු දෙළහයි. ඔහු හැදෙන්නේ නපුරු පාලකයින්ගේ මාලිගාවේ. ඔහු කුමරෙක් වගේ හැදී වැඩුණා. පාලකයින් තුන්දෙනාට ළමයින් නැහැ. ටුට්ටි ඔවුන්ගේ බූදලය හා පාලන බලය

හිමි කාරයා හැරියට ඔවුහු නියම කළා. ඔවුන්ගේ මරණින් පසු රටේ පාලකයා වෙන්නේ ටුට්ටි.

ටුට්ටි අඬන විට, පාලක නපුරෝ තුන්දෙනා බොහොම බය වුණා. ප්‍රොස්පේරෝට කතා කරන විට බයවුණාටත් වැඩියෙන් බය වුණා.

ටුට්ටි මිට මොළවනවා, දත්මිටි කනවා, සපත්තු පොළවේ ගහනවා, අඬනවා, කෑ ගහනවා. ඔහු යක් පැටියකු වගේ කෝපයට පත්වෙලා.

හේතුව මොකක්ද කියලා කවුරුවත් දැනගෙන හිටියේ නැහැ.

ටුට්ටිට උගන්වන ගුරුවරු බොහොම බයවෙලා, මාලිගාවේ කණුවලට මුවා වෙලා හැංගිලා හිටියා. මේ ගුරුවරු කළු පාට ලෝගු දැගෙන, කළු පාට තොප්පි පැළඳගෙන කාක්කෝ වගේ කළු පාටයි.

අඬලා, කෑ ගහලා ටුට්ටි කිව්වා එයාට වෙච්ච හානිය ගැන.

"මගේ බෝනික්කා, මගේ අපූරු බෝනික්කා කැඩුවා! මගේ බෝනික්කාව කඩලා දැම්මා! මුර සෙබළු මගේ බෝනික්කාට කඩු වලින් ඇන්නා!"

ටුට්ටි කඳුළු පිහදැල සුසුම් ලෑවා.

"මොනවා?" මහ පාලක නපුරා කෑ ගැහැව්වා.

"මොනවා ?"

"මුර සෙබළුද?"

"කඩු වලින් ඇන්නද?"

"ඔටුන්න හිමි ටුට්ටිගේ බෝනික්කාව කඩලා?"

කෑදරයෝ බොහොම හෙමින් බයෙන් කතා කළා.

"වෙන්න බැරි දෙයක්!"

මහඇමතියා ඔළුව බදාගෙන කල්පනා කරනවා. පිටිමෝල් අයිතිකාර මහ මෝලාට සිහිය නැතුව ගියා. නපුරු මහ පාලකයා කෑ ගැහැව්වා විතරයි ඔහුට ආයෙමත් සිහිය ලැබුණා.

"උත්සවය නවත්වාපල්ලා! වැඩ කල් දමාපල්ලා! ඇමති මණ්ඩලය රැස් කරව්! නිලධාරීන්ට, නඩුකාරයින්ට, අළුගෝසුවන්ට එන්ට කියාපිය! කැරළිකරුවන් මැරීම කල් දමව්! මාලිගාව ඇතුලේ පාවාදීමක්!" නපුරු පාලකයින් තිදෙනාගෙන් මහ එකා කෑ ගැසුවා.

හැම තැනම මහා කලබලයකි. විනාඩියකින් මාලිගාවේ ඉඳලා අස්රිය හැම තැනම යැව්වා. විනාඩි පහක් ගතවුණා විතරයි හැම පැත්තෙන්ම නඩුකාරවරු, උපදේශක වරු, අළුගෝසුවෝ මාලිගාවට ආවා. කැරළිකරුවන් මරා දමන හැටි බලන්ට ආපු පිරිසට විසිරිලා යන්ට කියලා මාලිගාවේ අණ බෙර කාරයා දැනුම් දුන්නා. වැදගත් හේතු නිසා කැරළිකරුවන් මරා දැමීම හෙට වනතුරු කල්දමා තිබෙන බව ඔහු කිව්වා.

කේක් ගෙඩියයි, එක උඩ වෑඩිවෙලා ක්‍රීම ගොඩකට යටවෙලා හිටිය බැලුම් වෙළෙන්දෑයි කෑම කාමරයෙන් එළියට ගෙන ගියා. බීලා වෙරිවෙලා හිටිය කෑදරයින්ට හොඳ සිහිය ලැබුණා.

හැම දෙනාම ඔටුන්න හිමි ටුට්ටිගේ කතාව ඇහුවා.

"මම පිට්ටනියේ වාඩිවෙලා හිටියා. මා ළඟ මගේ බෝනික්කා හිබුණා. අපි සූර්ය ග්‍රහණය සෙල්ලම් කළා. ඒක බොහොම අපූරු සෙල්ලමක්. මම ඊයේ සූර්ය ග්‍රහණය ගැන පොතක කියෙව්වා. සූර්ය ග්‍රහණය ඇති වුණාම දවල් කාලෙට තරු පේනවා..."

මෙතැනදී ටුට්ටිට ඇඬුණා. ඔහුට කතා කරන්ට බැරුව ගියා. ටුට්ටි වෙනුවට ඔහුගේ ගුරුවරයා කතා කළා. මිනිහත් බොහොම බයෙන්, බයෙන්. වෙව්ල, වෙව්ලා අමාරුවෙන් කතා කරන්නට පටන් ගත්තා.

"මම ඔටුන්න හිමි ටුට්ටි සහ එතුමගේ බෝනික්කා ළඟ තණ පිට්ටනියේ බිම දිගා වෙලා හිරු රැස්වලට මගේ මුහුණ අල්ලාගෙන හිටියා. මගේ නහයේ කුරුලෑ ගෙඩියක්. ඉරු රැස් වැටුණාම කුරුලෑව සනීපවෙයි කියලා මම හිතුවා. ඕන්න හිටි හැටියේම සෙබළු කීප

දෙනෙක් ආවා. දෙළොස් දෙනෙක් විතර. ඒ ගොල්ල බොහොම කේන්තියෙන් කතා කළා. අප ළඟට ඇවිල්ලා උන් නැවතුනා. උන්ගේ මුහුණු දිහා බලන්නත් බයයි. එක සෙබළෙක් ටුට්ටි කුමාරයාව ඇඟිල්ලෙන් පෙන්වලා මෙහෙම කිව්වා: "මේ ඉන්නෙ කොටි පැටියා. මූට තාත්තලා තුන් දෙනෙක් ඉන්නවා. උන් තමයි ඌරු තඩියෝ." මට තේරුණා ඒ ගොල්ල කා ගැනද කිව්වේ කියලා."

"කව්ද ඒ ඌරු තඩියෝ?" පාලක මහ නපුරු ඇහුවා.

එතකෙට අනිත් පාලක නපුරන් දෙදෙනාගේ මුහුණු ජම්බු වගේ රතු වුණා. ඔන්න ඒ පාර තමා මහා පාලක නපුරාගෙත් මුණ රතු වුණේ. තුන් දෙනාම එකවර සුසුම් ලෑවා. මාලිගාවේ ජනේල ඇරුණා, වැහුණා.

ටුට්ටිගේ ගුරුවරයා දිගටම කතා කළා: "ඒ ගොල්ල ටුට්ටිට බැන්නා: "නපුරු වල් ඌරු තඩියෝ තුන් දෙනෙක් එක නපුරු කොටි පැටියකුව ඇති කරනවා. ඒයි, ටුට්ටි නුඹේ හදවත තියෙන්නේ කොයි පැත්තෙද?" කියලා ඔවුන් ටුට්ටිගෙන් ඇහැව්වා. "මේ කොටි පැටියගේ හදවත ඉවතට අරන්. ඌ දැන් නියම, නපුරු දුෂ්ටයකු වගේ හැදෙනවා. ඔහු ජනතාවට වෛර කරනවා. ඒ විදියට තමයි ඌට උගන්වන්නේ... අර ඌරු තඩියෝ තුන්දෙනා මක බෑ වෙලා ගියාම, මේ නපුරු කොටියා රජවේවි."

"ඔය වගේ භයානක කතා නුඹට නවත්වන්න බැරිවුනාද?" මහ ඇමතියා ගුරුවරයාගේ උරහිසින් අල්ලලා, හොළවලා ඇහුවා.

අසරණ ගුරුවරයා බොහොම බයවෙලා ගොත ගහන්ට පටන් ගත්තා.

"මම දන්නවා උන්ගේ කතා භයානක බව. නමුත් මම බොහොම බයවෙලා හිටියා. ඒ ගොල්ල බොහොම කේන්තියෙන් උන්නා. මට අවි ආවුද කිසිවක් තිබුණේ නැහැ නොවැ. නහය උඩ කුරුලෑ ගෙඩිය විතරයි මට තිබුණේ. උන් ළඟ කඩු, තුවක්කු, බයිනේත්තු තිබුණා. "ඔන්න බලපල්ලා!" කියලා එක සෙබළෙක් කිව්වා. "මෙන්න පඹයෙක්, මෙන්න බෝනික්කෙක්. පඹයා බෝනික්කත් එක්ක සෙල්ලම් කරනවා. මේ කොල්ලට පණ ඇති ළමයින්ව පෙනෙන්නේ නැහැ. ඔහුට බෝනික්කෙක් දීලා." එතකොට තවත් සෙබළෙක් බොහොම කේන්තියෙන් කතා කරලා මෙහෙම කිව්වා: "මගේ බිරිඳවයි, ළමයිවයි

මම ගමේ නවත්වලා ආවා. මගේ පුතා කැටපෝල් එකකින් ගලක් විද්ද. ඔය ගල ඉඩම් අයිතිකාරයාගේ වත්තේ ඇපල් ගහක ගෙඩියක වැදුනා.පොහොසතුන්ට කළ අවමානයට මගේ පුතාට කස පහර දීමට ඉඩම් හිමියා අණ කළා. මගේ බිරිඳට නින්ද කරලා ඇයව දවසක් තිස්සේම කණුවක බැඳ තැබුවා." සෙබළ කෑ ගහලා ටුට්ටි ළඟට ආවා. පුතා ගැන කතාව කී සෙබලා කඩුවක් ගෙන බෝනික්කාට ඇන්නා. අනිත් අයත් ඒ වගේම ඇන්නා..."

බෝනික්කා ගැන කියන විටම ටුට්ටි ආයෙමත් අඬන්න පටන් ගත්තා.

"කොටි පැටියා ඔන්න නුඹට! උෆරු තඩියන්ටත් ඉක්මනින්ම දෙනව බැටේ කියලා ඒ ගොල්ල කීවා."

"ඒ දෝහියෝ කොහි ගියාද?" නපුරු පාලකයෝ කෑ ගහලා ඇහුවා.

"උන් බෝනික්කාව වීසි කරලා මාලිගාවත්තේ ඈතට දිව්වා. උන් කෑ ගහලා මෙහෙම කිව්වා: "ප්‍රොස්පේරෝට ජයවේවා! ටිබුල්ට ජය වේවා! නපුරු පාලකයින් තුන්දෙනාව විනාශ කරව්!"

"මුර කාරයෝ උන්ට වෙඩි තිබ්බේ නැත්තේ මොකද?" මැති ඇමතිවරු ඇහුවා.

ඔන්න එතකොට තමා ගුරුවරයා මහ භයානක කතාවක් කිව්වේ.

"මුර කාරයෝ උන්ට අත වැනුවා. තොප්පි ගලවලා වනලා හිනා වුණා. මුරකාරයෝ සෙබළුන් ළඟට ගිහිල්ලා සමුගන්න හැටි මම දුටුවා. ඒ ගොල්ල මෙහෙම: යාළුවනි, මහජනයා ළඟට ගිහිල්ලා කියන්න ඉක්මනින්ම යුද්ධ හමුදාව මහජනයගෙ පැත්ත ගන්නවා කියල..."

මාලිගාවත්තේ වුණු දේ එහෙමයි.

පාලකයෝ බයවුණා. මාලිගාවේ හැම තැනම තමාට පක්ෂ මුර සෙබළුන්ව පත් කළා. මාලිගාව වටේට, මාලිගා වත්තේ, ඇතුළු වන පිට වන නගර දොරටුවල පාලකයින්ට පක්ෂ හමුදා මුර කළා.

රජයේ ඇමති මණ්ඩලය රැස් වුණා. අමුත්තෝ ගෙවල් බලා ගියා. නපුරු පාලකයෝ තුන් දෙනා මාලිගාවේ වෙදනාගේ කාමරයට ගිහිල්ලා බර කිරලා බැලුවා. කොච්චර බය වුණත් බර නම් අවුන්සයක්වත් අඩුවෙලා නැහැ. එහෙම වෙන්න බැහැ. අපි කලබල වෙලා, බයවෙලා. අපේ බර අඩුවෙන්න ඕන, පාලකයෝ කිව්වා. වෙදනා බොරු කරනවා කියලා ඔහුව හිරගෙට නියම කළා.

ටුට්ටිගේ බෝනික්කා මාලිගා වත්තේ තිබී හොයා ගත්තා. සූර්ය ග්‍රහණය බැලීමට බෝනික්කාට බැරිවුණා. ආයෙමත් හදන්න බැරි වෙන විදියට බෝනික්කාව කඩා බිඳලා.

ටුට්ටිට කොහොමවත් උහුලාගෙන ඉන්ට බැහැ. ඇඬෙනවා. කැඩිච්ච බෝනික්කාව බදාගෙන ඔහු ඇඬුවා. පෙනුමෙන් බෝනික්කා ගෑනු ළමයකු වගෙයි. උසින් ටුට්ටිට සමානයි. බොහොම වටිනා බෝනික්කෙක්. බැලූ බැල්මට නම් පණ තියෙන ගැණු ළමයකු වගේමයි.

දැන් නම්, බෝනික්කාගේ ගවුම ඉරිලා. පපුවට කඩුවෙන් ඇනලා, කපලා, කොටලා.

ටික වෙලාවකට ඉස්සෙල්ලා නම් ඒ බෝනික්කා පුංචි ගෑනු ළමයකු වගේ නැටුවා, වාඩි වුණා, නැගිට්ටා, සිනහ වුණා. බෝනික්කාගේ පපුවේ සවිකරලා තිබුණු දුනු යන්ත්‍රයක්. දැන් ඒ යන්ත්‍රය කැඩිලා පරණ ඔර්ලෝසුවක් වගේ ගොර ගොර ගානවා.

"මගෙ බෝනික්කා මළා! අනේ අනේ මට වෙච්ච විපතක හැටි!" ටුට්ටි අඬ අඬා දුක්වුණා.

පුංචි ටුට්ටි නපුරු කොට පැටියකු නොවේ.

"මේ බෝනික්කාව වහාම හදන්ට ඕන. ඔටුන්න හිමි ටුට්ටි කුමාරයා බොහොම දුක්වෙනවා. මොනවා වුණත් මේ බෝනික්කාව හදන්ට ඕන." මහ ඇමතියා කිව්වා.

"වෙනින් බෝනික්කකු සල්ලිවලට ගනිමු." ඇමතිවරු යෝජනා කළා.

"ටුට්ටිට වෙනින් බෝනික්කෝ එපාලු. මේ බෝනික්කාට නැවත පණදෙන්ට ඕන කියලා කුමාරයා අණ කළා." මහ ඇමතියා කිව්වා.

"ඔය බෝනික්කාව හදන්ට පුළුවන් කාටද?"

"මම දන්නවා" පාසල් බාර ඇමති ඔළුව වැනුවා.

"කව්ද?"

"ඇමති වරුනි! අපේ නගරයේ ඉන්න දෙස්තර ගස්පාර් අර්නේරි ගැන අපට අමතක වෙලා. ඔහු වෙදකමයි, විද්‍යා සාස්තර සියයකුයි දන්නවා. ඔටුන්න හිමි ටුට්ටිගේ බෝනික්කාව ඔහුට හදන්නට පුළුවනි."

ඇමතිවරු බොහොම සතුටුවුණා.

"යසයි! යසයි!"

ඇමති මණ්ඩලයට ගස්පාර් ගැන කියන සින්දුව මතක් වෙලා, ඒ ගොල්ල මහ හඬින් එය ගායනා කළා:

අහසේ තරු අල්ලන්නට
මැරුණු අයට පණ දෙන්නට
වැලි මිරිකා තෙල් ගන්නට
පුළුවනි අපෙ අර්නේරිට.

සින්දු කියලා ඇමතිවරු එකතු වෙලා මෙහෙම ලිව්වා:

ගස්පාර් අර්නේරි දෙස්තර මහතා වෙතටයි.

ඔටුන්න හිමි ටුට්ටි කුමාරයාගේ බෝනික්කා කැඩිලා. පාලකයින් තුන්දෙනාගේ ආණ්ඩුවේ ඇමති මණ්ඩලය ඒ බෝනික්කාව හෙට උදේ වෙන කොට හදලා ආපහු ගෙනැවිත් බාර දෙන්ටයි කියලා ඔබට නියම කරනවා. බෝනික්කාව ඉතාම හොඳට හදලා තිබුණොත් ඔබට තෑගි දෙනවා. හෙට උදේ වන කොට හදලා ඉවර නොකළොත් ඔබට බරපතළ දඬුවම් කරනවා.

මීට,
ඇමති මණ්ඩලය වෙනුවෙන්
මහ ඇමති වරයා...

මහ ඇමතිවරයා ලියවිල්ලට අත්සන් කළා. ආණ්ඩුවේ සීල් එකත් ලියවිල්ලට තැබුවා. ඒ සීල් එක ට්ටිකුරුයි. ආණ්ඩුවේ ලකුණ තමා කරකිටි කිටි ගාලා තද වෙන්ට බැඳපු සල්ලි මිටියක්.

මාලිගාවේ මුර සෙබළ හමුදාවේ නායකයා කපිතන් බොනවෙන්ටූරා. ඔහු සිටුවරයෙක්. ඔහු ආණ්ඩුවේ නියමයත් අරගෙන, තවත් මුර සෙබළු දෙදෙනෙක් සමග දෙස්තර ගස්පාර් අර්නේරිව හොයන්ට ගියා.

මුර සෙබළ නායකයයි, තවත් සෙබළු දෙදෙනෙකුයි අස්පයින් පිට නැගලා ගියා. මාලිගාවේ මහ ලිපිකරුවා අස් රියකින් ගියා. ඔහු බෝනික්කාව දණහිස් උඩ තබාගෙන වාඩිවෙලා උන්නා. බෝනික්කාගේ ලස්සන ඔළුව මහ ලිපිකරුවාගේ උරහිස මත තිබුණා.

ඔටුන්න හිමි ටුට්ටි ඇඬීම නතර කළා. හෙට වෙන විට, බෝනික්කාට පණ ලැබෙයි කියලා ටුට්ටි හිතාපු නිසා තමයි ඇඬීම නතර කළේ.

ඉතින් මාලිගාවේ කේක් ගෙඩිය උඩ වාඩිවෙලා හිටපු බැලුන් වෙළෙන්දාට මොකද වුණේ?

ඔහුව කෑම ශාලාවෙන් එළියට ගෙන ගිය බව ළමයි දන්නවා නොවැ.

ඔහුවයි, කේක් ගෙඩියයි, කේක් හදන කාමරයට ගෙනියන්නට පටන් ගත්තා.

කේක් ගෙඩිය උස්සා ගෙන යන විට එක සේවකයකුගේ පයකට දෙඩම් ලෙල්ලක් පැගිලා, ඔහු ලිස්සා වැටුණා.

"ප්‍රවේසමින්!" අනිත් සේවකයෝ කෑ ගැසුවා.

"මගේ අම්මෝ! මට බැරියෝ!" බැලූන් වෙළෙන්ද කේක් ගෙඩිය උඩ ඉඳලා මහ හඬින් කිව්වා.

කොහොම වුණත් සේවකයාට නොවැටී ඉන්නට බැරිවුණා. ඔහු කේක් කාමරයේ සිමෙන්ති ගල් පොළොව උඩ 'දඩාස්' ගාලා වැටුණා.

ඔහුගේ කකුලත් තුවාල වෙලා, ඔහු වේදනාවෙන් කෑ ගැසුවා.

'හැබෑට ලස්සනයි!" කියලා බක්කරේ පැටව් ටික සන්තෝස වුණා.

කේක් ගෙඩියත් එක්ක බිම වැටුණු බැලූන් වෙළෙන්ද කොල්ලන් දිහා බලලා "යක් පැටව්" කියලා බැන්නා.

කේක් ගෙඩිය කෑලි වලට වීසිවුණා. බැලූන් වෙළෙන්දගේ ඇඟේ තිබුණු ක්‍රීම් හැම තැනම වීසි වුණා. සේවකයා පැනලා දිව්වා.

බක්කරේ පැටව් ටික බොහොම සතුටින් උඩ පැන පැන හිනාවුණා.

බැලූන් වෙළෙන්ද කේක් කෑලි ගොඩේ වැටිලා ඉන්නවා. කේක් ගෙඩිය ඇතුළෙ තිබුණු මී පැණියි, ජෑම් ඉස්මයි ඔහුගේ ඇඟ පුරාම.

කේක් කාමරයේ ලොකු බක්කරේලා තුන් දෙනා හිටියේ නැහැ. පොඩි බක්කරේ පැටව් විතරයි ඉන්නේ. ඒ නිසා බැලූන් වෙළෙන්ද සතුටු වුණා.

"මේ කොල්ලන්ගේ උදව් අරගෙන මට මෙතැනින් බේරිලා යන්ට පුළුවනි." බැලූන් වෙළෙන්ද කල්පනා කළා.

ඔහු තවමත් බැලූන් බැඳලා තියෙන කඹය අල්ලාගෙන ඉන්නවා.

බක්කරේ පැටව් හැම පැත්තෙන්ම බැලූන් කාරයා ළඟට ආවා. හැම කොල්ලකුටම එක එක බැලූන් බෝලය බැගින් ලැබෙනවා නම් ඔවුන් බොහොම සන්තෝස වන බව ඔවුන්ගේ මුහුණු දිහා බලපු බැලූන් කාරයාට කල්පනා වුණා.

ඔහු බක්කරේ පැටවුන්ට කතා කළා:

"මම කැමති නැහැ බැලූන් බෝල අරගෙන අහසේ පාවෙන්න.

මම පොඩි කොල්ලෙක් නොවෙයි. වීරයෙක් නොවෙයි. මම නපුරු පාලකයින් තුන්දෙනාට බොහොම බයයි. කේක් ගෙඩිය උඩ වාඩිවෙලා ඉන්න මට බැහැ. මම බොහොම කැමතියි මාලිගාවෙන් පැනලා යන්ට."

පුංචි බක්කරේලා ටික හිනා වීම නැවැත්තුවා. බැලුන් බෝල බොහොම ලස්සනයි. ඉර අව්වට රතු, නිල්, කහ පාට බැලුන් බෝල දිලිසෙනවා.

"මම මෙතනින් බේරිලා යන්ට ඕන. ළමයිනේ නුඹලාට පුළුවන්ද මට උදව් කරන්න." බැලුන් බෝල බැඳලා තියෙන කඹය අල්ලා ගෙන වෙළෙන්ද ඇහුවා.

"පුළුවනි, පුළුවනි!" කොල්ලෝ හෙමින් පිළිතුරු දුන්නා. "මාමා අපට බැලුන් බෝල දෙනවද."



වෙළෙන්දටත් ඕන කරලා තිබුණේ ඔය විදිහ තමයි.

"හොඳයි, මම කැමතියි" වෙළෙන්ද ඕනෑවට එපාවට වගේ කිව්වා."මේ බැලුන් බොහොම වටිනවා. මමත් බැලුන් බෝල වලට බොහොම කැමතියි. ඉතින් ළමයිනේ නුඹලාට ඕන තම් මම ඒවා දෙන්නම්. නුඹලා බොහොම හොඳ ළමයින් බව මට පේනවා."

වෙළෙන්ද කටින් එහෙම කිව්වට හිතින් හිතුවේ එහෙම නොවෙයි. "මුන් යක් පැටව් වගයක්!" කියලා ඔහු යටි හිතින් බැන්නා.

"මහ බක්කරේ ගබඩා කාමරයට ගිහිල්ලා. හවස තේ වලට විස්කෝතු හදන්න ඔන හන්ද පිටි, බටර්, කිරි ගේන්න ඔහු ගිහිල්ලා!" එක බක්කරේ පැටියෙක් කිව්වා. "එයා එන්න ඉස්සෙල්ලා මාමාට මෙතැනින් පැනලා යන්න ලෑස්ති කරන්න ඕන."

"බොහොම හරි. පරක්කු කරන්න එපා." වෙළෙන්ද එකඟ වුණා.

"දැන් මම රහසක් හෙළි කරන්නම්!" එක පුංචි බක්කරේ කෙනෙක් කිව්වා.

ඔහු ලොකු උදුනක තියෙන මහ විසාල තඹ හැලියක් ළඟට ගිහිල්ලා එහි පියන ඇරියා.

"දැන් ඉතින් බැලුන් බෝල දෙන්න." පුංචි බක්කරේ ඉල්ලුවා.

"කොල්ලෝ, නුඹට පිස්සුද? මට හැලිය ඇතුළට රිංගන්න ඇති උවමනාව මොකක්ද? මෙතැනින් පැනලා යන්ටයි මට ඕන. හැලි ඇතුළට රිංගන්න නොවේ." වෙළෙන්ද කේන්තියෙන් සැරවුණා.

"හැලිය ඇතුළට රිංගන්නකො." පුංචි බක්කරේ කිව්වා.

"හැලිය ඇතුළටද?"

"ඔව් හැලියට."

"පස්සෙ මොනවා වේවිද?

"ඇතුළට රිංගලා බලන්නකො. මෙතැනින් පැනලා යන්ට පුළුවන් ඉතාම හොඳ විදිහ එහෙමයි." පුංචි බක්කරේ පැහැදිලි කළා.

ඒ තඹ හැලිය බොහොම ලොකුයි. ඒක ඇතුළට කෙට්ටු වෙළෙන්දට විතරක් නොවෙයි, වල් ඌරන් තරම් මහත නපුරු පාලකයින්ට වුණත් රිංගන්ට පුළුවනි.

"අහු නොවී පැනලා යන්ට ඕන නම් ඉක්මනින් රිංගන්න."

බැලුන් වෙළෙන්ද හැලිය දිහා බැලුවා. එය පතුලක් නැති ලිඳක් වගෙයි.

"හොඳයි." කියලා ඔහු සුසුම් ලෑවා. "බේරිලා යන්නට හැලිය ඇතුළට වුණත් රිංගන්නම්. අහසේ පා වෙනවට වැඩිය මෙය හොඳයි. කේක් ගෙඩිය උඩ වැඩිවෙලා ක්‍රීම් ගොඩකින් වැහිලා ඉන්නවට වැඩිය මෙය හොඳයි. කපටි කොල්ලනේ නුඹලාට ආයුබෝවන්. මෙන්න මට පැන යාමට උදව් කළාට තෑගි." වෙළෙන්ද පුංචි බක්කරේලාට බැලුන් බෝල බෙදා දුන්නා.

එතැන රැස්වෙලා හිටියා පුංචි බක්කරේලා විසි දෙනෙක්. වෙළෙන්දගේ අතේ තිබුණු බැලුන් බෝල වල ගණනත් හරියටම විස්සයි. කොලු රංචුව බොහොම සතුටු වුණා.

වෙළෙන්ද කකුල් ඉස්සරහට දලා හැලිය තුළට රිංගුවා. එක පුංචි බක්කරේ කෙනෙක් හැලියේ පියන වැහුවා.

"බැලුන් බෝල! බැලුන් බෝල!"කොල්ලෝ හිනා වෙවී උඩ පැන්නා.

කොල්ලො විසිදෙනාම බැලුන් බෝලත් අරගෙන කේක් කාමරයෙන් පිටවෙලා මාලිගාවේ බේකරිය ළඟ තිබෙන වත්තේ සෙල්ලම් කරන්ට පටන් ගත්තා.

දැන් ඉතින් වත්තට වෙලා කොල්ලෝ බැලුන් බෝල උඩ දම, දමා සෙල්ලම් කරනවා.

කොල්ලන්ගේ කෑ ගැසීම් ඇහිලා බේකරියේ ජනේල් දෙරවල් තුනක් ඇරලා මහ බක්කරේලා තුන්දෙනා වත්ත දිහා බැලුවා.

"මොකද? කෑ ගහන්නේ කව්ද? නැටීම නවත්වලා වහාම බේකරියට වරෙල්ලා!" කියලා මහ බක්කරේලා තුන්දෙනා අණ කළා.

පුංචි බක්කරේලා බොහොම බයවුණු හන්ද ඔවුන්ගේ අත්වල තිබුණු බැලුන් බෝල ඉබේටම අතහැරිලා අහසේ පාවෙන්නට වුණා.

පුංචි බක්කරේලාගේ සන්තෝසය එතනින් අවසන් වුණා.

බැලුන් බෝල වසසක එකවරම අහසේ පා වෙනවා. අහස නිල් පාටයි. බැලුන් බෝල රතු පාටයි, කහ පාටයි, නිල් පාටයි. පුංචි බක්කරේලා පුදුම වෙලා කටවල් ඇරගෙන බලාගෙන හිටියා.

5

කාපිරි තරුණයෙක්

සර්කස්කාර ටිබුල් යකඩ රිට දිගේ දුවලා ගිහිල්ලා දෙස්තර ගස්පාර්ගේ වහළේ දුම් බටයට රිංගලා, සීත කාලෙට ගිනි තපින ලිප අස්සෙන් කාමරය ඇතුළට ආපු හැටි ළමයින්ට මතකයි නේද.

දෙස්තර ගස්පාර් ටිබුල් කැටුව තමාගේ බෙහෙත් කාමරයට ගියා. එතැනදී මොනවා වුණාද කියල අපි දන්නේ නැහැ. දෙස්තරව ඔලාපොරොත්තුවෙන් සිටි හනිමේද් නැන්ද බොහොම මහන්සි වෙලා නිදගත්තා. ඇට කුකුළෙකුව හීනෙන් පෙනුණා.

ඊට පහුවද, වෙළෙන්ද බැලුන් සමග අහසේ පාවෙලා ගිහින් නපුරු පාලකයින් තුන් දෙනාගේ මාලිගාවට ඇතුළු වුණ ද, ටුට්ටිගේ බෝනික්කාව සෙබළුන් කඩාපු ද, හනිමේද් නැන්ද අකරතැබ්බයකට මුණ පෑවා. ඈ මීයකුව මී උගුලෙන් එළියට දැම්මා. ඒ මීයා එදා රෑ නැන්දගේ කොප්පරා බෑයත් කාලා. ඊට ඉස්සරින් ද සිකුරාදා රෑ නැන්දගේ කානේෂන් මලත් වීදුරුවත් එක්ක බිම වැටුණා. කානේෂන් මල අරළු පුසුඹයි.

ඔන්න එදම රෑ නැන්ද අටවපු මී උගුලට මීයකු අහුවුණා.

නැන්ද උදේ පාන්දර නැගිටලා මී උගුල දිහා බැලුවා. උගුලට අහුවෙච්ච මීයා කිසි ගණනක් නැතුව කුඩුවට වෙලා හිටියා. ඌ කුඩුව ඇතුළෙ හිටියෙ හරියට පුරුදු කාරයකු වගෙයි. නමුත් ඌ හිත ඇතුළෙ තිබුණු බය එළියට පෙන්වන්නේ නැතුව හිටියා.

"නුඹට කීවා නේද මගේ කොප්පරා බෑය කන්නට එපයි කියලා." නැන්ද මීයාට බැණලා මී උගුල පෙනෙණ තැනක තැබුවා.

නැන්ද ඇඳගෙන දෙස්තරව හොයා ගෙන බෙහෙත් කාමරයට ගියා. ඈ මීයාව අල්ලා ගත්තු හන්ද ඇතිවුණු සන්තෝසය ගැන කියන්ටයි ආවේ. ඊට ඉස්සරින් ද උදේ කොප්පරා බෑය නැතිවීම ගැන නැන්දට තමාගේ කනගාටුව දෙස්තර ප්‍රකාශ කළා. "මීයෝ කොහොමත් උම්බලකඩවලට, කොප්පරාවලට කැමතියි," ඔහු කිවා.

නැන්ද තරමක් සැනසුනා.

"මීයෝ කොප්පරාවලට කැමතියි... බලමුකෝ උන් මගේ උගුලට කැමතිද කියල" නැන්ද තමාටම කියා ගත්තා. එහෙම ඇය කීවේ ඊයේ.

අද, නැන්ද බොහොම ආඩම්බරයෙන් උගුලට අහුවුණ මීයාවත් අරගෙන දෙස්තරව හොයාගෙන ආවා.

වෙලාව උදේ හයට විතර ඇති. ගස්වල කොළ ලා හිරුරැස් වලින් බැබළෙනවා. පුංචි බක්කරේලාගේ අතින් ගිලිහිලා ඉගිලිලා ගිය බැලුන් බෝල තවම අහසේ පාවෙනවා.

නැන්ද මී උගුලත් අරගෙන දෙස්තරගේ බෙහෙත් කාමරය ළඟට ගියා.

බෙහෙත් කාමරය ඇතුළෙ මොකක්ද සද්දයක් ඇහුණා.

"අනේ දුප්පතා. තවම නිදගන්නවත් ගිහිල්ලා නැහැ වගෙයි!" නැන්ද කල්පනා කළා.

ඈ දෙරට තට්ටු කළා.

දෙස්තර යමක් කීවා. නැන්දට එය ඇහුනේ නැහැ.

දෙර හැරුණා. දෙර ළඟ දෙස්තර හිටගෙන ඉන්නවා. බෙහෙත් කාමරය ඇතුළෙ පෙරුන්කායන් පුසුඹයි. ලිපේ රතු පාට ගිනි අඟුරු කැට දිලිසෙනවා.

දෙස්තර මුළු රෑ තිස්සෙම නිදා ගන්නේ නැතිව වැඩ කරලා වගෙයි කියලා නැන්දා කල්පනා කළා.

"සුබ උදෑසනක් වේවා!" දෙස්තර සිනාවෙලා කිව්වා.

නැන්දා මී උගුල පෙන්නලා ආඩම්බරේට කතා කළා. මීයා පෙරුම්කායන් පුසුඹ හන්දා නහය හකුළා ගත්තා.

"මීයාව අල්ලා ගත්තා!"

"ආ! එහෙමද පෙන්වන්නකෝ!" කියලා දෙස්තර සතුටුවෙලා කිව්වා.

හනිමේද් නැන්දා ජනේලය ළඟට ගිහිල්ලා මී උගුල පෙන්නුවා.

"මෙන්න කොප්පරා හොරා!"

නැන්දා මී උගුල පෙන්නන්ට දෙස්තර වෙතට අතක් දිගු කළ හැටියේම, ජනේලය ළඟ පෙට්ටියක් උඩ කළුම කළු පාට කාපිරියෙක් වාඩිවෙලා ඉන්නවා දැකලා පුදුම වුණා. "ප්‍රවේසමින්!" යන වචනය පෙට්ටියේ ලියා තියෙනවා.

කාපිරියා කොට කලිසමක් ඇඳලා.

කලිසම රතුම රතු පාටයි.

කාපිරි තරුණයාගේ හම කළුම කළු පාටයි. සමහර වෙලාවට දම් පාටට හුරුයි.

කාපිරි තරුණයා පෙට්ටිය උඩ වාඩිවෙලා දුම්කොළ පුරවපු පයිප්පයක් බී බී දුම් පිට කරනවා.

හනිමේද් නැන්දා 'ආහ්' ගාලා කෑ ගැසුවා. දෑත් වනලා පුදුම වුණා. ඈ දෑත් වනන කොට හරියට එළවළු කොටුවේ පඹයකු වගෙයි. ඈ අත් දිග හරින විට මී උගුලේ දෙර ඇරිලා මීයා එළියට පැනලා දිව්වා.

ඒ වර නම් හනිමේද් නැන්දට බොහොම කේන්ති ගියා.

කාපිරි තරුණයා හා, හා ගාලා හිනාවෙලා, නවාගෙන හිටිය කකුල් දිග හැරියා. ඔහු ඇඳලා හිටියේ රතු පාට දිගට දිගේ සපත්තු දෙකක්. ඒවා ඉදිච්ච මිරිස් කරල් වගෙයි.

ඔහු හිනා වෙන විට, කටේ තිබුණු දුම් පයිප්පය දත්වල හැප්පිලා ටක ටක ගාලා හඬක් පිට කළා. දෙස්තරත් මහ හයියෙන් හිනා වුණා. ඔහුගේ ඇස් කණ්ණාඩි කුට්ටමත් උඩ පැන්නා.

හනිමේද් නැන්දු ඉක්මනට බෙහෙත් කාමරයෙන් එළියට පැනලා යන්ට ගියා.

"කොප්පර හොරා පැනලා ගියා! මීයා, කොප්පරා, කාපිරියා!" ඈ කිය කියා ගියා.

දෙස්තර ගස්පාර් ඇය පිටුපසින් දුවලා ගිහිල්ලා ඇයට කතා කළා:

"හනිමේද් නැන්දේ ඔබ කලබල වෙන්ට එපා. මගේ අලුත් පර්යේෂණය ගැන නැන්දට වේලාසනින් කියන්ට බැරිවුණා. නැන්දු දන්නවා නොවැ මම බෙහෙත් ගැන විතරක් නොවෙයි, විද්‍යා සියයක් දන්නා කෙනෙක් කියලා. ඒ මදිවට මම පර්යේෂණ කරනවා. අත්හදු බලනවා. මගේ බෙහෙත් කාමරයේ කාපිරි මිනිසුන්ව විතරක් නොවෙයි, අලි, කොටි, වලසුන්ව වුණත් හොයාගන්ට පුළුවනි. අනේ නැන්දේ මටයි, මගේ කාපිරි යාළුවාටයි බඩගිනියි. අපිට බිත්තර බැදලා උදේ කෑමට මොනවා හරි දෙන්න. මගේ කාපිරි යාළුවා බැදපු බිත්තරවලට බොහොම කැමතියි."

"මීයා කොප්පරාවලට කැමතියි, කාපිරියා බිත්තරවලට කැමතියි..." හනිමේද් නැන්දු සෙමින් කිව්වා.

"ඉතින් අපට බිත්තර බැදලා ගේන්ට. අද රෑට උගුලක් අටවලා මීයාව අල්ලා ගන්ට පුළුවනි. ඌ කොහේ යන්ටද, නැන්දේ... මීට පස්සේ ආයෙමත් ඌ හොරා කන්ට ඒවි. දැන් ඉතින් නැතිවෙච්ච කොප්පරා බෑයට අඬලා වැඩක් නැහැ." දෙස්තර නැන්දුව සැනසුවා.

හනිමේද් නැන්දු අඬ අඬා ගිහිල්ලා බිත්තර බැදලා ලුණු කියලා හිතේ තියාගෙන සීනි දලා, ගම්මිරිස් කුඩුත් දලා බිත්තර ගෙනාවා.

"ගම්මිරිස් බොහොම වැඩියි, ඒ නිසා බොහොම රසයි." කිය කියා කාපිරි යාළුවා බැදපු බිත්තර කෑවා.

හනිමේද් නැන්දු ගිහිල්ලා අරිස්ට බෝතලයෙන් වීදුරුවට ටිකක් වක්කරගෙන බීවා. අරිස්ටෙත් ගම්මිරිස් රහයි. අරිස්ටෙට ගම්මිරිස් කුඩු කොහොම වැටුණද කියල ඈ දන්නේ නැහැ.

උදේ කෑම කාලා දෙස්තර ගස්පාර මහපාරට බැහැලා යන හැටි නැන්දුට ජනේලයෙන් පෙනුණා. අළුත් මප්ලරයක් බෙල්ල වටේ

බැඳගෙන, අළුත් හැරමිටියක් අරගෙන, අළුතෙන් අඩි සවි කරපු පරණ සපත්තු දෙක කකුල්වලට දමාගෙන දෙස්තර ගස්පාර් ගියා.

ඔහු ළඟින්ම කාපිරියත් ගමන් කළා.

හනිමේද් නැන්ද මේ පුදුමය දැකලා ඇස්දෙක වහගෙන බිම වාඩි වෙන්ට හැදුවට, වාඩි වුණේ ගෙදර පූසගෙ ඇඟ උඩ. පූසා ඤාව් ගාලා කෑ ගැසුවා. හනිමේද් නැන්දට බොහොම තරහ ඇවිදින් ඈ කොස්ස අරගෙන පූසාට තඩි බෑවා. කම්මැලි පූසා නිතරම ඇගේ දෙපා ළඟට වෙලා ඉන්නවා. මොනවා හරි වැඩක් කරන කොට ඌව පයට පෑගෙ නවා. පූසා කිසිකලෙක මීයන් අල්ලන්නේ නැහැ. ඌ ගුටි කෑවේ ඔය හන්ද තමා.

මීයා ආයෙමත් කෑම කාමරයට ඇවිත් නැන්දගේ කේජු කෑල්ලක් කන්නට පටන් ගත්තා.

ටෙනී වීදිය දිගේ ගස්පාර් අර්නේරි ගමන් කළා. ඔය පාර දිගේ ගිහිල්ලා වමට හැරුණාම එලිසබැත් වීදියට වැටෙනවා. ඒ වීදිය හරහා ගියාම හෙණ වැදිච්ච මහා විශාල නුග ගහක් තියෙනවා. ටික දුරක් ගියාම දහ හතර වෙනි වෙළඳ පොළට යන්නට පුළුවනි.

දෙස්තර හා කාපිරි යාළුවා වෙළෙඳ පොලට ගියා. හවස් වේගන එන්නට පටන් අරගෙන. හෙණ වැදිච්ච නුග ගහේ අතු සුළඟට වැනුණා. දැන්වීම් කොළ අළවන මිනිහාට කොහොමවත් ඒවා අළවන්නට බැහැ. පාප්ප හොඳ නැති හන්දා. දුර ඉඳලා බලන කොට පෙනෙන්නේ, දැන්වීම් අළවන මිනිහා කොළයකින් මූණ පිහදනවා වගේ.

බොහොම මහන්සිවෙලා එක දැන්වීමක් ඔහු ඇළෙව්වා.

දෙස්තර ගස්පාර් එය කියෙව්වා:

පුර වැසියනි! පුර වැසියනි!
අද පාලකයෝ තුන් දෙනාගේ ආණ්ඩුව
මහජනයාට උත්සවයක් පවත්වනවා
සියල්ලෝම දහහතර වැනි වෙළඳ පොළට පැමිණෙත්වා!
නැටුම්
ගැයුම්
ක්‍රීඩා පෙන්වනු ලැබේ
සියල්ලෝම පැමිණෙත්වා!

"දැන් ඉතින් හැම දෙයක්ම පැහැදිලියි. නඩු අහන කොටුවේ අද කැරළි කරුවන්ව මරාදැමීමට ලෑස්ති වෙනවා. පෝසතුන්ගේ ආණ්ඩුවට විරුද්ධව දුප්පත් ජනතාවගේ පැත්ත අරගෙන සටන් කරපු වීරයින්ගේ බෙලි කපා දැමීමට නපුරු පාලකයෝ තුන් දෙනාගේ ආණ්ඩුව තීරණය කරලා. නපුරු පාලකයෝ මහජනයාව රවටන්නට උගුලක් අටවලා. මහජනයා නඩු අහන කොටුවට රැස්වෙලා පෝරක විනාශ කරලා, අළුගෝසුවන්ව මරා දමාවි කියලා නපුරු පාලකයෝ බයවෙලා." දෙස්තර ගස්පාර් කිව්වා.

ඔහු තම කාපිරි යාළුවාත් සමග කඩපොලේ චතුරශ්‍රයට ගියා. නැටුම් පෙන්වන තැන සෙනඟ පිරිලා. එතැන ජේත්තු කාරයෝ නැහැ. රත්තරන් පාට ගවුම් ඇඳ ගත්තු පොහොසත් නෝනලා එතන නැහැ. රත්රන් ගාපු අස්රිය හා දෝලාවලින් යන නාකි සිටුවරයෝ එතන නැහැ. ලොකු ලොකු සල්ලි මළු ඉණ වටේ එල්ලා ගත්තු ධනපති වෙළෙන්දන් එකකු වත් එතනට ආවේ නැහැ. මේ අඩුව දෙස්තරට හොඳට පෙනුණා.

මෙතැන රුස්වෙලා හිටියෙ නගරයේ දුප්පත් උදවිය. පුංචි කම්මල් කාරයෝ, අත්වැඩ කාරයෝ, සිල්ලර බඩු හා රොටී වෙළෙන්දෝ, ගෙවල්වල වැඩ කරන මෙහෙකාරියෝ, මැහැල්ලෝ, හිඟන්නෝ, කුලී වැඩ කරන්නෝ, අබ්බාගාතයෝ කඩ පොළට රුස්වෙලා හිටියා. ඔවුන් ඇඳගෙන හිටියේ ඉරුණු, පරණ ඇඳුම්. සමහරුන්ගේ ඇඳුම් ඉරිලා යට ඇඳුම් පවා පෙනෙනවා.

හුළං පාරට මැහැලියන්ගේ පැසුණු හිසකේ අවුල් වෙලා, ඇස් රතු පාට වෙලා. හිඟන්නන්ගේ ඉරුණු, පරණ ඇඳුම් තවත් ඉරුණා හුළං පාර හන්ද.

මේ මිනිස්සු බුම්මාගෙන නපුරක් වෙයි කියලා බලාපොරොත්තුවෙන් හිටියා.

"නඩු අහන කොටුවේ අපේ සගයින්ව මරා දමනවා. මෙතන අපව රවටන්ට කවටයෝ ඇවිල්ලා. උන්ට පාලක නපුරෝ තුන්දෙනා හුඟාක් රන් කාසි දීලා."

"නඩු අහන තැනට යමු!" මිනිස්සු කෑ ගැහැව්වා.

"අප ළඟ අවි නැහැ. තුවක්කු නැහැ. කඩු නැහැ. නඩු අහන කොටුව වටේට මුර සෙබළු ආරක්ෂක කව තුනක් හදලා තියෙනවා."

"සෙබළු දැනට උන්ට සේවය කරනවා. උන් අපට වෙඩි තැබුවා. කමක් නැහැ! අද හෙටම උන් නපුරු පාලකයින්ට විරුද්ධව අප සමඟ එකතු වේවි."

ඊයේ රෑ තරු පහන ළඟදී මුර සෙබළෙක් නායකයාට වෙඩි තියලා ටිබුල්ගේ පණ බේරා ගත්තා."

"ටිබුල් කෙහෙද? ඔහු පැනලා ගියාද?"

"දන්නේ නෑ. රෑ තිස්සේම, යුද හමුදාව කම්කරුවන්ගේ පැල් පත් වලට ගිනි තිබ්බා. නමුත් ටිබුල්ව අල්ලා ගන්ට ඒ ගොල්ලන්ට බැරි වුණා."

දෙස්තර ගස්පාර් කාපිරි යාළුවත් එක්ක විකට නැට්ටුවන් ළඟට ආවා. එතන වේදිකාවක් හදලා, තිර ඇදලා තියෙනවා. රබන් හඬ, ගෙජ්ජි හඬ, බට නළා වාදනය ඇහෙනවා. විකට නැට්ටුවෝ රඟ පෑමට ලැස්ති වුණා.

තිරය ඇරිලා එක නැට්ටුවෙක් හිස එළියට දැම්මා. ඒ මිනිහා ස්පාඤ්ඤ ජාතිකයෙක්. ඔහුට පිස්තෝලයෙන් ඕනෑම ඉලක්කයකට

වෙඩි තැබීමට පුළුවනි. බොහොම දක්ෂ හරඹ කාරයෙක්. ඔහුගේ උඩු රැවුල හරිම විශාලයි. ඔහු එක ඇහැක් කරකවලා වටපිට බැලුවා.

ඔහු කාපිරි තරුණයාට කතා කළා. "ඒයි. යාළුවා නුඹත් ආවේ නැටුම් පෙන්වන්ටද? නුඹට කීයක් ගෙව්වද?"

කාපිරි තරුණයා කතා කළේ නැහැ.

"මට රන් කාසි දහයක් ලැබුනා." හරඹ කාරයා පුරසාරම් දෙඩුවා. කාපිරි තරුණයාත් නැට්ටුවෙක් කියලා ඔහු කල්පනා කළ නිසා තමයි ඔහුට කතා කළේ.

කාපිරියා තිරය ඇරලා වේදිකාවට ඇතුළු වුනා. ස්පාඤ්ඤ ජාතිකයා ඔහුට වැදගත් රහසක් හෙළි කළා. නපුරු පාලකයෝ තුන්දෙනා නැට්ටුවන්, හරඹ කාරයින් සියයක් කුලියට අරගෙන. පාලකයින් තුන්දෙනාගේ හොඳ කියන්නන්, සල්ලිකාරයින්, රදළයින්, ඉඩම් හිමියන්, ධනපතින් ගැන වර්ණනා කරන්ටත්, කැරලි කරුවන් ගැනත්, ප්‍රොස්පේරෝ හා ටිබුල් ගැනත් බොරු කියලා මහජනයාව රවට්ටන්ටත් ඔවුන්ව නියම කරලා තියෙනවා කියලා ස්පාඤ්ඤ ජාතිකයා ඔහුට කිව්වා.

"උන් නැට්ටුවන්ව, විජ්ජා කාරයින්ව, කවටයින්ව, අසරුවන්ව, සතුන් මෙල්ල කරන සර්කස් කාරයන්ව, කුලියට ගත්තා... ඔවුන්ට ලොකු මුදලක් ගෙව්වා"

"හැබෑටම ඔය කට්ටිය නපුරු පාලකයින්ට උදව් කිරීමට එකඟ වුණාද?" එහෙම ඇසුවේ දෙස්තර ගස්පාර්.

"ස්-ස්-ස්" ස්පාඤ්ඤ ජාතිකයා දෙතොල් මත ඇඟිල්ලක් තියලා ඔහුට නිහඬ වෙන්ට කිව්වා. "ඔය ගැන මහ හයියෙන් කතා කරන්න එපා. විරුද්ධ වෙච්ච නැට්ටුක්කාරයින්ව පාලකයෝ හිර කළා."

කාපිරි තරුණයාගේ හිත ගැස්සුණා.

මේ වෙලාවේදී සංගීත වාදනය පටන් අරගෙන තිරය ඇරිලා කවටයෙක් වේදිකාවට ආවා. මිනිස්සු වේදිකාව ළඟ රැස් වුණා.

"පුර වැසියනි! නුඹලාට සුබ පැතීමට අවසර දෙන්න." ඒ කවටයාගේ කටහඬ කුකුළකුගෙ වගෙයි. ඔහු බොරු කකුල් ඇඳලා හිටියා.

මිනිස්සුන්ගෙ සද්දෙ අඩු වුණාම ඔහු අයෙමත් කතා කළා :

පුර වැසියනි! නුඹලාට සුබ පැතීමට අවසර දෙන්න. අපේ ආදරණීය, මහත රතුපාට පාලකයෝ තුන් දෙනාගේ නියමය අනුව අද නීච කැරලිකාරයින්ව මරා දමනවා..."

ඔහුට කතාව ඉවර කරන්ට ලැබුණේ නැහැ. රොටී වෙළෙන්දෙක් හරියට ඉලක්කය බලා ඔහුගේ කටට රොටියක් වීසි කළා.

"ම්-ම්-ම්..."

කවටයාට එයට වඩා වචනයක්වත් කතා කරන්ට බැරි වුණා. බාගෙට තැම්බිච්ච අමු රොටිය බෝතල කටේ හිරවුණු පොරොප්පයක් වගේ ඔහුගේ උගුරෙ හිරවුණා. ඔහු ඇස් වහගෙන දෑත් වනන්නට වුණා.

"යස වැඩේ!" මිනිස්සු කෑ ගැසුවා. කවටයා වේදිකාව ළඟ තිබුණු වැටක හැප්පුණා.

"නීචයා! නපුරු පාලකයින්ගේ පගාවට යටවෙලා. අපේ නිදහස සඳහා මරණයට පවා බය නැතිව සටන් කළ වීරයින්ට බණින්ට ආවා, නීචයා!" මිනිස්සු කෑ ගැහැව්වා.

සංගීත වාදනය වඩාත් වැඩි වුණා. තවත් බටනලා නවයකුයි, තුර්කී බෙර තුනකුයි, වීණාවකුයි සංගීත වාදනයට එක් වුණා. වීණාවේ හඬ ඇහෙන කොට දත් කැක්කුම හැදෙනවා.

නැටුම් කණ්ඩායම් බාර මුදලාලිලා ජනයාගේ අසතුට, සංගීත වාදනයෙන් මැඩ පැවැත්වීමට උත්සාහ කළා.

"කට ඇරිය හැටියට කට හරහට රොටී වීසිකළාම අපේ නැට්ටුවෝ බය වෙනවා. කිසිවක් නූන හැටියට හැසිරෙන්නට ඕන" කියලා එක නැට්ටුවෙක් කියාපි.

"මහත්වරුනි! නැටුම් බලන්ට එන්න, එන්න!" "බරවා කකුල" යන නමින් ප්‍රසිද්ධ තවත් නැටුම් කණ්ඩායමක් මහ ජනයා ඉදිරියට ආවා.

වේදිකාවේ තිරය මැත් කරලා නැටුම් කණ්ඩායමේ ලොක්කා වේදිකාවට ආවා. ඔහුගේ හිස වසා තිබුණු තොප්පිය උසයි, කොළ පාටයි. කම්මුල් දෙකේම රතු පාටට වටකුරුවට ලප ඇඳලා.

ඔහු ජර්මන් භාෂාවෙන් කතා කරනවා වගේ "ට්ස්ස්" "ට්ස්ස්" කියලා කිව්වා. "අපේ නැටුම්, හරඹ බොහොම උසස් ඒවා."

මිනිස්සු ඔහුගේ කතාව අහන්ට රැස්වුණා.

අද උත්සවය හන්දා අපේ යෝධයාට වේදිකාවට එන්ටයි කියමු. ඔහුගේ නම ලපිතුප්."

"ටා-ටී-ටූ-ටා" නළා පිඹින්නට පටන් ගත්තා.

එහෙන් මෙහෙන් එකෙක් දෙන්නෙක් අප්පුඩි ගැහැව්වා.

සංගීත වාදනය බොහොම ජයට කෙරුණා. තිරය ඇරලා ලපිතුප් යෝධයා වේදිකාවට ආවා.

හැබෑටම ඒ මිනිහා හරි විශාලයි. ඒ වගේම ඔහුට බොහොම ශක්තිය තිබෙනවා.

ලපිතුප් යෝධයා හුස්ම අරගෙන, අං වලින් අනින්නට යන ගොනකු වගේ ඔළුව පහත් කරගෙන ලෑස්ති වුණා. ඔහු මස්පිඬු හරියට හාවකු ගිලපු කෙට්ටු පිඹුරකුගෙ බඩ පිම්බෙන්නා වගේ. පිම්බුණා.

වැඩකාරයෝ යකඩ පොලු අගට ලොකු යකඩ බෝල සවි කරපු "බාබෙල්," ගෙනල්ලා හැම තැනම දැම්මා. මේ හන්දා දුවිලි නැංගා, කඩපොළ පුරාම දුවිලි නැංග නිසා තරමක කලබලයක් ඇතිවුණා.

යෝධයා ලොකු යකඩ බෝල දෙකක් අරගෙන උඩ විසිකරලා, එකට එක හැප්පෙව්වා. එතකොට ගිනි පුපුරු විසි වුණා.

"මෙන්න මේ විදිහට පාලකයෝ තුන්දෙනා ප්‍රොස්පේරෝගේ ඔළුවයි, ටිබුල්ගේ ඔළුවයි පොඩි කරලා දමාවි."

නපුරා පාලකයෝ තුන්දෙනා මේ යෝදයාටත් අල්ලස් දීලා තිබුණා.

"හා-හා-හා" ගාලා ඔහු හිනාවුණා.

තමාගේ කටට රොටියකින් ගහලා කට වහන්නට කවුරුවත් ඉදිරිපත් වෙයි කියලා ඔහු විශ්වාස කළේ නැහැ: ඔහු බොහොම ශක්තිමත් මිනිහෙක් නිසයි එහෙම කල්පනා කළේ.

මිනිසුන් නිහඬ වුණාම කාපිරි තරුණයා කතා කළා. රැස්වෙලා හිටිය මිනිස්සු ඔහු දිහා බැලුවා.

"නුඹ මොනවද කිව්වේ?" කාපිරි තරුණයා යෝධයාගෙන් ඇහුවා. ඔහු වේදිකාවට ළං වුණා.

මේ යකඩ බෝල දෙක එකට හැප්පුණා වගේ ප්‍රොස්පේරෝයෙයි, ටිබුල්ගෙයි ඔළු ගෙඩි දෙක පාලකයෝ තුන්දෙනා පොඩිකරලා දමී."

"කට වහපන්!"

කාපිරි තරුණයා එහෙම කිව්වේ බොහොම සන්සුන් වෙලා. දැඩි ගතියකින්. ඔහු කෑ ගැහැව්වේ නැහැ.

"නුඹ කව්ද? කළු යකාද?" යෝධයා කේන්තියෙන් ඇහුවා.

යෝධයා යකඩ බෝලය පැත්තකට වීසි කළා. ඔහු සුදුමැලි වුණා.

කාපිරි තරුණයා වේදිකාවට නැග්ගා.

"නුඹට බොහොම හයිය තියෙනවා. ඒ වගේම නුඹ බොහොම නීච මිනිහෙක්. නුඹ කව්ද? ජනතාවට අපහාස කරන්ට නුඹට බලය දුන්නේ කව්ද? මම නුඹව දන්නවා. නුඹේ තාත්තා යකඩ තලන්නෙක්. ඔහු තාමත් කම්මලේ වැඩ කරනවා. නුඹේ අක්කාගෙ නම නෙලී. ඈ රෙදි අපුල්ලනවා. පෝසතුන්ට බැල මෙහෙවර කරනවා. සමහර විට ඇයට ඊයේ සෙබළු වෙඩි තැබුවද දන්නේ නැහැ. නුඹ පාවාදීම් කරන දෝහියෙක්." කාපිරි තරුණයා කිව්වා.

යෝධයා පුදුම වෙලා පසුබැස්සා. කාපිරියා කී කතාව ඇත්තයි. යෝධයාට කිසිවක් තේරුණේ නැහැ.

"පලයන් යන්ට!" ඔහු යෝධයාට කිව්වා.

ඔන්න එතකොට තමා යෝධයා කාරණය තේරුම් ගත්තේ. ඔහුට කෙන්ති ආවා. ඔහුගේ මුහුණ රතු වුණා. ඔහු දැතේ ඇඟිලි අකුලා ගත්තා.

"මාව මෙතනින් එළවා දමන්න නුඹට අයිතියක් නැහැ" යෝධයා බොහොම අමාරුවෙන් කිව්වා. "මම නුඹව අඳුනන්නේ නැහැ. නුඹ යකෙක් තමා."

"මම තුනට ගණන් කරන්න ඉස්සෙල්ලා මෙතැනින් පලයන් යන්න! එකයි!" කාපිරි තරුණයා ගණන් කරන්ට පටන් ගත්තා.

බලා හිටිය පිරිස ගල් ගැහුණා. යෝධයා කාපිරියාට වැඩිය අඩියක් විතර උසයි. තුන් ගුණයක් මහතයි. නමුත් මිනිස්සු තීරණය කළා සටනක් ඇතිවුණොත් කාපිරි තරුණයා දිනයි කියලා. ඔහු බොහොම දැඩිව, ස්ථිරව, විශ්වාසයකින් හිටියා.

"දෙකයි!"

යෝධයා හිස පහත් කර ගත්තා.

"කළු යකා!" ඔහු කීවා.

"තුනයි!" කාපිරි තරුණයා ගණන් කළා.

යෝධයා අතුරුදහන් වුණා. බලා හිටිය බොහෝ දෙනා දැස් වහගෙන දැන් දැන් පහර වදින හඬ ඇසෙයි කියලා හිතාගෙන හිටියා.

ඒ ගොල්ල ඇස් ඇරලා බලනකොට යෝධයා හිටියේ නැහැ. යෝධයා වැටෙන් එහාට පැනලා දිව්වා.

"නපුරු පාලකයින් තුන්දෙනාව පන්නන්නේ ඔන්න ඔහොමයි!" කාපිරි තරුණයා අතක් ඔසවලා සතුටින් කිව්වා.

මිනිස්සු සන්තෝෂ වුණා. සමහරු අත්පුඩි ගැහැව්වා. සමහරු තොප්පි උඩදලා ඇල්ලුවා.

"මහජනයට ජයවේවා!"

"ජයවේවා! ජයවේවා!"

දෙස්තර ගස්පාර් විතරක් අසතුටු වෙලා හිස වැනුවා. ඔහු අසතුටු වුණ කාරණාව ගැන කවුරුවත් දන්නේ නැහැ.

"ඔහු කව්ද? ඔහු කව්ද? ඒ කාපිරියා කවුද?" මිනිස්සු අහන්ට පටන් ගත්තා.

"ඔහු නළුවෙක්ද?"

"අපි ඔහුව කවදාවත් දැකලා නැහැ!"

"නුඹ කව්ද?"

"නුඹ අප වෙනුවෙන් කතා කළේ ඇයි?"

"අපට කියාපන්! කියාපන්!"

මේ වේලාවේදී මෙතැනට වැරහැලි ඇඳගත් මිනිහෙක් ආවා. ඊයේ හැන්දෑවේ මල් වෙළෙන්දියන් සහ රිය කරුවන් සමග කතා කළ මිනිහා තමා ඒ. දෙස්තර ගස්පාර් ඔහුව හඳුනා ගත්තා.

"ඔන්න බලාපල්ලා! නුඹලාට පේන්නේ නැතිද අපව රවටන හැටි? මේ කාපිරියත් අර යෝධයා වගේම නළුවෙක්. මුන් ඔක්කොම හොරු. මෙයත් නපුරු පාලකයින්ගෙන් මුදල් අරගෙන." හිඟන්නා කීවා.

කාපිරි තරුණයා අත්මිට මෙළෙව්වා. හිනා වුණු පිරිස මේ වර කෝපවුණා.

"ඔව්! එක තක්කඩියෙක් අනිකාව පැන්නුවා."

"ඔහු, ඔහුගේ සගයාට පාර වදීවි කියාල වේලාසනින් ඔහුව එළවා දැම්මා."

"භංගවේවා!"

"තක්කඩියා!"

"පාවා දෙන්නා!"

දෙස්තර ගස්පාර් මොනවාදෝ කියන්න සූදානම් වුණා. පමා වුණා වැඩියි. මිනිස්සු දෙළොස් දෙනෙක් දුවගෙන ඇවිල්ලා කාපිරියාව වට

කළා.

"ඕකාට ගහපල්ලා!" මැහැල්ලක් කිව්වා. කාපිරි තරුණයා අතක් දිගු කළා. ඔහු සන්සුන්ව හිටියා.

"නැවතියල්ලා!"

වටවෙලා හිටිය මිනිස්සු හූ කිව්වා. උරුහන් බෑවා. පස්සේ නිහඬ වුණා. කාපිරි තරුණයා කතා කළා:

"මම තමා සර්කස්කාර ටිබුල්."

මිනිස්සු ටිකින් ටික ඇත් වෙලා විසිර ගියා.

"ආ!" සමහරු විශ්මය පළ කළා.

මිනිස්සු ගල් ගැහිලා බලාගෙන හිටියා. එක මිනිහෙක් ප්‍රශ්න කළා:

"නුඹ කොහොමද කළු පාට වුණේ?"

"ඒ ගැන නුඹලා දෙස්තර ගස්පාර් අර්නේරිගෙන් අහපල්ලා." ඔහු හිනාවෙලා ළඟ හිටිය දෙස්තරව පෙන්නුවා.

"හැබෑටම මේ ටිබුල් තමා!"

"ටිබුල්!"

"ජයවේවා! ටිබුල් නිරෝගීව, ජීවත් වෙනවා! ටිබුල් අප සමගයි!"

"ජයවේවා!..."

කෑ ගැසීම් හිටි හැටියේම නැවතුණා. බලාපොරොත්තු වුණේ නැති පාරක දෙයක් සිදු වුණා. දැන ටාඩ්වෙලා හිටිය මිනිස්සු කලබල වුණා. ඒ ගොල්ල නැගිටල විසිර ගියා.

"නිහඬවෙයල්ලා! නිහඬවෙයල්ලා!"

"ටිබුල්, දුවපන්, බේරිලා පලයන්!"

චතුරශ්‍රයට අසරු සෙබළු තුන්දෙනෙක් සහ අස් රියක් ආවා.

කපිතන් බොනවෙන්ටූරා සිටුවරයයි තව අසරු සෙබළු දෙදෙනෙකුයි ඉදිරියෙන් ගමන් කළා. අස්රිය ඇතුළෙ වාඩිවෙලා හිටියෙ මාලිගාවේ මහ ලියන්නා. ඔහු ටුට්ටිගේ කැඩිච්ච බෝනික්කාව අරගෙන ගිය බව දන්නවා නොවැ. ඔහු බෝනික්කාව කර පින්නා ගෙන හිටියා.

මේ කට්ටිය දෙස්තර ගස්පාර්ව හෙව්වා.

"මුර සෙබළු ඇවිල්ලා!" එක මිනිහෙක් කෑ ගහලා කිව්වා විතරයි, කීපදෙනෙක්ම වැටවල්වලට උඩින් පැනලා අතුරු දහන් වුණා.

කළු පාට අස්රිය නැවතුණා විතරයි අස්පයෝ හිස වනන්නට පටන් ගත්තා. උන්ගේ කරේ බැඳලා තියෙන පුංචි සීනුවලින් හඬ පිටවුණා.

නිල්පාට පිහාටු සෙළවුණේ සුළං පහරටයි.

අසරු සෙබළු අස්රිය ආරක්ෂා කළා.

කපිතන් බොනවෙන්ටූරාගේ කටහඬ බොහොම ගොරෝසුයි. වීණාව වයන කොට දත් කැක්කුම හැදෙනව නම්, මේ කපිතන්ගෙ කටහඬ ඇහෙන කොට දත් ගලවනවිට, දත් කඩන විට ඇතිවන වේදනාවක් ඇතිවෙනවා.

කපිතන් බෙල්ල දිගු කරලා කෑ ගැසුවා: "දෙස්තර ගස්පාර් අර්නේරිගෙ ගෙදර තියෙන්නේ කොහිද?"

ඔහු අස්පයාගේ නාස් ලනුව ඇද්ද. ඔහු අත්වලට හමින් හදපු අත් කවර දගෙනයි හිටියේ.

කපිතන් ළඟ හිටිය මැහැල්ලක් බොහොම බයවෙලා අතක් දිගු කරලා පෙන්නුවා. ඇය පෙන්නුවේ කොහෙද, මොකක්ද කියලා ඇයම දන්නේ නැහැ.

"කොහෙද?" කපිතන් බෙරිහන් දීපි.

ඒ පාර හරියට දතක් ගැලෙව්වා වගේ නොවෙයි, දත් ඇන්දම ගැලෙව්වා වගේ වේදනාවක් දැනුණා.

"මම මෙතන. මාව හොයන්නේ කවුද?"

මිනිස්සු ඔහුට ඉඩ දුන්නා. දෙස්තර ගස්පාර් හෙමිහිට අස්රිය ළඟට ආවා.

"දෙස්තර ගස්පාර් අර්නේරි ඔබද?"

"ඔව් මම තමයි."

අස් රියේ දෙර ඇරුණා.

"රියට නැගලා වාඩි වෙන්න. ඔබ ඔබේ ගෙදරට ගෙනියනවා. එහිදී ඔබට දැනගන්නට පුළුවනි අපි ආපු කාරණය ගැන."

රිය කරුවා වහාම දෙර ඇරලා දෙස්තරට වාඩි වෙන්න සලස්වලා දෙර 'පාටස් ' ගාලා වැහැව්වා.

අසරු සෙබළු තුන් දෙනයි අස් රියයි ඇතට ගියා. විනාඩියකින් වංගුවෙන් හැරුණු නිසා එය ජනයාට පෙනුණේ නැහැ.

කපිතන් බොනවෙන්ටූරා සහ මුර සෙබළු කාපිරි වෙස් අරගෙන හිටිය ටිබුල් ව දැක්කේ නැහැ. ඒ ගොල්ල ටිබුල්ව දක්කත් හඳුනාගන්නට බැහැ.

අනතුරු දුරුවුණ හැඩයි. ඔන්න හිටි හැටියේම පිරිස අතරින් එකෙක් නපුරු ලෙස කෑ ගැහැව්වා. වැටට එහා හිටිය යෝධයා ලපිතුප් බෙල්ල දිගු හැරලා කෑ ගැහැව්වා.

"හිටපිය හිටපිය කාපිරියෝ! මම දැන් මුර සෙබළු ළඟට දුවගෙන ගිහිල්ලා නුඹ ටිබුල් බව උන්ට කියන්නම්" යෝදයා ටිබුල්ට තර්ජනය කළා.

එහෙම කියලා ඔහු වැටට උඩින් පැන්නා විතරයි, වැටේ හැපිලා වැට කැඩුණා. යෝධයාගේ බර උහුලන්ට වැටට බැරිවුණා.

යෝධයාගේ කකුල ඇමැට්ටි වුණා. ඔහු දැත් වනලා කෑ ගැහැව්වා.

"නැවතියල්ලා! නැවතියල්ලා සර්කස් කාර ටිබුල් මෙතැන ඉන්නවා. ටිබුල් මෙතැන ඉන්නවා. මම ඔහුට අල්ලා ගත්තා."

ඒ පාර තවත් විපතක් ඇති වුණා. ඉලක්කයට වෙඩි තියන්න දක්ෂ. එක ඇහැක් කරකවන ස්පාඤ්ඤ ජාතිකයා ඉදිරියට ආවා. ඔහුගේ බද පටියේ එල්ලා තියනවා එක පිස්තෝලයක්. අනික් පිස්තෝලය ඔහුගේ අතේ. ඔහු වේදිකාවට නැගලා කෑ ගැහැව්වා :

"පුර වැසියනි, ටිබුල්ව මුර සෙබළුන්ට අල්ලලා බාර දෙන්ට ඕන. නැතිනම් අපට නරකයි. පුර වැසියනි, පාලකයෝ තුන්දෙනා සමග සටන් කරන්න එපා."

ඔහුගේ කතාවට එක්වුණ 'බරවා කකුල' නැමැති නැටුම් කණ්ඩායමේ ලොක්කාත් කතා කළා.

"ටිබුල් මගේ නැටුම් පෙන්වීම කඩා කප්පල් කළා. මගේ යෝධයාව පන්නා දැම්මා. පාලකයෝ තුන්දෙනා ඉදිරිපිට ඔහු පෙනුවේ වග කීමට මට බැහැ" ලොක්කා කිව්වා.

මිනිස්සු ටිබුල්ව ආරක්ෂා කළා.

නොන්ඩි ගහමින් දුවපු යෝධයාට අස්පයින් පිට ගිය මුර සෙබළුන් ළඟට යන්ට බැරි වුණා. ඔහු ආපහු චතුරශ්‍රයට ආවා. යෝධයා කේන්තියෙන් ටිබුල්ව හොයනවා. ස්පාඤ්ඤ ජාතිකයා වේදිකාව උඩට නැගලා පිස්තෝල දෙකම අතට ගත්තා. නැටුම් කණ්ඩායමේ ලොක්කා ලොකු වළලු වගයක් අතට ගත්තා. සර්කස් වලදී සතුන් ඒ වළලු ඇතුලෙන් පනිනවා. ඔහු ඒවා ඒ මේ අත වැනුවා. ස්පාඤ්ඤ ජාතිකයා වෙඩි තියන්ට කුරුමාණම් අල්ලනවා.

වහාම පැනලා දුවන්ට ඕන කියාල ටිබුල් තීරණය කළා. මිනිස්සු පිසිරිලා ගියා. ටිබුල් චතුරශ්‍රය ළඟ තිබුණු වැටෙන් එහාට පැනලා, වැටේ සිදුරකින් බැලුවා. යෝධයයි, ස්පාඤ්ඤ ජාතිකයයි, 'බරවා කකුලේ' ලොක්කයි වැට දිහාට දුවනවා. ඒ ගොල්ල දුවන හැටි බලලා ටිබුල්ට හිනා. පිස්සු හැදිච්ච අලියකු වගේ යෝධයා දුවනවා. ස්පාඤ්ඤ

ජාතිකයා මීයකු වගේ උඩ පනිනවා. 'බරවා කකුලේ' ලොක්කා වෙඩි වැදුණු කාක්කෙකු වගේ නොන්ඩි ගහනවා.

"ටිබුල් අපි නුඹව පණ පිටින් අල්ලා ගන්නවා" තුන් දෙනාම කීවා. "වහාම යටත් වෙයන්."

ස්පාඤ්ඤ ජාතිකයා දත් සපනවා. පිස්තෝලය වනනවා. 'බරවා කකුල' නාටක මණ්ඩලයේ ලොක්කා කඩදසි වළල්ල වනනවා.

ටිබුල් එළවළු කොටුවකට වෙලා ඔවුන් පිළිගන්න සූදානම් වුණා. ඒ එළවළු කොටුවේ ගෝවා, බීට්රූට්, තම්පලා ආදිය වැවිලා.

සුළං හමන්ට වුණා. අහස නිල් පාටයි, පිරිසිදුයි.

තුන් දෙනාම එළවළු කොටුවට ළං වුණ හැටියේම සටනක් පටන් ගත්තා.

"ටිබුල් නුඹ මෙතනද?" යෝධයා ඇහුවා.

කිසිවෙක් පිළිතුරු දුන්නේ නැහැ.

ස්පාඤ්ඤ පිස්තෝල කාරයා කතා කළා:

"වහාම යටත් වෙයන්, මගේ දෑත් වල පිස්තෝල දෙකක්. ඉතාම ඉස්තරම් පිස්තෝල 'තක්කඩියා සහ පුත්‍රයා' නැමැති සමාගමේ කම්හල් වල හදපු ඒවා. ඉලක්කෙට වෙඩි තියන්න මා තරම් දක්ෂ මිනිහෙක් නැතිබව නුඹ දන්නවා නොවෙද?"

ටිබුල් වෙඩි තියන ශාස්තරේ දන්නේ නැහැ. ඔහු අත පිස්තෝලයක් පවා තිබුනේ නැහැ. දැන් නම් ඔහු ළඟ පිස්තෝල වෙනුවට තියෙන්නේ ගෝවා ගෙඩි. ටිබුල් ඉක්මණින් ලොකු බරැති ගෝවා ගෙඩියක් කඩලා වැටෙන් එහාට වැරෙන් වීසිකළා. ඒක වැදුනේ කාගේ ඇඟේද දන්නවද? බරවා කකුලේ ලොක්කාගේ බඩේ. ටිබුල් තවත් ගෝවා ගෙඩි දෙකක් කඩලා වීසි කළා. ඒවා බෝම්බ වගේ පිපිරුණා.

හතුරෝ තුන්දෙනා කලබල වුණා.

ටිබුල් හතර වැනි ගෝවා ගෙඩිය කඩන්ට පාත්වුනා. ගෝවා ගෙඩිය දෙපැත්තෙන්ම අල්ලලා අදිනවා, අදිනවා කඩා ගත්ට බැහැ. ඒ විතරක් යැ! ගෝවා ගෙඩිය කතා කළා:

"මම ගෝවා ගෙඩියක් නෙවෙයි. මගේ ඔළුව අතහරින්න. මම පුංචි ළමයින්ට බැලුන් බෝල විකුණන වෙළෙන්ද. මම නපුරු පාලකයින් තුන් දෙනාගේ කුස්සියේ තඹ හැලියට රිංගුවා. ඒක උමං ගෙයක්. එළියට ආවේ මේ එළවළු කොටුවෙන්. ඒක බොහොම දිග උමං ගෙයක්."



ගෝවා ගෙඩියක් මිනිහෙක් වගේ කතා කරනවා ඇහුණට ටිබුල්ට විශ්වාස කරන්ට බැහැ.

ටිබුල් බිමට පාත්වෙලා කතා කරන ගෝවා ගෙඩිය දිහා හොඳට බැලුවා. ඇස් වලින් පේන හන්දා ඔහු විශ්වාස කළා. කඹය දිගේ යන ටිබුල් වගේ කෙනෙකුගේ ඇස් පෙනීම ගැන විශ්වාස කරන්ට ඕන.

ඇත්තටම බැලුන් වෙළෙන්දගේ ඔළුව ගෝවා ගෙඩියකට වඩා වෙනස්. හැබැයි ඔහුගේ ඔළුව බොහොම වටකුරුයි. තේ පෝච්චියක් වගේ. නහය තේ පෝච්චියේ හොට වගෙයි.

ඒ වේලාවේදී බැලුන් වෙළෙන්දා උමං මග දිගේ ඇවිල්ලා එළියට ඔළුව දම්මා විතරයි. ඔහුගේ ඔළුව පස් වලින් පිරිලා.

"ආයුබෝවන්!" ටිබුල් බැලුන් වෙළෙන්දට කිව්වා.

වෙළෙන්දා ඔහු දිහා බැලුවා. වෙළෙන්දගේ ඇස් දෙක මොරගෙඩි වගේ වටකුරුයි.

"මගේ බැලුන් ටික මම පුංචි බක්කරේලාට දුන්නා. උන් මාව මේ උමං මගට දම්මා... අන්න බලන්න මගේ බැලුන් ඉගිලෙනවා..."

ටිබුල් අහස දිහා බැලුවා. ඈත, ඈත නිල්පාට අහසේ රෝසපාට බැලුම් බෝලයක් පාවෙන හැටි ඔහුට පෙනුණා.

පුංචි බක්කරේලා අතින් ඉගිල්ලිලා ගිය බැලුන් බෝල වලින් එකක් තමා එය.

ටිබුල් ව අල්ලන්ට ආපු තුන්දෙනා පහර දීමට අර ඇන්ද. අහසේ පාවෙන බැලුන් බෝලය ඔවුන්ටත් පෙනුණා. ස්පාඤ්ඤ ජාතිකයා බැලුන් බෝලය දුටු හැටියේම ඔහුට අනික් හැම දෙයක් ගැනම අමතක වුණා. ඔහු අහස දිහා බලලා එක ඇහැක් අඩවන් කරලා පිස්තෝලය එල්ල කරලා මෙහෙම කිව්වා:

"අර බලාපල්ලා! ඈත අහසේ පාවෙන බැලුම්බෝලය මම හරියට ඉලක්කෙට වෙඩි තියනවා. ඕන කෙනෙක් එක්ක රන් කාසි දහයකට ඔට්ටු ඇල්ලීමට මම ලෑස්තියි. වෙඩිතියන්න මට වැඩිය දක්ෂ මිනිහෙක් මේ රටේ නැහැ."

අනික් දෙන්නා ඔට්ටු ඇල්ලීමට කැමැති වුණේ නැහැ. ස්පාඤ්ඤ ජාතිකයා ඔට්ටු අල්ලන්න කිය කියා බල කරනවා. යෝධයටයි, 'බරවා කකුලේ' ලොක්කාටයි කේන්ති ගියා.

"බුරුවා! ගොන් බූරුවා! බැලුන් වලට වෙඩි තියන්න වෙලාවක් නොවෙයි මේ. ඇයි බුරුවෝ අපි ටිබුල්ව අල්ල ගන්ට ඕන. නිකම් මූනිස්සම් නාස්ති කරන්ට එපා" යෝධයා බැන්නා.

ස්පාඤ්ඤ ජාතිකයාට ඒ බැනුම් හරියට බීරි අලියාට වීණා ගහන්නා වගෙයි. බැලුන් බෝලයට වෙඩි තියනකල් ඔහුට ඉවසුම් නැහැ. ඔහු පිස්තෝලයෙන් ඉලක්කය අල්ලන්ට වුනා. ඔවුන් බැලුන් බෝලය දිහා බලාගෙන බැණ ගන්නා කොට, ටිබුල් උමං මගේ හිටිය බැලුන් බෝල වෙළෙන්දව එළියට ඇදලා ගත්තා. වෙළෙන්දගේ ඇඟේ කේක් කැලි, පැණි වලට ඇලුණු කජු, ක්‍රිම්, පස්, වැලි ඔක්කොම එකට ලඩ ගැහිලා ඔහු දිහා බලන්නත් පුදුමයි.

උමං ගෙයි සිදුර හරියට ලොකු බෝතල කටක් වගෙයි. ඒ සිදුරට පස් වැටෙන කොට හඬක් ඇතිවුණා.

ස්පාඤ්ඤ ජාතිකයා වෙඩි තිබ්බා. වැදුනේ බැලුම් බෝලයට නොවෙයි, 'බරවා කකුලේ' ලොක්කාගේ තොප්පියටයි. ඔහුගේ තොප්පිය යාරයක් විතර උසයි. ඒ අතර ටිබුල් එළවළු කොටුවේ වැටෙන් පැනලා යන්ට ගියා.

ලොක්කාගේ හිසේ තිබුණු කොළපාට තොප්පිය දුම් බටයක් වගේ බිම වැටුණා. ස්පාඤ්ඤ ජාතිකයා බොහොම කලබල වුණා. දක්ෂ වෙඩි තබන්නා හැටියට ලබාපු කීර්තියත් නැතිව ගියා. 'බරවා කකුල'

නාටක මණ්ඩලේ ලොක්කාට ඔහු ගැන තිබුන හැඟීමත් නැතුව ගියා.

"ආ බොල කපටියා!" ලොක්කා කෝප වෙලා බැන්නා. ඔහුගේ අතේ තිබුණු වළල්ලෙන් ඔහු පිස්තෝල කාරයාට ගැහැව්වා.

පිස්තෝල කාරයාගේ බෙල්ල වටේ කඩදාසි වළල්ල වැටිලා.

යෝධයා මේ සටනට මැදිහත් වුණේ නැහැ. නමුත් වෙඩි සද්දෙට බල්ලෝ රැළක් දුවගෙන ආවා. එක බල්ලෙක් යෝධයාගේ ඇඟට කඩා පැන්නා.

"පුළුවන් අය බේරිලා දුවපල්ලා!" යෝදයා කෑ ගහලා දුවන්ට පටන් ගත්තා.

තුන් දෙනාම බල්ලන්ට බයේ දුවනවා.

බැලුන් වෙළෙන්ද නැගිටලා වටපිට බැලුවා. තුන් දෙනාම එළවළු කොටුවේ කොළ පෝර ගොඩට එහා තියන පල්ලම දිගේ පෙරළි පෙරළී දිව්වා යෝධයාගේ එක කකුලක් බල්ලෙක් හපා කෑලා. ඔහු නොන්ඩි ගහනවා. 'බරවා කකුල' නැටුම් කණ්ඩායමේ ලොක්කා ගහක එල්ලිලා ඉන්නවා. ස්පාඤ්ඤ ජාතික පිස්තෝල කාරයා බල්ලන්ට වෙඩි තියනවා. නමුත් වෙඩි වදින්නේ එළවළු කොටුවේ හිටවලා තියෙන පඹයාටයි.

බල්ලෝ පල්ලම ළඟට ඇවිල්ලා නැවතුණා. උන් පල්ලම දිගේ දුවන්ට කැමති නැතුවා වගෙයි. යෝධයාගේ කකුල හපා කෑ බල්ලා උගේ රතුපාට දිව වනලා, දත් විරිත්තලා, වලිගය වැනුවා.

6

බලාපොරොත්තු නොවූ දෙයක්

ටිබුල් කාපිරි වෙස් ගත් හැටි දෙස්තර ගස්පාර්ගේන් අහලා දැනගන්ටයි කිව්වා මතක ඇති නේද?

අපට දෙස්තරගෙන් අහන්නේ නැතුව ඒ ගැන අනුමාන කරන්ට පුළුවනි. ටිබුල් ජනතා කැරැල්ල පැරදුණ හැටියේම පැනලා ගියා. මුර සෙබළු ඔහු පසු පස ගිහිල්ලා කම්කරු ගෙවල්වලට ගිනි තිබ්බා. තරු පහන අසලදී ටිබුල්ට වෙඩි තැබුවා. යකට රිට දිගේ දුවලා ගිහිල්ලා වහළේ දුම් බටයකට ඇතුළු වෙලා දෙස්තර ගස්පාර්ගේ ගෙදර ලිප අස්සෙන් රිංගලා ටිබුල් එළියට ආවා. නමුත් ටිබුල් කොයි මොහොතේ

හරි සෙබළුන්ගේ අතට අහුවීමට ඉඩ තිබුණා. අවදානම බොහොම විශාලයි. බොහෝ දෙනෙක් ටිබුල් ව අඳුණනවා.

ලොකු කඩ අයිති බඩ මහත මුදලාලිලා සියල්ලම නපුරු පාලකයින් තුන්දෙනාට පක්ෂයි. දෙස්තරගේ ගෙය ළඟ ගෙවල්වල ඉන්න පොහොසත් උදවිය, ටිබුල් ගස්පාර්ගේ ගෙදර හැංගිලා ඉන්නවයි කියලා මුර සෙබළුන්ට ඔත්තු කියාවි.

ටිබුල් ලිප අස්සෙන් එළියට ආපු හැටියේම ගස්පාර් ඔහුට මෙහෙම කිව්වා:

"යාළුවා නුඹගෙ රූපෙ වෙනස්කරන්ට ඕන."

දෙස්තර ටිබුල්ව වෙනින් මිනිහකු කළා.

ඔහු ටිබුල්ට කතා කළා:

"නුඹ යෝධයෙක්. නුඹේ පපුව බොහොම ලොකුයි. උරහිස් පළලයි. දත් කිරිවගේ සුදු පාටයි: කොණ්ඩෙ කළුයි, මුදු වගේ කැරලි ගැහිලා. නුඹේ හම සුදු පාටට නොතිබුණා නම් යාළුවා නුඹව උතුරු ඇමෙරිකාවේ ඉන්න කාපිරි, නීග්රෝ ජාතිකයෙකු හැටියට ගණන්ගන්ට පුළුවනි. ඉතින් ඒ හන්දා මම නුඹව නීග්රෝ කාරයකු කරන්නම්.

දෙස්තර ගස්පාර් අර්නේරි වෙදකම විතරක් නොවෙයි, තවත් විද්‍යා සියයක් විතර දන්නා බව කීවා මතකද. ඔහු ඒ වගේම කරුණාවන්ත මිනිහෙක්. ඔහු විවේක ගන්නා විටත් පරීක්ෂණ පවත්වනවා. ඔහු ඒ වගේ දේවල් කරන්ට බොහොම කැමතියි. දෙස්තර ගස්පාර් දෙමව්පියෝ නැති අසරණ ළමයින්ට තෑගි දුන්නා. ඒ ගොල්ලන්ට සතුටු කරවන්න මල් වෙඩි හදලා පත්තු කළා. සෙල්ලම් බඩු හැදුවා. සංගීත භාණ්ඩ හැදුවා. බොහොම අපූරු සෙල්ලම් බඩු හදලා ළමයින්ට තෑගි කළා.

"යාළුවා ඔන්න බලනවා. මේ බෝතලේ වතුර වගේ පාටක් නැති බෙහෙතක්. මේ බෙහෙත ඇඟේ ගාපු හැටියෙම හුළං වලට වේලිලා හම කළුපාට වෙනවා. ඒක දැලි අඟුරු කළු නොවෙයි. දම්පාටට හුරු කළු පාටක්. හරියටම ඇමෙරිකන් නීග්රෝ ලාගේ පාට. මෙන්න මේ බෝතලේ තියෙනව වෙනින් බේත් වතුරක්. ඇඟේ ගාපු හැටියෙම ආයෙමත් සුදුපාට වෙනවා." දෙස්තර විස්තර කළා.

ටිබුල් එයාගෙ සර්කස් ඇඳුම ගළවලා බෙහෙත් වතුර ඇඟ පුරාම ගා ගත්තා. ඒ බේත පෙරුම්කායම් පුසුඹයි.

පැයක් ගතවුණු හැටියේම ටිබුල් හැබෑ කාපිරියෙක් වුණා.

අන්න ඒ වේලාවේදී තමයි හනිමේද් නැන්ද දොස්තර ගේ බේත් කාමරයට ආවේ. ඉතිරි හරිය ළමයි දන්නවා නෙව.

දැන් අපි දෙස්තර ගස්පාර්ට මොකද වුණේ කියල හොයල බලමු. බොනවෙන්ටූරා කපිතාන් දෙස්තරව හොයන්ට ආවා. කඩපලේදී දෙස්තර අස්රියට නැගලා ගියා.

අස්රිය බොහොම වේගයෙන් දිව්වා. ලපිතුප් යෝධයාට පවා එය ළඟට කිට්ටු වෙන්ට බැරි වුණා.

අස්රිය ඇතුළෙ බොහොම කළුවරයි. මහ ලියන්නාගේ උකුලේ හිටියේ පුංචි ගෑනු ළමයෙක් කියලා බෝනික්කාව දැකපු ගස්පාර් හිතුවා.

මහ ලියන්නා නිහඬව උන්නා. බෝනික්කාත් එහෙමයි.

"සමාවෙන්න මම මේ ආසනයෙන් වැඩි කොටසක ඉඳගත්තා නේද?" දෙස්තර ගස්පාර් මහ ලියන්නාගෙන් ඇසුවා.

මහ ලියන්නා ටිකක් සැරෙන් වගේ කතා කළා:

"කලබලවෙන්ට එපා."

පාර දෙපැත්තේ පහන් කණු වලින් එළිය අස්රිය ඇතුළට ඉඳ හිට වැටෙනවා. ටික වේලාවකින් දෙස්තරගේ ඇස් කළුවරට පුරුදු වුණා. මහ ලියන්න්නාගේ නහය බිලී කටුවක් වගේ වක ගැහිලා තියෙන හැටිත්, ගෑනු ළමයාගේ ඇස් දෙක බාගෙට වැහිලා තියෙන හැටිත් එතකොට දෙස්තරට පෙනුණා. නමුත් සුදුමැලි වෙලාද කියලා හරියට හොයගන්ට බැහැ, කළුවර හන්ද.

"අනේ පව්. මේ ළමයා ලෙඩ වෙලා වෙන්ට ඕන." දෙස්තර කල්පනා කළා.

ඔහු නැවත මහ ලියන්නට කතා කළා:

"මට හිතෙන්නෙ මගේ උදව් ඕන වෙලා තියෙනවා කියලා. එහෙම නේද?" ඔහු ඇහුවා.

"ඔව් ඔබේ ආධාරය ඕන" මහ ලියන්නා කීවා.

"මේ ළමයා මහත පාලකයින් තුන්දෙනාගෙ ලේලි කෙනෙක් වෙන්ට ඕන. නැත්නම් ටුට්ටිගේ යාළු කෙනෙක් වෙන්ට ඕන" දෙස්තර ගස්පාර් දිගටම කල්පනා කළා. "ඇගේ ඇඳුම බොහොම වටිනවා. මාලිගාවේ ඉඳලයි ගෙනෙන්නේ. කපිතන් රිය කැටුව යනවා. ඒ කරුණු අනුව කල්පනා කරන විට, මේ ළමයා බොහොම වැදගත් කෙනෙක් වෙන්ට ඕන. නමුත් ටුට්ටි ළඟට පණ ඇති ළමයින්ට යන්ට අවසර නැහැ. මේ පුංචි දේවදූතිය ඔහු ළඟට ගියේ කොහොමද?" දෙස්තර ගස්පාර් කල්පනා කළා.

දෙස්තරට හරි නිගමනයක් කරන්ට බැහැ. ඔහු ආයෙමත් මහ ලියන්නා සමග කතාවට වැටුණා.

"මේ ළමයාගේ අසනීපය මොකක්ද? ගලපටල රෝගයද?"

"නැහැ ඇගේ පපුවේ සිදුරක්."

"ඔබ කියන්න හැදුවේ ඇගේ පෙනහළු නරක්වෙලා කියලද?" දෙස්තර ඇහුවා.

"නැහැ. ඇගේ පපුවේ සිදුරක්" අයෙමත් මහ ලියන්නා කිව්වා.

ආචාරශීලී දෙස්තර තර්ක කරන්ට ගියේ නැහැ.

"අසරණ ළමයා!" දෙස්තර සුසුම් ලෑවා.

"ළමයෙක් නොවෙයි, බෝනික්කෙක්." මහ ලියන්නා පැහැදිලි කළා.

දැන් අස්රිය දෙස්තරගේ දොර ළඟට ඇවිල්ලා.

බොනික්කාව වඩාගෙන මහ ලියන්නයි, බොනවෙන්ටූරා කපිතනුයි දෙස්තර ගෙදරට ඇතුළු වුණා. දෙස්තර ඒ ගොල්ල එක්ක බෙහෙත් කාමරයට

ගියා.

"මේක බෝනික්කෙකු නම් මේ ගොල්ල මා ළඟට ආවෙ මොකටද?" දෙස්තර කල්පනා කළා.

මහ ලියන්නා විස්තර කළාම දෙස්තරට පැහැදිලි වුණා.

උදේ අතට අහුවුණු මීයා පැනලා ගිය නිසා, කාපිරි තරුණයාව දැකලා බයවුණු නිසා බොහොම කලබල වෙලා හිටිය හනිමේද් නැන්ද, හෙමින් හෙමින් දොර ළඟට ඇවිත් යතුරු සිදුරෙන් බැලුවා. ඈ මහ භයානක කපිතන් බොනවෙන්ටූරව දැක්කා. ඔහු කඩුව අල්ලාගෙන හිටියා. ඔහුගේ සපත්තු දණහිස් ළඟටම උසයි. සපත්තු අඩි බොහොම දිගයි. ලෙඩවෙලා හිටිය ගෑනු ළමයකුව මහ ලියන්නා ඇඳි පුටුවක් මත වාඩි කරවන හැටි ඈ දැක්කා. ළමයාගේ ගවුම රෝසපාටයි. ළමයා ඔළුව පාත් කරගෙන දෙපා දිහා බලාගෙන ඉන්නවා වගෙයි. ඇගේ දෙපාවල සපත්තු සුදු පාටයි. රත්රන් මල් වැඩ දලා, බොහොම ලස්සනයි.

මහපාරේ කුණාටුව බොහොම තදයි. ඒ හන්ද නැන්දට ඔවුන්ගේ කතාව අහන්ට බැරි වුණා.

එහෙත් ඈට සමහර දේ තේරුණා.

මාලිගාවේ මහ ලියන්නා නපුරු පාලකයින් තුන් දෙනාගේ ඇමති මණ්ඩලයේ නියෝගය පෙන්නුවා. දෙස්තර බොහොම කලබල වෙලා එය කියෙව්වා.

"හෙට උදේ වෙන කොට බෝනික්කාට පණ ලැබිල තියෙන්ට ඕන." මහ ලියන්නා පුටුවෙන් නැගිටින ගමන් කිව්වා.

කපිතන් සපත්තු එකට හැප්පෙව්වා.

"ඔව්. ඒ උණාට..." දෙස්තර දෑත් වනලා කතා කළා: "මම උත්සාහ කරන්නම්. නමුත් පොරොන්දු වෙන්ට පුළුවන්ද? මේ පුදුම බෝනික්කාගේ යන්ත්‍ර ගැන මට දැනුමක් නැහැ. මම එය ඉගෙන ගන්ට ඕන. කැඩුණු තැන හොයලා බලන්ට ඕන. මේවා කරන්ට වේලාව ගතවෙනවා. සමහර විට බොහොම කල් යාවි. සමහර විට එය මට හදන්ට බැරුව යාවි... බෝනික්කාට පණ දෙන්ට බැරුව යාවි... මට කියන්ට බැහැ. මේ තරම් කෙටි කාලයකින්... එක රැයකින්... මට පොරොන්දු වෙන්න බැහැ..." දෙස්තර විස්තර කළා.

මහ ලියන්නා ඔහුගේ කතාවට බාධා කරලා දබරැඟිල්ල පෙන්නලා මෙහෙම කිව්වා:

"ඔටුන්න හිමි ටුට්ටිගේ දුක බොහොම ලොකුයි. ඒ නිසා පමා කරන්න බැහැ. හෙට උදේ වෙනකොට බෝනික්කාට පණ දෙන්ට ඕන. පාලකයෝ තුන්දෙනා අණ කරලා තියෙන කොට කාටවත් බැහැ එය වෙනස් කරන්ට. හෙට උදේට පණ ඇති බෝනික්කාව මාලිගාවට ගේන්ට ඕන."

"ඔව්. ඒ උණාට..." දෙස්තර කතා කරන්න හැදුවා.

"කතා කිරීමෙන් පලක් නැහැ! දෙස්තර! හෙට උදේ එළිය වැටෙන කොට බෝනික්කාට පණ දීලා තියෙන්ට ඕන. ඔබ එය ඉටු කළොත් ඔබට තෑගි ලැබේවි. බැරිවුණොත් ඔබට බරපතල දඬුවම් කරාවි.

දෙස්තර තිගැස්සුණා.

"මම උත්සාහ කරන්නම්. බොහොම ලොකු වගකීමක් නෙව..."

"සත්තකින්ම" දෙස්තරගේ කතාවට බාධා කළ මාලිගාවේ මහ ලියන්නා මෙසේ දන්වා හිටියා. "මම ඔබට පාලකයෝ තුන් දෙනාගේ නියමය බාර දුන්නා. ඔබ එය ඉටු කළ යුතුයි. ආයුබෝවන්!"

හනිමේද් නැන්දු යතුරු සිදුරෙන් බලාගෙන කතාව අහගෙන ඉඳලා ඉක්මනට තමාගේ කාමරයට දිව්වා. ඒ කාමරයේ මුල්ලක මීයා කේජු කකා හිටියා. භයානක අමුත්තෝ පිටවෙලා ගියා. මහ ලියන්නා අස්රියට නැගලා වාඩිවුණා. කපිතන් අස්පයා පිට උඩ නැග්ගා. අසරු සෙබළුයි, අස් රියයි ගමන් ගත්තා.

ටුට්ටිගේ බෝනික්කා දෙස්තරගේ බෙත් කාමරයේ තියෙනවා.

දෙස්තර අමුත්තන්ව පිටත් කරලා හනිමේද් නැන්දු ළඟට ඇවිත්, හෙමිහිට මෙහෙම කිව්වා.

"නැන්දේ මතක තියාගන්න. මම නුවණ තියෙන මිනිහකු හැටියටත්, දක්ෂ වෙදකු හැටියටත්, දක්ෂ ශිල්පියකු හැටියටත් ප්‍රසිද්ධයි. නමුත් හෙට උදේ වෙනකොට ඒව සියල්ල විතරක් නොවෙයි, මගෙ ඔළුවත් නැතිව යාවි. මුළු රැයම නිදි නැතිව වැඩ කරන්ට ඕන. නැන්දට තේරුණා ද?" දෙස්තර නපුරු පාලකයෝ තුන්දෙනා එවාපු නියෝගය ලියලා ඇති කඩදාසිය වනලා අයෙමත් කතා කළා: "මට බාධා කරන්න එපා. සද්ද කරන්න එපා. පිඟන් හප්පන්න එපා. ලිප පත්තු කරලා දුම් ගස්සන්න එපා. කුකුළන්ට අඬගහන්න එපා. මීයන් අල්ලන් එපා. බිත්තර බැදිලි, අරිස්ට වලට අරළු කළවම් කිරීම වගේ දේ කරන්ට එපා. නැන්දට තේරුණාද?"

දෙස්තර ගස්පාර්ට බොහොම කේන්ති ඇවිල්ලා.

හනිමේද් නැන්දගේ කාමරයට ගිහිල්ලා දෙර වහගෙන කල්පනා කළා:

"හරිම භයානකයි. බොහොම භයානකයි. මට නම් මේවා කිසි දෙයක් තේරුම් ගන්ට බැහැ. කාපිරියෙක්. බෝනික්කෙක්. නියෝගයක්. බොහොම නරක කාලයක් ලබලා!"

හිත සන්සුන් කරගන්ට නැන්දගේ තමාගේ ලේලිට ලියුමක් ලියන්ට පටන් ගත්තා. ලියන කොට පෑන කිටි කිටි ගාන සද්දෙ ඇහෙන්නේ නැති වෙන්ට බොහොම ප්‍රවේසමින් ලියන්නට වුණා. දෙස්තරට බාධා කරන්ට නැන්දගේ කැමති නැහැ.

නැන්දගේ ලේලිට දෙස්තරගේ හපන්කම් ගැන කියනවා. ඊයේ උදේ බේත් කාමරයේ ඉඳල එළියට ආපු ලස්සන කාපිරි තරුණයා ගැන ලියන්න වුණා.

"...ඔන්න ඉතින් අපේ දෙස්තර ඔය ලස්සන කාපිරියත් එක්ක කඩපොළට ගියා. ආවේ මාලිගාවේ අස් රියෙන්. මුර සෙබළු තුන් දෙනෙකුත් ආවා. මහ ලියන්නා බෝනික්කෙක් ගෙනාවා. හරියට පණ පිටින් ඉන්න ගෑනු ළමයකු වගෙයි. හැබැයි අර ලස්සන කාපිරියා ආවේ නැහැ. ඔහු කොහෙ ගියාද. මා දන්නේ නැහැ..."

කාපිරි තරුණයා නොඑහොත් ටිබුල් කොහෙ ගියාද කියලා කල්පනා කළේ හනිමේද් නැන්දගේ විතරක් නොවෙයි, දෙස්තර ගස්පාරුත් ඔහු ගැන කල්පනා කළා. බෝනික්කාට අලුත් වැඩියා කරන ගමන්ම ඔහු ටිබුල් ගැන කල්පනා කළා. දෙස්තර කේන්තියෙන් තනියම කතා කරන්න පටන් ගත්තා:

"ප්‍රවේසම් වුණේ නැහැ! මම ටිබුල්ව නියම නීග්‍රෝ කාපිරියකු කළා. කිසි කෙනකුට බැහැ ඔහුව අඳුණා ගන්ට. ඔහු දහහතරවැනි කඩ පොළේදී මේ රහස මිනිසුන්ට හෙළි කළා. ටිබුල්ව අල්ලා ගනීවි... පරිස්සම් නොවී හිතුමතේට වැඩ කළා. යකඩ කුඩුව ඇතුළට වැටෙන්ට ටිබුල් ආසාද?"

දෙස්තර ගස්පාර් බොහොම කලබල වෙලා. ඉස්සෙල්ලා ටිබුල් පරිස්සම් නොවී හැසිරුණා. දැන් මේ බෝනික්කා... පෝරක දහයක් තඩු අහන කොටුවේ හදලා තියෙනවා...

"බොහොම නරක කාලයක්!" දෙස්තර කෑ ගැසුවා.

අද කැරලිකරුවන් මරා දැමීම කල් දමා තිබෙන බව දෙස්තර දැනගෙන හිටියේ නැහැ. මාලිගාවේ මහ ලියන්නා වැඩිය කතා කළේ නැහැ. මාලිගාවේ සිදුවූ දේ ගැන ඔහු දෙස්තරට කිව්වේ නැහැ.

දෙස්තර බෝනික්කා දිහා බලලා කල්පනා කළා:

"මේ තුවාල කොහින්ද? මේවා කඩුවකින් වගේ අවියකින් කරපු තුවාල. මේ අපූරු බෝනික්කෙකුව කඩලා දමලා... එය කළේ කවුද? ඔටුන්න හිමි ටුට්ටි කුමාරයාගේ බෝනික්කාව කැඩුවේ කවුද?"

මුර සෙබළු බෝනික්කාව කඩුවෙන් කොටපු බව දෙස්තර දැනගෙන හිටියේ නැහැ. මාලිගාවේ සේවය කරන මුර සෙබළු පවා නපුරු පාලකයින් තුන්දෙනාට විරුද්ධව නැගිටලා දුප්පත් මහ ජනයාගේ පැත්තට එන බව දෙස්තර කොහොමටවත් දැන හිටියේ නැහැ. ඔහු ඒ ගැන දැනගෙන හිටියා නම් බොහොම සතුටු වේවි!

දෙස්තර බෝනික්කාගේ මුහුණ දැතට අරගෙන සැලකිල්ලෙන් බැලුවා. ඒ වේලාවේ ජනේලයෙන් ඉර අව්ව බෝනික්කාගේ මූණට වැටුණු හන්ද එය දිලිසෙන්නට වුණා.

"පුදුමයි, බොහොම පුදුමයි. මේ වගේ මුහුණක් මම කොහෙදෝ දැකලා තියෙනවා... ඔව්, සත්තකින්ම දැකලා තියෙනවා! කොහිද? කවදද? මතක නැහැ. බෝනික්කාගේ මුහුණ පණ ඇති ගෑනු ළමයකුගේ මූණ වගෙයි. මඳ සිනා පානවා වගෙයි. එක වෙලාවකදී ඒ බෝනික්කා සතුටු වෙනවා වගේ. තවත් වෙලාවකදී දුක් වෙනවා වගේ. හැබෑටම පණ ඇති මුහුණක්... ඔව්, ඔව්, මේ වගේම ගෑනු ළමයකු මම දැකලා තියනවා. ළඟ පෙනීම දුර්වල හන්ද මට හරියට මතක තියා ගන්න බැහැ." දෙස්තර ගස්පාර් බෝනික්කා දිහා බල බලා කල්පනා කළා.

ඔහු බෝනික්කාගේ මුහුණ තමාගේ මුහුණට බොහොම ළං කරගෙන බැලුවා.

"කොතරම් පුදුමාකාර බෝනික්කෙක්! හැබෑම දක්ෂ ශිල්පියෙක් මේ බෝනික්කාව හදලා තියෙනවා. අනික් බෝනික්කෝ වගේ නොවෙයි. අනිත් බෝනික්කන්ගේ ඇස් නිල් පාටයි, කිසිදෙයක් ගැන කල්පනා කරන හැටි ඒ ඇස් වලින් පෙනෙන්නේ නැහැ. නහය පොඩ්ඩක් උඩු අතට හැරිලා. තොල් මල් පෙති වගේ. කොණ්ඩෙ රන්වන් පාටයි. හැම බෝනික්කාම ඒ වගෙයි. එහෙත් මේ බෝනික්කා අනිත් එවුන් වගේ නොවෙයි. පණ ඇති හැබෑ ගෑනු ළමයෙක් බෝනික්කකු වුණා

වගෙයි!" දෙස්තර තනියම කල්පනා කරනවා.

තමාට හැදීමට බාර කරපු බෝනික්කා දිහා බලලා දෙස්තර බොහොම සතුටු වුණා. බලන්ට, බලන්ට ඔහුට මතක් වෙන්නේ මේ බෝනික්කා වගේම ගෑනු ළමයකුව ඔහු දැකපු බවයි. බළල් ඇස් ඇති, අවුල් වෙච්ච කෙස් ඇති ළමයකුව දැකපු බව දෙස්තරට හොඳට මතකයි. බෙල්ල හරවලා බලන හැටි ඔහුට බොහොම හොඳට මතකයි. දෙස්තර බොහොම හුඟාක් වෙලා බෝනික්කා දිහා බලාගෙන හිටියා.

දෙස්තර ළමයකුට වගේ බෝනික්කාට කතා කළා:

"බෝනික්කෝ, බෝනික්කෝ නුඹේ නම මොකක්ද?"

බෝනික්කා කොහොමද කතා කරන්නේ. ඌ ගොළුවෙලා. බෝනික්කා කැඩිලා. ඌට ආයෙමත් පණ දෙන්ට ඕන. ඌට කටහඬ ලබා දෙන්ට ඕන. හිනා වෙන්න, නටන්න ගෑනු ළමයකු වගේ හැසිරෙන්න පුළුවන් වෙන විදිහට බෝනික්කාව හදන්න ඕන.

"බෝනික්කා අවුරුදු දෙළහක ගෑනු ළමයකු වගෙයි."

පමා කරන්ට බැහැ. දෙස්තර බෝනික්කාව අලුත් වැඩියා කිරීමට පටන් ගත්තා. "මේ බෝනික්කාට පණ දෙන්න ඕන..."

හනිමේද් නැන්දෑ ලේලිට ලියුම ලියලා ඉවර කළා. පැය දෙකක් තිස්සේම ඈ නිකම් ඉන්නවා ඊට පස්සේ ඈ මෙහෙම කල්පනා කළා: 'දෙස්තරට නියම කරපු හද්සි වැඩේ මොකක්ද? බෝනික්කා මොකාද?' බලන්නට ඕන."

නැන්දෑ හෙමිහිට බෙහෙත් කාමරයට ගිහිල්ලා යතුරු සිදුරෙන් බැලුවා. සිදුරට යතුර දමලා තිබුණු නිසා කිසිවක් පෙනුණේ නැහැ. ඈ යන්ට හැරෙන කොටම, දෙස්තර දෙර ඇරගෙන එළියට ආවා. ඔහු බොහොම කලබල වෙලා හිටියා. නැන්දෑ යතුරු සිදුරෙන් බලන්ට ඇවිත් දෙර ළඟ හිටිය හැටි පවා දැක්කෙ නැහැ. එක පාරටම දෙර ඇරගෙන දෙස්තර එළියට ආපු නිසා නැන්දත් කලබල වුණා.

"නැන්දේ මට ගමනක් යන්ට තියෙනවා. කුලී අස් රියකට අඬ ගහන්න!" දෙස්තර කිව්වා.

ඔහු නිහඬව හිටලා නළල පිස ද ගත්තා.

"නපුරු පාලකයින් තුන් දෙනාගේ මාලිගාවටයි මම යන්නේ. සමහර විට මම ආපසු නේන්න පුළුවනි."

හනිමේද් නැන්දෑ පුදුමවෙලා අඩියක් පස්සට ගියා.

"නපුරු පාලකයින්ගේ මාලිගාවටද?"

"ඔව්, නැන්දේ. බොහෝම බරපතල වැඩක්. ටුට්ටිගේ බෝනික්කා මෙහාට ගෙනාවා. ඌ ලෝකයේ ඇති ඉතාම හොඳ බෝනික්කා. ඒ බෝනික්කාගේ යන්තර සූත්තර කැඩිලා. නපුරෝ තුන්දෙනා මට නියම කළා හෙට උදේ වෙන්ට ඉස්සෙල්ලා බෝනික්කාව හදන්ට. නොකොළොත් මට බරපතල දඬුවම් දේවි."

නැන්ද අඬන්ට ලැහැස්ති වුණා.

"මේ බෝනික්කාට පණ දෙන්ට මට බැහැ. මම බෝනික්කාගේ ඇඟ ඇතුලේ තිබෙන යන්තරය හොඳට බැලුවා. මට එය හදන්ට වුණත් පුළුවනි. නමුත් එක දැති රෝදයක් කුඩු වෙලා. සුළු දෙයක්. ඒ වුණාට මට එය අමුතුවෙන් හදන්ට බැහැ... අලුත් දැති රෝදයක් හදන්ට ඕන... ඒ රෝදය හදන්ට ඕන කරන රිදී මගෙ ළඟ තියෙනවා... හැබැයි රිදී පදම් කරන්ට බෙත් වතුරේ දලා පැය හතළිස් අටක් තියන්න ඕන. නැන්දට තේරෙනවද පැය හතළිස් අටක් ඕන... නමුත් මට අණ කරලා තියෙනවා හෙට උදේ එළි වෙන කොට පණ ඇති බෝනික්කාව මාලිගාවට බාර දෙන්නයි කියලා."දෙස්තර ගස්පාර් නැන්දට පැහැදිලි කළා.

"වෙනින් යන්තරයකින් දැති රෝදයක් එතනට දාන්න බැරිද?" නැන්ද බයෙන් වගේ ඇහුවා.

දෙස්තර අතක් ගස්සා දැම්මා.

"දැති රෝද කීපයක්ම මාරු කළා. හරි ගියේ නැහැ."

විනාඩි පහක් යන්ට ඉස්සෙල්ලා කුලී අස් රියක් දෙස්තරගේ ගෙය අසල නවත්වලා තිබුණා. නපුරු පාලකයෝ තුන්දෙනාගේ මාලිගාවට යාමට දොස්තර ලැස්ති වුණා.

"හෙට උදේට බෝනික්කාව හදන්න බැහැයි කියලා මම ඔවුන්ට කියන්නම්. ඕන දඬුවමක් මට දීපුවාවෙ..." දෙස්තර කිව්වා.

හනිමේද් නැන්ද ඒප්රන් රෙද්ද තදින් හපන්නට වුණා. ඈට ඔළුවේ කැක්කුම හැදෙන තුරු ඈ රෙදි කොණක් හැපුවා.

ගස්පාර් දෙස්තර බෝනික්කාවත් අරගෙන අස් රියේ නැගිලා යන්ට ගියා.

7

මහ රෑ අසිරු ගමනක්

දෙස්තර අස් රියේ වාඩි වෙලා යනවා. හුළං පහර බොහෝම අමිහිරි හඬක් ඇති කළා. මොටට පිහියක් ගිනි ගලකට අල්ලලා මුවහත් කරන කොට ඇතිවන හඬක් එයින් පිටවුණා. කන්වලට යකඩ උලකින් අනින්නා වගෙයි.

දෙස්තර කබා කර උස්සාගෙන දෙකන් වහ ගත්තා.

හුළං බොහෝම ඉහළින් හමන්නට වුණා. ඈත අහසේ තරු පිහදමන්නා වගේ ඔන්න ඊට පස්සේ අහස වළාකුළු වලින් පිරුණා. කුණාටු නිසා බොහෝම හීතල වුණා.

දෙස්තරට හීතල දැනිලා ඔහු වැහි කබාය පොරවා ගත්තා. ඔහු, බෝනික්කාවත් වැහි කබායේ බාගයකින් එතුවා.

"ඉක්මනින් රිය එළවන්ට. එළවන්ට.

තේරුමක් නැතිව දෙස්තර කලබල වෙලා රිය කරුවාට කතා කරලා වඩාත් ඉක්මනින් රිය එළවන්ට කියලා කිව්වා.

රෑ අඳුරුයි, බයයි. මූසල පාටයි. ඉඳලා හිටලා ගෙයක ජනේලයකින් රතු එළියක් දකින්ට පුළුවනි. අනිත් ගෙවල් වල ජනේල දොරවල් වහලා. මිනිස්සු බොහෝම නරක දේ බලාපොරොත්තුවෙන් හිටියා.

ඒ අඳුරු රෑයේ හැම දෙයක් ගැනම සැක කරන්නට වුණා. කළුවරේ යන කොට බෝනික්කාගේ ඇස් පවා දිලිසෙන හැටි දෙස්තරට පෙනුණා. ඔහු බෝනික්කා දිහා නොබැලීමට උත්සාහ කළා.

"මොන බොරුද? හොල්මන් අවතාර කියා දේ නැහැ. ඒව බොරු. මට මහන්සි නිසා මම දුර්වල වෙලා. හැමදම රෑට මෙහෙම තමා. අද මහපාරේ මිනිස්සු යනවා එනවා අඩුයි. හුළං හැමීම විතරයි, අද

වෙනසකට තියෙන්නේ. රෑ යන එන අය කළු ලෝගු ඇඳපු මිනීමරුවන් වගෙයි... හන්දිවල තියෙන ලාම්පු විතරක් කණාමැදිරි එළියක් වගේ මලානිකයි. ඉක්මනට මාලිගාවට යන්ට පුළුවනි නම්...!"

බයවුනාම හොඳම බේත තමා නිදාගැනීම. ඔළුව තුවායකින් ඔතා ගත්තම ඉක්මනට නින්ද යනවා. දෙස්තර ඔළුව වැහි කබායෙන් ඔතා ගත්තා. නින්ද යන තුරු ඔහු ගණන් කරන්ට පටන් ගත්තට නිදාගන්ට බැරිවුණා. එතකොට ඔහු නිදි මන්තරයක් ජප කළා.

"ඔන්න අලියෙක් ආවා මට නිදිමතයි, ඔන්න අලි දෙන්නෙක් ආවා. මට නිදිමතයි. ඔන්න අලි තුන් දෙනෙක් ආවා මට නිදි මතයි." ඔහොම අලි රංචුවක් ආවයි කිව්වත් දෙස්තරට නොවේ නින්ද ගියේ.

ඔයින් මෙයින් දෙස්තර, විසිතුන් වෙනි අලියාත් ආවා මට නිදිමතයි." කීවා විතරයි දෙස්තර හීනෙන් හැබෑ අලියකු දැක්කා. ඌ රෝස පාටයි. හරියට ලපිතුප් යෝධයාට සමානයි. දෙස්තර නින්දෙන් හීනයක් දැක්කා.

හීනයක් ටික වේලාවක් පෙනුණාට බොහෝ දේ දකින්ට පුළුවනි. ඔන්න දැන් දෙස්තර හීනෙන් නපුරු පාලකයෝ තුන් දෙනා ඉදිරිපිට පෙනී හිටියා. දෙස්තරට විරුද්ධව නපුරෝ නඩු අහනවා. හැම නපුරෙක්ම පීප්පයක් තරම් මහතයි. උන් තුන් දෙනා අලි තුන් දෙනකු පිට නැගලා හිටියා. දෙස්තර උන් තුන් දෙනා ඉදිරි පිට බෝනික්කාත් අරගෙන හිටියා. අභිකුන්ඨිකයෙක් වඳුරු පැටියකු අරගෙන ඉන්නවා වගෙයි.

නපුරෝ දෙස්තරගේ කතාවට සවන් දුන්නේ නැහැ.

"නුඹට අපේ අණ පිළි පදින්ට බැරිවුණා. බරපතල දඬුවම්වලට මූණ පෑමට සිදුවේවි. නුඹ ඔය දරුවා අරගෙන තරු පහන ළඟ තියෙන යකඩ රිට දිගේ ගමන් කරන්ට ඕන. කණ්ණාඩි ගළවාපන්..." නපුරෝ තුන්දෙනා දෙස්තරට අණ කළා.

දෙස්තර හීනෙන් සමාව ඉල්ලා හිටියා. ඔහු වැඩියෙන්ම බයවුණේ බෝනික්කා විනාශ වෙයි කියලා... ඔහු මෙහෙම කිව්වා:

"මට නම් වැටිලා පුරුදුයි... රිටෙන් ලිස්සලා ගිහින් ජල තටකයට වැටුණට කමක් නැහැ. මට වැටිලා පුරුද්දක් තියෙනවා. නගර දෙරටුව ළඟ තිබුණු උස කණුව මාත් එක්ක කඩාගෙන වැටුණා... නමුත් මේ ලස්සන බෝනික්කා බිම වැටුණොත් උගේ කැලිවත් හොයන්න

බැරිවේවි... බෝනික්කාට අනුකම්පා කරන්න... මේ බෝනික්කෙක් නොවේ. පණ තියෙන ගෑනු ළමයෙක්. ඇගේ නම මට අමතක වෙලා..."

"බැහැ. බැහැ. නුඹට සමාව දෙන්නේ නැහැ! අපේ නියෝගය අනුව නුඹට දඬුවම් කරනවා." නපුරෝ තුන්දෙනා කීවා.

කවුදෝ මහ හයියෙන් කෑ ගහපු හන්දා දෙස්තර අවදි වුණා.

"නපුරෝ තුන්දෙනාගේ නියමය එහෙමයි!" කියලා කිසිවෙක් ඔහුගේ කනට කට ළං කරලා කෑ ගැහැව්වා වගෙයි.

දෙස්තර ඇස් හැරලා බැලුවා. හැබෑටම මුර සෙබළෙක් එහෙම කෑ ගැහැව්වා. දෙස්තර ඇස් කණ්ණාඩි කුට්ටම ගළවලා බැලුවා. ඔහු නිදාගෙන සිහින බලන විට තවත් රෑ බෝ වෙලා. දැන් නම් කට්ට කළුවරයි.

ඔහු ගමන් කළ අස්රිය නවත්වලා. ඔහු වටේට කළු ඇඳුම් ඇඳගත් මිනිස්සු. දෙස්තරට ඇස් ඇරුණේ මුර සෙබළුන්ගේ කෑ ගැසීම් හන්දා. ඔවුන්ගේ අත්වල ලන්තෑරුම්. ඒවා වැනෙන විට හෙවනැලි වැටෙනවා.

"මොකද වෙලා තියෙන්නේ? අපි කොහෙද? මේ මිනිස්සු කවුද?"

එක මුර සෙබළෙක් දෙස්තර ළඟට ඇවිල්ලා ලන්තෑරුම ඔහුගේ මූණට කිට්ටු කරලා බැලුවා. ඒ ලන්තෑරුම අල්ලාගෙන හිටිය අත කළුපාට අත් මේස් වලින් වැහිලා.

මුර සෙබළු බව දෙස්තරට තේරුම් ගියේ කාට පාට අත් මේස් දැක්කට පසුවයි.

"පාලකයෝ තුන්දෙනාගේ නියෝගය එහෙමයි! ඔහු කෑ ගැහැව්වා.

ලන්තෑරුමේ ආලෝකයට ඔහුගේ රූපය පෙනුණා. ඔහු හිසේ තිබුණු කළු පාට තොප්පිය යකඩ තොප්පියක් වගෙයි රෑ කළුවර නිසා පෙනුණේ.

"කාටවත් බෑ අද මාලිගාව අහලකටවත් යන්න. ඔක්කොමල්ලා මාලිගාවට හැතැප්මයක් දුරින් ඉන්නට ඕන. පාලකයින්ගේ නියෝගය එහෙමයි. නගරෙ මිනිස්සු කැරලි ගහනවා. මාලිගාව පැත්තට යන්ට අවසර නැහැ." මට මාලිගාවට යන්ට ඕන. ලොකු හදිස්සියකට." දෙස්තර කිව්වා.

ඔහු කේන්ති වෙලා.

මුර සෙබළා ගොරෝසු හඬකින් බෙරිහන් දුන්නා.

"මුර හමුදාවේ ලොක්කා මායි. මගේ නම සෙරේජ්. මීට එහා

අඩියක්වත් මම අවසර දෙන්නේ නැහැ. කරත්ත කාරයා ආපහු හරවාපිය!" කපිතන් ලන්තෑරුම වනලා කෑ ගැසුවා.

ඒ වර දෙස්තර කෝපවුණා, තමාට මාලිගාවට යන්ට ඕන කාරණය ගැන දැනගත්තම යන්ට අවසර දෙති කියලා දෙස්තර කල්පනා කළා:

"කපිතන්, මම දෙස්තර ගස්පාර් අර්නේරි!"

පිළිතුරු වෙනුවට ඔහු මහ හඬින් හිනා වුණා. හැම තැනින්ම ලන්තෑරුම් අල්ලන්ට වුනා.

"පුර වැසිය! මේ වගේ භයානක වේලාවකදී විහිළු කරන්ට අපට බැහැ. ඒ මදිවට මහ රෑ."

"මම තමුසෙට නැවත කියනවා, මගේ නම දෙස්තර ගස්පාර් අර්නේරි."

කපිතන් සෙරේජ්ට යකා වැහුණා. ඔහු වචනයෙන්, වචනය වෙන් වෙන්ව කියන්ට පටන් ගත්තා.වචනයක් කියනවා, කඩුව වනනවා.

"නුඹට මාලිගාවට රිංගන්ට ඕන හන්ද, නුඹ බොරු නමක් ගෙතුවා. දෙස්තර ගස්පාර් අර්නේරි රෑට රස්තියාදු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම මේ වගේ රෑයක. දැන් ඔහු වැදගත් වැඩක් කරනවා. ඔහු ඔටුන්න හිමි කුමාරයා වන ටුට්ටිගේ බෝනික්කාට පණ දෙනවා. ඔහු හෙට උදේට මාලිගාවට එනවා. නුඹ වංචා කාරයෙක්. මම නුඹව හිරබාරයට ගන්නවා!"

ඔන්න ඒ පාර දෙස්තර ගස්පාර්ටත් බොහොම කේන්ති ගියා.

"මොනවද? තමුසේ කියන්නේ කොහොමද මට වංචාකාරයා කියන්නේ ? කමක් නැහැ. මම දැන් තමුසේට බෝනික්කාව පෙන්වන්නම්!"

දෙස්තර අස්රියේ ආසනයට අත දැම්මා. එහෙත්...

බෝනික්කා නැහැ. දෙස්තර නිදගෙන හීන බලන කොට, බෝනික්කා ආසනෙන් බිමට වැටිලා නැතිවුණා.

දෙස්තරට හීන්දුඩිය දැම්මා.

"මේකත් හීනයක් වෙන්ට ඕන." ඔහුට සිතුනා.

එහෙත් අවාසනාවට එය හීනයක් නොවෙයි. සැබෑ සිද්ධියක්.

මුර සෙබළ නායකයා දත්මිටි කාලා එක් අතකින් ලන්තෑරුම ඔසවලා බොහොම සැරවෙලා කතා කළා:

"පලයව් යන්ට! මේ නාකියාව හිරබාරයට අරගෙන මෙතැන ආරක්සා කරන්ට වෙලාවක් නැහැ... පලයව් යන්ට."

ඔහුගේ අණට කීකරු වෙන්ට සිද්ද වුණා. අස්ථිය කරුවා රිය හැරෙව්වා. අස් රිය හඬක් නැගුවා. අස්පයා හේසාරවය කළා. දෙස්තර ආපහු හැරිලා ආවා.

දෙස්තරට දුක උහුලා ගන්ට බැරුව ඇඬුණා. සෙබළා දෙස්තරට බොහොම නපුරු විදිහට කතා කළා. ඔහුට නාකියා කියලා බැන්නා. නමුත් ප්‍රධාන දෙය ඔහු අතින් ටුට්ටිගේ බෝනික්කා නැතිවීමයි.

"සැබෑටම මගේ හිස ගසා දැමීමට තරම් බරපතළ වරදක් මා කළා." දෙස්තර කල්පනා කළා.

ඔහුට ඇඬුණා. ඔහුගේ කණ්ණාඩි කඳුළු වලින් තෙමිලා. ඔහුට කිසිදෙයක් පෙනුණේ නැහැ. දෙස්තරට තමාගේ හිස තුවායෙන් ඔතාගන්ට හිතුනා.

රියකරුවා වේගයෙන් රිය එලෙව්වා. දෙස්තර විනාඩි දහයක් විතර ඇඬූ කඳුලෙන් හිටියා. ඊට පස්සේ තමයි, ඔහු නැවත කල්පනා කරන්ට පටන් ගත්තෙ.

"ඔව් මට මේ රෑ ආයෙමත් බෝනික්කාව හොයාගන්ට පුළුවන් වේවි. මහ රෑ මිනිස්සු පාරෙ ගමන් කරනවා අඩුයි. සමහර විට කව්රුවත් ඒ බෝනික්කාව නොදැක්කා වෙන්න පුළුවනි..."

රියකරුවාට කිව්වා හෙමින් යන්ටයි කියලා, පාර දෙපැත්ත ප්‍රවේසමින් බලන්න කිව්වා.

"මොනවා හරි දැක්කද?' කිය කියා දෙස්තර රියකරුගෙන් අහනවා.

"මෙනාවත් නැහැ. මොනවත් නැහැ." කිය කියා රියකරුවා පිළිතුරු දෙනවා.

රියකරුවා කිසිම තේරුමක් නැති දේවල් ගැන දෙඩවන්නට පටන් ගත්තා.

"පුංචි පීප්පයක්."

"නැහැ. නැහැ. ඒක නොවෙයි." දෙස්තර කීවා.

"අන්න ලොකු වීදුරු කැල්ලක්."

"නැහැ. නැහැ."

"කැඩිච්ච සපත්තුවක්."

"නැහැ. මම හොයන්නෙ ඒක නොවෙයි." දෙස්තර හෙමින් කිව්වා.

රියකරුවා බෝනික්කා හොයාගන්ට උත්සාහ කළා. ඔහුට කළුවරේ හොඳට ඇස් පෙනෙනවා. ඔහු රියකරුවකුට වඩා මහ මුහුදේ නැව් පදවන කපිතන් කෙනෙකුට සමානයි.

"රෝස පාට ගවුමක් ඇඳපු බෝනික්කකුව දැක්කේ නැතිද?"

"නැහැ" රියකරුවා කනගාටු වෙලා පිළිතුරු දුන්නා.

"කවුරුහරි බෝනික්කාව ඇහිඳගෙන තියෙනවා. දැන් ඉතින් හොයලා වැඩක් නැහැ... මෙන්න මෙතැනදියි මට නින්ද ගියේ... අනේ!"

දෙස්තරට අයෙමත් ඇඬෙන්ට එනාව.

රියකරුවා අනුකම්පා පෙන්නන්ට වගේ නහයෙන් සෙමින් හඬක් නැගුවා.

"දැන් ඉතින් මොනවා කරමුද?"

"අනේ මම දන්නේ නැහැ... මම දන්නේ නැහැ" දෙස්තර හිස පහතට හරවාගෙන කනගාටුවෙන් කිව්වා. දුක නිසයි, අස්රිය හැප්පෙන නිසයි ඔහුගේ හිස ඉබේටම වැනෙන්ට වුණා. "ඔව්, ඔව්. මම දන්නවා. මට ඉස්සෙල්ලා ඒ ගැන අමතක වුණා. ඒ බෝනික්කා පණැති ළමයෙක්. ඒ ළමයා පැනලා ගියා. සත්තකින්ම ඇක්ත.... මට නින්ද ගිය හැටියේම ඈ පැනලා ගියා. ඇයට පණ තියෙන බව මට ඉස්සෙල්ලා කල්පනා වුණේ නැහැ. කොහොම වුණත් ඒ නිසා මගේ වරදේ බරපතළකම අඩුවෙන්නේ නැහැ. නපුරු පාලකයෝ මට දඬුවම් කරාවි..."

දෙස්තරට බඩගින්නක් දැනුණා. ඔහු ටික වේලාවක් නිහඬව ඉඳලා බොහොම බැරෑරුම් ලෙස රියකරුවාට කතා කළා:

"අද මම දවාලටවත් මොනවත් කෑවේ නැහැ. ළඟම තියෙන කඩයට මාව ගෙනියන්න."

බඩගින්න නිසා දෙස්තර සන්සුන් වුණා.

අස්රිය බොහෝ වේලාවක් වීදි ඔස්සේ ගියා. තේ කඩවල, බත් කඩවල දෙරවල් වහලා තිබුණා. පොහොසත්, සල්ලිකාර මුදලාලිලා එද රෑ බොහොම බයෙන් හිටියා. පොහොසත්තු බංගලාවල්, කඩ සාප්පු, ගබඩා ආදියට යතුරු ඉබ්බන් දමලා වහලා දැම්ම. ඇතුළෙත් දෙරවලට, දෙරපොලු හරහට සවිකළා. ලොකු පෙට්ටි, අල්මාරි හේත්තු කළා. ජනේල වලට යකඩ පොලු සවිකළා. ඔවුන් මුළු රෑයම නිදු ගත්තේ නැතිව හිටියා. ඔවුන් ළඟ ඉන්න වටිනා බල්ලන්ට උදේ ඉඳලම කෑම දුන්නේ නැහැ. උන් බඩගින්නේ හිටියාම හොඳට හොරුන් අල්ලයි කියලා තමයි බල්ලන්ට කෑම නොදුන්නේ. හැබෑටම පෝසතුන්ටයි, මුදලාලිලාටයි, ඉඩම් හිමියන්ටයි අඳුරු රෑයක්. මුර සෙබළු කීප දෙනෙක්

නපුරු පාලකයින් තුන්දෙනාට විරුද්ධ වෙලා, ටුට්ටිගේ බෝනික්කාව කැඳවූ හැටි මහජනයාට ආරංචි වෙන්නට පටන් ගත්තා. මේ ආරංචිය නිසා පෝසත්තු බොහොම බයවුණා.

"මදෑ වෙච්ච වැඩක හැටි! අපට මින් පස්සෙ නම් මුර සෙබළුන් ගැන විස්වාසයක් තියන්න බැහැ. ඊයේ උන් මහජනයාගේ කැරැල්ල පාගලා විනාශ කළා. අද උන් මහජනයගේ පැත්ත අරගෙන අපේ බංගලා වලට වෙඩි තියාවි. පෝසත්තු එහෙම කිව්වා."

බඩගින්නට මොනවා හරි කෑමට දෙස්තරගේ හිතේ තිබූ ආසාව නැතිව යන හැඩයි. කඩ සාප්පු සේරම වහලා.

"ගෙදර යන්න සිද්ද වේවිද? බොහොම දුර යන්න එපාය. මම බඩගින්නේ මැරී යාවී." දෙස්තර කල්පනා කළා.

ඔන්න හිටිය හැටියේම මස් බදින පුසුඹක් දැනුණා. ඒ පුසුඹ දැනෙනකොටත් හිතට සැපයි, එළු මස්, බොම්බයි ළූනුත් එක්ක බදිනවා වෙන්ට ඕන. රිය කරුවා දැක්කා පහනක් පත්තුවෙන පොඩි කඩයක්.

ඒ මොකක්ද?

"ඒක මොනවා හරි කෑමට විකුණන කඩයක් නම් හොඳා!" දෙස්තර ආසාවෙන් කිව්වා.

අස්රිය පත්තු වෙන පහන ළඟට ආවා. ඒක තේ කඩයක් නොවෙයි. ගෙවල් පේලියකට ටිකක් ඈතින් රෝද හතරක් උඩ ගෙයක්. පහන් එළිය ඇතට පෙනුණේ ඒ ගෙයි දෙර හරියට වහලා තිබුණේ නැති හන්ද.

රියකරුවා රියෙන් බැහැලා වටපිට බලන්න ගියා. දෙස්තරට බැදපු මස්වල පුසුඹ අමතක වුණා. ඔහු නහය අකුලා ගෙන ඉව ඇල්ලුවා.

"මම බල්ලන්ට බොහොම බයයි. ඒ විතරක් නොවෙයි, මෙතැන පඩි පෙළක් තියෙනවා..." එහෙම කිව්වේ රියකරුවා.

"ඔතන කවුද?"

දෙර ඇරුණා. පාරට වැටෙන පහන් ආලෝකය තවත් වැඩි වුණා. පහන් එළියට ඉදිරියෙන් දෙර ළඟ හිටිය මිනිහාව, දෙස්තරයි අස්රිය කරුවයි දැක්කේ කළුපාට හෙවනැල්ලක් වගෙයි.

දෙස්තර වෙනුවෙන් රියකරුවා කතා කළා:

"දෙස්තර ගස්පාර් අර්නේරි ඇවිල්ලා ඉන්නවා. නුඹලා කව්ද? රෝද උඩ තියෙන මේ ගේ කාගෙද?"

"මේක බිර්සාක් මාමාගේ සර්කස් කණ්ඩායම" හෙවනැල්ල පිළිතුරු දුන්නා. හෙවනැල්ල බොහොම සතුටින් අත් වනලා මෙහෙම කිව්වා "මහත්වරුනි! එන්න. එන්න. බිර්සාක් මාමාගේ සර්කස් කණ්ඩායම බැලීමට දෙස්තර ගස්පාර් ආපු හන්ද අපි බොහොම සතුටු වෙනවා."

වාසනාවත් අවසානයකි! රෑ තිස්සේ රස්තියාදු වීම අවසානයි. බිර්සාක් මාමාගේ සර්කස් කණ්ඩායමට ජය වේවා! දෙස්තරට, රියකරුවාට විතරක් නොවෙයි, අස්පයාටත් කෑම ලැබුණා. රෝද උඩ තිබුණු ගෙය අමුත්තන්ට උදව් කරන තැනක්. එතැන බිර්සාක් මාමාගේ සර්කස් කණ්ඩායම පදිංචි වෙලා හිටියා.

මුළු රටම බිර්සාක් මාමාගේ සර්කස් කණ්ඩායම ගැන දන්නවා. කඩ පොළේ හැම ඉරිදුටම ඔහු සර්කස් පෙන්වනවා. උත්සව දවස්වලට සල්පිලට ගිහිල්ලා සර්කස් පෙන්වනවා. මේ කණ්ඩායමේ බොහොම දක්ෂ නළුවෝ හිටියා. ඒ දවස්වල ඒ ගොල්ල බොහොම ජයට සර්කස් පෙන්නුවා. මේ කණ්ඩායමේ හිටිය හොඳම නළුවා තමයි කඹය දිගේ ගමන්කරන ටිබුල්.

කඹය දිගේ යාමට ටිබුල්ට වැඩිය දක්ෂ මිනිහෙක් හිටියේ නැති බව ළමයි දන්නවා නොවේද. තරු පහන අසලදී ඔහු පෙන්වපු දක්ෂකම්, මුර සෙබළ නායකයා වෙඩි තියපු හැටි ඔබට මතකයි.

ටිබුල් කඹය දිගේ යන දැට එය බැලීමට රැස්වෙන සුළු වෙළෙන්දෝ. ළමයි, හිඟන්නෝ, දුප්පත් මිනිස්සු! අත්වල කරගැට එනකල් අත්පුඩි ගහනවා... පෝසත් මුදලාලිලාත්, රස්තියාදු කාරයෝත් ඉස්සර ටිබුල්ට අත්පුඩි ගැහැව්ව නිසා දැන් දුක් වෙනවා. "අපි ඔහුට අත්පුඩි ගැහැව්වා, ඔහු අපට විරුද්ධව සටන් කරනවා..."

ටිබුල් කඹය දිගේ යාම නවත්වලා දුප්පත් මහජනයගෙ පැත්ත අරගෙන සටනට ගිය හන්ද සර්කස් කණ්ඩායමේ නායකයා - බිර්සාක්ට දැන් ආදයම අඩුයි.

දෙස්තර ගස්පාර් ටිබුල්ව කාපිරියෙකු කළ හැටි, ඔහු අතින් ටුට්ටිගේ බෝනික්කා නැති වුණු හැටි කාටවත් කිව්වේ නැහැ.

රෝද උඩ තියෙන ගෙයි ඇතුළෙ දෙස්තර දුටු දේ මොනවාද?

දෙස්තරට වාඩි වෙන්න තුර්කි රටේ හදපු රබානක් දුන්නා. ඒක වටේට රත්රන් පාට නූල්. ලස්සන වැඩ දපු කවරයක්. ගේ ඇතුළෙ තිරවලින් මුවාකරපු කාමර කීපයකි.

රෑ බෝ වෙලා. සර්කස් කාරයෝ නිදා හිටියා. දෙර ඇරලා දෙස්තරටයි රිය කරුටයි ඉස්සෙල්ලාම කතා කළේ විකට නළුවා. ඔහුගේ නම අව්ගුස්ටො. එදා රෑ ගෙය මුර කළේ ඔහු යි. දෙස්තරයි, අස්රියයි ළංවන විට, අව්ගුස්ටො එළු මස් කෑල්ලකුයි, ලූනු ගෙඩියකුයි බැද බැද හිටියා. ඒ නිසයි දෙස්තරට පුසුඹ දැනුනේ.

දෙස්තර තුර්කි රබාන උඩ වාඩිවෙලා ගෙයි ඇතුළ හොඳට බැලුවා. පොඩි පෙට්ටියක් උඩ පොල්තෙල් පහනක් පත්තු වෙනවා. ගෙයි බිත්තිය දිගටම සර්කස් පෙන්වීමට ඕන කරන වළලු, ගෙජ්ජි, කඹ, ලෝහ මිටි සවිකරපු සුදුපාට, රෝසපාට කස. රත්රන් තරු, මල් මහපු සර්කස් ඇඳුම්, වෙස් මූණු. සමහර වෙස් මූණුවල අං, සමහර ඒවා වල ඇස් කන් නාස් යකුන්ගෙ වගෙයි. එක වෙස් මුහුණක කන් දෙක කුළු දෙකක් තරම් විශාලයි.

එක මුල්ලක කූඩුවක් ඇතුළෙ පුංචි සතෙක් හිටියා. තව තැනෙක දිග ලී මේසයක්. මේසයට ඉහළින් මූණ බලන කණ්ණාඩි දහයක් විතර තිබුණා. හැම කණ්ණාඩියක් ළඟම ඉටිපන්දමක් බැගින් තිබුණා. මේසය උඩ කුඩා පෙට්ටි පාට වර්ග පින්සල්, බොරු කොණ්ඩ, පුයර, මල්, රෝසපාට පුයර.

"දෙස්තර මහත්තයා දන්නවද අද අපි මුර සෙබළුන් ගේ අතට අහුනොවී පැනලා ගියා." අව්ගුස්ටෝ කීවා. "අපේ නළුවෙක් තමයි ටිබුල්. මුර සෙබළු හිතනවා අපි ඔහුව හංගා ගෙන ඉන්නවයි කියලා."

මහළු විකටයා බොහොම කනගාටු වුණා.

"ටිබුල් කොහෙද කියලා අපි දන්නේ නැහැ. ඔහුව මරා දමලා ඇති. නැතිනම් යකඩ කූඩුවේ දමලා ඇති."

මහලු විකටයා සුසුමක් හෙළා හිස වැනුවා.

"ඔබ මහ රෑ අප ළඟට ආ නිසා කනගාටුයි. අපි ඔබට බොහොම කැමතියි. ඔබට පුළුවනි අපව සනසන්න. දෙස්තර මහත්මයා දුප්පතුන්ගෙ පැත්තෙ බව අපි දන්නවා. මම ඔබට එක සිද්ධියක් මතක් කරන්නම්. අපි අඟුරු කඩ පොළේදී, ගිය අවුරුද්දේ වසන්ත යේදී,

සර්කස් පෙන්නුවා. මගේ දුව සිංදුවක් කීවා." මහල්ලා විස්තර කළා.

"ඔව් ඔව්." දෙස්තරට මතක් වුණා. ඔහුගේ හදවත යම්තම් ගැස්සුණා.

"මතකද දෙස්තර මහත්තයා එදා සර්කස් බලන්ඩ ඇවිල්ල හිටියා. මගේ දුව සිංදුවක් කීවා. රදළයගෙ බඩට වැටෙන්නෙ නැතිව ගින්දරට වැටිල පිච්චෙන්න කැමති වුණු කැවුම ගැන..."

"ඔව්. ඔව්. ඉතින්."

"රදළ මැහැල්ලක් ඔය සිංදුව අහලා බොහොම අමනාප වෙලා, වැඩකාරයින්ව එව්වා මගේ දුවගෙ කනින් ඇදලා ඇයට ටොකු අනින්න."

"ඔව්, ඔව්, මට මතක් වුණා. වැඩකාරයින්ව මම එළවා ගත්තා. රදළ නෝනා මාව අඳුනාගත්තු හන්දා ඇයට ලජ්ජා හිතුණා." දෙස්තර කීවා.

දෙස්තර මහත්තයා ගියාට පස්සෙ මගෙ දුව කීවා, රදළ මැහැල්ලගෙ වැඩකාරයෝ ඇගේ කන්වලින් ඇදලා තුවාල කළා නම් ඇය මැරිලා යාවී කියලා. දෙස්තර මහත්තයා නිසා මගේ දුව බේරුණා. ඈ එය අමතක කරන්නේ නැහැ!" විකට නළුවා මතක් කළා.

"දැන් ඔබේ දුව කොහිද?" දෙස්තර බොහොම කලබල වෙලා ඇසුවා.

මහලු විකට නළුවා තිරයෙන් එහාට ගිහිල්ලා දුවට අඬගැසුවා. ඔහු අමුතු නමකින් ඇයට කතා කළා. ඒ රටේ වෙන අයට ඒ වගේ නම් නැහැ.

"සුවනී!"

තත්පර කීපයකට පස්සේ ගෑනු ළමයෙක් තිරය මෑත්කරලා බෙල්ල හරවලා බැලුවා. ඇගේ හිසකේ කැරලි ගැහිලා මුදු වගේ. ඈ දෙස්තර දෙස සතුටු සිතින් බැලුවා.

දෙස්තර ඈ දිහා බැලුවා විතරයි ගල් ගැහුණා. ඒ තමා ටුට්ටිගේ බෝනික්කා. ඇරපු අතක් නැහැ. ටුට්ටිගේ බෝනික්කා.

නුනවැනි කොටස

සුවඳ

8

පුංචි නිළිය අසීරු චරිතයක් රඟපායි

ඔව්, හැබෑටම සුවනී තමා ඒ බෝනික්කා!

ඈ කොහේ ඉඳලා ආවාද? හාස්කමක් නේද? කොතරම් ලොකු හාස්කමක්ද? හාස්කම් කිසිම දුක සිදු නොවන බව බොහොම හොඳින් දෙස්තර ගස්පාර් දැනගෙන හිටියා. හාස්කම් කියන්නේ රැවටීම බව ඔහුගේ තීරණයයි. බෝනික්කාට පණ තියෙන්න ඇති. දෙස්තරගෙ අතින් ඇය බිම වැටුණු හැටියේම මුරණ්ඩු කෙල්ලක වගේ ඈ පැනලා ගියා.

දෙස්තර තමාගේ අතින් නැතිවුණු බෝනික්කා කියලා හිතාගෙන සුවනීට කතා කළා:

"ඔහොම හිනාවෙලා හරියන්නේ නැහැ! ඔහොම හිනා වුණාට බෝනික්කෝ, නුඹ කළ වැරැද්දේ බරපතල කම අඩුවෙන්නේ නැහැ. පේනව නේද කොහොම හරි නුඹව හොයාගන්නට අපට පුළුවන් වුණා. නුඹව හොයාගන්නට පුළුවන් කියල හිතපු තැනකදී නොවෙයි නේද අහම්බෙන් හරි හොයා ගත්තේ."

සුවනී ඇසි පිහදා ගත්තා. පුංචි හාවකු වගේ ඈ ඇස් පිය හෙළන්නට පටන් ගත්තා. ඈ පුදුමවෙලා අව්ගුස්ටෝ දිහා බැලුවා. මහල්ලා හූල්ලන්ට වුණා.

"ඔබ කවුදැයි කියල වහාම කියන්න!"

දෙස්තර බොහොම ගොරෝසු හඬකින් ඇහුවා. එහෙත් සුවනී කොතරම් ලස්සනද, ඔහුට කෝපවීමට පවා බැරි වුණා.

"දෙස්තරට මාව අමතක වෙලා නේද? මගේ නම සුවනී."

"සුව-නී... නුඹ නෙවද ටුට්ටිගේ බෝනික්කා!" දෙස්තර ඇසුවා.

"මොන බෝනික්කෙක්ද! මම ළමයෙක්..."

"මොනවා? නුඹ මාව රවටන්ට එපා!" දෙස්තර කීවා.

සුවනී තිරයෙන් එහාට ගියා. පහන් එළියට ඇයව හොඳට පෙනුනා. අවුල්වුණු හිසකේ ඇති ඇගේ හිස පැත්තකට හරවාගෙන ඈ සිනා වුණා. පුංචි කුරුළු පැටවුන්ගේ පියාපත්වල පාටට සමාන පාටකින් ඇගේ හිසකේ දිලිසුණා.

කුඩුවේ ඇතුළෙ හිටිය පුංචි සතා බොහොම ඕනෑකමකින් ඇය දිහා බැලුවා.

දෙස්තර ගස්පාර් තවමත් හිතන්නේ මේ ගෑනු ළමයා ටුට්ටිගේ බෝනික්කා කියලා. මිනිස්සු කබල වුණාම සමහර දේ ඔවුන්ට පේන්නේ නැහැ. දෙස්තර ගස්පාර් කොච්චර ලොකු උගතෙකු උණත් වැදගත් කරුණු ගැන කල්පනා නොකර හිටියා.

වැදගත් කාරණය තමයි, මේ සර්කස් රෝද ගෙය ඇතුළෙ ඉන්න ගෑනු ළමයගෙ ඇඳුම වෙනස් වීම. පිටස්තර පෙනුමක් බෝනික්කාට වඩා වෙනස් වීම.

ඇගේ නිල්පාට ඇස් දිලිසෙනවා. එක වේලාවකට ඒ ඇස් බොහොම බරපතළ හැටියක් පෙන්වනවා. තවත් වේලාවක ඒවා සැලකිලිමත් බවක් පෙන්වනවා. බෝනික්කාගේ ඇස්වල තිබුණු කනගාටුව මේ ඇස්වල කොහෙත්ම පෙනෙන්ට නැහැ. අනිත් අතට මේ ගෑනු ළමයා බොහොම චාම් ගතියක් පෙන්වනවා.

අපි තවත් දුර වෙනස හොයමු. බෝනික්කා ඇඳලා හිටියේ රෝසපාට ගවොමක්. ඒකට රත්රන් මල් වැඩ දාලා තිබුණා. ඒ තරම් ලස්සන ගවොමක් කාටවත් තිබුනේ නැහැ. ඒ ගවොමට මොකද වුණේ. ඒ ගවොම ඇන්දම ඕනෑම ළමයෙකු හරියට කුමාරියක් වගෙයි. මේ ළමයා ඇඳලා තියෙන්නෙ දුප්පත් ගවොමක්. සපත්තු දෙක පරණයි. සුදු පාටට වඩා අළු පාටට හුරුයි . මේ දුප්පත් ඇඳුම් නිසා සුවනී ටුට්ටිගේ බෝනික්කාට වඩා අවලස්සනයි කියලා හිතන්ට එපා. ඒ ඇඳුම් ඇගේ රූපෙට හොඳට කැපෙනවා. සුවනීගෙ බැල්ම කොතරම් ලස්සනද, කුමරියන්ටත් වඩා ලස්සනයි. කතාවල එන කුමරියෝ හිටි හැටියේම ගෙම්බියන් වෙනවා, නැතිනම් ගෙම්බියන් හිටි හැටියේම කුමාරියෝ වෙනවා.

ඉතාම වැදගත් කරුණ ඔබට මතකද? ටුට්ටිගේ බෝනික්කාට මුර සෙබළෙක් කඩුවෙන් කොටපු හන්ද පපුවේ සිදුරක් තිබුණා. එහෙත් සුවනීගේ ඇඟේ එහෙම තුවාල ඇත්තේම නැහැ.

සුවනී හැබෑටම පණ ඇති බෝනික්කෙක්!

මේ කරුණු දෙස්තර ගස්පාර්ට පෙනුණේ නැහැ. ඔහු ඒවා ගැන කල්පනා නොකළා කියලා කීම වඩාත් හොඳයි. සමහර විට තව විනාඩියකින් ඔහු ඒ ගැන කල්පනා කරන්ට ඉඩ තිබුණා වෙන්ට

පුළුවනි. එහෙත් ඊට ඉස්සෙල්ලා කිසිවෙක් දෙරට තට්ටු කළා. කාරණය තව තවත් අවුල් වුණා. සර්කස් ගෙදරට ඒ පාර ඇතුළු වුණේ කාපිරි තරුණයා.

සුවනී බයවෙලා කෑ ගැහැව්වා. කුඩුවේ ඇතුළෙ හිටිය සතා සද්ද කලා. ඌ මොකාද කියල හරියටම කියන්න බැහැ. මුගටිකුට ටිකක් සමනයි.

කාපිරියා කවුද කියලා අපි දන්නවා. ටිබුල්ව කාපිරියෙකු කළ දෙස්තරත් දන්නවා. ඒ වුණාට අනිත් අය මේ රහස ගැන දැනගෙන හිටියේ නැහැ. කලබලය ඇතිවුණේ ඒ නිසයි.

වීනාඩි පහක් විතර සර්කස් කාරයෝ මවිත වෙලා බලාගෙන සිටියා. කාපිරි තරුණයා මුරණ්ඩු විදිහට හැසුරුණා. කාපිරි තරුණයා සුවනීව අල්ලලා උඩ දලා වැටෙන්නට ඉස්සෙල්ලා අල්ලලා නහය සිප ගත්තා. නූල්පටක එල්ලලා තියෙන ඉදිච්ච ඇපල් ගෙඩියක් හපන්ට ලෑස්ති වෙන්නා වගේ කාපිරියා ඇගේ ප්‍රංචි නහය හපා නොකෑවා විතරයි.

මහලු අව්ගුස්ටෝ බොහොම බය වෙලා ඇස්දෙක වහගෙන හිස වැනුවා. අපරාධකරුගේ හිස ගහල දන්ටද නැතිනම් ඔහුට සීනි නැතිව ඌරු මීයෙකු කන්ට දෙන්ටද කියන එක ගැන තීරණයක් ගන්න බැරුව හිටි චීන රටේ මහ රජු වගේ අව්ගුස්ටෝ ඔළුව වැනුවා.

සුවනීව උඩ දමන කොට ඇගේ සපත්තුවක් වීසි වෙලා පහනට ලැදිලා පහන නිවුණා. දැන් ඉතින් හොඳටම කළුවරයි. කාපිරි කොලොප්පම හන්ද කලබල තවත් වැඩියි. ඔයින් මෙයින් යන්තම් අරුණෝදය ඇතිවේගන එන්නට වුණා.

"ඔන්න අරුණෝදය වැටීගෙන එනවා. ටුට්ටිගේ බෝනික්කාවත් අරගෙන මම නපුරු පාලකයිනේගේ මාලිගාවට යන්ට ඕන" කියලා දෙස්තර කීවා.

කාපිරි තරුණයා දෙර යම්තමින් ඇරියා, අරුණෝදයේ එළිය දෙර අස්සෙන් රෝද උඩ තියෙන ගෙට ඇතුළු වුණා. අව්ගුස්ටෝ ඇස් දෙක වහගත්තු ගමන් ඉන්නවා. සුවනී තිරෙන් එහාට ගිහිල්ලා හැංගුණා.

දෙස්තර ටිබුල්ට සිදු වුණු දේ ගැන විස්තරයක් කළා. ටුට්ටිගේ බෝනික්කාට පණ දෙන්ට ඕන කියලා අණ කළ හැටි, ඔහු අතින් බෝනික්කා නැතිවුණු හැටි, නැතිවෙච්ච බෝනික්කා දැන් මේ සර්කස් ගෙයි ඉන්න හැටි ඔහු ටිබුල්ට පැහැදිලි කළා.

සුවනී තිරයට එහා වාඩිවෙලා මේ කතාව අහගෙන හිටියා.

"දෙස්තර මොකද මේ කාපිරියට ටිබුල්, ටිබුල් කියලා කියන්නේ. ටිබුල් සුදු පාටයි, මේ මිනිහා කළුපාටයි බලන්නත් බයයි." සුවනී කල්පනා කළා.

සුවනී තිරය මෑත්කරලා බැලුවා. කාපිරියා රතු කලිසමේ සාක්කුවකින් දිග බෝතලයක් අතට ගත්තා. ඔහු බෝතලේ මූඩිය ගැළෙව්ව හැටියෙම එයින් වී කුරුල්ලෙකුගෙ වගෙ හඬක් මතු වුණා. බෝතලයේ තිබුණු බේත් වගයක් අරගෙන ඇඟේ ඇතුල්ලුවා විතරයි, කාපිරියා සුදුපාට වෙලා. දැන්නම් ඔහු ටිබුල් තමයි. ඔහුගේ ඇඟේ කළුපාට ලපයක්වත් ඉතිරි වුණේ නැහැ.

"ජයවේවා!" කියලා සුවනී කෑ ගහලා දුවගෙන ඇවිල්ලා ටිබුල්ගෙ බෙල්ල බදගත්තා.

මහළු අව්ගුස්ටෝ ඇස්දෙක වහගෙන පෙට්ටියක් උඩ වාඩිවෙලා ඉන්නකොට තමයි, සුවනි ජයවේවා කියලා කෑ ගැහැව්වේ. අව්ගුස්ටෝ හිතුවා මොකක් හරි නරකක් වෙලා ඇතැයි කියලා. ඔහු පෙට්ටිය ඇතුළට වැටුණා. එතකොට ටිබුල් ඔහුව එළියට ඇදලා ගත්තා.

සුවනී බෙල්ල බදගෙන ටිබුල්ව සිපගත්තා.

"හරිම පුදුමයක්. ටිබුල් කොහොමද කාපිරියෙක් වගේ කළුපාට වෙලා අයෙමත් සුදුපාට වුණේ? මට කොහොමටවත් අඳුනාගන්ට බැරි වුණා." සුවනී කිව්වා.

"සුවනී!" ටිබුල් සැරෙන් කතාකළා විතරයි, සුවනී එක පාරටම බිමට පැනලා හරියට සෙබළෙකු වගේ කෙළින් හිටියා.

"මොකද?" ඈ පාසල් යන ළමයෙකු වගේ ඇසුවා.

ටිබුල් ඇඟේ හිස අත ගෑවා. සුවනී ඔහු දෙස සතුටින් බලනවා.

"දෙස්තර ගස්පාර් කී දේ සුවනිට ඇහුණද?"

"ඔව්. ටුට්ටිගේ බෝනික්කව හදන්ටයි කියල නපුරු පාලකයෝ තුන්දෙනා දෙස්තරට අණ කරලා. ඒ බෝනික්කා අස්ප කරත්තෙන් පැනල ගියාලු ඒ බෝනික්කා මම ලු."

"දෙස්තරට වැරදිලා. දෙස්තර මහත්තයා මේ බෝනික්කා නොවෙයි. මේ අපේ සර්කස් කණ්ඩායමේ පුංචි ළමයා. එයාට හොඳට නටන්ට පුළුවනි. ඇගේ නම සුවනී. මගේ ඉතාමත්ම හොඳ අත් උදව්කාරී."



"ඒක ඇත්තයි. ටිබුල් මාවත් වඩාගෙන කඹයදිගේ ගිහිල්ලා තියෙනවා." සුවනී දෙස්තරට පැහැදිලි කළා.

සුවනී ටිබුල්ගෙ ඉතාම හොඳ අත් උදව්කාරී කියපු හන්දා ඇට බොහොම සන්තෝෂයි.

"ටිබුල් හොඳයි!" සුවනී ටිබුල්ගේ අත්වල මුහුණ ඔබා ගත්තා.

"හැබෑටමද? මේ බෝනික්කා නොවෙයිද? සුවනීද? ඔව්. ඔව්. එහෙම වෙන්ට ඕන! දැන් නම් මට පැහැදිලියි. මට මතකයි. මම එක දවසක් ඔය ළමය සර්කස් එකේදී දැක්කා. ඔව්... ඔව්... මට මතකයි. ඇට පහර දීමට රැඳළ අම්මන්ඩි කෙනෙක් සේවකයින් එව්වා. මම උන්ව එළවා දැම්මා!" ඔහු සතුටු වෙලා අත්පුඩි ගැහැව්වා. "හා-හා-හා. ඔව් සත්තකින්ම. ටුට්ටිගේ බෝනික්කා දැකපු වේලාවෙ ඉඳලා මට මතක් වුණා ඒ වගෙ කෙනෙකු මම දැකලා තියෙන බව. මේක බොහොම කලාතුරකින් වෙන දෙයක්. බෝනික්කයි සුවනීයි හරියට නිඹුල්ලු වගෙ." දෙස්තර පැහැදිලි කළා.

අවුල් බේරාගත්තු නිසා හැම දෙනාම සන්තෝෂ වුණා.

දැන් එළිය වැටෙන්ට පටන් අරගෙන. කුකුළෝ හඬලන්නට වුණා.

දෙස්තර ආපහු කනගාටු වුණා.

"මේ සියල්ල යසයි. මගේ අතින් ටුට්ටිගේ බෝනික්කා හැබෑටම නැතිවෙලා. ලොකු විපතක්..."

"නැහැ. ඔබට ඒ බෝනික්කා ආපසු ලැබිලා." ටිබුල් කීවා.

"කොහොමද?"

"එහෙම තමා. සුවනීට තේරෙනවාද?" ටිබුල් ඇසුවා.

"ඒ වගෙයි" සුවනී අනුමත කළා.

"ඇත්තටමද?" ටිබුල් ඇසුවා.

"සත්තකින්ම, ඔව්" සුවනී මඳ සිනා පෑවා.

දෙස්තරට නම් කිසිම දෙයක් තේරුනේ නැහැ.

"ඉරිදා දවස් වල කඩපොළේදී සර්කස් පෙන්වන කොට මා කී දේ අහගෙන හිටියද? මම 'හරි' කී හැටියෙම සුවනී කඹය දිගේ ආවා. මම කඹය මැද හිටගෙන හිටියා. කඹය මහ සෙනඟට ඉහළින් ඇදලා තිබුණා. සුවනී මා ළඟට ඇවිදින් මම දනගහලා 'හරි' කී හැටියෙම මගේ උරහිසට නැංගා... එතකොට බයවුණාද?" ටිබුල් ඇසුවා.

"නැහැ. ටිබුල් මට 'හරි' කී හැටියෙම බය නොවී කලබල නොවී, සන්සුන් වෙලා ඉන්නට ඕන. ඉතින් මම බය වුණේ නැහැ." සුවනී කීවා.

"ඔන්න මම 'හරි' කියලා කී හැටියෙම් සුවනී බෝනික්කෙකු වෙන්නට ඕන."

"හොඳයි මම බෝනික්කෙකු වෙන්නම්."

"ඈ බෝනික්කෙකු වෙනවද? ඒකේ තේරුම කුමක්ද?" දෙස්තර ඇහුවා.

අපේ දෙස්තරට නොතේරුණාට ළමයින්ට නම් තේරිලා ඇති නේද. දෙස්තර ගස්පාර් තරම් ඔය ළමයි කලබල වුණේ නැති හන්ද ටිබුල්ගේ කතාව වැටහෙනවා ඇති.

දෙස්තර එදා රෑ කොහෙත්ම නිදා ගත්තේ නැහැ නොවේද. ඔහුගෙ සනීපය නිසා පුදුම විමට පුළුවනි.

කුකුළ දෙවැනි වර හඬළන විට කළයුතු දේ ගැන තීරණය කරලා ඉවරයි. ටිබුල් ඒ ගැන විස්තරයක් කළා.

"සුවනී ඔබ නිළියක්. වයසින් බාල වුණාට නිළියක් හැටියට ඔබ ඉතාම හොඳයි. බොහොම දක්ෂයි. සුවනීට මතකද අපි ගිය අවුරුද්දේ

'මෝඩ රජා' නැටුම පෙන්නුවා. රන් රෙදි වියන්නිය වගේ රඟපෑවා ඉතාම ලස්සනයි. ඊට පස්සේ සුවනී බැලේ නැටුමේදී රූපයක් වගේ අතපය නොසොල්ලා හිටගෙන හිටියා. පිටිමෝල අයිතිකාරයා තේ පෝච්චියට පර්වර්තනය වෙන හැටි රඟපෑවා බොහොම අගේට. ඔබ අනිත් අයට වඩා වැඩිය හොඳට නැටුවා, රඟ පෑවා. නුඹට පුළුවනි බොහොම හොඳට කල්පනා කරන්න. ප්‍රධාන දේ බය නැති කමයි, හොඳට කල්පනා කිරීමයි. සුවනීට මේ දෙකම තියෙනවා." ටිබුල් කීවා. සුවනී කොතරම් සන්තෝෂ වුණාද, ඇගේ කම්මුල් පවා රතු වුණා. ඈ තරමක් ලජ්ජා වුණා.

"දැන් ඉතින් සුවනි ඔබ ටුට්ටිගේ බෝනික්කා වෙන්ට ඕන."

සුවනී බොහොම සතුටු වෙලා අත්පුඩි ගහලා මහලු අවිගුස්ටෝස්, ටිබුල්ටයි, දෙස්තරටයි ආචාර කළා.

"සුවනි ඒ විතරක් නොවෙයි. ඔබ දන්නවද ප්‍රොස්පේරෝව යකඩ කූඩුවක දලා නපුරු පාලකයෝ තුන්දෙනාගේ මාලිගා වත්තේ තියලා තියෙන බව. ප්‍රොස්පේරෝවත් නිදහස් කරන්ට ඕන."

ඔව් යකඩ කූඩුවේ දෙර අරින්නේ කොහොමද?"

"ඔව්, මම දන්නවා ප්‍රොස්පේරෝට බේරිලා යන්ට පුළුවන් මගක්. රහසක්."

"රහසක්ද?"

"ඔව්. එතන උමං මගක් තියෙනවා."

ටිබුල් එතනදී බැලුන් වෙළෙන්ද පැනලා ආ හැටි විස්තර කළා.

"උමං මග පටන්ගන්නේ කුස්සියෙ තියෙන ලොකු තඹ හැලියකින්. ඔබ ඒ මග හොයා ගන්න." ටිබුල් සුවනීට උපදෙස් දුන්නා.

"හොඳයි" සුවනී පිළිතුරු දුන්නා.

ඉර තවම පායලා නැහැ. කුරුල්ලෝ අවදිවෙලා කීචි බීචි ගාන්ට පටන් ගත්තා. රෝද උඩ තියෙන සර්කස් ගෙදර ජනේලයෙන් බැලුවම හිමිදිරි පාන්දර තණ පිටියේ තණ ගස් සහ පැළෑටි සුළඟට වැනෙන හැටි පෙනෙනවා.

හොඳට එළිය වැටුණාට පස්සේ තමයි කූඩුවේ හිටිය සතා මුගටියා නොවෙයි, හිවල් දෙනක බව දැනගත්තේ.

"අපි වේලාව නාස්ති කරන්න හොඳ නැහැ. අපට දුර යන්ට තියෙනවා." දෙස්තර කිව්වා.

සුවනී තමාගේ ඉතාම හොඳ ඇඳුම් දෙස්තරට පෙන්නුවා. ඒ ඇඳුම් සියල්ල මැහැව්වෙත් සුවනී, තනියමයි. බොහොම දක්ෂ නිළියන් වගේම පුංචි තමාට ගැලපෙන ඇඳුම් තෝරාගන්න දක්ෂයි. ඇගේ රුචියත් ඒ වගෙම උසස්.

දෙස්තර ගස්පාර් ඇඳුම තෝරාගන්න උදව් කළා.

"මේ ගවුම ඉතාම හොඳයි. නැතිවුණු බෝනික්කා ඇඳලා හිටිය ගවුම වගෙම ලස්සනයි. මෙන්න මේ ගවුම අඳින්න!"

සුවනී දෙස්තර තෝරපු ගවුම ඇඳගත්තා. දැන් සුවනී හරියට බබළන හඳහාමි වගෙයි. ලෝකයේ කිසිම ළමයෙකුට ඒ වගේ ලස්සන ඇඳුමක් උපන් දින උත්සවයටවත් අඳින්න ලැබෙන්නේ නැහැ. ඒ ගවුම රෝස පාටයි. සුවනි අතක් හරි පයක් හරි සොලවන විට ගවුමේ තිබෙන රත්රන් නූල් පොටවල්, රන් කැටි වැහිපොදක් ඇතිකරන්නා වගෙයි පෙනෙන්නේ. රෝසපාට ගවුම දිලිසෙනවා. සර සර ගාලා හඬක් ඇතිකරනවා.

"මම ලෑස්තියි" සුවනි කිව්වා.

සුවනී දෙස්තරත් එක්ක නපුරු පාලකයින් තුන්දෙනාගේ මාලිගාවට යන්ට ඉස්සෙල්ලා සර්කස් පෙන්වන නළුවන්ගෙන් සමුගත්තා. ඒ නළුවෝ කඳුළු හලන්ට කැමති අය නොවෙයි. හැමදම සර්කස්

පෙන්වන කොට ඒ ගොල්ල ජීවිතයට හානි වනවාට බය නැතුවයි රඟපාන්නෙ.

"අනේ මගේ රත්රන් දුවේ, ඉක්මනින්, ආපහු වරෙන්" මහලු අව්ගුස්ටෝ සුසුම් ලා කිව්වා.

"මම දැන් කම්කරු ජනපදයට යනවා. අපේ බලය ගැන අපි නිසි ලෙස තක්සේරු කරන්ට ඕන. කම්කරුවෝ මා එනතුරු බලා ඉන්නවා. මම ජීවත්ව නිදහසේ ඉන්න බව ඒ ගොල්ල දැනගෙන තියෙනවා." එහෙම කිව්වේ ටිබුල්.

ටිබුල් ලොකු වැහි කබායක් ඇඳගෙන වට්ටියක් වගේ ලොකු තොප්පියක් දගත්තා. කළුපාට ඇස් කණ්ණාඩි කුට්ටමක් ඇස්වල දාගෙන බොරු නහයක් හැබෑ නහයට උඩින් අලවා ගත්තා. "කයිරෝ සංචාරය" නැමැති නැටුමට අයිති ඇඳුම් තමයි ඔහු ඇඳගත්තේ.

දන්නම් ටිබුල්ව හොයාගන්ට කොහොමටවත් බැහැ. ඔහුගේ බොරු නහය නිසා හරියට නත්තල් සීයා වගේ පෙනුණට ඔහුට කාටවත් අඳුනාගන්ට බැහැ.

මහලු අව්ගුස්ටෝ දෙර ළඟ හිටගෙන ඔවුන්ට ආයුබෝවන් කීවා. දෙස්තරයි, ටිබුල් සහ සුවනීයි ගෙයින් එළියට ගියා.

ඉර පායන්ට පටන් ගත්තා.

"ඉක්මනට! ඉක්මනට!" දෙස්තර කිව්වා.

විනාඩියකින් දෙස්තරයි සුවනීයි අස්රියේ වාඩි වුණා.

පාරවල් පාළු වෙලා ඉඳ හිට මිනිස්සු කතා කරන හඬ ඇසුණා. ඔන්න හිටි හැටියේම බල්ලෙක් මහ හයියෙන් බුරන්නට පටන් ගත්තා. ඊට පස්සෙ බල්ලා උගේ කකුලක් රියකට යටවුණා වගේ හීන් හඬකින් උඩු බුරලන්නට වුණා.

දෙස්තර අස් රියේ ඉඳලා දෙර ඇරලා බැලුවා.

ලපිතුප් යෝධයාව හපා කාපු බල්ලාව මතකයි නේද. අන්න ඒ බල්ලා තමයි උඩු බුරලෑවේ.

දෙස්තර හොඳට බැලුවා. බල්ලා මිනිහෙක් එක්ක පොර කනවා. උස හීන්දෑරි මිනිහෙක්, ඔහුගේ හිස පුංචියි, ලස්සනයි. ඔහුගේ ඇඳුම විකාරයක්. ඔහු බල්ලාගෙන් ලස්සන යමක් උදුරා ගත්තා. හරියටම කියන්න බැහැ මොකක්ද කියලා. රෝසපාට රෙදි කෑලි එහාට මෙහාට විසි වුණා.

ඒ පොරයෙන් මිනිහා ජය ගත්තා. ඔහු උඳුරාගත්තු දෙය කිහිලි ගන්නාගෙන වේගයෙන් පැන පැන දුවන්ට පටන්ගත්තා දෙස්තරගෙ අස්රිය දිසාවට.

ඒ මිනිහා හොඳටම ළං වුණා. දෙස්තරගේ උරහිසට උඩින් සුවනී ඔහු දිහා බැලුවා. අර මිනිහා උඩ පැන පැන එක තාලයකට දුවනවා. හරියට බැලේ නැටුම් ගුරෙක් වගේ. ඔහුගේ කබාය කොළපාටයි. පිටි මෝලේ හුළං රෝදේ වගේ කබාය පියාඹනවා. ඔහුගේ කිහිල්ලේ ගෑනු ළමයෙක්. ඇගේ පපුව තුවාල වෙලා.

"ඒ මම යි!" සුවනී කෑ ගහලා කිව්වා.

ඈ වාඩිවෙලා කොට්ටයකින් මූණ වහගත්තා.

සුවනීගේ කෑ ගැසීම නිසා අර මිනිහා හැරිලා බැලුවා. ඔහු නැටුම් ගුරා බව දෙස්තර ඇඳින ගත්තා.

දෙස්තර අතින් ඊයේ රෑ නැති වුණු බෝනික්කාව නැටුම් ගුරා ඇහිඳගත්තු බව දැන් තේරුණා නොවෙද.

9

බඩගිනිකාර බෝනික්කා

ඔටුන්න හිමි පුට්ටි කුමාරයා මාලිගාවේ සඳලුතලයට වෙලා ඉන්නවා. ඔහු අසල භූගෝල ශාස්ත්‍රය උගන්වන ගුරුවරයා දුර දක්නයකින් බල බලා හිටියා. මාලිමා යන්ත්‍රයක් ගෙනෙන්ට කියලා පුට්ටි ඉල්ලා හිටියා. එය දැන් උවමනා නැහැ.

පුට්ටි බෝනික්කාව ගේනකල් බලා හිටියා.

පහුවදා උදේට පණ ඇති බොනික්කා ලැබෙන නිසා සතුටු වුණ පුට්ටි එදා රෑ බොහොම සැපට නිදා ගත්තා.

සඳලු තලයේ ඉඳලා බලනකොට මාලිගාවට එන අස්රියවල්, මිනිසුන්ව දුර ඉඳලම පෙනෙනවා. තද ඉර අව්ව දුර බැලීමට බාධාවක්. පුට්ටි ඉර අව්වට ඇස් දෙක දෑතින් මුවා කරගෙන පාර දිහා බැලුවා.

"තවම කිසිවක් පේන්නේ නැහැ!" ගුරුවරයා කිව්වා.

බෝනික්කාව ගේනවද කියලා දුර ඉඳලම බැලීමට බාර කළේ භූමි ශාස්ත්‍රය උගන්වන ගුරුවරයාටයි. ඔහුට ඉතා හොඳින් ක්ෂිතිජය පේනවා. ඔහු අට දිසාව ගැන දන්නවා.

"නැහැ. පෙනෙනවා වෙන්ට පුළුවනි" ටුට්ටි එකට එක කීවා.

"මා සමග තර්ක කරන්ට එපා. මා ළඟ දුරදක්නය තියෙනවා. ඒ විතරක් නොවේ. මට විශාරද දැනීමක් තියෙනවා. මට පෙනෙනවා ජැස්මින් මල් පොකුරු. ඒවාට ලතින් භාෂාවෙන් ලස්සන නමක් තියෙනවා. මට මතක නැහැ. ඔන්න ඊළඟට මට පේනවා මුර සෙබළු. ඒ ගොල්ල වටේට සමනලයො පියාඹනවා. ඇත මහපාර... පොඩ්ඩක් ඉන්න! පොඩ්ඩක් ඉන්න!"

ගුරුවරයා දුර දක්නය කරකවලා බැලුවා. ටුට්ටි දෙපයේ ඇඟිල්වලින් හිට ගත්තා. පාඩම් ඉගෙනගන්නේ නැතිව පාඩම් දෙන්ට ගිය දා හදවත ගැස්සෙනවා වගේ ඔහුගේ හදවත ගැස්සෙන්ට පටන් ගත්තා.

"ඔව්" ගුරුවරයා ඈත බලා කීවා.

ඒ වේලාවේදී අසරුවෝ තුන්දෙනෙක් මාලිගා වත්තේ. ඉදලා පාර පැත්තට ගියා. ඒ කපිතන් බොනවෙන්ටූරාගේ නායකත්වයෙන් යුත් පිරිස ගියේ අස්රිය පිළිගන්ටයි.

"ජය වේවා!" කියලා ටුට්ටි මහ හඬින් කෑ ගැහැව්වා. ඈත ගමේ හිටිය පාත්තයින්ට පවා ඒ කෑ ගැසීම ඇහිලා උන් හඬ නැගුවා.

බොහොම සතුටින් උඩ පනින ටුට්ටි සඳලු තලයෙන් බිමට බැරිවෙලාවත් වැටුණොත් ඔහුව අල්ලන්ට හරඹ උගන්වන ගුරුවරය ලෑස්ති වුණා.

දෙස්තර ගස්පාර් ගේ අසිරිය මාලිගාවට ළං වුණා. දැන්නම් දුරදක්නය ඕනත් නැහැ. භූමි ශාස්ත්‍රය ඕනත් නැහැ. අස්රියක් එනවද, නැද්ද කියල බලන්ට ඒ දෙකම නැතිව පුළුවනි. අස් රියයි සුදු අස්වයි හැම දෙනාටම පෙනුණා.

වාසනාවන්ත මොහොතකි! අස්රිය අන්තිම පාලම අසල නැවැත්තුවා. මුර සෙබළු අස්රියට ඉඩ දුන්නා. ටුට්ටි උඩ පැන පැන දැත් වනලා අඬ ගැසුවා. ඔහුගේ රන්වන් කෙස් කැරළි සෙළවුණා. මහලු,මිටි, කෙට්ටු, මිනිහෙක් නුහුරු ලෙසට අස්රියෙන් බැස්සා. මුර සෙබළු කඩු දිගු කරලා ආචාර කලා. මිටි, කෙට්ටු මිනිහා අස්රියෙන් ඔබ්නික්කෙකුව එළියට ගත්තා, හරියට රෝස මල් පොකුරක් ගන්නවා වගේ. අස්රිය දිහා බලාගෙන හිටිය ටුට්ටිට පෙනුණු හැටි තමයි. ඒ.

බෝනික්කා, නිල්පාට අහස, දිලිසෙන ඉරු රැස්, පිණි බින්දු සහිත තණ පිටිය, මේවා සේරම කියන්න බැරි තරම් ලස්සන පින්තූරයක් වගෙයි.

විනාඩියකින් බෝනික්කා මාලිගාවට ගෙනාවා. මේවා සියල්ලම සිද්ධවුණේ මෙහෙමයි.

බෝනික්කා තනියම ගමන් කළා.

සුවනී බෝනික්කෙකු වගේ රඟපෑ හැටි ඉතාම අනර්ඝයි! ඇයව බෝනික්කන් ගොඩක තිබ්බා නම් කාටවත් කියන්න බැහැ ඈ බෝනික්කෙක් නොවෙයි කියලා.

සුවනී බොහොම සන්සුන්ව හන්දි නමන්නේ නැතිව ගමන් කළා. ඈ බෝනික්කෙකු වගේ රඟපාන්ට ආසා කලා වෙන්ට ඕන.

සර්කස් පෙන්වන විට සුවනී ඔයිට වැඩිය අමාරු වැඩ කරලා තියෙනව. පොල්තෙල් පහනක් අතකින් අරගෙන එය නොනිවෙන්නට උඩ වීසිකර ඔළුව අල්ලනවා. උඩ පැනලා තුන්පාරක් පිනුම් ගහලා ආපහු දෙපා පොළොවට තියනවා...

සුවනී පොඩි වුණාට සර්කස්වලදී ලස්සනට සිංදු කීවා, පිනුම් ගැහැව්වා, කඹය දිගේ ගිහිල්ලා දස්කම් පෙන්නුවා.

සුවනී පොඩ්ඩක්වත් බය වුණේ නැහැ. බෝනික්කකු වීම නිසා ඈ සතුටු වුණා. බොහොම කලබල වුණේ දෙස්තර ගස්පාර්. ඔහු සුවනී පිටුපසින් ගමන් කළා. සුවනී බැලේ නාට්කාංගනාවක් වගේ ඇඟිලි තුඩුවලින් ගමන් කළා. ඇගේ ගවුම ළෙලදුන්නා.

ලී පොළොව දිලිසුණා.

මාලිගාවෙ පොළොව හදලා තියෙන්නේ ඔබ දැසු බුරුත ලීයෙන්. එය හරියට කණ්ණාඩියක් වගේ. සුවනීගෙ රෝස පාට ගවුම ඔපදැපු බුරුත පොළොවෙන් පෙනුණා. දිලිසෙන ලී පොළොවයි, වටේටම කණ්ණාඩියි නිසා විශාල මාලිගා ශාලාව තවත් ලොකුවට පෙනෙනවා. සුවනී වඩාත් පුංචියි වගේ.

සුවනී ගමන් කරන කොට හරියට පොකුණක පාවෙන රෝස මල් කළඹක් වගෙයි.

ඈ සතුටින්, මඳ සිනා පාමින් යකඩ ඇඳුම් ඇඳගෙන හිටිය මුර සෙබළුන් ළඟින් ගමන් කළා. ඔවුහු පුදුමයට පත්වෙලා බලාගෙන හිටියා. උපන් තේකට හිනා නොවුණු ඇමතිවරු පවා ඇයව දැකලා යම්තම් හිනා වුණා.

සුවනී ඉදිරියේ ලොකු ලොකු ඇමතිවරු, නිලදරුවෝ පසු බැස්සා. ඈ ගමන් කළේ මාළිගාවේ අයිතිකාරිය වගේ.

මාළිගාව ඇතුළෙ මීයට පිම්බා වගේ නිහඬ වෙලා. සුවනී ගමන් කරන හඬ ඇහෙනවා. මල් පෙත්තක් වැටෙන හඬ ඇහෙනවා.

ටුවිටි උඩ ඉඳලා පඩිපෙළ දිගේ පහළට බැහලා දුවගෙන ආවා බෝනික්කාව පිළිගන්ට. ඔහුට හරි සන්තෝෂයි.

දෙදෙනාම එක උසයි.

සුවනී නැවතුනා.

"ඔහෝ, මෙයා තමා ඔටුන්න හිමි ටුට්ටි!" ඈ කල්පනා කළා.

ඇය ඉදිරිපිට ඉන්න කෙට්ටු කොල්ලා තරහ ගිය කෙල්ලකට සමානයි. ඔහුගේ ඇස් අව් පාටයි. ඔහුගේ මූණ යන්තමින් කනගාටු ගතියක් පළ කළා. හිස යම්තම් පැත්තකට හැරිලා.

ටුට්ටි කව්ද, නපුරු පාලකයෝ කව්ද, ඒ ගැන සුවනී දන්නවා. නපුරු පාලකයෝ තුන්දෙනා රටේ තියෙන යකඩ, වානේ ලෝහ වර්ගත්, ගල් අඟුරුත්, වී, සහල්, තිරිඟුත් සියල්ලම එකතුකර ගත්තා. ඒ ගැන පුංචි සුවනී දන්නවා. මහජනයා බඩගින්නේ දුක් විඳින හැටි ඈ දන්නවා. රදළ ළමාතැනී කෙනෙක් සුවනීගෙ කන් දෙක තුවාල කිරීමට වැඩ කාරයින් එවපු හැටි ඈට මතකයි. නපුරු පාලකයෝ, ඉඩම් හිමියෝ ධනපතියෝ මුදලාලිලා එක පැත්තක බව පුංචි සුවනී හොඳට දන්නවා. ප්‍රොස්පේරෝව යකඩ කුඩුව ඇතුළට දැම්මේ ඒ ගොල්ල තමයි. ටිබුල්ව අල්ලා ගන්න හදන්නේ මේ පල්හොරු කට්ටිය තමයි. මේවා ගැන පුංචි සුවනී හොඳට දන්නවා.

සුවනී මාලිගාවට එනකොට ඈ කල්පනා කළේ ටුට්ටි හරියට අර රදළ ළමා තැනී වගේ කෙනෙක් කියලයි. ටුට්ටි පුංචි, කෙට්ටු, නපුරු,

දිව එළියට දමාගෙන ඉන්න හොටු කොල්ලෙක් වෙන්ට ඕන කියල ඈ කල්පනා කළා.

ටුට්ටි ඒ වගේ කෙනෙක් නොවේ. ටුට්ටි හන්ද සුවනීට අප්පිරියාවක් දැනුනේ නැහැ.

ටුට්ටි සුවනී දිහා සතුටු සිතින් බැලුවා.

"මගේ බෝනික්කා නුඹද?" ටුට්ටී අතක් දිගු කළා.

"මම මොනව ද කරන්ට ඕන?" බය වුණු සුවනී කල්පනා කළා. දෙස්තර මට වේලාසනින් ඒ ගැන කීවේ නැහැ නොවේද... බෝනික්කො කතා කරනවද? මුර සෙබළු කඩා දපු බෝනික්කා හැසිරිච්ච හැටි මම දන්නේ නැහැ...

සුවනීට උදව්වට ඉදිරිපත් වුණා දෙස්තර ගස්පාර්. ඔහු ටුට්ටිට කතා කරලා මෙහෙම කිව්වා:

"ඔටුන්න හිමි ටුට්ටි. මම බෝනික්කාට පණ දුන්නා. පණ දුන්නා විතරක් නොවෙයි, ඉස්සරටත් වැඩිය දැන් ඈ ලස්සනයි. වඩාත් හොඳ ගවුමක් ඇන්දෙව්වා. ප්‍රධාන කාරණය බෝනික්කාට කතා කරන්නයි, සිංදු කියන්නයි උගැන්නුවා."

"හරිම වාසනාවක්!" ටුට්ටි හෙමින් තමාටම කියාගත්තා.

"දැන් ඉතින් රඟපාන්න ඕන!" සුවනී කල්පනා කළා.

ඔන්න ඉතින් බිර්සාක මාමාගේ සරකස් කණ්ඩායමට අයත් මේ පුංචි නිළිය තම අළුත් චරිතය රඟ පෑමට පටන් ගත්තා.

ඇගේ වේදිකාව මාලිගාවේ මහ ශාලාව. ලොකු ලොක්කෝ මහ ගොඩක් ඇවිත් හිටියා. ඒ ගොල්ල හැම තැනම පඩිපෙළ දිගේ හිටියා, කොරිඩෝරයේ හිටියා. සඳලුතල වල හිටිය උදවිය වඩා හොඳට බෝනික්කාගේ ගී ගැයීම අහන්ට ශාලාවට ඇවිත් තෙරපෙන්නට වුණා.

ඉර අව්වට නොයෙක්, නොයෙක් පාටැති මල් දිලිසෙනවා.

මහ ගොඩක් සෙනග සිනා මුසු මුනුණු වලින් ඇය දෙස බලන හැටි සුවනීට පෙනුණා.

කෑම උයන කෝකි අප්පුලා අත්වල ඇඟිලි දිගහැර ගෙන සුවනී දිහා බලනවා. ඒ ගොල්ලන්ගේ ඇඟිලි වලින් නොයෙක් කෑම ජාති වල යුෂ පෙරෙනවා. ඇමති ගොල්ල නොයෙක් පාටැති කබා ඇඳගෙන හිටියා. හරියට වඳුරෝ කුකුළන්ගේ වෙස් අරගත්තා සමානයි. පුංචි මහත සංගීත ශිල්පියෝ කිටි කිටියේ තදේට කළු කෝට් ඇඳගෙන

හිටියා. මාලිගාවේ නෝනලා, ඒ ගොල්ලන්ගෙ මහත්තුරු, කුදු දෙස්තර ගොල්ලො, නහය දිග පන්ඩිතයෝ, දූතයෝ, මෙහෙකාරයෝ ඇමතිගොල්ල වගේම බොහොම ලස්සනට ඇඳ පැළඳගෙන හිටියා.

මේ මහ පිරිස ඇලෙන්ට පුළුවන් හැම තැනටම ඇලිලා ඉන්නවා.

හැම දෙනෙක්ම හැම දෙයක්ම නිහඬ වෙලා. ඒ ගොල්ල ඉහළට ඇද ගත්තු හුස්ම පහළට හෙළන්නේ නැතුව බලාගෙන හිටියා. පුංචි සුවනී කිසි බියක් සැකක් නැතිව ඔවුන් දිහා බෝනික්කෙක් වගේ බැලුවා. ඈ කෙහෙත්ම ලජ්ජා වුණෙ නැහැ. කඩ පොළේ සර්කස් බලන්ඩ එන මිනිසුන් ව දැකලා ඇයට පුරුදුයි. මේ මාලිගාවේ ඉන්න අය කඩ පොළේ මිනිසුන්ට වඩා සැරයි. එහෙත් සර්කස් බලන්ට කඩ පොළට ආපු මිනිස්සු - වැඩකාරයො නළුවෝ, සෙබළු, පාසල් ළමයි, පුංචි වෙළෙන්දෝ නළුවන් ගැන රඟපෑම ගැන මාලිගාවේ හිටිය නිකමුන්ට වැඩිය දන්නවා. සුවනී ඒ ගොල්ලන්ට බය වුණේ නැහැ. සර්කස් බලන්ට කඩ පොළට ආපු මිනිස්සු මෙහෙම කිව්වා.

"ලෝකයේ ඉන්න ඉතාම හොඳ ළමා නිළිය තමා සුවනී!...

හැම කෙනෙක්ම තමාගේ අතේ තියෙන අන්තිම සතය වුනත් සුවනී දෙසට වීසි කළා. ඇයට කේක් කෑල්ලක් හරි විස්කෝතුවක් හරි ගන්ට මිනිසුන් උදව් කළේ ඔය විදිහටයි.

ඔන්න ඉතින් සුවනී දැන් බෝනික්කා වගේ රඟපෑමට ඉදිරිපත් වුණා.

ඈ දෙපයේ ඇඟිලි වලින් හිටගත්තා. අත්දෙක මුහුණ ළඟට කිට්ටු කරලා වැළමිටි නවාගෙන පුංචි ඇඟිලි දෙක දික් කළා. සිංදුවක් කියන්ට පටන්ගත්තා. ඒ අතරම මුහුණ වමටයි දකුණටයි හැරෙව්වා.

අඟර දඟර පාලා හිනාවුණා. ඈ පුදුම විදිහට ඇස් වටකුරු කරගත්තා. බෝනික්කන්ගේ ඇස් වටකුරු නොව.

මෙන්න මේ සිංදුව ඈ කීවේ.

බෝනික්කෙකි මා ඉස්සර
මට පණ දුන්නා දෙස්තර
මැරුණු අයට පණ දෙන්නට
පුළුවනි අපෙ අර්නේරිට

බලන්න මම හිනාවෙනව
අහන්න මම ගී කියනව

නටන්න මම හරි හපනී
මගෙ නම සුන්දර සුවනී

සෙබළු කඩපු බෝනික්කා
ටුට්ටිව හීනෙන් දැක්කා
බෝනික්කව කඩපු නිසා
ටුට්ටී හීනෙන් ඇඬුවා!

ඉස්සර මා බෝනික්කෙකි
දැන්නම් ලස්සන නිළියකි
නටන්න මම හරි හපනී
මගෙ නම සුන්දර සුවනී!

"සුවනී" බොහොම හෙමින් ටුට්ටී තමාටම කියා ගත්තා.

ඔහුගේ ඇස්වල කඳුළු පිරුණා. ඒ කඳුළු හන්ද ඔහුට ඇස් හතරක් තියෙනව වගේ පෙනුණා.

බෝනික්කා සින්දුව කියලා හිස පාත්කරලා ආචාර කළා. මාලිගාවේ ලොකු ලොක්කෝ බොහොම සතුටින් සුසුම් ලෑවා. හිස් වනලා තලු මැරුවා.

සින්දුව ඉතාම ලස්සන තාලයක් අනුව ගායනා කළා. නමුත් පුංචි ළමයෙකුට ඔය තරම් කනගාටු ලෙස ගී කියන්න ඔබින්නෙ නැහැ. කට හඬ රත්රන් නළාවකින් පිටවන මිහිරි හඬක් වගෙයි.

සංගීත වාදනය මෙහෙවන ආචාර්ය වරයා කිව්වා දෙව්දුවක් වගේ ගී ගයනවා කියලා.

"සින්දුව තරමක් පුදුමයි" එහෙම කීවේ පපුවේ පදක්කමක් එල්ලාගෙන හිටිය නාකි රදළයෙක්.

සිංදුව ගැන කීම එතැනින් නැවතුනා. ශාලාවට නපුරු පාලකයෝ තුන්දෙනා ආවා. බොහොම සෙනග පිරිලා ඉඳීම ඒ ගොල්ලන්ගේ හිතට ඇල්ලුවේ නැහැ.

සුවනී බෝනික්කාවයි, දෙස්තර ගස්පාර් අර්තේරිවයි නපුරු පාලකයෝ තුන්දෙනාට හඳුන්වා දුන්නා.

නපුරු පාලකයෝ ඊයෝ කැරලි හන්ද කලබල වෙලා නැති හැඩයි. ඒ ගොල්ල මාලිගා වත්තට වෙලා බෝලත් සමග සෙල්ලම් කළා. එහෙම

කළේ මාලිගාවේ දෙස්තරගේ උපදෙස් අනුවයි. තුන්දෙනාම අලි පැටව් වගෙ මහත හන්ද බෝල සෙල්ලමෙන් පස්සෙ හති දැම්මා. ඇඟ පුරාම දුඩිය දුලා. කෑම දිරවන්ට තමයි එහෙම ව්‍යායාම් කළේ. තුන්දෙනාම මහන්සි වෙලා. ඔවුන්ගේ මුහුණු දුඩිය නිසා දිලිසෙනවා. කමිස දුඩිය නිසා පිටට ඇලිලා. එක්කෙනෙකුට බෝල පාරක් වැදිලා ඇහැ වටේට නිල්පාට වෙලා තව එක් කෙනෙක් බයෙන්, බයෙන් නිල්පාට ලපය දිහා හොර ඇහින් බලනවා.

"එයා වෙන්ට ඕන මෙයාගෙ ඇහැට බෝලයෙන් ගැහැව්වේ." සුවනී කල්පනා කළා.

පාර කාපු නපුරු පාලකයෝ ගෙරෙව්වා. දෙස්තර ගස්පාර් කලබල වුණා වගෙ මඳසිනා පෑවා. නපුරු පාලකයෝ තුන්දෙනා නිහඬව බෝනික්කා දිහා බැලුවා. ටුට්ටි බොහොම සන්තෝෂයෙන් ඉන්න හන්ද, තුන්දෙනා සතුටු වුණා.

"ඉතින්, තමුසෙද ගස්පාර් අර්නේරි?" පළමුවැනියා ඇහැව්වා.

දෙස්තර හිස වැනුවා.

"බෝනික්කා කොහොමද?" දෙවැනියා ඇහුවා.

"බොහොම අගෙයි!" ටුට්ටි සතුටින් කෑ ගැසුවා.

ටුට්ටි මෙතරම් සතුටින් ඉන්නවා ඔවුහු තුන්දෙනා කවදාවත් දැකලා නැහැ.

"හොඳයි, හොඳයි! හැබැටම බෝනික්කා හරි අගෙයි..."

පළමුවැනි නපුරා නළල පිහදලා, නපුරු ලෙස කෑ ගහලා මෙහෙම කීවා.

"දෙස්තර ගස්පාර්, නුඹ අපේ නියමය ඉටු කළා. දැන් නුඹට ඕන තැග්ගක් ඉල්ලන්ට අවසර දෙනවා."

නිහඬතාවයක් ඇති වුණා.

දෙස්තර ඉල්ලන දේ පොතක ලියාගන්ඩ ලෑස්ති වුණ, මාලිගාවේ මහ ලියන්නා. ඔහු පුංචි, මිටි මිනිහෙක්. රතුපාට බොරු කොණ්ඩයක් ඔහු ඇඳලා හිටියා.

දෙස්තර තමාට ඕන දේ ඉල්ලන්නට පටන් ගත්තා:

"කැරලි ගහපු අයව මරා දමන්ට ඊයේ නඩු අහන කොටුවේ පෝරක දහයක් හැදුවා..."

"අද එවුන්ව මරා දමනවා" එක නපුරෙක් දෙස්තර ගේ කතාවට කට දැම්මා.

"මාත් කියන්නේ ඒ ගැන තමයි. මගේ ඉල්ලීම මේකයි. දැන් හිරභාරයට අහුවෙලා ඉන්න කැරළි කරුවන්ට නිදහස දෙන්ටයි කියලා මම ඉල්ලා හිටිනවා. හදපු පෝරක දහය පුච්චලා දමන්ට ඕන..."

දෙස්තරගේ ඉල්ලීම ඇහුණු හැටියේම බොරු කොන්ඩකාර මහ ලියන්නාගේ අතේ තිබුණු පෑන බිම වැටුණා. පෑන් තලය දෙවැනි නපුරාගේ කකුලේ ඇනුණා විතරයි, ඔහු වේදනාව නිසා මහා හඬින් කෑ ගැහැව්වා. බෝල පාරට ඇහැ වටේ නිල්පාට ලපයක් තිබුණු පළමුවැනි නපුරා බක බක ගාලා හිනා වුණා. බෝලයෙන් ඇහැට ගැහැව්වේ දෙවැනි නපුරා.

"මොන යකෙක්ද මේ!" දෙවැනි නපුරා මෙහෙම කියලා පෑන කකුලෙන් එළියට ඇද්ද "මොන යකෙක්ද මේ! ඒ ඉල්ලීම රාජ අපරාධයක්! ඒ වගේ ඉල්ලීම් ඉල්ලන්ට අවසර නැහැ!"

මහ ලියන්නා බයවෙලා පැනලා ගියා. ඔහු පැනලා යනකොට, ඔහුගේ පයට හැප්පිලා මල් පෝච්චියක් පෙරළිලා ඒක බෝම්බයක් වගේ පිපිරුණා. මාලිගාව ඇතුළෙ මහා පෙරළියක් පටන් ගත්තා. දෙවැනි නපුරා පෑනක් අරන් ලියන්න පස්සේ දුවන්නට පටන් ගත්තා. ඔහු පෑනෙන් ලියන්නාට ගැහුවා, හරියට හෙල්ල විසිකරන හරඹ කාරයෙක් වගේ. ඔය තරම් මහත මිනිහෙකුට පුළුවන්ද ඒ වගේ දෙයක් හරියට කරන්න. පැන මුර සෙබළෙකුගේ පිටේ ඇනුණා. එහෙත් මුර

සෙබළා හෙළවුණේවත් නැහැ. පෑන එහෙම ඇනිලා තිබුණා. මුර සෙබළ නායකයා තවත් මුර කාරයකුව එතනට පත් කරන තුරු සෙබළා පෑන් පාරත් කාගෙන ඉටි රූපයක් වගේ හිටියා.

"මම ඉල්ලා හිටිනවා, මරණයට නියම කරලා තියෙන සියලුම කම්කරුවන්ට ජීවිත දානය දෙන්ටයි කියලා. පොරක වලට ගිනි තැබිය යුතුයි" දෙස්තර සෙමින්, ස්ථිරවම කියා හිටියා. නපුරු පාලකයෝ තුන්දෙනා මහ හයියෙන් කෑ ගහලා සැර වුනා. පොරවකින් දර පළන්නා වගේ හඬක් ඇහුණා.

"බැහැ! බැහැ! බැහැ! කොහොමටවත් ඉඩ දෙන්න බැහැ. ඔවුන්ව මරා දමනවාමයි!"

"මැරෙන්න" දෙස්තර ගස්පාර් සුවනීට හෙමින් කිව්වා.

සුවනී තේරුම් ගත්තා ඊළඟට රඟපාන්න ඕන කොහොමදැයි කියලා. ඈ දෙපාවල ඇඟිලි වලින් නැගිටලා හීන් හඬකින් කෑ ගහලා වැනුණා. ඇගේ ගවොම හරියට සමනලයකුගේ පියාපත් වගේ සැලෙන්නට වුණා. හිස පැත්තකට ඇලවුණා. දැන්, දැන් මැරිලා වැටෙන්ට වගේ ඈ සැරසුණා.

ටුට්ටි ඉක්මනින් ඈ වෙතට පැන්නා.

"අනේ! අනේ!" කියලා ඔහු කෑ ගැහැව්වා.

සුවනී තවත් දුක්වන හැටි මවා පෙන්නුවා.

"ඔන්න පේනවා නේද? බෝනික්කාගේ පණ අයෙමත් නැතිවෙන්ඩ යනවා. ඇගේ යන්ත්‍රය බොහොම සියුම්. ලේසියෙන් කම්පනය වෙනවා. මගේ ඉල්ලීම ඉටු කරන්නේ නැතිනම් බෝනික්කාගේ යන්ත්‍රය බොහොම නරක්වීමට ඉඩ තියෙනවා. ආයෙමත් බෝනික්කා නරක් වුණොත් ඔටුන්න හිමි ටුට්ටි කුමාරයා බොහොම කනගාටු වේවි." දෙස්තර ගස්පාර් නපුරු පාලකයින් තුන් දෙනාට කිව්වා.

ටුට්ටි බොහොම කෝප වෙලා, අඩි පොළවේ හප්පලා, දත්මිටි කාලා, ඇස් දෙක වහගෙන කෑ ගැහැව්වා පිස්සකු වගේ.

"මම ඉඩ දෙන්නේ නැහැ. ඉඩ දෙන්නේම නැහැ. දෙස්තරගේ ඉල්ලීම වහාම ඉටු කරන්න ඕන. මගේ බෝනික්කාව මම ආපහු දෙන්නේ නැහැ! සුවනී! සුවනී! ඔහු සුසුම්ලන්නට වුණා.

නපුරු පාලකයින්ට දෙස්තරගේ ඉල්ලීම ඉඩ දෙන්න සිදු වුණා. අණක් නිකුත් කළා. සියලුම හිරකායින්ව නිදහස් කරන බවට ප්‍රසිද්ධ කළා. දෙස්තර ගස්පාර් බොහොම සතුටු වෙලා ගෙදර ගියා.

"දන්නම් මම දවසක්ම හොඳහැටි නිදගන්නවා." දෙස්තර එහෙමයි කල්පනා කළේ.

නගරයට යන ගමන් දෙස්තරට ආරංචි වුණා, නඩු අහන කොටුවේ තිබුණු පෝරක වලට ගිනි තියලා ඉවරයි කියලා. කැරළිකාරයින්ව නොමැරූ හන්ද, ධනපතීන් බොහොම අසතුටු වුණා කියලත් ආරංචි වුණා.

සුවනී මාලිගාවේ නැවතුණා.

ටුට්ටිගේ සතුට වචන වලින් විස්තර කරන්ට බැහැ. ඔහුට මල් අතගානවා, කටු කම්බි පාගාගෙන වතුර වලකට වැටුනේ නැතුවා විතරයි. සන්තෝෂෙ හන්ද, ඔහුට ඒවා කිසිවක් පෙනුණේ නැහැ. දැනුනෙත් නැහැ.

"මේ කොල්ලට තේරෙන්නේ නැද්ද මම පණ ඇති කෙල්ලක් බව. මම ඔහු නම්, ඔහු හැසිරෙන විදියට හැසිරෙන්නේ නැහැ." සුවනී එහෙම කල්පනා කළා.

ටුට්ටිට උදේ කෑම ගෙනාවා. මහ ගොඩක් රසැති ලස්සන කෑම එතැන කේක් කැලි තිබුණා. සුවනීට මතක් වුණා ගිය අවුරුද්දේ එකම එක කේක් කැල්ලක් කාපු බව. ඒවා කේක් නොවෙයි, ලෑතර ජාතියක් කියලා අව්ගුස්ටෝ එදා සුවනීට කිව්වා. ටුට්ටිට ගෙනාපු කේක් හරියට මල් වගේ ලස්සනයි. මී මැස්සෝ දහදෙනෙක් ඒවාට මල් කියලා රැවටුණා.

"දැන් මම මොනවා කරන්ටද? බෝනික්කෝ කෑම කනවද? බෝනික්කෝ නොයෙක් වර්ග ඉන්නවා... මට නම් කේක් කැල්ලක් කන්න හරිම ආසයි!" සුවනී සිත සිතා ලතවුනා.

"මටත් කේක් කැල්ලක් දෙන්න..." සුවනී හෙමිහිට කීවා. ඇගේ මූණ ලජ්ජාවෙන් රතු වෙලා.

"අන්න හරි හොඳ බෝනික්කා. ඉස්සර මම නුඹට කැව්වාට නුඹ කෑවේ නැහැ. තනියම කන්න බැහැ. නුඹට කෑම කන්න පුළුවන් වුණු හන්ද මම හරි සතුටුයි" ටුට්ටි සුවනීට කිව්වා.

සුවනී එක කැල්ලක් කෑවා, කැලි දෙකක්, තුනක්, හතරක්ම කෑවා. හරිම සතුටුයි. ටුට්ටිට කෑම ගේන සේවකයා මේක දැකලා බොහොම පුදුම වෙලා කටු ඇරගෙන බලාගෙන හිටියා.

ඔහු පුදුම වුණ නිසා ඔහුගේ කට ඉබේටම ඇරිලා.

සේවකයාගේ තීරණය හරි.

කෑම කන බෝනික්කන්ව සේවකයා කවදවත්ම දැකලා නැහැ.

සුවනී සේවකයා දැක්ක නිසා බය වුණා. හතරවෙනි කේක් කෑල්ලෙන් කොටසක් ඈ අතින් බිම වැටුණා.

වාසනාවකට වගේ ඔහු කට වහගත්තා.

"රස්නෙ වැඩි හන්දා මගේ ඔළුව කැක්කුමක් හැදිලා. ඒ නිසා තමයි මට ඒ විදියට මායාවක් පෙනුණේ." සේවකයා කල්පනා කළා.

ටුට්ටි ආසාවෙන් කතා කරලා, කරලා, මහන්සි වෙලා කට වහගත්තා.

ඉර සැරට පායනවා. නිහඬතාවයක් ඇතිවෙලා. ඊයේ මාලිගාවට හමාපු සුළං දැන් බොහෝම දුර ගිහිල්ලා වෙන්න ඕන. බොහොම රස්නෙයි. කුරුල්ලෝ පවා පියාඹන්නේ නැහැ.

සුවනී ටුට්ටි ළඟින් පිට්ටනියේ වාඩි වෙලා හිටියා. ටුට්ටි ළඟ ටුක්-ටුක් ගාන හඬක් ඇහෙනවා. හරියට ඔර්ලෝසුවක් වගෙයි. නමුත් ඔර්ලෝසුවේ හඬ ටික්-ටික් මිසක් ටුක්-ටුක් නොවන බව සුවනී දන්නවා.

"ඒ මොකක්ද?" සුවනී ඇහැව්වා.

"මොනවද?" කියලා ටුට්ටි ඇහි බැමී හකුළුවාගෙන ලොකු මිනිහෙකු වගේ පුදුම වෙලා ඇය දිහා බැලුවා.

"අර ටුක්-ටුක් ගාන්නේ නුඹ ළඟ ඔර්ලෝසුවක් තියෙනවද?

එක පාරටම ටුට්ටි පිළිතුරු දුන්නේ නැහැ. නිහඬව හිටියා. ආයෙමත් ටුක්-ටුක් ගාන සද්දයක් ඇහුණා. සුවනී ඇඟිල්ලක් දිගු කළා. ටුට්ටි සද්දෙ අහගෙන හිටියා.

"ඒක ඔර්ලේසුවක් නොවෙයි. මගේ යකඩ හදවත ටුක්-ටුක් ගානවා..." ටුට්ටි පැහැදිලි කළා.

10

සත්තු වත්ත

වේලාව දවල් දෙක වුනාම ටුට්ටිව පංති කාමරයට අඬගැසුවා. ඔහුට ඉගෙනගන්න වේලාවයි. සුවනී තනියම ඉන්නවා.

කවුරුවත් සැක කළේ නැහැ සුවනී පණ ඇති ළමයකු කියලා. ටුට්ටිට අයිති හැබෑ බෝනික්කා දෙස්තර අතින් නැති වුණා. අන්න ඒ බෝනික්කා දැන් කා ළඟද. මතකද නැටුම් ගුරා උෑව ඇහිඳගත්තා. නැටුම් ගුරාගේ නම නටනපාද. ඒ බෝනික්කත් බොහොම ලස්සනයි.

හැබයි ඌ කෑම කන්නේ නැහැ. සමහර වේලාවට ටුට්ටි හරි වෙන්ට ඕන. ඒ බෝනික්කාට බඩගිනි නැතුවා වෙන්නට ඕන.

දැන් ඉතින් සුවනී තනියම ඉන්නවා.

ඈ හරියට නොදන්නා රටකට ඇවිල්ලා වල් මත් වුණා වගේ හිටියා.

මාලිගාව මහ විශාලයි. දෙරවල් සියයක් තියෙනවා. පඩිපෙළවල් මහ ගොඩක්.

හැම තැනම මුර සෙබළු. උන් දිහා බලන්ටත් බයයි. උන් යකඩ හැට්ට ඇඳගෙන, බොරු කොණ්ඩ දාගෙන. උන්ගේ යකඩ ඇඳුම් දිලිසෙනවා.

සුවනී මුර සෙබළුන් දිහා බැලුවේ නැහැ.

ඈ ටුට්ටිගේ ඇඳ ළඟ තිබුණු ජනේලය අසල හිටියා.

"දැන් ඉතින් වැඩ පිළිවෙලක් යොදගන්ට ඕන," සුවනී කල්පනා කළා. ප්‍රොස්පේරෝ ඉන්න යකඩ කූඩුව තියෙන්නෙ ටුට්ටියේ සත්තු වත්තෙ. මම කොහොම හරි සත්තු වත්තට යන්ට ඕන." කියලා සුවනී හිතාගත්තා.

ටුට්ටිට හැබෑ ළමයින් කවදාවත් පෙන්නාපු නැති බව ඔය ළමයි දන්නවා නෙවද. ටුට්ටිව කිසිම දුක නගරයට ගෙනියල නැහැ. ඔහු ළමයින්ව දකීවි කියලා තමයි එහෙම කළේ. ටුට්ටි හැඳුනේ මාලිගාව ඇතුළේ. ඔහුට නොයෙක් දේ ඉගැන්නුවා. ඔහුට බොහොම නපුරු, දුෂ්ට රජවරුන් ගැනයි යුද්ද සෙනවිවරුන් ගැනයි කියා දුන්නා. ඔහු එටේ ඉන්න අයට හිනාවීම පවා තහනම් කරලා. ඔහුට ඉගැන්නුවේ බොහොම මහලු ගුරුවරු. ඒ ගොල්ල කෙට්ටුයි. කිසිමදක හිනාවුණේ නැහැ. ඒ ගොල්ල දෙදෙනෙක්ම බඩේ රෝග වලින් පෙලුණා. නිතර, නිතර බඩ රිදෙනකොට කොහොමට වත් හිනවෙන්ට බැහැ.

මිනිස්සු හිනාවෙන හැටි ටුට්ටිට අහන්න ලැබුණෙ කලාතුරකින්. මාලිගාවෙ කෑමට මස් කපන්නා ඉඳලා හිටලා බීලා වෙරිවෙලා, හිනාවෙවී කොළොප්පම් කරන හැටි ඇහිලා තියෙනවා. සමහර උවස්වලදී නපුරු පාලකයෝ තුන්දෙනා ලොකු, ලොකු සල්ලි කාරයින්ව ගෙන්වලා ඒ අයත් එක්ක එක්කහු වෙලා බීලා හිනාවෙන සැටි ටුට්ටි දැකලා තියෙනවා. ඒවා සතුටුවීම නිසා ඇතිවෙච්ච සිනාසීම් කියලා කියන්ට බැහැ. ඒ ගොල්ල හිනාවෙන කොට බලන්න පවා බයයි.

හිනාවුණේ බෝනික්කා විතරයි. බෝනික්කාගේ හිනාව නිසා නපුරක් වෙන්නේ නැතැයි කියලා නපුරු පාලකයෝ සිතුවා. ඒ

විතරක් නොවෙයි, බෝනික්කාට කතා කරන්න බැහැ නොවැ. ටුට්ටිව මහ ජනයාගෙන් වෙන් කරලා. මාලිගාව, උයන, යකඩ පාලම්, අව් ගත් මුර සෙබළු, මේවායින් ටුට්ටිව කොටුකරලා තියෙන බව කියා දෙන්න බෝනික්කෙකුට බැහැ. ඉතින් මේ නිසා ටුට්ටි කම්හල්, ආකර, හිරගෙවල්, ගොවීන්, දනපතියෝ දුප්පතුන්ව තළා පෙළා වැඩ ගන්නා හැටි, වැඩ කරන ජනතාව දහ දුක් විඳින හැටි ආදී දේ ගැන කොහෙත්ම දැනගෙන හිටියේ නැහැ.

නපුරු පාලකයෝ තුන් දෙනාට වුවමනා කළේ ඔටුන්න හිමි ටුට්ටි ඉතාම නපුරු, දුෂ්ට පාලකයකු කරවීමටයි. ඔහුව ළමයින්ගෙන් ඈත් කරලා, ඔහුට සත්තු වත්තක් හදලා දුන්නේ එහෙම නපුරකු කරවීමටයි.

"ටුට්ටි නපුරු සතුන් දිහා බලපුවාවේ. ඔහුට ඉන්නවා පණ නැති ලස්සන බෝනික්කෙක්. නපුරු සත්ත දෙසත්, කොටින්ට අමු මස් දෙන සැටිත්, පිඹුරා පණ පිටින් හාවකු ගිලින හැටිත් ඔහු බලපුදෙන්. නපුරු සත්තු කෑගහන හැටි අහලා, උන්ගේ ඇස් වල ඇති නපුරු බැල්ම ටුට්ටි දැකපුදෙන්. අන්න එවිට ඔහු නපුරු, දුෂ්ඨ පාලකයකු වේවි" කියලා නපුරු පාලකයෝ තුන්දෙනා කල්පනා කළා.

එහෙත් නපුරන්ට ඕන විදියට වැඩ වුණේ නැහැ.

ටුට්ටි ඉතා හොඳින් ඉගෙන ගත්තා. ඔහු නපුරු රජුන් ගැන ඉගෙන ගත්තා. ගුරුවරයින් දිග, උල් නහයවල් දිහා කේන්තියෙන් බැලුවා. ඒ වුණාට ඔහු නපුරෙක් වුණේ නැහැ.

ඔහු සතුන්ට වැඩිය සිය බෝනික්කාට ආදරය කළා.

දෙළොස් අවුරුද්දක් වයසැති කොල්ලෙක් බෝනික්කන් එක්ක සෙල්ලම් කරනවයි කියලා සමහරු පුදුම වේවි. ඒ වයසෙ ළමයි වැඩිය ආසා කරන්නේ දඩයම් කිරීමට. ටුට්ටිගේ ඒ හැසිරීමට වෙනත් හේතුවක් තිබුණා. ඒ ගැන පස්සෙ කියන්නම්.

අපි දැන් සුවනී ගැන හොයලා බලමු.

සුවනී හවස් වන තුරු හිටියා. මහ දවල් බෝනික්කා වැනි, වැනී ගියොත් හැම දෙනාම අවිශ්වාස කරාවී.

පාඩම් ඉවර කරලා ටුට්ටි ආවා. ඔහු බෝනික්කා සමග සෙල්ලම් කළා.

"නුඹ දන්නවද, මම දෙස්තර ගස්පාර්ගේ ගෙදර ඉන්නකොට, දෙස්තර මට බෙහෙතක් පෙව්වා. ඒ බෙහෙත පෙව්ව හැටියම මට

හීනයක් පෙනුණා. මම හීනෙන් හැබෑ ළමයෙක් වුණා... මම හරියට සර්කස් නිළියක් වගේ රඟපෑවා. මම රෝද උඩ සර්කස් ගෙයක අනිත් සර්කස් කාරයෝ එක්ක නැවතිලා හිටියා වගේ හීනෙන් පෙනුණා. ඔන්න ඉතින් අපි හැම තැනම සර්කස් පෙන්නුවා. මම කඹය උඩ යන හැටි, පිනුම් ගහන හැටි, හීනෙන් දැක්කා..."

ටුට්ටි කට ඇරගෙන කතාව අහගෙන හිටියා.

"අපි බොහොම දුප්පත්. බොහෝ දවස් වලදී අපට දවල්ට කෑමක් පවා නැහැ... අප ළඟ හිටියා ලොකු සුදුපාට අස්පයෙක් උගේ නම අනරා. මම උගේ පිට උඩ නැගලා හිටගෙන හරඹ ක්‍රීඩා පෙන්නුවා. අස්පයා මළා. මාසයක් තිස්සේ අපට හරිහැටි කෑමටවත් මුදල් හොයා ගන්ට බැරිවුණා. අස්පයට හොඳට කෑම දීමට බැරිවුණ නිසා ඌ දුර්වල වෙලා මළා..."

"දුප්පත්? මට තේරුම් ගන්ට බැහැ නුඹලා දුප්පත් වුණේ මොකද කියලා" ටුට්ටි ඇහුවා.

"අපි සර්කස් පෙන්නුවේ දුප්පත් මිනිසුන්ටයි. සමහර දවස් වලට අපි සර්කස් පෙන්නුවාම, අපට ලැබෙන්නේ සතය, සත දෙක වගේ තඹ කාසි විරතයි. සමහර දවස් වලට අපේ මහලු අව්ගුස්ටෝ තොප්පිය දික් කළාට එක සතයක්වත් ලැබෙන්නේ නැහැ." සුවනී විස්තර කළා.

ටුට්ටිට ඇගේ කතාව කොහොමටවත් තේරුම් ගන්ට බැහැ.

භවස් වෙලා ඇඳිර පැතිරෙන තුරු සුවනී ටුට්ටිට දුප්පත් මිනිසුන් ගැන විස්තර කළා. ඔවුන් විඳින දුක් කරදර, ඔවුන්ගේ කුසගින්න ගැන ටුට්ටිට පැහැදිලි කළා. පුංචි ළමයින්ගේ කන් උගුල්ලන රදළ අම්මණ්ඩිලා ගැන කිව්වා. දුප්පත් මිනිසුන්ව හපා කෑමට පොහොසත් මිනිසුන් ඔවුන්ගේ බල්ලන්ව උසිගන්වන හැටි ටුට්ටිට විස්තර කළා. ටිබුල්, ගැනත් ප්‍රොස්පේරෝ ගැනත්, කම්කරුවෝ. පතල් කරුවෝ, නැවියෝ පොහොසතුන්ගේ පාලනය පෙරළා දැමීමට කැරළි ගහන හැටිත් අගේට පැහැදිලි කරලා කිව්වා.

වැඩි වැඩියෙන් ඈ කිව්වේ සර්කස් පෙන්වීම ගැනයි. ඈට හීනය ගැන අමතක වුණා.

"මම බොහෝ කාලයක් තිස්සේ බිර්සක් මාමාගේ සර්කස් එකේ රඟපානවා. මම බොහොම පුංචි කාලෙ ඉඳලා නටනවා, අස්පයා උඩ නැගිලා පිනුම් ගහනවා. එක ඔන්චිල්ලාවක ඉඳලා තවත් ඔන්චිල්ලාවකට

'මාර පිනුම' ගහලා පනිනවා. සර්කස් එකේ විත්ත පෙන්වීමටත් මට පුළුවනි. ඇප්රිකට් ඇට වලින් නළා හදලා ඒවාවලින් වෝල්ස් නැටුම වාදනය කරන්ට මට පුළුවනි."

"ඇප්‍රිකට් ඇටවලින් නළා හදන්නේ කොහොමද?"

"ආ නුඹ දන්නේ නැහැ! ඇප්රිකට් ඇට වලින් නළා හදනවා නුඹ දැකලා නැද්ද? ඒක බොහොම ලේසියි. ඇට දෙළහක් අරගෙන නළා දෙළහක් හැදුවා. ගලක අතුල්ලලා පොඩි සිදුරක් හදනවා..."

"හරිම අපූරුයි" සුවනීගේ කතාව අහගෙන හිටිය ටුට්ටි කිව්වා.

"ඇප්රිකට් ඇට වලින් නළා හදනවා විතරක් නොවෙයි, යතුරකින් වුණත් නළා පිඹින්න පුළුවනි..."

"යතුරකින්! ඒ කොහොමද? මගේ ළඟ යතුරක් තියෙනවා. පිඟලා පෙන්නපන්..."

ටුට්ටි මෙහෙම කියලා එයා ඇඳ හිටි කමිසයේ බොත්තම් ඇරලා හීන් දම්වැල් පොටකින් කරේ එල්ලාගෙන හිටිය පොඩි යතුරක් පෙන්නුවා."

"මෙන්න!"

"මොකද නුඹ යතුරක් කරේ එල්ලාගෙන ඉන්නේ?"

"මේ යතුර මට දුන්නේ මහ ඇමතියා. ඒක සත්තු වත්තේ ඉන්න සතකුගේ කුඩුවෙ යතුරක්."

"නුඹ ළඟ අනිත් සතුන්ගෙ කුඩුවල යතුරු තියෙනවද?" ඈ ඇසුවා.

"නැහැ. මේ යතුර ඉතාම නපුරු සතාගේ කුඩුවෙ යතුර කියලා මහඇමති කිව්වා."

සුවනී ටුට්ටිගේ යතුර අරගෙන නළාවක් වගේ පිඹලා ලස්සන තාලයක් වාදනය කළා.

ටුට්ටි බොහොම සතුටු වුණා. ඔහු කොතරම් සන්තෝෂ වුණාද, මහ ඇමතියා ඒ යතුර පරිස්සම් කර ගන්ට ඕනයි කියලා කී බවත් ඔහුට අමතක වුණා. යතුර සුවනීගේ අතේ ඈ වාදනය කරලා ඉඹේටම ඇගේ රෝස පාට ගවුමේ සාක්කුවක එය දමා ගත්තා.

හවස් වුණා.

ටුට්ටිගේ නිදන කාමරය ළඟම බෝනික්කාට කාමරයක් වෙන් කරලා තිබුණා.

ටුට්ටි නින්දට ගියා. ඔහු නින්දෙන් පුදුම හීන දැක්කා: දිය නහයවල් ඇති වෙස්මූණු ඇඳගත් මිනිසුන්. එක මිනිහෙක් මහ විශාල කහ පාට ගලක් කර උඩ තියාගෙන අමාරුවෙන් ගමන් කරනවා. පීප්පයක් වගේ බඩක් තියෙන මිනිහෙක් කළුපාට කසයකින් ගල උස්සාගෙන යන මිනිහට ගහනවා. වැරහැලි ඇඳගත් කොල්ලෙක් අර්තාපල් ගෙඩියක් කනවා. රේන්ද ගොතපු ගවුමක් ඇඳගත් රදළ ළමාතැණී කෙනෙක් අස්පයෙක් පිට නැගිලා යන ගමන් ඇප්රිකට් ඇට දෙළහකින් සංගීත වාදනයක් කළා.

ටුට්ටි සැපසේ නිදාගෙන හීන දකින විට මාලිගාවේ අනිත් කෙළවරේ වෙනින් දෙයක් සිදුවුණා. එය එසේ මෙසේ දෙයක් කියලා හිතන්න එපා. එදා රෑ හීන දැක්කේ ටුට්ටි විතරක් නොවෙයි. පුදුම හීන දැක්කා ටුට්ටිගේ සත්තු වත්ත මුරකරන අනිත් මුර සෙබළෙකුත්.

මුර සෙබළා ගල් පඩියක් උඩ වාඩි වෙලා යකඩ වැටට හේත්තු වෙලා නිදගෙන අරුම පුදුම හීනයක් දක්කා. ඔහුගේ කඩුව දිලිසෙනවා. ඔහු කඩුව දණහිස් මත තබාගෙනයි නිදගෙන හීන දැක්කේ. ඔහුගේ පිස්තෝලය බඳ පටියේ එල්ලා තිබුණා. ඔහු ළඟ බෙරළු ගොඩේ ලන්තෑරුම් පහනක් තිබුණා. ගහකින් බිම වැටුණු දළඹුවෙක් මුර සෙබළාගේ අත අස්සට බඩ ගාන්නට වුණා.

බොහොම සාම කාමී ජවනිකාවක් වගෙයි.

ඉතින් මුරසෙබළා නිදගෙන අරුම පුදුම හීනයක් දකිනවා. ටුට්ටිගේ බෝනික්කා ඔහු ළඟ හීනෙන් ආවා වගේ ඔහුට පෙනුණා. එදා උදේ දෙස්තර ගස්පාර් අර්නේරි මාලිගාවට ගෙනාපු බෝනික්කාම තමයි ඒ. බෝනික්කාගේ ඇඳුම උදේ හැබෑයින් දක්ක ඇඳුම්ම තමයි. නමුත් දැන් හීනෙන් පේන්නෙ බෝනික්කා හරියට පණ ඇති ළමයකු හැටියටයි. ඈ හොඳට ඇවිද්ද, වටපිට බැලුවා. ඇඟිල්ලක් දෙතොල් වලට තියලා කට වහගත්තා.

ලන්තෑරුමට ඇගේ රුව පේනවා.

මුර සෙබළා ඇය දිහා බලා මඳ සිනාවක් පෑවා.

ඊට පස්සේ ඔහු හරි හැටි වාඩිවෙලා යකඩ වැටේ මලක් වගේ සිදුරකට නහය ඔබාගෙන නිදා ගත්තා.

සුවනී දක්කා මුර සෙබළා නිදගෙන ඉන්නා හැටි. ඔහුගේ ලන්තෑරුම් පහන අතට අරගෙන දෙපයේ ඇඟිලි තුඩුවලින් ගමන් කරලා ඈ වැට දෙසට ගියා.

මුර සෙබළා නින්දෙන් ගොරවන්නට වුණා. ඔහුගේ හිතේ ගොරවන්නේ ඔහු නොවෙයි, කුඩුවක ඉන්න කොටියෙක් කියලා.

එහෙත් සත්තුවත්තේ හැම සතෙක්ම නිදගෙන හිටිය හන්දා නිහඬතාවයක් තිබුණා.

ලන්තෑරුම් එළිය වැටෙන්නේ කුඩා පෙදෙසකට විතරයි. සුවනී බොහොම හෙමින් ඇවිදිනවා. අඳුර දිහා හොඳට බලනවා. වාසනාවකට වගේ එදා රෑ කට්ට කළුවරයි. අහසේ තරු තිබුණා. මාලිගාවේ වත්තේ පහන් කණුවල ආලෝකය සත්තු වත්තට වැටුණේ අතරින් පතර. ගස් වලට මුවාවෙලා.

සත්තු වත්තට ඇතුළු වෙලා සුවනී පටු මඟ දිගේ ගමන් කළා. මඟ දෙපස සුදුපාට මල් වලින් පිරුණු මල් පඳුරු.

සුවනීට සතුන්ගේ ගඳ දැනුණා. ඈ සතුන්ගේ පුසුඹ අඳුණනවා. ඉස්සර සර්කස් කණ්ඩායම එක්ක සිංහයෝ තුන්දෙනෙකුයි, ලොකු බල්ලෙකුයි, සතුන් මෙල්ලකරන්නෙකුයි තැනින් තැන ගියා.

පටු මග අගට කොටුවක වගේ හිස් බිමක්. වටේට කළුපාට ගෙවල්වගේ කූඩු.

"සතුන්ගේ කූඩු" සුවනී හෙමින් කීවා.

ඇගේ හදවත ගැහෙන්ට පටන් ගත්තා. සුවනී සතුන්ගේ කූඩු ළඟට ආවා.

"ප්‍රොස්පේරෝ කොයි කූඩුවේද?" ඈ කැළඹුණා.

ඈ ලන්තෑරුම උස්සලා කූඩුවෙන් කූඩුව බැලුවා. හැම කූඩුවක්ම නිහඬයි. ලන්තෑරුමේ එළිය කූඩුවට වැටුණම කූඩුවේ හරස් පොලුවලින් අතිවන හෙවනැලි සතුන්ගේ ඇඟට වැටෙනවා.

ඈ දැක්කා සතුන්ගේ විශාල කන්, පිටවල්, දිගඇරිලා තියෙන පාද. රාජාලියෝ පිහාටු දිග හැරගෙන නිදගෙන හිටියා, මහ විශාල බිම් මල් වගේ. සමහර කූඩු ඇතුළෙ හිටිය සතුන්ව අඳුණාගන්ටත් අමාරුයි.

හීන් රිදී කූඩුවක වට රවුමක ගිරව් කීපදෙනෙක් හිටියා. කූඩුවේ හරස් පොලු ළඟම හිටිය ගිරවාගේ බෙල්ල රතු පාටයි. ඌ එක ඇහැක් ඇරලා සුවනී දිහා බැලුවා. උගේ ඇහැ හරියට ඉදිච්ච දෙහි ගෙඩියකට සමානයි.

ඌ ඉක්මනට ඇහ වහගෙන නිදි වගේ හිටියා. ඌ, උගේ රතුපාට බෙල්ල දිහා බලලා හිනාවුණා වගේ සුවනී දැක්කා. ඌ බොහොම කපටි ගිරවෙක්.

"මම මෝඩ කෙල්ලක්!" ඈ තමාටම කියා ගත්තා. නමුත් ඇගේ හිතට බයක් දැනුණා.

හිටි හැටියේම කළුවරේ පටස් ගාන සද්දයකුයි, හීන් කෙඳිරියකුයි ඇහුණා.

රෑට අස්ස ඉස්තාලෙට හරි කුකුළු කොටුවට හරි ගිහිල්ලා අහගෙන ඉන්න. නිහඬතාවය තිබුණට නොයෙක්, නොයෙක්, පොඩි, පොඩි සද්ද ඇහෙනවා. තටු ගහන හඬ, තලු මරන හඬ, නොයෙක්, නොයෙක් සද්ද අහන්න පුළුවනි.

"ප්‍රොස්පේරෝ කොහිද?" ආයෙමත් සුවනී හිතන්නට පටන් ගත්තා. ඔහුව මරා දමලා, ඔහු හිටිය කූඩුවට රාජාලියකුව දැම්මයි කියලයි ඇයට හිතෙන්නේ.

අඳුරේම කවුදෝ බැරැඩි හඬකින් කතා කළා:

"සුවනී!"

ඒ කට හඬ බොහොම ගුටිකාපු හන්දු වේදනා විඳින සතකුගේ කෙඳිරි ගෑමකට සමානයි.

"අනේ!" සුවනීට ඉබේටම කෑ ගැහුණා.

ඈට කතා කළ හඬ ආපු පැත්තට ඈ ලන්තෑරුම ඇල්ලුවා. පහනේ එළියට පෙනුණේ රතු පාට ගිනි බෝල දෙකක්. මහ විසාල කළුපාට වලසෙකු වගේ සතෙක් කුඩුවේ යකඩ පොලු අල්ලාගෙන හිස ඒවාට හේත්තු කරගෙන හිටියා.

"ප්‍රොස්පේරෝ!" සුවනී සෙමින් කිව්වා.

විනාඩියක් ඇතුළත ඈට අදහස් ගොඩක් කල්පනා වුණා.

මොකද ඔහු මෙතරම් භයානක වුණේ? ඔහුගේ ඇඟ පුරාම මයිල්, හරියට වලසෙකුගෙ වගේ. ඔහුගේ අත්වල නියපොතු වැඩිලා. ඔහු නිරුවතින් ඉන්නවා. මිනිහෙක් නොවෙයි ගෝරිල්ලෙක් වගෙයි.

සුවනී අඬන්ට ලෑස්ති වුණා.

"ඔන්න අන්තිමට නුඹ ආවා. සුවනී, මට දැනුණ නුඹව බලන්නට පුළුවන් වේවි කියලා.

"ආයුබෝවන් ප්‍රොස්පේරෝ! මම ආවේ. මාමාව හිර කුඩුවෙන් එළියට අරගෙන නිදහස් කරන්නයි." සුවනී වෙවුල වෙවුල කිව්වා.

"අද මට කුඩුවෙන් එළියට යන්න බැහැ. මා ගල් ගැහිලා!"

ඔහු වේදනාවෙන් කෙඳිරි ගාන හැටි ඇයට ඇසුනා. කළු වලසෙක් වැනි සිරුර අමාරුවෙන් නැඟිටලා යකඩ පොලු අල්ලා ගත්තා.

"සුවනී ළඟට එන්න!"

සුවනී ඔහු ළඟට ගියා. ඒ මුහුණ දිහා බලන්න පවා බයයි. ඒ මුහුණ මිනිහකුගේ මූණක් වගේ නොවෙයි. වලසෙකුගේ හොම්බකට සමානයි. වැඩියෙන් භයානක දේ තමා, ඒ වලස් මූණේ කන් දෙක මිනිහෙකුගේ කන් දෙකකට බොහොම සමානවීම. හිසකෙස් කොටට කපලා.

සුවනී දෙනෙත්වල කඳුළු පිහදා ගන්ට අතක් එසවූවා. ලැන්තෑරුම එතකොට වැනුණා.

"සුවනී නුඹ මට බයද... මගේ මිනිස් හැඩහුරු කම නැතිවෙලා. නුඹ බයවෙන්ට එපා! ළඟට වරෙන්... නුඹ උස ගිහිල්ලා, කෙට්ටුවෙලා. නුඹේ මුහුණෙන් කනගාටු ගතියක් පේනවා..."

ඔහු කතා කළේ බොහොම ලොකු වේදනාවකින්. ඔහුට ඉබේම දණ ගැසුණා. ඔහු කට ඇරගෙන හුස්ම ගත්තා. ඔහුගේ කට පුරා ලේ. සමහර දත් රතු පාටයි.

"මම දැන් මැරෙන්න ළඟයි. මම දැනගෙන හිටියා මැරෙන්න ඉස්සෙල්ලා නුඹව බලන්න ලැබේවි කියාලා."

ඔහු අතක් දිගු කළා. අඳුරේ යමක් හෙව්වා. යකඩ ඇණයක් බිම වැටෙන හඬ ඇසුණා. ඉන් පසු ලේ පෙරෙන අත ඔහු දිගු කළා.

ඔහු කුඩා ලී කෑල්ලක් සුවනීට දුන්නා.

මේ ලී කැල්ලේ ඕන දේ ලියලා තියෙනවා. මේක අරගනින්."

සුවනී ලී කෑල්ල සඟව ගත්තා.

"ප්‍රොස්පේරෝ!" ඈ හෙමින් කතා කළා.

පිළිතුරු නැහැ.

සුවනී ලන්තෑරුම් පහන යකඩ කුඩුව ළඟට අල්ලා බැලුවා. ඔහුගේ දත් දෙපෙළ තදින් වැහිලා. ඇස් දෙක ඇරිලා.

"ප්‍රොස්පේරෝ! සුවනී ඇඬුවා. ඈ අත තිබුණු ලන්තෑරුම බිම වැටුණා.

ප්‍රොස්පේරෝ මළා! ඔහු මළා! අනේ ප්‍රොස්පේරෝ!"

පහන නිවුණා.

හතරවැනි
කොටස

ප්‍රොස්පේරෝ

11

සුවනී සෙබළුන්ට අසුවෙයි

සත්තු වත්තේ දෙර ළඟ වාඩිවෙලා නිදගෙන උන්න මුර සෙබළා ළඟ තිබුණු පහනත් අරගෙන සුවනී ප්‍රොස්පේරෝව හොයන්ට ගිය බව දන්නවා නේද. ලන්තෑරුම් පහනත් අරගෙන සුවනී සතුන්ගේ කූඩු පහුකර ගෙන යනකොට සතුන්ට ඇහැරුණා.

උන් කෑගහන්ටයි, අත් තටු ගහන්ටයි, සද්ද කරන්ටයි පටන් ගත්තා.

නිදගෙන හිටිය මුර සෙබළා නින්දෙන් අතක් දිග හරින විට, ඒ අත යකඩ වැටට වැදිලා ඔහු අවදි වුණා.

ඔහු නැගිට්ටා, හැම තැනම බැලුවා, ඔහුගේ ලන්තෑරුම් පහන නැහැ. අහසේ තරු දිලිසෙනවා. පිච්ච මල් සුවඳයි.

"යක්ෂ දිස්ටියක්!" මුර සෙබළා එහෙම කියලා කෙළ ගැසුවා, ළඟ තිබුණ පිච්ච මල් වැලට. මල් පෙත්තක් කැඩුණා.

සත්තු කෑ ගහනවා. සද්ද කරනවා.

මුර සෙබළා අනතුරු අඟවන නළාව පිම්බා. විනාඩියක් ගියා විතරයි ගිනි පන්දම් අරගෙන සෙබළු දුවගෙන ආවා. එක සෙබළෙකුගේ පය ලිස්සා ඔහු වැටුණා. තව සෙබළෙකුගේ සපත්තු අඩුවක හැප්පිලා ඔහුගේ නහය කැඩිලා ලේ ගලන්නට වුණා.

මගේ ලන්තෑරුම හොරකම් කරලා!"

"කවුදෝ සත්තු වත්තට රිංගලා!"

"හොරු!"

"කැරලි කාරයෝ!"

නහය කඩාගත්තු මුර සෙබළයි, අනිත් අයයි එකතුවෙලා පන්දම් අරගෙන හොරාව හොයන්න ගමන් කළා.

නමුත් ඔවුන්ට කිසිම දෙයක් හොයා ගන්ට බැරිවුණා.

කොටියෝ නැගිටලා දත් විරිත්තලා ගොරවන්නට වුණා, සිංහයෝ උන්ගේ කූඩුවල ඇවිද්ද. ගිරව් නොයෙක් සද්ද ඇතිකළා. හරියට සතුන්ගේ වාදනයක් වගේ. වඳුරෝ උඩ පනින්නට වුණා. වලස්සු ගෙරෙව්වා.

ගිනි පන්දම් හන්දා සත්තු වඩ වඩාත් කෝපවෙලා.

මුර සෙබළු සතුන්ගේ කූඩු හැම එකක්ම බැලුවා.

කිසි දෙයක් හොයාගන්ට බැරි වුණා.

සුවනී ගෙනිච්ච ලන්තෑරුම් පහන පවා හොයාගන්න බැරි වුණා.

නහය කඩාගත්තු මුර සෙබළා නහයෙන් කතා කළා:

"නැවතියල්ලා!" ඔහු පන්දම ඉහළට ඉස්සුවා.

මුර සෙබළු උඩ බැලුවා. ලොකු ගහක කළු පාටට පේනවා. කොළ සෙළවුණේ නැහැ රැය නිසලයි.

"පේනවද?" මුර සෙබළා සැරවෙලා ඇහැව්වා. ඔහු පන්දම වැනුවා.

"ඔව්, මොනවදෝ රෝස පාටට පෙනෙනවා..."

"පුංචියි..."

"ඉඳගෙන ඉන්නවා..."

"මෝඩයෝ! මොකාද දන්නවද? ඒ ගිරවෙක්. කුඩුවෙන් එළියට ඉගිල්ලිලා ගිහින් ගහ උඩ ලැගලා ඉන්නවා! ගිරවෙක් නොවෙයි. උෆ යකාට ගියාදෙන්."

සත්තු වත්ත මුරකරපු සෙබළා කට වහගෙන හිටියා.

"ගිරවා අල්ලා ගන්ට ඕන. උෆ සත්තුන්ව නැගිට්ටවලා කාල ගෝට්ටියක් ඇති කළා."

"කතාව ඇත්ත. වුරුම්! නුඹ තමා බාලයා. ගහට නැගපන්."

වුරුම් ගහ ළඟට ගියා . නගින්න බයයි.

"ගහට නැගලා ගිරා හොටෙන් උෆව අල්ලපන්." අනිත් මුර සෙබළු වුරුම්ට කිව්වා.

රෝසපාට ගිරවා නොසෙල්වී ඉන්නවා. පන්දම් සේරම ගිරවා දිහාට දික් කරලා.

වුරුම් තොප්පිය ගළවලා හිස කසලා මෙහෙම කිව්වා.

"මට බයයි. ගිරවි හපනවා. බොහොම රිදේවි."

"මෝඩයා!"

ඔයින් මෙයින් වුරුම් ගහට බඩගෑවා. බාගයක් දුර නැගලා, ඔහු නැවතිලා ආපහු බිමට බැස්සා.

"ගස් බඩ ගාන්න මට බැහැ. ගිරවුන්ට විරුද්ධව යුද්ධ කරන්න මට බැහැ" වුරුම් කිව්වා.

මේ වේලාවේදී මහල්ලෙක් තරහින් කෑ ගැහැව්වා. මහල්ලා සෙරෙප්පු අද්ද අද්ද ආවා.

"ගිරවාට හිරිහැර කරන්න එපා! උෆට ඉන්න පාඩුවේ, ඉන්න දෙනවා!" මහල්ලා කෑගැසුවා.



කෑ ගහපු මහල්ලා තමා සත්තු වත්ත පාලනය කරන ලොක්කා.

ඔහු සත්ත්ව විද්‍යාව පිළිබඳ පණ්ඩිතයෙක්. ලෝකයේ ඉන්න සියලුම සතුන් ගැන ඔහු දන්නවා.

කාලගෝට්ටිය හන්ද ඔහු අවදිවෙලා මෙතැනට ආවා.

ඔහුගේ ගෙදර තියෙන්නේ සත්තු වත්ත ළඟමයි. ඔහු නිදා හිටිය පිජාමා ඇඳුම පිටින්ම ගහ ළඟට ඇවිත්.

පණ්ඩිතයා බොහොම කලබල වුණා. මුර සෙබළු ඇවිත් ඔහුගේ සත්ත්ව ලෝකයට කඩා වැදීමට යනවා. මෝඩ පහේ සෙබළෙක් ඇවිත් ගිරවාගේ බෙල්ලෙන් අල්ලන්ට ලෑස්ති වෙනවා.

මුර සෙබළු විසිර ගියා.

සත්ත්ව විද්‍යාව පිළිබඳ පණ්ඩිතයා යටි උගුරෙන් කෑ ගහන්නට පටන් ගත්තා. ගහ උඩ රෝස පාටට මොකක්දෝ පෙනෙනවා.

"ඔව්. ඒ ගිරවා තමයි. මගේ ඉතාම හොඳ ගිරවී. ඔය ගිරවිට කුඩුවේ නිකම් ඉන්ට බැහැ. හැබෑ දඟකාරී. ඒ මගේ ලෝරා, ලෝරා! ඔහු යටි උගුරෙන් ගිරවියට අඬ ගැසුවා." පණ්ඩිතයා ලස්සන හුරතල් නම් වලින් අඬගහන්ට කැමතියි."ලෝරා! ලෝරා! ලෝරා!"

මුර සෙබළු හිනාවුණා. හැබෑටම මේ පූංචි මහල්ලා පිජාමා ඇඳුමක් ඇඳගෙන, දිග තොප්පියක් ඔළුවේ දමාගෙන, සෙරප්පු කුට්ටිමක් පය ලා ගෙන යටි උගුරෙන් කෑ ගහනවා. ඔහු ඊටේට මහ යෝද මුර සෙබළු ගිනි පන්දම් අරගෙන ඉන්වා. කුලප්පු වෙච්ච කොටි, වලස්සු සිංහයෝ හඬ නගනවා, ගොරවනවා.

ඔන්න, ඊට පස්සෙ හොඳටම හිනා විය හැකි දෙයක් සිද්ධ වුණා. පණ්ඩිතයා ගහ දිගේ බඩ ගෑවා. ඔහු ඉක්මනින් ගහට නැග්ගා. ඔහු පුරුදු කාරයෙක්. එකයි, දෙකයි, තුනයි කියන්ට ඉස්සෙල්ලා පණ්ඩිතයා රෝස පාට ලපයක් වගේ පෙනෙන තැනට ළං වුණා. මහල්ලෙක් ගස් නැගීම භයානක වැඩක්.

"ලෝරා!" කියලා ඔහු ආයෙමත් කෑගැහැව්වා.

හිටි හැටියේම පණ්ඩිතයා යටි උගුරෙන් මර හඬ දුන්නා. හැතැප්මයක් දුරට ඒ හඬ ඇසෙන්න ඇති.

"යකෙක්!" ගහ උඩ යකෙක් ඉන්නවා! පණ්ඩිතයා කෑ ගැසුවා.

ගිරවා සමග අත්තක් උඩ කවුදෝ මහ දූවැන්තයෙක් ඉන්නා හැඩයි.

මුර සෙබළු ගහෙන් ඇත් වුණා. පණ්ඩිතයා ගහෙන් බිම වැටුනා. ආසනාවකට ඔහු හයිය ඇති කොට අත්තකට ඇමුණුනා. ඔහුගේ

පිජාමා කබාය ගහට ඇමිනිලා ගහේ එල්ලිලා ඉන්නවා.

අනිත් පණ්ඩිතයෝ, මේ පණ්ඩිතයා ගහේ එල්ලිලා ඉන්න හැටි දක්කානම්, ඔහුගේ තට්ටයටයි, දැනීමටයි ගරු කිරීමක් වශයෙන් අහක බලාගෙන යාවි. ඔහු ගහේ එල්ලිලා හිටිය විදිහ ඔහුගේ පණ්ඩිතකමට ඔබින්නේ නැහැ.

මුර සෙබළු බයවෙලා ඈත් වුණා. උන්ගේ අත්වල තිබුණු ගිනි පන්දම් වැනෙන්න පටන් ගත්තා. කළුවරේ යමකුට හිතන්න පුළුවනි, ගිනි රන් පාටට දිලිසෙන බෙලි ඇති කළු පාට අස්පයෝ දුවනවා කියලා.

සත්තු කෑ ගහලා, ගොරවලා පස්සෙ සන්සුන් වුණා. පණ්ඩිතයා ගහේ එල්ලිලා පඹයකු වගේ ඉන්නවා. ඒ අතර මාලිගාවේ කැළඹීම් ඇතිවෙලා.

අරුම පුදුම ගිරවා ගහට පියාඹන්ට විනාඩි පහළොවකට ඉස්සෙල්ලා නපුරු පාලකයින් තුන්දෙනාට නරක ආරංචියක් ලැබුණා.

"නගරයේ කැළඹීම් ඇතිවෙලා. කම්කරුවෝ අවි අරගෙන. ඔවුන් ළඟ පිස්තෝල, තුවක්කු තියෙනවා. කම්කරුවෝ මුර සෙබළුන්ට වෙඩි තියනවා. ධනපතීන්ව අල්ලා ගඟට වීසි කරනවා."

"සර්කස් කාර ටිබුල් නගරය අවට ජනතාව යුද හමුදාවකට සංවිධාන කරන්ට පටන් අරගෙන."

"මුර සෙබළුන්ගෙන් බොහෝ දෙනෙක් නපුරු පාලකයින් තුන්දෙනාට සේවය නොකිරීමට කම්කරුවන්ගේ ගෙවල් වලට ගිහිල්ලා."

"කම්හල් වල වැඩ කරන්නේ නැහැ. යන්ත්‍ර නැවතිලා. පතල් කරුවෝ පතල් කණින්ට බැහැ, ධනපතින්ව තරකරන්ට තවත් බැහැ. කියනවා."

"ගොවියෝ ඉඩම් හිමියන්ට විරුද්ධව සටන් කරන්ට ඉදිරිපත් වෙලා."

ඇමතිවරු නපුරු පාලකයින් තුන්දෙනාට දැන්වූ ආරංචි ඒවාය.

අනතුරුදායක ආරංචි අහන කොට නපුරු පාලකයෝ තුන්දෙනා තව තවත් මහත් වෙන්ට පටන් ගත්තා. ඇමති මණ්ඩලය බලා ගෙන ඉන්නා විටම ඔවුන් රාත්තල් කාලක් බැගින් මහත් වුණා.

"අනේ මට බැහැ. මගේ ඉවසීම මෙතනින් ඉවරයි. මගේ කර පටියේ බොත්තම කැඩිලා. මගේ බෙල්ල මහත් වෙලා" එක නපුරු පාලකයෙක් කෑ ගැහුවා.

එතකොට ඔහුගේ කර පටියේ බොත්තම කැඩිලා 'පටාස්' ගාලා වීසිවුණා.

"අනේ අපොයි. මම මහත් වෙනවා. මාව බේරාගනිල්ලා!" අනිත් නපුරා කීවා.

තුන්වෙනියා දුකෙන් තමාගේ බඩ ගෙඩිය දිහා බලාගෙන ඉන්නවා. එයාගෙ බඩගෙඩිය තවත් මහත් වෙලා.

දැන් ඇමති මණ්ඩලය ඉදිරියේ හදිසි ප්‍රශ්න දෙකක්: එකක් තමයි, ඇස් ඉදිරිපිට මහත් වෙන නපුරු පාලකයින් තුන්දෙනාගේ බර අඩුකිරීමට පිළියමක් කිරීම. අනික, නගරයේ පැන නැගලා තියෙන කැරැල්ල මැඩ පැවැත්වීම.

මහත්වීම නැවැත්වීමට ගත් තීරණය මෙයයි:

"නැටුම්! නැටුම්! සත්තකින්ම නැටුම්! ඉතාම හොඳ බේත!" අත, පය, බඩ, කඳ, පිට, බෙල්ල, හොළවලා නටන්න ඕන.

"විනාඩියක්වත් පමාකරන්නේ නැතිව නැටුම් ගුරුව ගෙන්වල ඵහාම නැටුම් කියා දෙන්ට ඕන. පාලකයෝ නටන්ට පටන් ගත්තාම මහත්වීම නැවතිලා කෙට්ටු වෙන්ට පටන් ගනීවි."

"ඔව්." පළමුවැනි නපුරු පාළකයා කිව්වා. "නමුත්..."

හරියටම මෙන්න මේ වෙලාවෙදී තමයි, සත්තු වත්තේ ගහේ එල්ලිලා හිටිය පණ්ඩිතයා මාලිගාව දෙවනත් වෙන්න යටි උගුරෙන් කෑ ගැහැව්වේ. ඔහු ගහ උඩ හිටිය යකෙකුව දැකලා. ඔහු ගස්බඩ ගෑවේ ගිරවාව අල්ලා ගන්නයි.

ඇමති මණ්ඩලය තීරණ ගැනීම නවත්වලා සත්තු වත්තට දුවන්ට පටන් ගත්තා.

"හා! හෝ! හූ!" ගාන හඬ මාලිගා වත්ත පුරාම ඇහුණා.

මාලිගා වත්තේ මේ සද්දය හන්දා වර්ග තිස් හතකට අයිති යමනලයෝ පියඹලා ගියා උන් බොහොම ලස්සනයි.

මාලිගා වත්තේ හැමතැනම ගිනි පන්දම් පත්තු වෙන්ට පටන් ගත්තා. ගස් වල දුම්මල ලාටු ගින්නට අහුවෙලා එයින් සුවඳක් වහනය වුණා. මාලිගාවත්තට යාබද කැලෑව ගිනිගත්තා.

ගින්න සත්තු වත්තට අඩි දහයකින් පමණ ළං වුනා. හැම දෙනාම පුළුවන් තරම් හයියෙන් 'පණ එපා!' කියලා දුවනවා. දුවන අය ගිනි පන්දම් බිම දැලා දිව්වා. ඔවුන් එකිනෙකාගෙ ඇඟේ හැප්පිලා බිම වැටෙනවා. ගින්න නිසා ඇතිවුණු දුමෙන් මාලිගා වත්ත පිරිලා.

"අයියෝ!"

"අනේ!"

"බේරියල්ලා!"

මාලිගාවත්තට ආපු ලොක්කෝ හැමතැනම දෙවනත් කළා. හැම තැනම රතුපාට ගිනි සිළු.

සත්තු වත්තේ කුඩුවක හිටිය මහා දැවැන්ත මිනිහෙක්, දෙර හැරගෙන හෙමින්, හෙමින් ගමන් කළා.

හැම තැනම ගිනි ඇවිලිලා තියෙන මේ මොහොතේ ඔහු ගමන් කළේ අවතාරයක් වගේ. ඔහුගේ හිසකේ රතුපාටයි. දෙනෙත් ගිනිබෝල වගේ දිලිසෙනවා. ඇඳුම් ඉරිලා. අවතාරයක්ම තමා. ඒක අතකින් ඔහු කොටියකු සහ උගේ බෙල්ල වටේට යකඩ පටියක් දැපු දම්වැලක් අල්ලා ගෙන ගමන් කළා. කොටියා දම්වැළ කඩාගෙන දුවන්ට හදනවා. ගොරවනවා, පනිනවා. උඟ වරෙක දිව එලියට දගෙන කෑ ගහනවා. තවත් වරෙක ගොරවනවා.

දුවන මිනිසුන්ගෙන් සමහරු හැරී බැලුවා. ඒ මහ විශාල මිනිහාගේ අනිත් අතේ රෝස පාට ගවුමක් ඇඳගත්තු ගෑනු ළමයෙක්. ගෑනු ළමයා කොටියා දිහා බයවෙලා බලනවා. ඇගේ කකුල් වල රත්තරන් වැඩ දැපු සපත්තු. ඈ විසාල මිනිහාගේ උරහිසට, හිස තබාගෙන හිටියා.

"ප්‍රොස්පේරෝ!" දුවන මිනිස්සු කෑගැසුවා.

"ප්‍රොස්පේරෝ! ඒ ප්‍රොස්පේරෝ!"

"බේරිලා දුවපල්ලා!"

"බෝනික්කා!"

"බෝනික්කා!"

ප්‍රොස්පේරෝ කොටියාව ඉස්සරහට යැව්වා.

කොටියා ගොරවලා, වලිගය වනලා දුවන මිනිසුන් පස්සේ ලුහුබැඳ දිව්වා.

සුවනී ප්‍රොස්පේරෝගේ අතේ ඉඳලා බීමට පැන්නා. දුවන මිනිස්සු පිස්තෝල වීසි කර කර දිව්ව හන්දා මාලිගා වත්ත පුරාම පිස්තෝල. සුවනී බීමට පැනලා පිස්තෝල තුනක් ඇහිඳ ගත්තා. එයින් දෙකක් ප්‍රොස්පේරෝ දෑතට ගත්තා. එකක් සුවනී ගත්තා. පිස්තෝලය සුවනීගෙන් බාගයක් තරම් උසයි. ඒ වුනාට ඈ දන්නවා වෙඩි තියන්නට.

"යමු!" ප්‍රොස්පේරෝ අණ කළා.

කොටියා දුවන මිනිසුන් පස්සේ ගිහිල්ලා මොනවා කළාද කියලා ප්‍රොස්පේරෝවත්, සුවනීවත් සෙව්වේ නැහැ. මේ දෙදෙනාට ඕන ඉක්මනින් මාලිගාවෙන් පිටවෙලා යන්නයි.

ටිබුල් කියාපු රහස් ලිප කොහිද? පුංචි ළමයින්ට බැලුන් බෝල විකුණපු වෙළෙන්දා මාලිගාවෙන් පිටවෙලා ගිය රහස් ලිප කොහිද? ඒ ලිප උඩ තියන හැලිය තමා උමං මගට ඇතුළු වෙන දොරටුව.

"කුස්සියට යමු! කුස්සියට යමු!" සුවනී පිස්තෝලය වැනුවා.

මේ දෙදෙනා පඳුරු අතරින්, මහ අඳුරේ දුවනවා. නිදා හිටිය කුරුල්ලෝ අවදිවෙලා සට සට ගාලා තටු ගැහැව්වා. සුවනීගේ ලස්සන රෝසපාට ගවුම කිළිට වුණා.

"බොහොම රස කෑමක සුවඳ දැනෙනවා." සුවනී පනේලයක් ළඟ නැවතිලා කිව්වා.

සුවනී පිස්තෝලය වනලා ජනේලය පෙන්නුවා.

දෙදෙනාම ළඟ තිබූ ගහකට නැංගා. දුවගෙන ආපු මුර සෙබළු එය දැක්කා. දෙදෙනාම ගහේ අත්තක එල්ලිලා මාලිගාවේ කේක් කාමරයට ඇතුළු වුණා.

ඊයේ බැලුන් ගොඩක් සමග අහසේ පාවෙලා ආපු වෙළෙන්දා මාලිගාවට ඇතුළු වුණෙත් මේ ජනේලයෙන්මයි.

ඒ තමා මාලිගාවේ කේක් කාමරයි.

මාලිගා වත්තේ කොච්චර කලබල තිබුණත් කුස්සියේ වැඩ කෙරෙනවා. මහ රෑ කියලා බලන්නේ නැතුව බක්කරේලයි, පුංචි බක්කරේලා වන කපටි කොල්ලොයි, සුදු ඇඳුම් අඳගෙන, සුදු තොප්පි හිස ලාගෙන පාන් හදනවා.

ටුට්ටිගේ බෝනික්කාට පණ ලැබීම නිසා හෙට දවල් කෑමෙන් පස්සේ බෙදා දීමට විශේෂ සරුවත් වගයක් හදනවා. මේවර ලොකු කේක් ගෙඩියක් හදන්ට තීරණය කළේ නැහැ. ඊයේ වගේ කවුරු හරි අහසේ පාවෙලා ඇවිත් කේක් ගෙඩිය උඩ ඉඳ ගත්තොත්, මහ විනාශයක් වෙවි.

මැද විශාල හැලියක වතුර නටනවා. ඒ හැලියෙන් දුම් පිටවෙනවා. දුම නිසා පුංචි බක්කරේලාට හරි සතුටුයි. පලතුරු කැලි වලට කපන ගමන් මහ බක්කරේලාට හොරෙන් කටේ දගන්න පුළුවනියි නොවැ.

දුම අස්සෙන් මහ බක්කරේලා භයානක දෙයක් දුටුවා.

ජනේලය ළඟ තියෙන ගහේ අතු සෙළවුනා. හඬක් නැගුණා. රතු හිසකේ ඇති යෝධ මිනිහෙක් සහ පුංචි ගෑනු ළමයෙක් කේක් කාමරයට පැන්නා.

"අත් ඔසවව්! ප්‍රොස්පේරෝ දැන්ත් පිස්තෝල දෙක පෙන්නලා කෑ ගැහැව්වා.

"හෙළවෙන්ට එපා!" සුවනී උස් හඬින් කියලා පිස්තෝලය එල්ල කලා.

බක්කරේලා අත් ඔසවාගෙන ගල් රූප වගේ හිටියා.

ප්‍රොස්පේරෝ හැලියෙන් , හැලිය උස්සලා වීසි කළා.

හැලි, වළං කුඩේ කුඩු. තඹ හැලි ඉගිල්ලෙනවා, විසිවෙනවා. ප්‍රොස්පේරෝ කේක් කාමරයේ තිබුණ හැලි පොලවේ ගැසුවා. ප්‍රොස්පේරෝ උමං මග පටන්ගන්නා දෙරටුව වන හැලියයි සෙව්වේ. මාලිගාවෙන් පැනලා යන්ට දෙදෙනාටම පුළුවන් වෙන්නේ ඒ උමං මග සොයාගත්තොත් විතරයි.

දෙදෙනාම බෝතල්, බුජම්, හැලි, වළං, තාච්චු. පුනේල ඔක්කෝම හොලා බැලුවා. කේක් කාමරය පුරාම පිටි, කීස්මිස්, සීනි, පලතුරු, කජු විසිරිලා. මී පැණි බෝතල් බිඳිලා පැනි ගලා ගියා. හරියට හීනයක් වගෙයි. හීනෙන් හැම දෙයක්ම කරන්ට පුළුවනි.

"මෙන්න උමං මගට ඇතුළුවෙන හැලිය!" සුවනි ප්‍රොස්පේරෝට පෙන්නුවා.

සොයපු හැලිය හොයාගත්තා. හැලියේ පියන ඇරියා. ඒපියන බිම ඉහිරිලා තිබුණ මී පැණි ගොඩක වැටුණා.

පතුලක් නැති හැලිය ප්‍රොස්පේරෝ දක්කා.

"ප්‍රොස්පේරෝ දුවන්න! මම පස්සෙන් එන්නම්!" සුවනී කිව්වා.

ප්‍රොස්පේරෝ හැලිය ඇතුළට රිංගුවා. කේක් කාමරයේ හිටිය බක්කරේලා අඬන හැටි ඔහුට ඇසුණා.

සුවනීට හැලිය ඇතුළට යන්ට බැරිවුණා. මාලිගාවත්ත හැම තැනම දුවපු කොටියා ජනේලයෙන් පැනලා කේක් හදන කාමරයට ආවා. මුර සෙබළුන්ගේ වෙඩි පාරවල් නිසා උගේ හැමතැනම ලේ ගලන තුවාල.

බක්කරේලා එක මුල්ලකට දුවලා හැංගුණා. සුවනීට පිස්තෝලය ගැන අමතක වෙලා ළඟ තිබුණු ඇපල් ගෙඩියකින් කොටියාට ගැහැව්වා.

උඹ උමං මගේ දෙරටුව වන මහ හැලියට පැන්නා. ටික වේලාවක් උගේ වලිගය පෙනුණා. ඊට පස්සේ වලිගයත් නොපෙනී ගිය.

සුවනී දැතින් මූණ වහගෙන ඇඬුවා.

"ප්‍රොස්පේරෝ! ප්‍රොස්පේරෝ!"

නපුරු බක්කරේලා හාහා ගාලා හිනාවුණා. එතකොටම මුර සෙබළු කේක් කාමරයට ආවා. ඔවුන්ගේ නිල ඇඳුම් ඉරිලා, ඔවුන්ගේ මූණු තුවාල වෙලා. පිස්තෝල වලින් දුම් පිටවෙනවා. ඔවුන් කොටියාට විරුද්ධව සටන් කරලා.

"ප්‍රොස්පේරෝ මළා! කොටියා ඔහුව කෑලි වලට ඉරා දමාවි. එතකොට ජීවත් වෙලා පලක් නැහැ. මම යටත් වෙනවා!" සුවනී එහෙම කල්පනා කළා.

සුවනී ඇගේ ලොකු පිස්තෝලය පුංචි අතින් මුදහැරලා දුක්වෙලා කිව්වා.

උමං මග ඇතුළේ වෙඩි පුපුරන හඬ ඇසුණා. ප්‍රොස්පේරෝ කොටියාට වෙඩි තියපු හඬ තමයි ඒ.

මූර සෙබළු හැලිය වටේට හිට ගත්තා. ඔවුන්ගේ දණක් උසට මී පැණියි, සරුවතුයි.

එක මුර සෙබළෙක් හැලියට අත දැම්මා. දෙදෙනෙක් ඔහුව ඇදලා ගත්තා. ඔහු අතින් අල්ලා ගෙන හිටියේ මැරිච්ච කොටි වල්ගයයි. උමං මගේ හිරවෙලා තිබුණ කොටි මළ කුණ එළියට ඇද ගත්තා.

"කොටියා මැරිලා!" මුර සෙබළා කිව්වා.

"ප්‍රොස්පේරෝ පණ පිටින්! ප්‍රොස්පේරෝ පණ පිටින්! මහජනයාගේ මිතුරාව මම බේරා ගත්තා." කියලා සුවනී බොහොම සන්තෝස වුණා.

පුංචි සුවනී රෝසපාට ගවුමක් ඇඳලා, රත්තරන් වැඩ දැපු සපත්තු දෙය පය ලාගෙන සන්තෝස වෙනවා.

සන්තෝසය හන්දා සුවනීගේ මූණ රෝස පාට වුණා.

ටිබුල් ඇයට බාරකරපු කාරිය ඈ ඉටුකළා. පුංචි සුවනී ප්‍රොස්පේරෝ යෝධයාව නිදහස් කළා.

"ආ එහෙමද! බලමු. ආඩම්බරකාර බෝනික්කා! මීට පස්සේ නුඹට යොනදේ බලමුකෝ..." මුර සෙබළෙක් බෝනික්කාව අතට අරගෙන කිව්වා.

"පාලකයෝ තුන්දෙනා ළඟට ගෙනියමු."

"නුඹව එල්ලා මරා දමන්ට නියම කරාවි."

"පල් මෝඩයා!" සුවනී සෙමින් කිව්වා. ප්‍රොස්පේරෝ හැලි වළං විසි කරලා උමං මගට යන පාර හොයන වේලාවේදී ඇගේ ඇඟට වැටුණ මී පැණි බින්දුවක් ඈ ලෙවකෑවා.

12

නැටුම් ගුරුවරයා

බෝනික්කා පණ ඇති ගැනු ළමයකු බව දැනගත්තයින් පස්සේ මොනවා වුණාද කියල පසුව හොයල බලමු. ඒ විතරක් නොවෙයි, ගහේ අත්තක වහල හිටිය රෝස පාට ගිරවා කවුද, සත්ත්ව විද්‍යාව පිළිබඳ පණ්ඩිතයා ගහට නැගලා බයවුණේ මන්ද, කියල පසුව දැනගනිමු. තවමත් අර පණ්ඩිතයා ගහේ අත්තක එල්ලිලා ඉන්නවද දන්නේ නැහැ. ප්‍රොස්පේරෝ නිදහස ලබා ගත්තේ කොහොමද? කොටියෙක් කුඩුවෙන් එළියට ආවේ කොහොමද? සුවනීව කොහොමද ප්‍රොස්පේරෝ වඩාගත්තේ? මිනිහකු වගේ කතා කළ වලසා කවුද? ලී කැල්ලක ලියපු පණිවුඩයක් සුවනීට දීලා මැරුණු වලසකු වැනි දැවැන්ත මිනිහා කවුද? මේවා සියල්ලම පසුව තෝරා බේරා ගනිමු...

මෙතැනදී කිසිම හාස්කමක් වෙලා නැහැ. ඒ ගැන සහතික කරන්න පුළුවනි. හැම දෙයක්ම සිදුවුණේ තර්කානුකූලවයි.

දැන් අපේ කතාවේ හැටියට උදෑසනයි. උදේ වනවිට සොබාදහම බොහොම ලස්සන වෙනවා. එළු දෙනකගේ වගේ මූණක් ඇති, පුංචි කාලේ ඉඳලම ඔළුව කැක්කුම හන්ද පීඩා විඳින, ගැහැණියකගේ හිසේ ඇම්ම පවා එදා උදේ සුව වුණා. හරිම අපූරු උදෑසන. ගස්වල කොළ හෙළවුණේ නැහැ. සිඟිති ළමයින් වගේ ඒවා හෙමින් සින්දු කිව්වා.

ඒ වගේ උදෑසනක කවුරුත් නටන්ට ආසා කරනවා. නැටුම් හල ලොකු ලොක්කන්ගෙන් පිරිලා. ඒ නැටුම් හල බාර, නැටුම් ගුරුවරයා වන නටන පාදටයි.

බඩගින්නේ නටන්ටත් බැහැ. කණගාටු වුණාම නටන්ටත් බැහැ. බඩගින්නයි, කණගාටුවයි දෙකම තිබුණේ කම්කරුවන්ටයි. ඒ ගොල්ලන් නපුරු පාලකයින්ගේ මාලිගාව වටලන්ට යන්ට ලැහැස්ති වුණා.

ධනපතීන්ගේ දූ පුත්තු, ජේත්තුකාරයෝ පොහොසත් නෝනලා, හොඳට කාලා, බීලා නටන්ට ලැහැස්ති වුණා. ටිබුල් කුසගින්නේ ඉන්න කම්කරුවන්ව එක්කහු කරලා නපුරු පාලකයින් තුන්දෙනාගේ මාලිගාව අල්ලාගන්ට ලෑස්ති වන බව ධනපතියෝ, ඉඩම් අයිතිකාරයො, රදළයො දැනගෙන හිටියේ නැහැ. පුංචි සුවනී ප්‍රොස්පේරෝව නිදහස් කරපු බව ඒ ගොල්ල දන්නේ නැහැ. දුප්පත් මිනිස්සු ප්‍රොස්පේරෝ එනතුරු බලා හිටියා. ලොකු, ලොක්කෝ නගරයේ කැළඹිලි ගැන සැළකුවේ නැහැ.

එක ලොකු නෝනා කෙනෙක් බාල් නැටුමට යන්න ලෑස්තිවෙලා බොහොම වටිනා සපත්තු පය ලාගෙන මෙහෙම කිව්වා:

"මොන බොරුද! උන් ගියොත් මාලිගාව වටලන්න, ගියපාර වගේ මේ පාරත් උන්ට මුර සෙබළු පහර දේවි."

ඇපල් ගෙඩියක රස බල බලා, තමාගේ ලස්සන කබාය හරිගස්ස ගත්තු, ජේත්තු කාරයෙක් පිළිතුරු දුන්නා:

"ඔව්, සත්තකින්ම! ඔය පතල් කාරයින්ට, කිළුටු හැඳගෙන ඉන්න පුංචි කම්මල් කාරයින්ට තුවක්කු, පිස්තෝල, කඩු නැහැ. අපේ මුර සෙබළුන්ට තුවක්කු විතරක් නොවෙයි, කාල තුවක්කු හිටන් තියෙනවා."

ආඩම්බරකාර, උද්දච්ච, ලොකු ලොක්කෝ නටන පාදගේ නැටුම් හලට ආවා.

නැටුම් හලට ඇතුළු වන තැන මෙහෙම ලියපු දැන්වීමක් තිබුණා:

නටන පාද නැටුම් ගුරුතුමා
නැටුම් විතරක් නොවෙයි සුන්දරත්වය, රූප ලස්සනය ගැන
රහස්, ආචාරශීලිකම සහ ජීවිතය පිළිබඳ කාව්‍යමය රසිකත්වය
ගැන උගන්වනවා. අදම ඉගෙනගන්න.
නැටුම් දහයක් සඳහා
එකවර මුදල් ගෙවිය යුතුයි.

නැටුම් හලේ පොළොව තේක්ක ලීයෙන් හදලා. එය ඔප වැටෙන තුරු හොඳට මැදලා. නටනපාද ගුරු තුමා නැටුම් උගන්වනවා.

නටනපාද බට නළාව පිඹින්නේ දැතින් එය අල්ලාගෙන නොවෙයි. ළදාකොල් ටලින් තද කරගෙන. නටන ගමන් ඔහු දත් හොළවනවා, ඇනනවා, කර කවනවා. ඔහුගේ අත්වල ලස්සන අත් වැසුම්. ඔහු

නොයෙක් නොයෙක් ඉරියව් වලින් හිට ගන්නවා. ඇස් නටනවා. සපත්තුව තේක්ක පොළොවට හප්පලා තාලයට නටනවා. විනාඩියෙන්, විනාඩිය කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා තමාගේ රූපය දිහා බලනවා, ඇඳුම් දිහා බලනවා, හිසකෙස් අවුල් වෙලාද කියලා බලනවා.

ජෝඩු, ජෝඩු බදගෙන නටනවා, කැරකැවෙනවා. ඔවුන්ට දඩිය දන්ට පටන් අරගෙන. ඔවුන් හති දම දමා නටනවා. වතුර උතුරන්න කලියෙන් නටාපු කකුළුවන් ගැන මතක් වෙනවා, ඒ නැටුම් දිහා බැලුවාම.

එක ජෝඩුවක් බදගෙන අත් උස්සපුවාම මහ විශාල හැලියක නටන කකුළුවෙක් අඬූ ඉස්සුවාට සමානයි.

නටනපාද කකුළුවො නටන මහ හැලිය හැඳි ගාන හැන්ද වගෙ. ඔහු උසයි, කෙට්ටුයි, කුදුයි. හැන්දක් වගේමයි.

සුවනී මේ නැටුම් දිහා බැලුවා නම්, බොහොම හිනාවේවි. "මෝඩ රජා" නැමැති නැටුමේ ඇ 'ගෝවා ගෙඩිය' වගේ රඟපෑවා. පුංචි සුවනී මීට වඩා බොහොම හොඳට, ලස්සනට නැටුවා.

නැටුම් බොහොම ජයට කෙරීගෙන යන විට තුන් දෙනෙක් මිට මොළවපු අත්වලින් නැටුම්හලේ දෙරට තට්ටු කළා.

ඒ අත් තුන මැටිවලින් හදපු ගුරු ලේත්තු වලට සමානයි.

නැටුම් නැවතුණා.

විනාඩි පහක් යනකොට නැටුම් ගුරු නටනපාද, මාලිගාවට ගෙනගියා. ඔහු සමග අසරු මුර සෙබළුන් ගමන් කළා. එක මුර සෙබළෙක් නටනපාදව ඔහුගේ අස්පයා පිට තබාගෙන ගමන් කළා. අස්පයාගේ බෙල්ල පැත්තට පිට හරවාගෙනයි ගුරුතුමා ගමන් කළේ. තවත් අසරු මුර සෙබළෙක් ලොකු කාඩ්බෝඩ් පෙට්ටියක් අස්පයා පිට උඩ තියාගෙන ගියා.

"මම ස්වර මාලා සටහන්, සංගීත භාණ්ඩ, ඇඳුම්, බොරු කොණ්ඩා තවත් බඩු ගෙනියන්ට ඕන. මාලිගාවෙ කොච්චර කලක් ඉන්ට වේවිද දන්නේ නැහැ. මම නිතර ලස්සනට ඉන්ට කැමතියි. ඒ හන්දා දවසට තුන්, හතර, පස් පාරක්ම ඇඳුම් මාරු කරනවා." නැටුම්ගුරු නටනපාද මුර සෙබළුන්ට කිව්වා.

නට, නටා හිටපු අය නැටුම් ගුරුවරයාගෙ පස්සෙන් දුවලා ගිහින් ඔහුට අත් වනලා සමුගත්තා.

ඉර මුදුන් වේගත එනවා.

මාලිගාවට යාමට ඉඩ ලැබීම ගැන නටන පාද බොහොම සතුටු වෙනවා. පාලකයෝ තුන් දෙනා, ලොකු, ලොකු මුදලාලිලගේ, ධනපතීන්ගේ, ඉඩම් හිමියන්ගේ දූ පුතුන්ට කැමති නිසා, නටනපාදත් නපුරු පාලකයින්ට කැමති වුණා. නැටුම් ගුරා ලොකුම, ලොකු ධනපතීන්ට නම් වැඩියත් කැමතියි.

"හැබෑටම දුප්පත් මිනිසුන්ගෙන් මට ඇති ප්‍රයෝජනයක් නැහැ. උන්ට නටන්ට වේලාවක් නැහැ. උන් හැම තිස්සෙම වැඩ කරනවා. උන් ළඟ සල්ලිත් නැහැ. ධන පතියෝ. මුදලාලිලා වෙනස්. ඒ මහත්තැන් ළඟ සල්ලි. ඒ ගොල්ල කිසි වැඩක් කරන්නේ නැහැ!"

නටනපාද එහෙම කල්පනා කළා. ඔහු හිතන හැටියට ඔහු මෝඩයෙක් නොවෙයි. අපි හිතන හැටියට නම් ඔහු මෝඩයෙක්.

"අර සුවනී, පුංචි කෙල්ල මහ මෝඩියක්. මොකටද ඒ කෙල්ල දුප්පත් මිනිසුන් ඉදිරියේ නටන්නේ. උන් සමහර දට සුවනී කෙල්ලට

තඹ සතයක්වත් දෙන්නේ නැහැ." නැටුම් ගුරාට සුවනී ගැන මතක් වුනාම ඔහු එහෙම කල්පනා කළා.

දුප්පත් ජනතාවගේ සහ කම්කරුවන්ගේ නායකයා වන ප්‍රොස්පේරෝව බේරාගැනීමට පුංචි සුවනී ජීවිතය ගැන පාව කල්පනා නොකර ක්‍රියා කරපු හැටි මෝඩ නටනපාද දන්නවා නම් තවත් පුදුම වේවි.

අසරු සෙබළු ඉක්මනට ගියා.

පාර තොට වෙනදාට වඩා වෙනස් වෙලා. ඈත වෙඩි තියෙන හඬ ඇසෙනවා. කලබල වුණු පිරිසක් නගරයේ දෙරටු ළඟ රැස්වෙලා හිටියා. හිටි හැටියේ පොඩි කම්මල් අයිතිකාර කර්මාන්ත කාරයෝ පිස්තෝල අරගෙන පාර හරහා දුවනවා... මේ වගේ හොඳට ඉර පායන දවසකදී කඩ කාරයෝ ආසාවෙන් වෙළඳාම් කරන්නට ඕන. නමුත් ලොකු, ලොකු කඩ සාප්පු වහලා බඩ මහත මුදලාලිලා ජනේලවල පුංචි සිදුරු අස්සෙන් බයෙන්, බයෙන් බලනවා. ගෙවල්වල මිනිස්සු කෑ ගහනවා ඇහෙනවා.

"ප්‍රොස්පේරෝ!"

"ප්‍රොස්පේරෝ!"

"ඔහු අප සමගයි!"

"අප සමගයි!"

ඔන්න අස්සයකු පිට නැග්ග මුර සෙබළෙක් වේගයෙන් අසු පැන්නුවා. උගේ කටින් පෙණ උතුරනවා. බඩ මහත තඩි මුදලාලියෙක් දුවනවා. ලොකු පොලු අරගෙන ඔහුව ආරක්ෂා කරන්ට ඔහුගේ වැඩකාර පිරිස ඔහු වටේට දුවනවා.

එක තැනක සේවකයෝ තමන්ගේ හාම් පුතාව ආරක්ෂා කරනවා වෙනුවට පොලු වලින් ඔහුට තඩි බාන්නට පටන් අරගෙන. හාම්පුතා සේවකයින්ට පඩි ගෙවලා නැහැ. ඒ මිනිහා මර හඬ දීලා කෑ ගහනවා.

නැටුම් ගුරුතුමා ඉස්සෙල්ලා හිතුවා මුදලාලි ඇඳගෙන ඉන්න ටුවීට් කොට් එකෙයි, ටුවිට් රෙද්දෙයි දුවිලි මෙහෙකරුවෝ පිහදනවා කියලා.

මෙහෙකරුවෝ මුදලාලිට තඩිබාලා ඔහුව තාප්පයට හේත්තු කරලා පොලු වනලා ඔහුට තර්ජනය කළා. ඔවුහු දුවන ගමන් කෑ ගැහැව්වා.

"නපුරු පාලකයෝ තුන් දෙනා හංගවේවා! ධනපතින්ට අපි මීට පස්සෙ සේවය කරන්නේ නැහැ! ජනතාවට ජයවේවා!"

"ප්‍රොස්පේරෝ!"

"ප්‍රොස්පේරෝ!"

අනාතුරක් ඇතිවේය කියන ලකුණු මතුවුණා. වෙඩි බෙහෙත් දුඟුඹ පැතුරුණා.

අසරු මුර සෙබළු තුන් දෙනා නැටුම් ගුරු සමග යමින් හිටියා.

වෙනත් මුර සෙබළු දහ දෙනෙක් මේ හතර දෙනා යන මග අවහිර කළා. ඒ ගොල්ල පාබල මුර හමුදුවට අයත් සෙබළු.

"නැවතියව්!" සෙබළෙක් කෑ ගැසුවා. ඔහුගේ නිල් පාට ඇස් කෝපයෙන් දිලිසෙනවා. "නුඹලා කවුද?"

"නුඹට පේන්නේ නැද්ද?" නටනපාද සමග අස්පයකු පිට නැගලා හිටිය මුර සෙබළා ඇහුවා.

අස්පයින් නැවැත්තුවාට උන්ට එක තැන ඉන්ට බැහැ. උන් හෙමින් උඩ පනිනවා. මේ නිසා අස්පයාගේ සැදැලයයි, පටියයි හෙල්ලුනා. නැටුම් ගුරාගේ බඩවැල් පවා හෙළවුණා. වැඩිය හයියෙන් හෙළවුණේ සැදැලයද නැතිනම් බඩවැල්ද කියල කියන්ට අපහසුයි.

"අපි පාලකයෝ තුන්දෙනාගේ මාලිගාවේ මුර සෙබළු" අසරුවෙක් කීවා.

"අපි මාලිගාවට යනවා. අපට යන්ට ඉඩ හැරපල්ලා."

නිල්පාට ඇස් තියන පාබල මුර හමුදුවේ සෙබළා පිස්තෝලය එළියට අරගෙන එල්ල කළා:

"එහෙමනම් පිස්තෝල, තුවක්කු වහාම බාරදීපල්ලා. අපි මහජනයාට සේවය කරන්න ඕන. නපුරු පාලකයින්ට නොවෙයි."

අසරු මුර සෙබළුන් තුන් දෙනාව අනික් දහ දෙනා වට කරලා ඔවුන් දෙසට පිස්තෝල එල්ල කළා.

අසරු සෙබළුත් පිස්තෝල අතට ගත්තා. නටනපාද බයවෙලා අස්වයාගෙන් බිමට වැටුණා. ඔහුට ආපසු සිහිය ආවේ සටන් ඉවරවූ පසුවයි. සටනින් ජය ලැබුවේ පාබල හමුදුවේ මුර සෙබළුන්ටයි. නටනපාදව අසුපිට නංවාගෙන ගිය මුර සෙබළා සටනේදී මළා.

නැටුම් ගුරා ඇස්දෙක වහගෙන කෙඳිරි ගෑවා: "ලේ ගලනවා."

වෙනත් සෙබළෙක් ඔහු ළඟට ඇවිල්ලා ඔහුව දෑතින් අල්ලලා තුන්පාරක්ම හයියෙන් හෙළෙව්වා.

ඔහුගේ ඇඳුම් සංගීත භාණ්ඩ පෙට්ටිය පොඩිවෙලා, කැඩිලා. ඔහුගේ ඇඳුම් ඉරිලා. ඔහුගේ බොරු කොණ්ඩ, නළා පාර හැමතැනම විසිරිලා...

"අනේ!"

සෙබළු දෙපිළට බෙදී සටන් කරන විට නැටුම් ගුරාගේ ඇඳුම් පෙට්ටිය බිම වැටිලා විනාශ වුණා.

"අනේ, අයියෝ!"

ගුරුවරයා තමාගේ ඇඳුම් අහුලන්ට පටන් ගත්තා. කෝට්, ටයි, කලිසම්, කමිස, උඩ කබා, යට කබා, මේස, ලස්සන එහෙත් ලාභ සපත්තු, ඔය වගේ ලට පට ඔනු එකතු කරලා පාර මැඳ ඉඳගත්තා. ගුරුවරයාට මැරෙන්න තරම් මහ ලොකු කනගාටුවක් උපන්නා.

නැටුම් ගුරා බඩු එකතු කරන විට, අසු පිට නැග ගත්තු මුර සෙබළු තුන්දෙනෙක් මහ වේගයෙන් මාලිගාවට ගියා.

ඒ අස්පයින් තුන් දෙනා ඉස්සර අයිති වෙලා තිබුණේ නැටුම් ගුරුවරයා සමග ගිය මුර සෙබළුන්ටයි. සටනේදී එක සෙබළෙක් මළායින් පස්සෙ අනික් දෙදෙනා මජයනයාගේ පැත්ත ගත්තා. නැටුම් ගුරාගේ පෙට්ටියේ රෝස පාටට මොනවදෝ තිබුනා.

අසරු සෙබළු තුන්දෙනා වේගයෙන් අස්පයන්ව පැන්නුවා. එක සෙබළෙකුගේ අතේ රෙදි වලින් ඔතාපු මොනවදෝ තිබුණා.

ඉදිරියට එන අය ඔවුන්ට ඉඩදීලා අයින් වුණා. නිල්පාට ඇස් තියෙන මුර සෙබළාගේ තොප්පිය වටේට රතු පීත්ත පටියක් බැඳලා. එහි තේරුම සෙබළා මහජනයගේ පැත්ත ගත් බවයි.

ඔවුන්ව දකින මහ ජනයා අත්පුඩි ගහලා ඔවුන්ට හොඳ කියනවා. එහෙත් ඔවුන් දිහා බලා ගල් ගැහෙනවා. සෙබළකු කිහිලි ගන්නාගෙන යන පොදියෙන් ගෑනු ළමයකුගේ කකුල් දෙකක් පේනවා. රෝසපාට ගවුමකුයි, රත්රන් වැඩ දැපු සපත්තු දෙකකුයි පෙනෙනවා...

13

ජය ලැබීම

දැන් අපි කිව්වේ එදා උදේ ඉර පෑව්වට පස්සෙ වෙච්ච දේ. ඉර පායන්නට ඉස්සෙල්ලා එදා රෑ මහ කළුවරේ වුණේ මොනවාද. එදා රෑ වෙච්ච දේ බොහොම පුදුමයි නොවේද.

එදා රෑ මහජන කැරැල්ලේ නායක අවි සාදන කම්කරුවකු වන ප්‍රොස්පේරෝ හිර කුඩුවෙන් පැනලා දිව්වා. සුවනීව අපරාධ කාරියක් හැටියට අල්ලා ගත්තා.

එදා රෑ පිටකවර දැපු පහන් අරගත් තුන්දෙනෙක් ටුට්ටිගේ කාමරයට රිංගුවා.

මේ විදිහට තුන්දෙනෙක් ටුට්ටිගේ කාමරයට රිංගුවේ ප්‍රොස්පේරෝ කේක් කාමරයෙන් කුස්සියට ගිහිල්ලා මහ හැලියට ඇතුළු වෙලා පැනලා ගිහිල්ලා පැයක් විතර ගතවුණාට පස්සේ. කේක් කාමරයේ උමං පාරට ඇතුළු වන හැලිය ළඟදී සුවනීට හිරබාරෙට ගත්තයින් පස්සෙ.

ටුට්ටිගේ කාමරය කළුවරයි.

ජනේලයෙන් අහසේ තරු පෙනුණා.

ටුට්ටි බොහොම සැපසේ නිදගෙන උන්නා.

කාමරයට ඇතුළු වුණ තුන් දෙනා පහන් තුන හංගා ගන්ට වෑයම් කළා.

ඒ ගොල්ල මොනවා කළාද කියන එක දන්නේ නැහැ. කාමරයට පිටින් හිටිය මුරකරුවෝ ඔහේ නිකම් හිටියා.

කාමරයට ඇතුළු වුණ තුන්දෙනාට ඕන දෙයක් කරන්ට බලය තිබුණු බව එයින් තේරුම් ගන්ට පුළුවනි.

ටුට්ටිගේ භාරකාරයින්ට ධනිරිය තිබුණේ නැහැ. බෝනික්කාගේ සිද්ධිය මතකයි නේද. මාලිගා වත්තේදී බෝනික්කාට මුර සෙබළු කඩුවලින් අනින කොට ටුට්ටිගේ ගුරා බයවුණු හැටි මතකයි නොවේද. නපුරු පාලකයින් තුන්දෙනාට ඒ ගැන කියන විට, ටුට්ටිගේ ගුරුවරයා බයවුණා.

මේ වරත් ටුට්ටිව රැක බලාගන්නා ගුරුවරයා බය ගුල්ලෙක්.

තුන්දෙනා ටුට්ටිගේ කාමරයට ඇතුළු වුණ හැටියේම ඔහු බාර ගුරුවරයා බොහොම බයවුණා. ඔහු ඒ වේලාවේ හිටියෙ ටුට්ටිගේ කාමරය ඇතුළෙ. ඔහු ජනේලය ළඟ වාඩිවෙලා නිදිමත හැදෙනවට අහස දිහා බලාගෙන තරු ගණන් කළා.

ඔන්න එතකොට තමා අර මිනිස්සු තුන්දෙනා ලාම්පු අරගෙන කාමරයට ඇතුළු වුණේ. බාරකාර ගුරුවරයා පුටුව යටට රිංගලා හැංගුණා. ඔහුගේ නහය දිග නිසා ඔහුට හැංගිලා ඉන්න බැරිවෙයි කියලා ඔහු බයවුණා. අහසේ තරු එළිය හන්ද ඔහුගේ බිලිකටු නහය දිගට දිගේ පේනවා. නහය නිසා මිනිහා කවුද කියලා හොයා ගන්ට පුළුවනි.

පසුව ඔහු තරමක් සන්සුන් වුණා. "මගේ නහය දැකලා ඒ ගොල්ල හිතාවි ඒක පුටුවට අයිති කැටයම් වැඩක් කියලා."

තුන් දෙනා ලාම්පු අරගෙන ටුට්ටි නිදහිටිය ඇඳ ළඟට ආවා.

"මෙන්න" එකෙක් හෙමිහිට කිව්වා.

"නිදි" අනිකා පිළිතුරු දුන්නා.

"ස්ස්..." කෑගහන්ට එපා.

"ඔහු තද නින්දේ."

"එහෙනම්. පටන් ගනිමු."

මොකක්දෝ සද්දයක් ඇහුණා.

භාරකාර ගුරුගේ නළලට හීන් දඩිය දැම්මා. බය නිසාම ඔහුගේ දිග නහය තවත් දික් වෙන බව ඔහුට දැනුණා.

"ලැස්තියි."

"මෙහාට දෙනවා."

සද්දයක් ඇහුණා. බෝතලයක වතුර හෙළවන සද්දයක් වගේ. ආයෙමත් හැම දෙයක්ම නිහඬයි.

"කොහාටද වක්කරන්නේ?"

"කනට."

"ටුට්ටි කොට්ටයට කම්මුලක් තියාගෙන නිදි. බොහොම ලේසියෙන් බෙහෙත කනට වත් කරන්ට පුළුවනි."

"ප්‍රවේසමින් කනට බිංදු ගණනට වත් කරන්න."

"හරියට බිංදු දහයයි."

"පළමුවෙනි බින්දුව බොහොම හීතලයි. දෙවැනි බිංදුව කනේ වැටුණට දැනෙන්නේ නැහැ. පළමුවෙනි බිංදුව ඉක්මනින් ක්‍රියාකාරී වෙනවා. ඊට පස්සේ කිසි දැනීමක් නැහැ."

"පළමුවැනි බිංදුව ළඟටම ඉඩ නොතියා දෙවැනි බිංදුව වක්කරන්න."

"බොහොම හීතල දැනිලා කොල්ලාට ඇහැරේවි."

"ස්ස්ස්... වත් කරනවා. එකයි, දෙකයි!" සමන් පිච්චමල් සුවඳ කාමරය පුරාම පැතුරුණා.

"තුනයි, හතරයි, පහයි, හයයි" කවුදෝ ගණන් කළා.

"වැඩේ හරි."

"දැන් ඉතින් ඔහු දවස් තුනක්ම එක හුස්මට නිදා ගනීවි."

"ඔහුගේ බෝනික්කාට වුණ දේ ඔහු දන්නේ නැහැ."

"ඔහුට ඇහැ ඇරෙන විට වැඩ සියල්ල ඉවරයි."

"නැතිනම් ටුට්ටි අඬන්නයි, අඩි පොළවේ ගහන්නයි, කෑ ගහන්නයි වුණාම, පාලකයෝ තුන්දෙනා අර කෙල්ලට සමාව දේවි..." තව එකෙක් කිව්වා.

තුන්දෙනා කාමරයෙන් පිටවෙලා ගියා. බාරකාර ගුරුවරයා බයේ වෙවුල, වෙවුලා නැගිටලා ටුට්ටිගේ ඇඳ ළඟ තිබුණු රෝස පාට ලාම්පුවේ දැල්ල වැඩි කළා.

ටුට්ටි රේන්ද අල්ලපු සිල්ක් මෙට්ටයක් උඩ වැතිරිලා නිදි. ඔහු පුංචියි, නින්දෙන් පවා ආඩම්බරයි.

ඔහුගේ හිසකේ රන්වන් පාටයි. කොට්ට ලොකුයි, සුදු පාටයි.

බාරකාර ගුරුවරයා ලාම්පුව අතට අරගෙන ඔහුගේ මුහුණ දිහා හොඳට බැලුවා. පුංචි කන ඇතුළේ බෙහෙත් බිංදු මැණික් ගලක් වගේ දිලිසෙනවා.

භාරකාරයා පුංචි ඇගිල්ල ඔහුගේ කන ළඟට කිට්ටු කළා. බෙහෙත් හිඳිලා. බොහොම හීතලයි.

ටුට්ටි මළා වගේ නිදි.

ඊට පැය කීපයකට පසුව ඉර පැව්වා. මේ ළමයි දන්නවා උදේ මොනවා වුණාද කියලා.

උදේ පාන්දර මාලිගාවට යන විට, නැටුම් ගුරුවරයාට මොනවා වුණාද කියලා අපි දන්නවා. දැන් අපි හොයලා බලමු පුංචි සුවනීට මොකද වුණේ කියලා. ඈ මුර සෙබළුන්ගේ අතටම අහුවුණා මතකයි නෙවද!

ඉස්සෙල්ලාම කල්පනා කළා ඇයව උමං හිරගෙට දාන්න.

"බැහැ. ඒක බොහොම අනතුරුදායකයි. අපි ඉක්මනින් සාධාරණ නඩු ඇසීමක් පවත්වමු." මහ ඇමතියා කිව්වා.

"ඔව්. ඔව්. ඔය පුංචි කෙල්ල හන්දා කාලෙ නාස්ති කරන්ට බැහැ." නපුරු පාලකයෝ තුන්දෙනා එකඟ වුණා.

එදා රෑ කොටියා ඔවුන් තුන් දෙනාව ලුහුබඳිමින් දුවපු හන්දා ඔවුන්ට පණ එපයි කියලා දුවන්ට සිදුවුණු බව අමතක නොකරමු. ඔවුන්ට දැන් බොහොම මහන්සියි. තුන්දෙනාම නිදගන්ට ගිහිල්ලා මෙහෙම කිව්වා:

"අපි ටික වේලාවකින් නිඳා ඉඳලා, උදේට නඩු අහමු."

මෙහෙම කියලා නපුරු පාලකයෝ තුන්දෙනා නිදගන්ට ගියා.

මහ ඇමතියාට හොඳටම විශ්වාසයි, බෝනික්කා පණ ඇති පුංචි කෙල්ලක බව. නඩුකාරයා ඇයව මරා දමන්ට නියම කරාවි. ටුට්ටි අඬලා, කෑගහලා තීරණය වෙනස් කරයි කියලා හිතාපු මහ ඇමතියා ටුට්ටිට නිදි බෙහෙත් කනට වක් කරන්ට කියලා අණ කළා.

ලාම්පු තුනකුන් අරගෙන ටුට්ටිගෙ කාමරේට මහ රෑ ආපු තුන්දෙනා ඔහුගේ කනට නිදි බෙහෙත් වත් කළා.

දැන් ඉතින් ටුට්ටි හොඳටම නිදි.

සුවනීව මුර කාමරයට දැම්මා. එතැන මුර සෙබළුන්ගෙ තිප්පොළක්. ඇය වටේටම මුර සෙබළු ඉන්නවා. පිට මිනිහෙක් මෙතැනට ආවොත් පුදුම වෙනවාට සැක නැහැ. ලස්සන පුංචි ගෑනු ළමයෙක් බොහොම කනගාටුවෙන් මුර සෙබළුන් මැද වාඩිවෙලා ඉන්නේ මොකද කියලා පුදුම වේවි. මුර පොළේ අස්පයින්ගේ පිටට දාන සැදෑල, පිස්තෝල, තුවක්කු, බීර වීදුරු ගොඩගහලා තිබුණා.

මුර සෙබළු එකතු වෙලා සූදු සෙල්ලම් කලා. ගඳගහන දුම්කොළ පයිප්ප බිබී දුම් පිට කළා. උන් බැණගත්තා, ගහගන්නට පටන් ගත්තා.

මේ මුර පොළේ සෙබළු තවමත් නපුරු පාලකයින් තුන්දෙනාට පක්ෂයි. උන් සුවනීට අත මට්ටි මොළවලා තර්ජනය කළා. ගෙරෙව්වා. ඇයට පයින් ගැසුවා.

සුවනී ඒවා බොහොම සන්සුන් ලෙස ගණන් අරගෙන හිටියා. නමුත් ඔවුන්ව කේන්ති ගන්වන්න ඈ දිව දික් කරගෙන පැයක්ම එක විදිහට උන්නා.

බීර පීප්පයක් උඩ වාඩිවෙලා ඉන්න ඉඩ ලැබීම ඈ සිතුවේ සතුටක් හැටියටයි. හැබැයි එක නරකකට තිබුණේ ඇගේ ලස්සන ගවුම

කිලිටිවීම පමණයි. ගවුම ගිනි පන්දම් නිසා, කේක් කාමරයේදී වැටුණු පැණි හන්දා කිලිටි වුණා.

සුවනී තමා ගැන කල්පනා කළේ නැහැ. ඇය වැනි පුංචි ළමයකුට මරණය වැනි දේ ගැන හරියට හිතාගන්ට බැහැ. පිස්තෝල එල්ල කරනවට ඒ වගේ ළමයි බය නැහැ. හොඳටම බයවෙන්නේ කළුවර කාමරේ ඉන්ටයි.

සුවනී මෙහෙම කල්පනා කළා:

"ප්‍රොස්පේරෝ නිදහස් වුණා. දැන් එයයි ටිබුලුයි ඇවිල්ලා මාව බේරා ගනීවි. ඒ ගොල්ල එක්ක දුප්පත් මිනිස්සු ගොඩක් ඒවී."

සුවනී මෙහෙම කල්පනා කරනවිට, නැටුම් ගුරුගෙන් අර රෝසපාට පොදියක් උදුරා ගත්තු අසුරු සෙබළු තුන්දෙනා මාලිගාව දිහාට ආවා. ඒ පොදිය ගෙනාවේ නිල්පාට ඇස් ඇති සෙබළා.

ඔහු මාලිගා දෙරටුවට ළං වෙන විට, තම තොප්පිය වටේ ඔතලා තිබුණු රතු පීත්ත පටිය ගළවා දැම්මා. අනිත් දෙදෙනාත් එහෙම කළා.

එහෙම කළේ මාලිගා දෙරටුවෙන් ඇතුළු වෙන්ටයි.

මාලිගා දෙරටුව මුර කරන අය රතු පටි දුටුවා නම් වෙඩි තියන්න පටන් ගනීවි.

ඔවුන් යන්තම් දෙරටුවෙන් ඇතුළු වෙලා නායක මුර සෙබළාගේ ඇඟේ හැප්පෙන්නේ නැතුව ආවා.

නායක මුර සෙබළා කෝට් එකේ දූවිලි පිහදගෙන මෙහෙම කිව්වා:

"බොහොම වටිනා දෙයක් ගේනවා වෙන්නට ඕන."

දැන් සුවනීගේ අවසාන පැය ළංවෙලා. මහ ඇමතියා මුර පොළට ඇතුළු වුණා.

මුර සෙබළු නැගිටලා පේළිය හිටලා අත් ඔසවා ආචාර කලා.

"පුංචි කෙල්ල කෝ?" මහ ඇමති ඇහුවා.

"කෙල්ල මෙහෙවර" කියලා මුර සෙබළ මහා නායකයා අඬ ගැසුවා.

සුවනී හෙමිහිට පීප්පයෙන් බිමට බැස්සා.

ලොකු මුර සෙබළෙක් ඇඟේ බඳ පටියෙන් අල්ලලා ඉස්සුවා.

"පාලකයෝ තුන්දෙනා නඩු අහන සාලාවට ගියා. ඔය කෙල්ලව නාඩු ශාලාවට ගෙනියපල්ලා!" මහ ඇමතියා ඇස් කණ්ණාඩි පිහදා ගන්න ගමන් අණ කළා.

මහ ඇමතියා ඉස්සරවෙලා ඉස්තෝප්පුවට ගියා. සෙබළා සුවනීව එක අතකින් කිහිළි ගහගෙන ගියා.

ඇගේ ලස්සන ගවුම පොඩි වෙලා, කිලිටි වෙලා. සුවනී ඔහුගේ අතට තද වෙලා.

එහෙම එල්ලීගෙන වගේ ඉන්ට ඇට බැහැ. බොහොම රිදෙනවා. ඈ ඔහුගේ වැළමිට හැපුවා. ඔහුගේ අත කබායෙන් වැහිලා තිබුණට සුවනී වෙර දලා හැපුව හන්දා වේදනාව දැනුණා.

"යකින්න!" සෙබළා බැන්නා.

මහ ඇමතියා හැරිලා සෙබළ දිහා බලලා "මොකද?" කියලා ඇහුවා.

එතකොටම මහ ඇමතියාගේ කන හරහා වැදුනා 'පටාස්' ගාලා සැර පහරක්. මහ ඇමති නාකියා බිම ඇද වැටුණා.

ඔන්න එවිටම සුවනීව කිහිලිගන්නා ගෙන ගිය සෙබළාටත් හෙණ පාරක් වගේ පහරක් වැදුණා. ඔහුත් දඩාස් ගාලා බිම ඇද වැටිච්චි.

මහ විශාල නපුරු මූර සෙබළා ගහක් වගේ බිම ඇද වැටෙන්න, කොතරම් සැර පහරක් ගහන්න ඕනද කියලා කල්පනා කරල බලන්න!

මොකද වුණේ කියල සුවනී හැරිල බලන්න ඉස්සෙල්ලා ඇයව තවත් කවුදෝ ඇද්ද.

ඒ අත ශක්තිමත් වුණාට නපුරු නැති බව පුංචි සුවනීට තේරුණා.

"බය වෙන්න එපා!" සෙබළෙක් හෙමින් ඇට කිව්වා.

නපුරු පාලකයෝ තුන්දෙනා නඩු අහන ශාලාවට වෙලා නොඉවසිල්ලෙන් බලාගෙන ඉන්නවා. කපටි බෝනික්කාට විරුද්ධව නඩු අහන්න තුන්දෙනා කැමති වුණා. ඔවුන් වටේ නඩුකාරවරු, නිලදරුවෝ, උපදේශකවරු, ලේකම් වරු වාඩිවෙලා හිටියා. ඒ ගොල්ල ඇඳලා හිටිය බොරු කොණ්ඩ නොයෙක්, නොයෙක් පාටින් දිලිසෙන්නට වුණා. සුදු, කළු, රත්තරන්, දම් පාටින් ඒවා දිලිසුණා. ඉර අව්වට බොරු කොණ්ඩ දිලිසුණාට ඔවුන්ගේ නපුරු මුහුණු වලට සිරියාවක් ලැබුණේ නැහැ.

නපුරු පාලකයින් තුන්දෙනාට දඩිය දන්ට පටන් අරගෙන. ඔවුන්ගේ මේසය ඉස්සරහ කඩදාසි ගොඩක්. ඔහු තුනී කඩදාසි වලින් දඩිය පිහදම්මා. ලේකම් කෙනෙක් විනාඩියෙන් විනාඩියට අලුත් කඩදාසි ගෙනාවා.

"අපේ මහ ඇමති වරයා අපව පරක්කු කරනවා." පළමුවැනි නපුරු පාලකයා කිව්වා.

ඔන්න ඉතින් අන්තිමේදී බෝනික්කාව උස්සාගෙන එන මූර

සෙබළා නඩු අහන සාලාවට ආවා. බෝනික්කාගේ මුහුණ බොහොම කණගාඩු පාටයි.

ඊයේ හැම දෙනාවම මවිත කරපු ලස්සන රෝසපාට ගවුම දැන්නම් හොඳටම කිලිටි වෙලා. බෝනික්කාගේ ඔළුව සෙබලාගේ උරහිසට වැටිලා. ඇගේ මුහුණ සුදු මැලියි. ඇස්දෙක මළානිකයි.

නඩු සාලාවේ හිටිය මිනිස්සු හිස ඔසවලා බැලුවා.

නපුරු පාලකයෝ දෑත් පිසදැම්මා.

නඩු ලියන මහ ලේකම් දිග කන්වල ගහ ගෙන තිබුණු දිග පිහාටු පෑන් අතට ගත්තා.

"ආණ්ඩුවේ මහ ඇමතිවරයා කොහේද?" පළමුවැනියා ඇහුවා.

බෝනික්කාව ගෙනාපු සෙබළා වාර්තා කළා. ඔහුගේ නිල්පාට ඇස් දෙක සතුටින් දිලිසෙනවා.

"මහ ඇමති තුමාට අතර මගදී අතීසාර රෝගය හැදිලා, එයාට බඩ යනවා."

නඩුකාරවරු ඒ කතාව පිළිගත්තා.

නඩු ඇහීම පටන් ගත්තා.

සෙබළා බෝනික්කාව චිත්තිකාරයින්ගේ ලී බංකුව උඩ වාඩි කෙරෙව්වා. ඈ හිස පහත දමා ගෙන වාඩිවෙලා ඉන්නවා.

පළමුවැනි නපුරු පාලකයා ප්‍රශ්න ඇහුවා.

මෙතනදී පුදුම දෙයක් සිදුවුණා. ලී බංකුව උඩ වාඩි වෙලා ඉන්න බෝනික්කා එක ප්‍රශ්නයකටවත් පිළිතුරු දුන්නේ නැහැ.

"අපූරුයි!" නපුරු පාලකයෝ කිව්වා. "අපූරුයි. නුඹට තවත් අමාරු වේවි! නුඹට දෙන දඬුවම තවත් බර පතල කරනවා."

බෝනික්කා කට වහගෙන හිටියා.

සෙබළු තුන්දෙනෙක් ගල් ගැහුණා වගේ හිටගෙන හිටියා.

"සාක්කිකාරයින්ව කැඳවනු." නපුරු පාලකයෙක් අණ කළා.

එකම එක සාක්කි කාරයයි හිටියේ. ඔහු තමා සත්තු වත්තේ අදිපති පණ්ඩිතයා. මුළු රැය තිස්සේම ඔහු ගහේ අත්තක එල්ලිලා හිටියා. උදේ පාන්දර තමයි ඔහුව ගළවලා ගත්තේ. ඔහු රෑට අදින පිජාමා ඇඳුමයි, තොප්පියි එක්ක නඩු ශාලාවට ආවා සාක්කි දෙන්නට.

බංකුව උඩ ඉන්න සුවනී හෙවත් බෝනික්කා නැතිනම්, බෝනික්කා හෙවත් සුවනී දුටු පණ්ඩිතයා බයවෙලා බීම ඇද වැටෙන්නට ගියා. එවිට ඔහුව මුර සෙබළු අල්ලා ගත්තා.

"සිදුවූ දේ විස්තර කරන්න." ඔහුට අණ කළා.

පණ්ඩිතයා විස්තර සහිතව කතාව කීවා. ඔහු ගහේ අතු අතර රෝස පාට ටුට්ටිගේ බෝනික්කාව දුටු හැටිත්, ගහට නැග්ග හැටිත් විස්තර කළා. බෝනික්කෝ ගස් නගින්නේ නැතිනිසා ඔහු බොහොම බය වුණු බව සත්ත්ව විද්‍යාව දන්නා පණ්ඩිතයා කිව්වා.

"ඈ ප්‍රොස්පේරෝව නිදහස් කළේ කොහොමද?"

"මම දැක්කේ නැහැ. මට ඇහුණේ නැහැ. මට සිහිය නැතිවෙලා තිබුණා." පණ්ඩිතයා පිළිතුරු දුන්නා.

"හොර කෙල්ලේ, නුඹට කියන්ට පුළුවන්ද නුඹ ප්‍රොස්පේරෝට උදව් කරපු හැටි?"

සුවනී නිහඬව සිටියා.

"ඇයව හොල්ලපල්ලා!"

"සෑහෙන්න හොලවාපල්ලා!" නපුරු පාලකයෝ අණ කළා.

නිල්පාට ඇස්ඇති සෙබළා බොහොම භයියෙන් හොළවලා ඔළුවට ටොක්කුත් ඇන්නා.

සුවනී නිහඬව හිටියා.

නපුරු පාලකයෝ කෝපය හන්දා පුපුරන්නට වගේ දැගලුවා. බොරු කොණ්ඩ පැළඳපු ඔළුගෙඩි ඒ අත, මේ අත වැනුණා.

"කිසිම විස්තරයක් අපට ලබා ගන්න බැරිවෙන හැඩයි."

එතකොට සත්ත්ව විද්‍යාව පිළිබඳ පණ්ඩිතයා නළලෙ අත්ලෙන් ගහලා මෙහෙම කිව්වා:

"මොනවා කරන්න ඕනද කියලා මම දන්නවා!"

නඩුකාරයෝ ඔහු දෙස බැලුවා.

"සත්තු වත්තේ ගිරව් කූඩුවක් තියෙනවා. එතැන ලෝකයේ ඉතාම හොඳ ගිරව් ඉන්නවා. මිනිස්සු කියාපු දේ ඒ වගේම කියන්න ගිරව් සමර්ත බව හැම කෙනෙක්ම දන්නවා... මේ කෙල්ලයි ප්‍රොස්පේරෝයි කතා කරපු දේ ගිරවුන්ට හොඳට මතකයි. උන් ඒවා කට පාඩමෙන් කියාවි... එම නිසා සාක්කි කාරයකු හැටියට ගිරවකුව කැඳවන්න කියලා මම යෝජනා කරනවා."

නඩුකාරවරු සතුටින් කැමති වුණා.

පණ්ඩිතයා සත්තු වත්තට ගිහිල්ලා ගිරවකු ගෙනවා. පණ්ඩිතයාගේ දබර ඇඟිල්ල උඩ නාකි ගිරවෙක් වාඩිවෙලා හිටියා. උගේ බෙල්ල දිගයි, රතුපාටයි.

"පෙත්තප්පු, මගෙ පෙත්තප්පු. මතක් කරපන් සුවනී කෙල්ල ප්‍රොස්පේරෝට කොහොමද කතා කළේ කියලා." පණ්ඩිතයා ගිරවාට ජර්මන් බසින් කතා කළා.

සුවනී සත්තු වත්තට ගිහිල්ලා කතා කරපු හැටි බෙල්ල දිග ගිරවා අහගෙන හිටිය හැටි ළමයින්ට මතක ඇති නේද! ගිරවා හොරාට නිදගෙන හිටිය හැටි මතකයිනේද?

දැන් ගිරවා තම කුඩුවේ රිදී වළල්ල උඩ ලැගලා ඉන්නා විදිහටම පණ්ඩිතයාගේ ඇඟිල්ල උඩ වහලා ඉන්නවා.

ගිරවා හිනාවුනේ සතුටින්. සුවනී ගැන හෙළිකරන්ට ඉඩ ලැබුණු හන්ද.

පණ්ඩිතයා අයෙමත් ජර්මන් බසින් ගිරවාට කතා කළා. බෝනික්කව පෙන්නුවා.

එතකොට ගිරවා අත්තටු ගහලා කෑ ගැහැව්වා:

"සුවනී! සුවනී!"

පරණ ගෙවැටක දෙර පළුවක් හුළං පාරට වැනිලා හඬක් පිටකරනවා වගේ ක්‍රීක්, ක්‍රීක් ගාලා ගිරවා කතා කළා.

නඩුකාරවරු නිහඬව හිටියා.

පණ්ඩිතයාට බොහොම සන්තෝසයි.

ගිරවා කේළාම් කියන්නට පටන් ගත්තා. එදා රෑ ගිරවාට ඇහුණු දේ ඌ අයෙමත් කිව්වා. ප්‍රොස්පේරෝව මුදගත්තු හැටි ඔබ දැනගන්ට කැමතිද? එහෙනම් ගිරවාගේ කතාව අහන්න.

ගිරවා නම් හැබෑම හපනෙක්. එහෙම ගිරවි ඉන්නේ කලාතුරකින්. උගේ බෙල්ල වටේ තියෙන රතු පාටිය නිසා ඌ ගිරා රජකු වගෙයි. මිනිහෙක් වගේ ඌ කතා කරල මෙහෙම කිව්වා.

"නුඹ කවුද?" මිනිහෙක් වගේ ගිරවා ගොරෝසු කට හඬින් කතා කළා.

ඊට පසුව ඌ ගෑනු ළමයකුවගේ හීන් හඬින් මෙහෙම කිව්වා:

"මම සුවනී!"

"සුවනනීද?"

"මාව මෙහාට එව්වේ ටිබුල්. මම බෝනික්කෙක් නොවෙයි. පණ තියන ළමයෙක්. මම ආවේ ප්‍රොස්පේරෝව ගළවා ගන්ටයි. මම සත්තු වත්තට ආපු හැටි දැක්කාද?"

"නැහැ. මට වේලාසනින් නින්ද ගියා."

"එක කුඩුවකදි මට හමුවුණා වලසෙක් වගේ මිනිහෙක්. ඔහු කතා කළා. මම සිතුවා ඒ ප්‍රොස්පේරෝ කියලා. ඒ මිනිහා. මළා!"

"එයාගෙ නම ටුබ්. එයා මළාද?" ප්‍රොස්පේරෝ වගේ ගිරවා ඇසුවා.

"මම බයවෙලා කෑ ගැහුවා. මුර සෙබළු ආවා. මම ගහකට මුවා වුණා. ප්‍රොස්පේරෝ පණ පිටින් ඉන්න හන්දා මම බොහොම සතුටුයි. මම ආවේ ප්‍රොස්පේරෝ බේරා ගන්නයි."

"මගේ කුඩුවට ලොකු ඉබ්බෙකුව දැලා."

"මා ළඟ යතුර තියෙනවා." සුවනී වගේ ගිරවා හඬ මාරු කරලා කිව්වා.

ගිරවා එහෙම කියපු හැටියේම නඩුකාරවරු බොහොම කෝප වුණා.

"ආ තෝ හොර කෙල්ල! දැන් පැහැදිලියි. මේ පුංචි හෙර ටුට්ටිගේ කරෙ තිබුණු යතුර හොරකම් කරලා, ප්‍රොස්පේරෝව නිදහස් කළා. ප්‍රොස්පෙරෝ කොටියාව නිදහස් කළා."

"ඔවු!"

"ඔවු!"

"ඔවු!"

සුවනී නිහඬව හිටියා.

ගිරවා කටවහගෙන ඔළුව වනලා අත් තටු තුන් පාරක් ගස්සලා අනුමත කළා.

නඩු ඇහීම ඉවර වුණා.

තීරණය මෙහෙමයි:

"බොරුවට බෝනික්කාගේ වෙස්ගත් මේ කෙල්ල ටුට්ටිව රැවටුවා. පාලකයින් තුන්දෙනාගේ ප්‍රධාන හතුරාවන ප්‍රොස්පෙරෝව ඈ නිදහස් කළා. මේ නිසා සත්තු වත්තේ හිටිය ඉතාම හොඳ කොටියත් මළා. මේ නිසා මේ කෙල්ලව මරා දැමිය යුතුයි. බඩගිනි සතුන්ට මේ කෙල්ලව කෑමට දිය යුතුයි. උන් ඇයව මරාගෙන කාපුවාවේ." මරණ දඬුවම කියෙව්වා. සුවනී වාඩිවෙලා ඇසිපිය ගහන්නේවත් නැතිව, එයාට නෙවෙයි වගෙ ඔහෙ නිකම් හිටියා.

නඩුකාරවරු, ධනපතියෝ, ලොකු ලොක්කෝ සත්තු වත්ත දිහාවට ගියා. මිනිස්සු ගොඩක් එන හන්දා සත්තු කුලප්පු වෙලා කෑ ගැහැව්වා. බොහොම කලබල වුණේ සත්තු වත්ත බාර පණ්ඩිතයා.

නපුරු පාලකයෝ තුන්දෙනයි, ඇමතිවරුයි, මැතිවරුයි, ලොකු ලොක්කොයි ආසන වල වාඩිවුණා.

ඉර පායනවා. අහස නිල්පාටයි. ගිරව්න්ගේ පිහාටු අව්වට දිලිසෙනවා. වඳුරෝ පිනුම් ගහනවා. ඇතා හොඬ ඔසවලා හඬ නැගුවා.

සුවනී මේ කිසිම දෙයක් නොබලා හිටියා. ඈ කොටි කීපදෙනෙක් ඉන්න කූඩුව දිහා බලාගෙන ඉන්නවා වගෙයි. උන් විශාලයි. කහපාටයි, කළුපාට තිත් උන්ගේ ඇඟේ පිරිලා තිබුණා.

කොටියෝ හොරෙන් වගේ මිනිසුන් දිහා බැලුවා. සමහර විට උන් විශාල කටවල් ඇරලා, ඇනුම් හැරියා. එතකොට අමු මස් ගඳක් පැතුරුණා.

අසරණ සුවනී ඔහෙ ඉන්නවා.

දැන් ඉතින් ඈට සර්කස් එකත් ඉවරයි. අව්ගුස්ටෝව, ටිබුල්ව හමුවෙන්නෙත් නැහැ.

නිල් ඇස් තියෙන මුර සෙබළා සුවනී නොහොත් බෝනික්කාව සතුන්ගේ කූඩු ඉස්සරහ තාර දාල තියෙන තැනට ගෙනියලා බිම තැබුවා.

"අවසර දෙන්න! එතකොට අපේ ඔටුන්න හිමි ටුට්ටිට බෝනික්කෙක් කෝ? ඔහුගේ බෝතික්කා කොටියාගේ නියපොතු වලින් ඉරා දැම්මා කියලා දැනගත්තොත් ඔදු අඬලා, අඬලා දුක නිසා මැරිලා යාවි." එක ඇමතියෙක් ඇහැව්වා.

"ස්ස්ස්. ටුට්ටිට නිදි බෙහෙත් කනට වක්කරලා. ඔහු දවස් තුනක්ම එක හුස්මට නිදා ගනීවි. සමහර විට ඊටත් වැඩියෙන්..."

කූඩු ළඟ තියෙන රෝසපාට රූපය දෙස හැම දෙනාම බැලුවා.

සතුන් මෙල්ල කරන්නා එක අතකින් කසයකුයි, අනිත් අතින් පිස්තෝලයකුයි අරගෙන කූඩුවට ඇතුළු වුණා. සංගීත වාදනය කරන පිරිස පාලකයින් තුන්දෙනාට ජයවේවා කියන සින්දුව වාදනය කළා.

"පැනපියව්!" කියලා මෙල්ල කරන්නා කෑ ගැහුවා.

නපුරු පාලකයෝ තුන්දෙනා සතුටින් හිනාවුණා. ලොකු ලොක්කෝ බොරු කොණ්ඩා වැනුවා. කසය හඬ නැගුවා.

බඩගිනි කොටියෝ තුන් දෙනෙක් බිම වැටිලා හිටිය සුවනී ළඟට පැන්නා.

ඈ අහස දිහා බලාගෙන හෙළවෙන්නේ නැතිව ඉන්වා. හැම දෙනාම නැගිටලා හිටියා. දුප්පත් මිනිසුන්ගේ පැත්ත ගත්ත පුංචි

ළමයාව සතුන් කෑලි, කෑලි වලට ඉරාදමන හැටි බලන්නට ලොකු ලොක්කෝ නැගිටලා හිටියා.

එක කොටියෙක් සුවනී ළඟට ඇවිල්ලා ඉව අල්ලා වටයක් කැරකැවිලා අහකට ගියා. අනිත් කොටියා කකුලකින් සුවනීගේ ඇඟට පහරක් ගහලා වලිගය නටවලා ඈතට ගියා. තුන් වෙනියා ළඟටවත් ආවේ නැහැ. කොටියෝ තුන්දෙනාම නපුරු පාලකයින් තුන්දෙනා දිහා බලලා ගොරවන්නට පටන් ගත්තා.

අන්න එවිට තමයි, හැමදෙනාටම තේරුණේ කොටියන් ළඟ තියෙන්නේ බෝනික්කෙකු මිස, පණ ඇති ළමයකු නොවන බව. ඔව් ඇත්තටම බෝනික්කා. සෙබළු කඩුවෙන් ඇනපු පරණ බෝනික්කා. දෙස්තර ගස්පාර් මාලිගාවට ගෙනාපු ලස්සන සුවනී නොවෙයි.

තෝරා බේරා ගන්නට බැරි පුදුමයක්. පණ්ඩිතයාට දිව හැපුණා. සතුන් මෙල්ල කරන්නා ආපහු කොටියන්ව කූඩු වලට එළවලා බෝනික්කාට පයින් ගැහැව්වා. ඔහු පිත්තල බොත්තම් අල්ලපු තමාගේ ඇඳුම් ගළවා දමන්ට ගියා.

පාලකයෝ, ඇමතිවරු, ලොකු ලොක්කෝ නිහඬව හිටියා.

හිටි හැටියේම සත්තු වත්තට එහායින් බෝම්බයක් පිපිරුණා.

ලොක්කෝ විගහට බිම දිගාවුණා. සතුන් පස්සා ගාත් වලින් හිටගත්තා. එතකොටම දෙවැනි බෝම්බයත් පිපිරුනා. අහසේ දුම් පිරුණා.

"ඒ මොකක්ද? ඒ මොකක්ද?" ලොකු ලොක්කෝ ඇසුවා.

"දුප්පත් මිනිස්සු ඉස්සරහට එනවා."

"උන්ට කාලතුවක්කු තියෙනවා."

"මුර සෙබළු අපට වීරුද්ද වෙලා."

"අයියෝ! අයියෝ!

මාලිගා වත්තට ආපු මහජනතාව වෙඩි තියන්ට පටන් ගත්තා. දැන් එය පැහැදිලිව පෙනුණා.

පාලකයෝ, ඇමතිවරු, ලොක්කෝ දුවන්ට පටන් ගත්තා. ඇමතිවරු කඩු අතට ගත්තා. නපුරු පාලකයෝ කැත වචන කියලා බණින්නට වුණා.

මාලිගා වත්තට හැම පැත්තෙන්ම මිනිස්සු ආවා.

දැන් මිනිසුන්ගෙන් මාලිගාවත්ත පිරිලා. ඔවුන් තොප්පි පැළඳගෙන හිටියේ නැහැ. සමහරු තුවාල ලබලා. ඔවුන්ගේ ඇඳුම් ඉරිලා. එහෙත් ඒ ගොල්ල බොහොම සතුටින්... අද සටන් වලින් ජය ලැබූ අය තමා

දැන් මාලිගා වත්තට ඇවිල්ලා ඉන්නේ. මුර සෙබළු මහ ජනයගෙ පැත්ත අරගෙන. ඔවුන්ගේ තොප්පිවල රතුපාට පීත්ත පටි බැඳලා තිබුණා. කම්කරුවෝ තුවක්කු අතට අරගෙන. ඉඩම් නැති දුප්පත් ගොවියෝ වැරහැලි ඇඳගෙන ලී සෙරෙප්පු පය ලාගෙන, අවි අරගෙන හමුදු පිටින් ආවා. හැම තැනම වෙඩි හඬ ඇහෙනවා.

"අපි දිනුවා! ජය අපටයි!" මහජනයා කෑ ගැසුවා.

බේරෙන්නට බැරි බව නපුරු පාලකයින්ට තේරුණා.

"නැහැ! නුඹලා ජය ගෙන ඇහැ. මුර සෙබළුනි ඔවුන්ට වෙඩි තබව්!" එක නපුරු පාලකයෙක් අණ කළා.

මුර සෙබළු දුප්පත් මහජනයා සමග එකතුවෙලා අත්වැල් බැඳගෙන ඉස්සරහට ආවා. එවිට මහ හඬින් එක්කෙනෙක් කතා කළා: ඒ තමා ප්‍රොස්පේරෝ.

"නපුරු පාලකයින්! යටත් වෙයව්. ජනතාව ජය ගත්තා. ධනපතීන්ගේ, ඉඩම් අයිති කාරයින්ගේ පාලනය ඉවරයි. නගරය මහ ජනතාව අල්ලා ගත්තා. නුඹලාව හිරබාරයට ගන්නවා.!"

මහජනයා පාලකයින්ව වට කළා.

රතු කොඩි ලෙළ දුන්නා. දුප්පත් මිනිස්සු වටවෙලා අවි ඔසවලා, අත් ඔසවලා, සින්දු කියන්ට පටන් ගත්තා.

ටබුල් නිල්පාට ලොකුවක් ඇඳගෙන ප්‍රොසපේරෝ ළඟින් හිටියා:

ඔහුගේ නළලේ වෙළුම් පටියක්. තුවාලය ලේ වලින් තෙත්වෙලා.

"මේ හීනයක් වෙන්ට ඕන!" එක ධනපතියෙක් කෑ ගහල කියලා ඇස් දෙක වහ ගත්තා.

ප්‍රොස්පේරෝයි, ටිබුලුයි ගීතයක් ගායනා කලා. අනිත් අයත් ඒ අනුව ගායනා කරන්ට පටන් ගත්තා. පාලම්, දියපාරවල්, කුඩා ඇලවල් වලට එහා හිටිය දහස් ගණන් මිනිස්සු ඒ ගීතය ගායනා කළා. එය නපුරු පාලකයින්ව පරාද කරලා ජනතාව ජයගත් හැටි විස්තර කරන ගීතයයි.

ඒ ගීතය ඇහුණ හැටියේ බයෙන් වෙව්ලන්ට පටන් ගත්තේ නපුරු පාලකයෝ විතරක් නොවෙයි. නගරයේ ලොකු කඩ සාප්පු අයිති මුදලාලිලා, ජේත්තුවට අදින රස්තියාදු කාරයෝ, හොරකඩකාරයෝ, සල්ලි කාරයෝ හැම දෙනාම බය වෙලා වෙව්ලන්නට පටන් ගත්තා. ඔවුන්ට එම ගීතය හරියට වෙඩි පාරක් වගේ සැරට වැදෙනවා.

ධානපතියෝ, ඉඩම් හිමියෝ කන්වල ඇඟිලි ගහගෙන මුළු, මුළුවල හැංගුණා. කොහේ හැංගුණත් සින්දුව ඇහෙනවාමයි.

ධානපතියො, සල්ලි කාරයො කීප දෙනෙක් දුවලා දුවලා වරායට ගියා. ඒගොල්ල නෑව් නැගලා පිටරට යාමට කල්පනා කළා. දැන් ඉතින් ඉස්සර වගේ දුප්පත් මිනිසුන්ව භූරාගෙන කන්ට බැරිබව ඔවුන්ට තේරිලා.

වරායේ හිටිය නැවියෝ ඔවුන්ව හිරබාරයට ගත්තා. ඔවුන් සමාව ඉල්ලා මෙහෙම කිව්වා.

"අනේ අපට නිදහස දෙන්න. අපි නුඹලාට මීට පස්සෙ බල කරන්නේ නැහැ."

දුප්පත් මිනිස්සු, කම්කරුවෝ ඒ කතාව විශ්වාස කළේ නැහැ. ධනපතියෝ කම්කරුවන්ව මීට ඉස්සෙල්ලා රවට්ටලා තියෙනවා.

ඉර මුදුන් වුණා. අහස නිල් පාටයි ලොකුම ලොකු උත්සවයක් බොහොම ජයට පවත්වනවා කියලා හිතාගන්නට පුළුවනි.

මහ ජනතාව රටේ ගබඩා, හමුදු බැරැක්ක, මාලිගා, හාල්, පිටි, ආහාර ගබඩා, ලොකු කඩ, සාප්පු, බැංකු සියල්ලම අල්ලා ගත්තා. රතු පීත්ත පටි තොප්පිවලට බැඳ ගත්තු මුර සෙබළු, අවි ගත් කම්කරුවෝ ඒවා ආරක්ෂා කළා.

හැම තැනම රතු කොඩි එල්ලලා මෙහෙම ලියා තිබුණා:

රටේ හැම දෙයක්ම හදන්නේ කම්කරුවෝ, දුප්පත් මිනිස්සු, දුප්පත් ගොවියෝ!

අද පටන් ඒවා සියල්ලම අයිති දුප්පත් ජනතාවටයි!

ජනතාරජයට ජයවේවා! ධනපති රජය අදින් ඉවරයි!

නපුරු පාලකයින් තුන් දෙනාට වුණේ මොනවාද?

ඒ ගොල්ලන්ව මහජනයාට පෙන්වන්න මාලිගාවේ මහා ශාලාවට ගෙනගියා. අවි ගත්තු කම්කරුවෝ, ගොවියෝ, දුප්පත් මිනිස්සු මාලිගාව පිරෙන්ට රැස්වෙලා. සමහරු හිනාවුණා, විහිළු කළා. තවත් අය සතුට නිසා ඇඬුවා. සුවනී ටුට්ටිගේ බෝනික්කා වගේ වෙස් අරගෙන සින්දු කිව්ව දවසේ රැස්වුණු ලොක්කන්ට වඩා අද රැස්වුණු මහ ජනයා වෙනස්.

සුවනී සර්කස් වලදී සින්දු කියන විට, ඇයට අත්පුඩි ගහපු දුප්පත් මිනිස්සු අද මෙතැන රැස්වෙලා හිටියා.

මේතරම් දුප්පත් මිනිස්සු මේ මාලිගාවට කවදවත් ඇවිල්ලා නැහැ. අද තරම් ලස්සනට මීට ඉස්සෙල්ලා ඉර පායලත් නැහැ.

"ස්ස්!"

"නිහඬවෙයල්ලා!"

"නිහඬවෙයල්ලා!"

පඩිපෙළ දිගේ හිරකාරයින්ව ගෙනාවා. නපුරු පාලකයෝ තුන්දෙනා බිම බලාගෙන ආවා. ඔවුන්ව පඩිපෙළ දිගේ ගෙනාවේ මහජනයාට ඔවුන්ව හොඳට දැක බලා ගන්නට ඉඩ දෙන්නයි.

මහ යෝධයකු තරම් ලොකු ප්‍රොස්පේරෝ නැගිටලා කතා කළා: "මෙන්න නපුරු පාලකයින් තුන්දෙනාව අපි හිරබාරයට ගත්තා. ඔවුන්ගේ පාලන බලය අපි මහජනයාට බාර කළා. අපට දැනවද

දීලා, අපව පාගලා අපෙන් වැඩ ගත්තු ධානපතියෝ, ඉඩම් හිමියෝ මුදලාලිලා අදින් ඉවරයි. පේනවනේද නපුරු පාලකයෝ කොතරම් මහත් වෙලාද කියලා. අද පටන් දුප්පත් කම නැතිකරනවා. කම්හල්, කම්කරුවන්ට බාරදෙනවා. ඉඩම්, ගොවිතැන් කරන ගොවීන්ට බාර දෙනවා. ධනපතීන් හූරාකන්නන් අද පටන් නැහැ. අප හැම දෙනාටම සම අයිතිය අනුව ජීවත් වෙන්ට පුළුවනි. අපව තළා, පෙලා, අපේ ලේ උරා බීලා මහත් වෙන ධනපතීන් නැති නිසා අපට දුක සැප දෙකම එකසේ බෙදාගෙන ජීවත් වෙන්ට පුළුවනි." ප්‍රොස්පේරෝගේ හිසකේ රතුපාටයි. ඉර අව්වට රතුපාට හිසකේ දිලිසෙන්නට වුණා.

"ජයවේවා! ජයවේවා!" මිනිස්සු කෑ ගැහුවා.

නපුරු පාලකයෝ හොටු පෙර, පෙරා ඇඬුවා.

ප්‍රොස්පෙරෝ දිගටම කතා කළා:

"අද අපේ ජයග්‍රහණයේ දවසයි. බලන්න කොතරම් ලස්සනට හිර පායනවද! කොතරම් අගේට කුරුල්ලෝ ගී ගයනවද! කොතරම් සුවඳක් මල් වලින් වහනය වෙනවද! මේ දවස මතක තියාගන්න!"

මේ පැය මතක තියාගන්න කියලා කිව්වා විතරයි මිනිස්සු හැම දෙනාම වහාම ඔර්ලෝසුව දෙස හැරී බැලුවා.

ලොකු කණු දෙකකට මැදින් විශාල ඔර්ලෝසුවක් තිබුණා. ඒ ඔර්ලෝසුව සවි කරලා තිබුණේ විශාල බුරුත ලී පෙට්ටියකට.

"දැන් වේලාව කීයද?"

ඔන්න හිටිහැටියේම බුරුත පෙට්ටියේ පියන ඇරිලා. ඒ පෙට්ටිය ඇතුළෙ ඔර්ලෝසු දුනු දැති රෝද කිසිදෙයක් නැහැ. ඔර්ලෝසුවේ යන්ත්‍රය ගළවා දමලා. ඒ පෙට්ටිය ඇතුළෙ රෝසපාට ගවුමක් ඇඳගත්තු ළමයෙක් වාඩිවෙලා හිටියා. ඒ තමා සුවනී. ඈ බොහොම සතුටින්, බබළනවා.

"සුවනී!" හැම දෙනාම සුසුම් ලැවා.

"සුවනී!" ළමයි සතුටින් කෑ ගැහුවා.

"සුවනී, සුවනී, සුවනී!" මිනිස්සු සතුටින් අත්පුඩි ගැහුවා.

නිල්පාට ඇස් ඇති මුර සෙබළා සුවනීට ඒ බුරුත පෙට්ටියෙන් එළියට ගත්තා. ඒ මුර සෙබළාම තමා නැටුම් ගුරුගෙන් ටුට්ටිගේ පරණ බෝනික්කාව උදුරාගෙන අස්පයා පිටැ නැගිලා වේගයෙන් මාළිගාවට දිව්වේ. මහ ඇමතිට සිහි නැතිවෙන්ට පහර ගැහුවේත්, සුවනීව ඇදගෙන ගිය යේධ මුර සෙබළාට බිම වැටෙන්ට මහ හයියෙන් පහරක් ගැහුවේත්

නිල්පාට ඇස් ඇති සෙබළා තමා. ඉස්සෙල්ලාම ඔර්ලෝසු පෙට්ටිය ඇතුළෙ ටුට්ටිගෙ පරණ බෝනික්කාව හංගලා. මහ ඇමතියටයි, මුර සෙබළටයි සිහි නැති වෙන්ට ගහලා සුවනි ඔර්ලෝසු පෙට්ටිය ඇතුළෙ හංගලා, එහි තිබුණු පරණ බෝනික්කාව අරගෙන නඩු ශාලාවට ගියේ නිල් ඇස් තියෙන මුර සෙබළා. සුවනීයි බෝනික්කයි එකම මූණුවරක් තියන එක උස ඇති බව ඉස්සෙල්ලා අපි කීවා නේද. ඔහු තමයි බය නැතුව පරණ බෝනික්කාව කොටියන් ඉදිරියට දැම්මේ.

මිනිස්සු පුංචි සුවනීව අතින් අත උස්සාගෙන මාරුවෙන් මාරුවට යැව්වා. සුවනී මිනිසුන්ගේ උරහිස්වලට උඩින් ගමන් කළා වගෙයි. ලෝකයේ ඉතාම හොඳ නිළිය සුවනී කියලා මිනිස්සු කීවා. ඇගේ සර්කස් බලලා ඈට කෑසි විසි කළ දුප්පත් මිනිස්සු ඇගේ පුංචි අත සිපගත්තා. ඒ ගොල්ල සුවනීට බොහොම ආදරෙයි.

සුවනී මඳ සිනා පෑවා. කම්කරුවන්ගේ ලේ ගලන මුහුණු පිස දැම්මා. ළමයි සමග විහිළු කළා. ඇඬුවා. ගොත ගසමින් මොනවාදෝ කිව්වා.

"සුවනීව මගේ අතට දෙන්න! එයා තමයි මාව මාර කටෙන් ගළවා ගත්තේ." ප්‍රොස්පේරෝ එහෙම කියනකොට ඔහුගේ ඇස්වල කඳුළු පිරුණා.

"සුවනී! සුවනී!" ටිබුල් එයාගෙ නිල්පාට ලෝගුව වනලා කෑ ගැහුවා, "ඒ මගේ පුංචි යාළුවා. මෙහෙ එන්න සුවනී!"

ඔන්න එතකොට දෙස්තර ගාස්පාර් අර්නේරි හිනාවෙවී සෙනඟ ළඟට ආවා.

ප්‍රොස්පේරෝව දලා තිබුණු යකඩ කූඩුවටම නපුරු පාලකයින් තුන් දෙනාව දැම්මා.

අවසානය

නපුරු පාලකයින් තුන්දෙනාව පරදවා අවුරුද්දක් පිරුණා. එදා රට හැම තැනම උත්සව පැවැත්තුවා.

තරුපහන අසල කොටුවේ ළමයින් සඳහා ලොකු උත්සවයක් ලැහැස්ති කළා.

හැම තැනම දැන්වීම් අලවලා:

"සුවනී රඟපායි!"

ළමයි දහස් ගණනක් සුවනීගේ රඟපෑම් බැලීමට ආවා. එදා රඟපෑවේ සුවනී විරතක් නොවෙයි, තවත් කොල්ලෙක් සුවනී සමඟ වේදිකාවට ආවා. ඔහු සුවනීගෙ වයසට සමානයි. ඔහුගේ හිස කේ රන්වන් පාටයි.

ඒ තමා සුවනීගෙ සහෝදරයා. නපුරු පාලකයො තුන්දෙනා ටුට්ටි යන නමින් ඔහුව ඇති දැඩි කළා, ඔහුට රට බාර දෙන්නට. ඔහුට කවුරුත් කිව්වේ ඔටුන්න හිමි කුමාරයා කියලයි.

නගරයේ වැසියෝ බොහොම සතුටු වුණා. කොඩි ළෙල දෙනවා. මල් වෙළෙන්දියො බොහොම ලස්සන රෝසමල් වෙළඳාම් කළා. හැම තැනම කතුරු ඔන්චිල්ලා සවිකරලා. අස්පයින්ව ලස්සනට සරසලා. තරු පහන ළඟ කොටුවට රැස්වුණ ළමයි බොහොම ආසාවෙන් සුවනීගෙ රඟපෑම් බලනවා.

ළමයි සුවනීටයි, ටුට්ටිටයි රෝසමල් මිටි තෑගි කළා. ළමයි ඔවුන් දෙදෙනාව වට කරගත්තා.

සුවනී තමාගේ ගවුමේ සාක්කු වෙන් ලී කැල්ලක් අරගෙන, එහි ලියලා තිබුණු දේ ළමයින්ට ඇහෙන්නට කියෙව්වා.

ඔබට ඒ ලී කැල්ල මතකද, සුවනී සත්තු වත්තට ගිහිල්ලා ප්‍රොස්පේරෝගේ කුඩුව කියලා වලසෙක් වගෙ හිටිය මිනිහකු ළඟට ගියා මතකද. ඒ මිනිහා සුවනීගේ අතට ලී කැල්ලක් දීලා මළා.

ඒ ලී කැල්ලේ මෙහෙම ලියලා තිබුණා.

"නුඹලා දෙදෙනෙකි: අක්කයි, මල්ලියි. සුවනී සහ ටුට්ටි.

නුඹලාට වයස අවුරුදු හතරක් වුණාම, නපුරු පාලකයින්ගේ මුර සෙබළු ඇවිත් නුඹලා දෙදෙනාව හොරකම් කරගෙන ගියා. මගේ නම ටුබ්. මම විද්‍යාඥයෙක්. නපුරු පාලකයෝ මාව මාලිගාවට ගෙන්නලා මගේ දුව සුවනීවයි, පුතා ටුට්ටිවයි පෙන්නලා උන් මෙහෙම කිව්වා. 'නුඹගේ දුව වගේම බෝනික්කෙකු හදන්ට ඕන'. ඔවුන්ට ඒ වගේ

බෝනික්කෙකු වුවමනා මොකටද කියලා මම දැනගෙන හිටියේ නැහැ. මම මගේ දුව වගේම බෝනික්කෙකුව හැදුවා. ඒ බෝනික්කා ළමයෙකු වගේම වැඩෙන්ට ඕන. සුවනීට අවුරුදු පහක් පිරුණා. සුවනී‍යි, බෝනික්කයි එක වගේමයි, සුවනී වැඩෙනකොට බෝනික්කත් වැඩුණා. ඔන්න ඊට පස්සෙ නපුරු පාලකයෝ තුන්දෙනා ටුට්ටිව මාලිගාවේ තබාගෙන, සුවනීව සර්කස් කණ්ඩායමකට වික්කා. ඇය වෙනුවට ඔවුන් කතා කරන, බෙල්ල රතු ගිරවෙකුට ලබා ගත්තා. ටුට්ටිට සෙල්ලම් කිරීමට බෝනික්කාව දුන්නා. ඔන්න ඊට පස්සේ අර නපුරෝ තුන් දෙනා මට මෙහෙම අණ කළා: "මේ කොල්ලාගේ හදවත ඉවත් කරලා ඒ වෙනුවට යකඩ හදවතක් දාපන්." මම විරුද්ධ වුණා. එහෙම කළොත් මිනිහෙකුගේ මිනිස් ගති නැති වේවි. මට බැහැ එහෙම කරන්න. යකඩ හදවතක් නොවෙයි, රත්තරන් හදවතක් දැම්මත් මිනිස් ගති නැති වෙලා යාවී. මට බැහැ කියලා මම කිව්වා. ඒ පාර නපුරෝ තුන් දෙනා මාව සතකුගේ කූඩුවක දලා මට සතෙකුට වගේ වද දුන්නා. ටුට්ටිට කිව්වා ඔහුගේ හදවත යකඩවලින් හදලයි කියලා. නපුරන්ගේ කල්පනාව පුංචි ටුට්ටිවත් නපුරකු කිරීමටයි. මම දැන් අවුරුදු අටක් තිස්සේම මේ කූඩුවේ ලැගලා ඉන්නවා. මට ඇඳුම් දුන්නේ නැහැ. මගේ ඇඟේ මයිල් දිගට වැසුණා. දත් දික් වුනා. නමුත් මට මගේ දුවයි, පුතයි අමතක වුණේ නැහැ. ටට තුඹලාට බේරා ගන්ට බැරිවුණ හන්දා, තුඹලා දෙදෙනාගෙන් සමාව ඉල්ලනවා, අපි තුන්දෙනාටම මේ තරම් ලොකු විපතක් කළේ නපුරු පාලකයින් තුන් දෙනායි. මගේ රත්තරන් පුතාගෙ නුයි, දුවගෙනුයි මම සමුගන්නවා. මම කොතරම් දුක් වින්දත් මගේ සුවනීවයි, ටුට්ටිවයි අමතක කළේ නැහැ..."









Progressive Publishing House







Progressive Publishing House



Progressive Publishing House

යූරී ඔලේෂා

නපුරු පාලකයෝ තුන්දෙනා

ISBN 978-955-1319-69-4

LKR 600/-

9 "789551"319694"

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (ප්‍රෘ.) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08